
The Dinamina
# දිනමිණ
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
දිනමින

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ නවම් අව අටවක ලත් ශනි දින | කාණ්ඩය 112 | පත්‍රය 69 | පිටු 20 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 මාර්තු 06 සෙනසුරාදා




★




සදුතික පත්තර කාර්ණිය
යොවුන්ජනතා
අද පත්‍රය සමඟ

## පාස්කු දා ප්‍රහාරයට පෙර
## කඩු 6,000ක් ගෙන්වීම ගැන
# විමර්ශන ප්‍රගතිය උසාවිය නීතිපතිගෙන් ඉල්ලයි



නෙල්කා මැදගෙදර

පාස්කු බෝම්බ ප්‍රහාර වූ කාල සීමාව ආසන්නයේදී කිසියම් පිරිසක් විසින් මෙරටට කඩු 6,000ක් ආනයනය කිරීම සම්බන්ධයෙන් දැනට විමර්ශනයක් ආරම්භ කර තිබේ ද? සහ එහි වත්මන් තත්ත්වය කුමක් ද? යන්න පිළිබඳ ආරක්ෂක ලේකම්වරයා සහ පොලිස්පතිවරයාගෙන් උපදෙස් ගෙන ඒ පිළිබඳව මේ මස 31 වැනිදා අධිකරණයට කරුණු ඉදිරිපත් කරන ලෙස අභියාචනාධිකරණය නීතිපතිවරයාට ඊයේ (05) නියම කළේය.
පිට 06

# බඩ ඉරිඟු වගාවට දුන් ඉඩම් අයිති මහවැලියටයි



නීතිපති පිට 6

## අපරාධ මැඬීන්න සතියක් මෙහෙයුම්
පිට 6

## ගුවන් හමුදාවේ 70වැනි සංවත්සරයට
### බළ ගණ 2කට ජනපති වර්ණ

නුවන් කොඩිකාර

දශක හතක කාලයක් මව්බිමේ සාමය උදෙසා ජීවිත පුද කළ සහ කැප වීමෙන් ක්‍රියා කළ ගුවන් විරුවන්ට ජාතියේ ගෞරවය පිරිනමන බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඊයේ (05) පැවසීය.
පිට 06

## ‘ගම සමඟ පිළිසඳර’ 13වැන්නෙන් ජනපති අද ගිරිබාවට

නුවන් කොඩිකාර

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සහභාගි වන ‘ගම සමඟ පිළිසඳර‘ 13 වැනි වැඩසටහන කුරුණෑගල දිස්ත්‍රික්කයේ ‘ගිරිබාව‘ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් වේරගල ග්‍රාම නිලධාරි වසමේ මාඳුරාගම ක්‍රීඩාපිටියේදී අද (06) 10.00ට ඇරඹේ.
පිට 06

## මානව හිමිකම් කවුන්සිලයේදී චීනයේ සහාය ස්ථිරයි

මහින්ද අලුත්ගෙදර

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේදී ස්ථිර වශයෙන්ම ශ්‍රී ලංකාවට සහාය දෙන බවට චීනය සහතික වී තිබේ.
පිට 06

පිට 6
## එන්නතෙන් පසු දින 2කට වඩා උණ නම් වෛද්‍ය උපදෙස් ගන්න



වෛද්‍ය හේමන්ත හේරත්

කළු අත්පටියක් පැලඳ කළු ඉරු දිනට සහාය දෙන්න
අගරදගුරු පදවි පූජක සංඝය ඉල්ලයි



කෙරවළපිටියේ ඉදි වන ශ්‍රී ලංකාවේ පළමු ස්වාභාවික ද්‍රව වායු (LNG) විදුලි බලාගාරය සඳහා මුල්ගල තැබීම අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් ඊයේ (05) පෙරවරුවේ සිදු කෙරුණු අතර ඒ අවස්ථාවට පැමිණි අගමැතිවරයා ඇතුළු ආරාධිතයන් ප්‍රථම පස් පිඩැල්ල කැපීමට එක්ව සිටි අයුරු. මේ අවස්ථාවට සහභාගි වූ විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම, පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය ඇමැති දුමින්ද දිසානායක, රාජ්‍ය ඇමැතිවරුන් වන සුසිල් ප්‍රේමජයන්ත, නිමල් ලාන්සා, විදුලිබල අමාත්‍යාංශයේ ලේකම් වසන්තා පෙරේරා, ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති ඉංජිනේරු විජිත හේරත්, ලක්දනව් සමාගමේ සභාපති ඉංජිනේරු යූ. ඩී. ජයවර්ධන මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක් මෙහි වෙති.

## කුරුවිට තරුණියගේ හිස බුත්තල ළිඳෙත් නෑ
### කැලණි ගඟේ මෙහෙයුම් දිගටම

රක්ෂණ ශ්‍රියන්ත

ඝාතනයට ලක් වූ කුරුවිට තරුණියගේ හිස බුත්තල පොලිසියේ උප පොලිස් පරීක්ෂකවරයාගේ නිවෙසේ ළිඳේ හෝ ඒ අවට ප්‍රදේශයේ දමා ඇත්දැයි සොයා පොලිසිය ඊයේ (05) විමර්ශන ආරම්භ කළ ද මෙතෙක් හිස හමු වී නැත.
පිට 06



## දහම් පාසල් අවසාන විභාගය 13-14 දිනවල

සිතාරා සේනානි

දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය-2019 රට පුරා විභාග මධ්‍යස්ථාන 853කදී මේ මස 13 සහ 14 දිනවල පැවැත්වීමට විභාග දෙපාර්තමේන්තුව කටයුතු යොදා තිබේ. මේ සඳහා අයදුම්කරුවන් 122,100ක් පෙනී සිටීමට නියමිතය.
පිට 06

## කොවිඩ් සිරුරු 2ක් ඔට්ටමාවඩිහිදී භූමදානය කරයි

සුභාෂිණී සේනානායක

කොවිඩ් -19 ආසාදිතව මියගිය පුද්ගලයන් දෙදෙනකුගේ දේහ කොරෝනා මරණ භූමදානය සඳහා තෝරා ගත් ප්‍රදේශයක් වන මඩකලපුව ඔට්ටමාවඩි ප්‍රදේශයේදී ඊයේ (5) භූමදාන කටයුතු කළ බව කොවිඩ් 19 ව්‍යාප්තිය වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය පවසයි.
පිට 06

## ග්‍රෑන්ඩ්පාස් රේගු අංගණයෙන් කෝටි 9ක හොර සිගරැට් හමු වෙයි

සුභාෂිණී සේනානායක සහ මහින්ද අලුත්ගෙදර

නීතිවිරෝධි ලෙස මෙරටට ගෙන්වන ලද දුම්වැටි 150,000ක් අඩංගු බහාලුමක් ග්‍රෑන්ඩ්පාස් රේගු අංගණයේ තිබී කළ පරීක්ෂාවකදී ශ්‍රී ලංකා රේගුව විසින් අත්අඩංගුවට ගෙන තිබේ.
පිට 06

## මේ වසර අවසානයේ සියලු දෙනාට විදුලිය
### අගමැති කියයි

මහින්ද අලුත්ගෙදර

මේ වසර අවසන් වන විට රටේ සියලු ජනතාවට විදුලිය දීමට කටයුතු කරන බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා ප්‍රකාශ කරයි.
පිට 06

## ‘මියන් කුමාර‘ නිදහස් කරන්නැයි ඉල්ලූ පෙත්සම 8දා කැඳවයි

නෙල්කා මැදගෙදර

බෙල්ලන්විල රජ මහ විහාරයට මියන්මාර් රජයෙන් පරිත්‍යාග කරන ලද ‘මියන් කුමාර‘ නම් ඇත් පැටවා නැවත කැලයට මුදාහැරීමට යටත්ව උඩවලව අලි අනාථාගාරයට දීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස පොලිස්පතිවරයාට නියම කරන්නැයි ඉල්ලා ගොනු කර ඇති රිට් පෙත්සමක් මේ මස දහ අට වැනිදා කැඳවීමට අභියාචනාධිකරණය ඊයේ (05) තීරණය කළේය.
පිට 06

පිට 6
## කොවැක්ස් පහසුකමේ පළමු මාත්‍රා තොගය හෙට මෙරටට

## ශ්‍රී ලනිපයට කළමනාකාර කමිටුවක්


## ඉරණතිව් භූමදානය ජාතිවාදයට පාර කැපීමක්



## කොවිඩ් සිරුරු භූමදානයට හොඳම තැන මුසලි



## කාන්තා හිංසන පිටු දකින්න පනතකට යෝජනා



## ආසාදිතයන් 31ක් හමු වෙලා:
# බදුල්ල රෝහලේ පිළිකා රෝගී ප්‍රතිකාර වාට්ටුව වසයි

කොවිඩ් ආසාදිතයන් 31ක් හඳුනාගැනීමත් සමඟ බදුල්ල රෝහලේ පිළිකා රෝගීන්ට ප්‍රතිකාර කරන වාට්ටුව තාවකාලිකව වසා දැමේ. වෛද්‍යවරයකු, රෝහල් කාර්ය මණ්ඩල සේවකයකු, රෝගීන් සහ රෝගීන් බලා ගැනීමට පැමිණි 29ක් මෙලෙස ආසාදිතයන් බවට හඳුනා ගනු ලැබුවේ ඔවුන්ට සිදු කරන ලද පී.සී.ආර්. පරීක්ෂණ ඔස්සේය. මීට පෙර පසුගිය මාර්තු මස 02 වැනිදා මේ වාට්ටුවේ සේවය කරනු ලැබූ හෙදියක කොවිඩ් ආසාදිතයකු ලෙස හඳුනාගැනීමෙන් පසු තවත් හෙදියක් සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩලයේ සේවකයන් දෙදෙනකුට ද කොරෝනා වයිරසය ආසාදනය වී ඇති බවට ඊයේ (05) දිනයේදී ලද PCR වාර්තා මගින් තහවුරු වී ඇත. වයිරසය ආසාදනය වූ රෝහල් කාර්ය මණ්ඩලයේ සියලු දෙනා කොවිඩ් මර්දන එන්නත ලබාගෙන සිටි අය බවද වාර්තා වේ.

# කොවිඩ් ප්‍රතිශක්තිකරණ වැඩසටහනට පෞද්ගලික අංශයේ සුව සේවකයනුත්

## රජයේ තීරණයට පෞද්ගලික රෝහල් හා සාත්තු නිවාස සංගමයේ ප්‍රසාදය

**මහින්ද අලුත්ගෙදර**



ශ්‍රී ලංකාවේ දැනට සිදු කරමින් පවතින කොවිඩ්-19 ප්‍රතිශක්තීකරණ වැඩසටහන සඳහා පෞද්ගලික අංශයේ සුව සේවකයන් ද ඇතුළත් කරගැනීමට මෑතක දී රජය ගත් තීරණයට ප්‍රසාදය හිමිවෙයි.

මේ එන්නත්කරණ වැඩසටහනට පෞද්ගලික සුව සේවකයන් ද ඇතුළත් කරගැනීම සම්බන්ධයෙන් රජයට ප්‍රසාදය පළ කරන බව පෞද්ගලික රෝහල් හා සාත්තු නිවාස සංගමය ප්‍රකාශ කරයි.

ඉදිරි සති කීපයේ දී තවත් එන්නත් තොගයක් මෙරටට ලැබීමට නියමිත බව සඳහන් කරන එම සංගමය සුව සේවකයන්,සෞඛ්‍ය පරිපාලකයන් හා සහාය කාර්ය මණ්ඩලය ආදි පෞද්ගලික අංශයේ සියලුදෙනාට මේ එන්නත්කරණ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට රජය සහයෝගය ලබාදෙනු ඇතැයි විශ්වාසය පළකරයි.

මේ පිළිබඳව අදහස් දක්වමින් පුද්ගලික රෝහල් හා සාත්තු නිවාස සංගමයේ සභාපති ආචාර්ය ලකිත් පීරිස් මහතා පෙන්වා දෙන්නේ කොවිඩ්-19 ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනට පෞද්ගලික අංශයේ වෛද්‍ය කාර්ය මණ්ඩලය ද ඇතුළත් කරගැනීම පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යංශයට හා ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය ඇමැතිනියට කෘතඥතාව පළකරන බවයි.

ගෝලීය වශයෙන් කොවිඩ්-19 එන්නත් හිඟයක් පවතින මේ අවස්ථාවේ දී ඉදිරිපෙළ සුව සේවකයන් සඳහා එන්නත ලබාදීම පිළිබඳ රජයේ බලධාරීන්ට පෞද්ගලික රෝහල් හා සාත්තු නිවාස සංගමය සිය කෘතඥතාව පළකරයි.

කෙසේ වෙතත් පෞද්ගලික අංශයේ සියලුම කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ සම්පූර්ණ එන්නත් මාත්‍රා තවමත් ලැබී නොමැති බවත් රටේ එන්නත් තොග වැඩිවෙත්ම ඉතිරි එන්නත් මාත්‍රා සංඛ්‍යාව ද ඉතා ඉක්මණින් ඔවුන්ට ලබාදෙනු ඇති බවත් එම සංගමය කියයි.

## යාපනයේ තෙන්මරච්චි එළවළු වෙළෙඳසල වසයි

**උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ**

යාපනයේ වඩමරච්චි නැගෙනහිර ප්‍රදේශයෙන් අලුතින් කොරෝනා රෝගීන් 13ක් හමුවීමත් සමඟ යාපනයේ තෙන්මරච්චි එළවළු වෙළෙඳසල පෙරේදා(04) සිට වසා දමා ඇත. මේ වන විට යාපනයේ කොඩිගාමම් පොදු වෙළෙඳසලද කොරෝනා ආසාදිතයන් හමුවීම නිසා වසා දමා තිබේ. මේ දිනවල යාපනයෙන් හමුවන නව කොරෝනා රෝගීන් වෙළෙඳසල් ආශ්‍රිතව සිටි පිරිසක් බව උතුරු පළාත් නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සඳහන් කරයි.

# ඇල්පිටිය මූලික රෝහලෙන් ආසාදිතයකු පැනගිහින්

ඇල්පිටිය මූලික රෝහලේ පළමු වාට්ටුවේ ප්‍රතිකාර ලබමින් සිටි කොරෝනා ආසාදිතයකු රෝහල් වාට්ටුවෙන් පැන ගොස් ඇතැයි වාර්තා වේ. කොළඹ වැල්ලවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවකු වන ඔහු කිසියම් රෝගාබාධයකට උෟරගස්මන්හන්දිය රෝහලට ඇතුළත්වීමෙන් පසු වැඩිදුර ප්‍රතිකාර සඳහා ඇල්පිටිය මූලික රෝහලට මාරුකර එහි ප්‍රතිකාර ලබමින් සිට ඇත. ඔහුගේ පී.සී.ආර්.පරීක්ෂණයක් සිදුකර ඇති අතර එම පරීක්ෂණ වාර්තාව ලැබී තිබේ.

# පේටන්ට් බලපත්‍ර නිකුත් කිරීම ප්‍රමාද කරන්න එපා

## බුද්ධිමය දේපළ නීතිමය කාර්යාංශයට උපදෙස් දුන් බව වෙළෙඳ ඇමැති කියයි

**අසේල කුරුළුවංශ හා මධ්‍යම පළාත් සමූහ නිහාල් ජයවර්ධන**

නවෝත්පාදනවල අයිතිය තහවුරු කරන පේටන්ට් බලපත්‍ර නිකුත් කිරීම ප්‍රමාද නොකරන ලෙස බුද්ධිමය දේපළ පිළිබඳ නීතිමය කාර්යාංශයට උපදෙස් දී තිබෙන බව වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා පවසයි.

පේටන්ට් අයිතියක් ලබා ගත්තද එය වාණිජ භාණ්ඩයක් ලෙස දේශිය හා විදේශීය වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීමේදී බාධක බොහෝ මතුවන බවත් නව නිපැයුම් කරන නිර්මාණකරුවන්ට අවශ්‍යය දේශපාලන සහ රාජ්‍ය අනුග්‍රහය ලබාදී ඇගයීමට ලක්කර ඔවුන් ඔසවා තබන වැඩපිළිවෙළක් අපට නොතිබුණු බවත් ඒ මහතා කීය.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ නව නිපැයුම් අංශයේ කණ්ඩායමක් මගින් මහචාර්ය ගාමිණී රජපක්ෂ මහතාගේ නායකත්වය යටතේ නිෂ්පාදනය කරන ලද ලොව ප්‍රථම ප්‍රතිවයිරස නාශක පෙරණයකින් සමන්විත මුහුණු ආවරණය නිල වශයෙන් හඳුන්වාදීම සහ වෙළෙඳ පොළට නිකුත් කිරීම නිමිත්තෙන් දෙවන රාජසිංහ මාවතේ පිහිටි ඕක්රේ හෝටලයේදී පසුගියදා (03) පැවැති උත්සවයකදී ඇමැතිවරයා මේ බව ප්‍රකාශ කළේය.

ඉසබෙලා සහ සරසවි සමූහ ව්‍යාපාරයේ සභාපති,දේශීය රෙදිපිළි නිෂ්පාදක සංගමයේ සභාපති හේමන්ත පෙරේරා හා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උපකුලපති මහචාර්ය උපුල් දිසානායක මහත්වරු මෙහිදී මේ නිෂ්පාදන අලෙවි වෙළෙඳ ගිවිසුමකට එළඹීමද මෙහිදී සිදු කෙරුණි. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පර්යේෂණ කණ්ඩායම මේ නව නිෂ්පාදනය හඳුනාවාදීමට පැමිණි අවස්ථාවේ දේශීය රෙදිපිළි නිෂ්පාදක සංගමයේ සභාපතිවරයාටත් ඒ සඳහා සහභාගි වන ලෙස තමන් ආරාධනා කළ බවත් ප්‍රායෝගිකව රජයේ මුදල් යොදවා මේ ආකාරයේ නිෂ්පාදනයක් වෙළෙඳ පොළට හඳුන්වාදීම අසීරු බැවින් එම පියවර ගත් බවත් ඇමැතිවරයා කීය.



ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතාට නව මුහුණු ආවරණයේ ක්‍රියාකාරීත්වය සිදුවන ආකාරය ගැන මහාචාර්ය ගාමිණී රාජපක්ෂ මහතා පැහැදිලි කළ අයුරු.

නැනෝ තාක්ෂණය බද්ධ කර කපු රෙදි භාවිතයෙන් සියයට සීයක් වයිරස්හරණය කිරීමට හැකි ලෝකයටම ප්‍රයෝජනවත් වන මුඛ ආවරණයක් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මූලිකත්වයෙන් නිපදවීම රටට විශාල ආඩම්බරයක් බවත් මේ සඳහා අවශ්‍යය ජත්‍යන්තර වෙළෙඳ පොළ අවස්ථා ලබා ගැනීමට ඉදිරියේදී අවශ්‍යය සියලු පියවර ගන්නා බවත් හෙතෙම ප්‍රකාශ කළේය.

තම අමාත්‍යාංශය යටතේ ඇති වාණිජ දෙපාර්තමේන්තුව හා අපනයන සංවර්ධන මණ්ඩලය මගින් වාණිජ අධ්‍යක්ෂවරු රටවල් 28ක නිත්‍ය සේවයේ යොදවා තිබෙන බවත් මාසයකට වරක් අපනයන ප්‍රවර්ධනය සම්බන්ධයෙන් තමන් ඔවුන් සමඟ සූම් තාක්ෂණය ඔස්සේ සාකච්ඡා කරන බවත් කී ඒ මහතා මේ මස පැවැත්වෙන වෙළෙඳ කොමාසාරිස්වරුන්ගේ හමුවට මේ නිෂ්පාදන කණ්ඩායමටද සහභාගිවීමට අවස්ථාව ලබාදී නව නිෂ්පාදනය පිළිබඳ ලෝකයේම ඉන්න බලයලත් නිලධාරීන්ට අවබෝධයක් ලබාදීමට පසුබිම සකසන බවද පැවසීය.

ලෝකයේ මේ නව මුඛ ආවාරණයට විශාල ඉල්ලුමක් ඇතිකර ගත හැකි බවද ඇමැතිවරයා කීය.

නව මුඛ ආවරණය නිපදවන ලද කණ්ඩායමට නායකත්වය දුන් මහචාර්ය ගාමිණී රාජපක්ෂ මහතා අදහස් දක්වමින් වසරක පමණ පරීක්ෂණ කාලසීමාවක් ගතකර මේ නව නිපැයුම හඳුන්වාදුන් බවත් මේ ආකාර වයිරස් නසන ලේයර් තුනකින් සමන්විත මයික්‍රෝ හා නැනෝ අංශුවලින් සමන්විත ලොව කිසිදු රටක නිෂ්පාදනය කර නොමැති බවත් පැවසීය.

මෙය සතියකට වතාව බැගින් සේදුම්වාර 20ක් පමණ සිදුකළත් තත්ත්වයෙන් බාල නොවන ආකාරයට සකස්කර තිබෙන බැවින් එය සති 20ක පමණ කාලයක් භාවිත කිරීමේ හැකියාව තිබෙන බවද ඒ මහතා ප්‍රකාශ කළේය.

මේ මුඛ ආවරණය භාවිත කිරීමට කපු රෙදි භාවිත කර තිබෙන බැවින් භාවිතයෙන් පසු එය ක්‍රමවත් ලෙස පරිසරයට මුදා හැරියද කිසිදු පරිසර හානියක් සිදු නොවන බවත් කෙටි කාලයකදී එය පොළොවට දිරාපත් වන බවත් මහචාර්යවරයා කීය.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උපකුලපති මහාචාර්ය උපුල් දිසානායක,නියෝජ්‍ය උපකුලපති මහාචාර්ය පරාක්‍රම කරුණාරත්න,විශේෂඥ වෛද්‍ය චමින්ද හේරත් මහත්වරු ඇතුළු පිරිසක් මේ අවස්ථාවට සහභාගි වූහ.


**ඡායාරූපය-මධ්‍යම පළාත් සමූහ**



## උස්වත්ත කන්ෆැක්ෂනරි වර්ක්ස් ප්‍රයිවට් ලිමිටඩ්හි අනුග්‍රහයෙනි

# රුපියල් තිස්දහසක තෑගි

## ටිපි ටිප්
**ප්‍රහේලිකා අංක - 38**



තෑගි රටාව

පළමුවන ත්‍යාගය රුපියල් 10,000 — දෙවන ත්‍යාගය රුපියල් 5000
තෙවැනි ත්‍යාගය රුපියල් 3000 — රුපියල් 1000 බැගින් සැනසිලි ත්‍යාග 11යි.

ජයග්‍රාහකයන් තෝරාගනු ලබන්නේ කුසපත් ඇදීමෙනි. ජයග්‍රාහකයන්ගේ නම් සහ ප්‍රහේලිකාවේ නිවැරැදි විසඳුම් දිනමිණ පත්‍රයේ පළ වේ. ත්‍යාග මුදල් තෙමසක් ඇතුළත පිරිනැමේ.

නම: ------------------------------

ලිපිනය: ------------------------------
------------------------------

දිනය: ------------ ------------ අත්සන:

**කොන්දේසි**

සතියට දෙවරක් පළවන මෙම ප්‍රහේලිකාව සඳහා මුදලින් රුපියල් තිස්දහසක් මාසිකව පිරිනැමේ. දිනමිණ පත්‍රයේ පළවන ප්‍රහේලිකා විසැඳුම් පුරවා එය 6 X 3 සාමාන්‍ය කවරවල පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. ලිපියේ ඉහළින් වම් කෙළවරේ දිනමිණ ටිපි ටිප් ප්‍රහේලිකා අංක 38 යනුවෙන් සඳහන් කර දිනමිණ ප්‍රහේලිකාව තැ.පෙ. 1134, කොළඹ යන ලිපිනයට 2021 මාර්තු මස 31 වැනිදා හෝ ඊට පෙර උස්වත්ත Tipi Tip හෝ බිස්කට් දවටන දෙකක් සහිතව එවිය යුතුය. ලියුම් කවරයේ ඔබේ ආපසු ලිපිනය ද ලියන්න. ඡායාපිටපත් ප්‍රතික්ෂේප කැරේ. ලේක්හවුස් ආයතනයේ සහ උස්වත්ත සමූහ ව්‍යාපාරයේ සේවක සේවිකාවන්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජික සාමාජිකාවන්ට තරගයට ඉදිරිපත් විය නොහැකිය.

## උපකාරක පද

**හරහට**

1. බලයෙන් පහ කෙරුණු මියන්මාර නායිකාව
6. රෝදය
8. නිද්‍රාව
10. පාවැසුම්
11. සංස්කෘතික භාෂාව
13. තාල වර්ගයට අයත් ගසකි
14. ඉබේ සෑදුණු ජලාශය
15. ෂාරුක් ඛාන් හා කාජල් රඟන ජනප්‍රිය හින්දි චිත්‍රපටයකි.
16. ස්වර
18. ධර්ම මාර්ගය
19. භාවකු ගැන සඳහන් ජාතක කතාව
20. මාලදිවයිනේ අගනුවර
21. රාශි චක්‍රයේ 11 වැනි රාශිය

**පහළට**

2. කොරෝනා වයිරසය මුලින්ම හමු වූ චීන නගරය
3. සාර
4. යහපත් චර්යාවන් සහිත
5. සවන පැරකුම්බා රජුගේ බිසව
7. මේ කෘමියා කෑ තැන දැඩි වේදනාකාරීය
8. ස්පර්ශ සංවේදයක්, වේදනාව හා උෂ්ණත්වය දැනීමත් නැතිවීම.
9. දහය
12. පුරාතන තම්බපණ්ණිය අද හඳුන්වන නම
16. ශෝභන / යහපත්
17. පළමු ලම්භකර්ණ වංශික රජු
19. චර්ම

**● සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද (අනුරූ මාධ්‍ය සේවා) 072 3561975**






# ‘සෞභාග්‍යයේ දැක්ම උදෙසා ජනතා කේන්ද්‍රීය ප්‍රකාශනය’ එළිදැක්වීම අද


ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ නායක ජලසම්පාදන ඇමැති වාසුදේව නානායක්කාර මහතා විසින් රචිත ‘සෞභාග්‍යයේ දැක්ම උදෙසා ජනතා කේන්ද්‍රීය ප්‍රකාශනය’ එළිදැක්වීම අද (06) පස්වරු 3.00ට කොළඹ 7 නිදහස් මාවතේ පුස්තකාල සේවා මණ්ඩල ශ්‍රවණාගාරයේ දී පැවැත්වේ.

අතුරලියේ රතන හිමි, විමල් වීරවංශ, උදය ගම්මන්පිල, දිනේෂ් ගුණවර්ධන,දයාසිරි ජයසේකර,ජීවාන් තොණ්ඩමන්, මහාචාර්ය තිස්ස විතාරණ මැති ඇමැතිවරුන් ඇතුළු පක්ෂ 12ක නායකයන් මේ දොරට වැඩුම නිමිත්තෙන් පැවැත්වෙන සාකච්ඡාමය සංවාදයට එක්වීමට නියමිතය.

ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ ප්‍රකාශනයක් ලෙස එළිදැක්වෙන මේ ග්‍රන්ථය මගින් ජනාධිපතිවරයා විසින් ඉදිරිපත් කර ඇති සෞභාග්‍යයේ දැක්ම එහි නියමාර්ථයෙන්ම යථාර්ථයක් කර ගැනීමට මුල් වන දස ප්‍රතිපදා පිළිබඳ පුළුල් විමර්ශනාත්මක විවරණයක් ඉදිරිපත් කර ඇත.

## ඩේලි නිව්ස් හිටපු කර්තෘ
# බන්දුල ජයසේකර අභාවප්‍රාප්ත වෙයි

**මහින්ද අලුත්ගෙදර**



ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියකු, පුවත්පත් කතුවරයකු මෙන්ම රාජ්‍ය තාන්ත්‍රික නිලධාරියකු වූ බන්දුල ජයසේකර මහතා අභාවප්‍රාප්ත විය. රුධිරගත පිළිකා රෝගයකින් පීඩා විඳි බන්දුල ජයසේකර මහතා මියයන විට 60 වැනි වියේ පසු විය.

2006 - 2007 කාලයේ ලේක්හවුස් ආයතනයේ ඩේලි නිව්ස් පුවත්පතේ ප්‍රධාන කර්තෘවරයා ලෙස කටයුතු කළ ඒ මහතා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ පාලන සමයේ ජනාධිපති මාධ්‍ය ඒකකයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස ද විදේශ කටයුතු අමාත්‍යාංශයේ මහජන සන්නිවේදන අංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් ද සේවය කළේය.

රාජ්‍යතාන්ත්‍රිකයකු ලෙස ඔස්ට්‍රේලියාව, කැනඩාව රටවල සේවය කර තිබෙන අතර එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිව්යෝර්ක්හි ශ්‍රී ලංකා නියෝජ්‍ය නිත්‍ය නියෝජිතවරයා වශයෙන් ද කටයුතු කර ඇත.

බන්දුල ජයසේකර මහතා සිරස රූපවාහිනී නාලිකාව මගින් විකාශය කළ ‘පැතිකඩ’ වැඩසටහන හරහා ප්‍රේක්ෂක ජනාදරයට පත්වූ අතර ජනතා ගැටලු හමුවේ හඬ අවදිකළ මාධ්‍යවේදියකු ලෙස ද බන්දුල ජයසේකර මහතා ප්‍රකටය.

2019 වසරේ දී බන්දුල ජයසේකර මහතාට රුධිර පිළිකාවක් ඇති බවට හඳුනා ගන්නා ලද අතර සිංගප්පූරුවෙන් ද ප්‍රතිකාර ලැබීය. රෝග විනිශ්චය කිරීමෙන් පසු ඒ මහතා සිය අවසන් කාලය කරාපිටිය රෝහලේ රෝගී ප්‍රතිකාර මධ්‍යස්ථානයේ ගතකළ අතර ඒ මහතාගේ අවසන් කටයුතු බොරැල්ල පොදු සුසාන භූමියේ දී අද (06) සිදුකෙරේ.

# පොලිසිය නීතියට පිටු පා අත්අඩංගුවට ගත් ගොකරැල්ලේ උසස් පෙළ සිසුවා තවම හිරේ

**ඉබ්බාගමුව සමූහ - කුමාරි දිසානායක**

මත්ද්‍රව්‍ය ළඟ තබා ගැනීමේ චෝදනාව යටතේ ගොකරැල්ල පොලිසිය විසින් මීට මාස පහකට පෙර අත්අඩංගුවට ගනු ලැබූ උසස් පෙළ සිසුවාට අගතියක් හා අසාධාරණයක් සිදුව ඇති බවත් අත්අඩංගුවට ගැනීම නීති විරෝධී බවත් පොලිස් කොමිසම මවුපියන්ට දන්වා ඇතත් මේ වනතුරුත් මේ සිසුවා නිදහස් කිරීමට බලධාරී පියවර ගෙන නැති බව වාර්තාවේ

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රදේශිය ලේකම් කොට්ඨාසයේ, 545 තෙලඹුගල්ල ග්‍රාම නිලධාරී වසමේ, වාගොල්ල ග්‍රාමයේ පදිංචි ඩී.ඒ. කංචන ප්‍රගීත් ධර්මතිලක නම් මේ 19 හැවිරිදි පාසල් සිසුවා අත්අඩංගුවට පත්වන්නේ ඔහු 2020 අ.පො.ස උසස් පෙළ විභාගයට කලා විෂය ධාරාවෙන් පෙනී සිටීමට සූදානමින් සිටියදීය. 2020 ඔක්තෝබර් මස 10 වැනි දා විභාගයට දින දෙකක් තිබියදී ගොකරැල්ල පොලිසියේ දූෂණ විමර්ශන ආංශයේ නිලධාරීන් පිරිසක් විසින් ඔහු අත්අඩංගුවට ගන්නා ලද්දේ ගංජා සන්තකයේ තබා ගත් බව කියමිනි. පොලිසියට ගෙන ගොස් මේ සිසුවාට අමානුසික ලෙස පහර දී ඇති අතර පසුව හෙරොයින් ළඟ තබාගත් බවට බී වාර්තාවක් අධිකරණයට ඉදිරිපත් කර තිබේ.

පොලිසිය කංචනට චෝදනා ගොනු කර ඇත්තේ, විෂ වර්ග අබිං සහ අන්තරායකර ඖෂධ පනතේ 54 වගන්තිය ද අනුව වීම හේතුවෙන් ඔහුට මේ වනතෙක් අධිකරණයෙන් ඇප ලබා දී නැත.

අත්අඩංගුවට පත් වීම හේතුවෙන් සිසුවාට උසස් පෙළ විභාගයට පෙනී සිටීමේ අවස්ථාව ද අහිමි ව ගියේය. ඔහුට උසස් පෙළ විභාගයට ඉදිරිපත් වීමට අවස්ථාව සලසා දෙන මෙන් ඉල්ලීම් කළද, ඊටද අවස්ථාව ලබා නොදුන් බව මාපියෝ කියති. ඔහු බන්ධනාගාර ගත කොට මාස පහක පමණ කාලයක් ඉක්ම ගොස් ඇති අතර, බන්ධනාගාරය තුළදී කොවිඩ් රෝගයය වැළඳී එයින් ද පීඩා විඳ ඇත.

කංචන මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ නීති විරෝධි අයුරින් බවත්, එයින් කංචනට අගතියක් සහ අපකීර්තියක් සිදුව ඇති බවටත් පොලිස් කොමිසම විසින් කරන ලද පරීක්ෂණයකදී හෙළිදරවු වූ බවට වූ ලේඛනයක් එම කොමිසම විසින් කංචනගේ මව වෙත එවා තිබුණත්, මෙවැනි මානව හිමිකම් කඩකිරීමක්, මූලික අයිතිවාසිකම් කඩකිරීමක් සිදුකර ඇති පොලිස් නිලධාරීන් හට සාධාරණ දඬුවම් ලබාදීමක් මෙතෙක් සිදු වී නැත.

කංචනට සිදු වූ අසාධාරණයට එරෙහිව සාක්ෂි ලබා දී තිබෙන ඔහුගේ මිතුරා ද මේ වන විට සිටින්නේ දැඩි පීඩනයකින් වන අතර, ඔහුගේ ආරක්ෂාවට ගොකරැල්ල පොලිසියෙන් ඇති තර්ජනය තවමත් අවසන් නැත.

පොලිසියේ ඇතැම් නිලධාරීන් විසින් දිගින් දිගටම සිදුකරනු ලබන මෙවැනි අත්තනෝමතික ක්‍රියාවන්ගේ බලපෑමට ලක් වූ පළමු සහ අවසන් වින්දිතයා කංචන නොවන බවත්, මෙවැනි සිදුවීම් මාධ්‍ය මගින් හෙළිදරවු කිරීමෙන් හෝ එවැනි අවස්ථාවකදී මහජනයා ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ යම් අවබෝධයක් ඇතිවන බවත්, කුරුණෑගල මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථානයේ සම්බන්ධීකාරක ඤාණවීර දිසානායක මහතා පෙන්වා දෙයි.

# යාපනයේ සිවු නිවුන් දරුවෝ ප්‍රථම උපන්දිනය සමරති



**උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ**

උතුරු පළාතේ රෝහලකදී දී ඉපදුණු පළමු සිවු නිවුන් දරුවන්ගේ පළමු උපන්දිනය යාපනය තෙලිප්පලෙයි රෝහලේ කාර්ය මණ්ඩලය විසින් 4 දා සමරණ ලදී.

මවුපියන් සමඟ දරුවන් හතර දෙනා රෝහලට කැඳවා ඇති තෙලිප්පලෙයි රෝහලේ කාර්ය මණ්ඩලය සිවු නිවුන් දරුවන්ට තෑගි බෝග පිරිනැමූහ මේ සිවු නිවුන් දරුවන් හතර දෙනාගෙන් පිරිමි දරුවන් දෙදෙනා විනෝද් හා විශ්ව වශයෙන්ද ගැහැණු දරුවන් දෙදෙනා විනෝතිනී හා විශ්මිකා වශයෙන්ද නම් ලබා සිටිති.

# අන්තර්ජාතික ප්‍රවාහන දිනය අදයි:

## පෙරවරු 10.00ත් 10.02ත් අතර වාහනවල නළා ශබ්ද එපා

## සෑම වාහනයක් වෙනුවෙන්ම පැළයක්

**සුභාෂිණී සේනානායක**

අන්තර්ජාතික ප්‍රවාහන දිනය අදට (06) යෙදී තිබේ.

ඊට සමගාමීව වැඩසටහන් රැසක් ප්‍රවාහන අමාත්‍යාංශය විසින් ඊයේ (05) ක්‍රියාත්මක කළ අතර එහි රුක් රෝපණ වැඩසටහන යටතේ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට අයත් සෑම බස් රථයකටම, සෑම දුම්රියකටම සහ සෑම පෞද්ගලික බස් රථයකටම පැළයක් ලබා දීමේ වැඩසටහනක් ප්‍රවාහන අමාත්‍යාංශය විසින් සංවිධානය කර ඇත.

මේ වැඩසටහන යටතේ පැළ 5000ක් පමණ රට පුරා රෝපණය කිරීම අරමුණ බව ප්‍රවාහන ඇමැති ගාමිණී ලොකුගේ හා රාජ්‍ය ඇමැති දිලුම් අමුණුගම මහත්වරු ප්‍රවාහන අමාත්‍යාංශයේදී ජාත්‍යන්තර ප්‍රවාහන දිනය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනකට එක්වෙමින් කියා සිටියහ.

ප්‍රවාහනය හේතුවෙන් සිදු වන පරිසර දූෂණය අවම කිරීමට මෙසේ සෑම බස් රථයකටම පැළයක් ලබා දීමට තීරණය කර ඇති අතර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන සෑම වාහනයකට ම මෙලෙස පැළ ලබා දීමට තීරණය කර ඇත.

එමෙන්ම ජාත්‍යන්තර ප්‍රවාහන දිනය සමරමින් පෙරවරු 10.00ත් 10.02ත් අතර කාලය තුළ වාහන වල නළ ශබ්ද නොකරන ලෙසද ප්‍රවාහන අමාත්‍යාංශය සියලු වාහන හිමියන්ගෙන් ඉල්ලීමක් සිදු කරන අතර ප්‍රවාහන දිනය වෙනුවෙන් බැනර් 300ක් ප්‍රදර්ශනය කිරීමට ද තීරණය කර ඇත.

ජාත්‍යන්තර ප්‍රවාහන දිනය සංකේතවත් කරමින් රුක් රෝපණ වැඩසටහනේ ප්‍රධාන උත්සවය මාකුඹුර බහුවිධ ප්‍රවාහන පරිශ්‍රමයෙන් ආරම්භ කෙරේ.

# මුව පැටවෙක් අතරමං වෙලා



**මිහිර විජේසේකර-මාරවිල සමූහ**

මදුරන්කුලිය වීරපුර ප්‍රදේශයේ ඉඩමක අතරමං වි සිටි මුව පැටවකු එම ඉඩමේ හිමිකරුවන් විසින් පුත්තලම වනජීවි පාලන ඒකකයට භාර දිමට කටයුතු කර ඇත.

මෙම මුව පැටවා මාස 6 ක පමණ වයසැති තිත් මුවෙකි. කිසිදු අනතුරක් සිදු වී නොමැත.

අභය භූමියකට මුදා හැරිමට ප්‍රමාණවත් වයසක නොසිටිම නිසා මුව පැටවා පුත්තලම වනජීවි පාලන ඒකකයේ නිළධාරින් විසින් නිකවැරටිය වනජීවි ප්‍රතිකාර ඒකකයට භාර දීමට කටයුතු කර ඇත.

# රිය අනතුරු මරණ 15ක්

**රක්ෂණ ශ්‍රියන්ත**

දිවයිනේ විවිධ ප්‍රදේශවලින් සිදුවූ රිය අනතුරුවලින් මරණ 15ක් ඊයේ (05) උදෑසන 6.00න් අවසන්වූ ගතවූ පැය 24තුළ පොලිසිය වෙත වාර්තා වී තිබේ. එම මරණ වලින් මරණ 11ක්ම පෙරේදා (04) සිදුවූ රිය අනතුරුවලින් සිදුවී ඇති අතර අනෙක් මරණ මීට කලින් සිදුවූ රිය අනතුරුවලින් බරපතල තුවාල ලබා සිටි අයයි.

මියගොස් ඇති පුද්ගලයන්ගෙන් 06 දෙනෙකුම පදිකයෝය. 05දෙනෙකු යතුරු පැදිවල ගමන් කළ පුද්ගලයන්ය. පා පැදියක ගමන් කළ පුද්ගලයකු, ත්‍රිරෝද රථ වල ගමන් කළ පුද්ගලයන් දෙදෙනෙකු, සහ වෑන් රථයක ගමන් කළ පුද්ගලයෙකු ද මියගොස් තිබේ. පෙරේදා (04) රිය අනතුරු 120ක් පොලිසියට වාර්තාවී ඇති අතර පුද්ගලයන් 40 දෙනෙකු තුවාල ලබා රෝහල් ගත කර ඇත.

# සෞභාග්‍යයේ සංවර්ධන කාර්යාංශය

## ගම් මට්ටමින් වැඩ අරඹයි

**ජයසිරි මුණසිංහ**

ග්‍රාමීය දුප්පත්කම දුරු කිරීම සහ විරැකියාවට තිත තැබීමේ අරමුණින් රජය සෞභාග්‍යයේ සංවර්ධන කාර්යාංශය නමින් වෙනමම කාර්යාංශයක් පිහිටුවා තිබේ.

නව කාර්යාංශය හරහා ගම නගා සිටුවීමට පියවර ගන්නා බව සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයංරැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය ඇමැති ෂෙහාන් සේමසිංහ මහතා ප්‍රකාශ කළේය. තම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ එක්ව සෞභාග්‍යයා සංවර්ධන කාර්යාංශය ඉදිරියේදී ගම් මට්ටමින් දුප්පත්කම දුරු කිරීම සඳහා කටයුතු කරන බව සේමසිංහ මහතා අනුරාධපුරයේ පැවති නිෂ්පාදන ගම්මාන ඇරඹීමේ උත්සව සභාව අමතා ප්‍රකාශ කළේය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ෂෙහාන් සේමසිංහ මහතා මෙසේද කීය.

අපි නිෂ්පාදන ගම්මාන 500ක් ශ්‍රී ලංකාව පුරා ආරම්භ කරනවා. මේ වසරේ ආරම්භ කරලා අවසන් කරන්න මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තියෙනවා.

# බලගල්ල සරස්වතී මහ පිරිවෙනේ

## ආදි කර්තෘන් සැමරුම තුන දිනක්

දිවුලපිටිය බලගල්ල සරස්වතී මහ පිරිවෙන් ආදි කර්තෘන් වහන්සේලාගේ ගුණානුස්මරණ පිංකම් මාලාව 07, 08, 09 දිනයන්හිදී එම පිරිවෙන් පරිශ්‍රයේදී පැවැත්වේ.

ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහා නායක අග්ගමහා පණ්ඩිත මකුලෑවේ විමල මහා නාහිමියන්ගේ ප්‍රධානත්වයෙන් මෙය පැවැත්වෙන අතර කුල දරුවන් සසුන්ගත කිරීම, සඟසතු දානමය පිංකම්, පරිවේණාධිපති හිමියන් හා කෘත්‍යාධිකාරී නාහිමියන් විසින් සංස්කරණය වූ ශාස්ත්‍රීය සංග්‍රහය හා ධර්ම දේශනා සංග්‍රහය ග්‍රන්ථ පිළිගැන්වීම, ත්‍යාග ප්‍රදානය, මහාචාර්ය කෝන්ගස්තැන්නේ ආනන්ද නායක හිමිපාණන් විසින් ආදි කර්තෘ ගුණානුස්මරණ විශේෂ දේශනය පැවැත්වීම මෙම පිංකම් මාලාවේදී සිදුකෙරේ.

# දේශපාලන පළි ගැනීම් පිළිබඳ සොයා බැලූ කොමිසමේ අවසන් වාර්තාව කථානායකට

**සුභාෂිණී සේනානායක**

දේශපාලන පළි ගැනීම් පිළිබඳ සොයා බැලීමට පත්කළ ජනාධිපති කොමිෂන් සභාවේ අවසන් වාර්තාව සහ රාජ්‍ය ආයතනවල සිදුවී ඇතැයි කියන දූෂණ වංචා පිළිබඳ සොයා බැලීමට පත්කළ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තා ඊයේ (05) කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා වෙත භාරදෙනු ලැබීය. ජනාධිපති නීති අධ්‍යක්ෂ ජෙනරාල් ජනාධිපති නීතිඥ හරිගුප්ත රෝහණදීර මහතා විසින් මේ වාර්තා දෙක කථානායකවරයාට පිළිගන්වනු ලැබීය.



# යාපනයේ ගුරුවරයකුට කපා කොටා තුවාල කරලා

**උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ**

කිසියම් පිරිසක් විසින් යාපනයේ පාසල් ගුරුවරයකුට පහර දී කඩු වලින් කපා කොටා බරපතල තුවාල සිදු කර ඇත.තුවාල ලැබූ පුද්ගලයා යාපනය තෙලිප්පලෙයි රෝහලට ඇතුළත් කොට තිබේ.

යාපනයේ මල්ලාකම් ප්‍රදේශයේදී මෙම සිදුවීම 4 දා රාත්‍රී රාත්‍රී 9.30 ට පමණ සිදුව තිබේ.

යතුරු පැදිවලින් පැමිණි පස් දෙනකුගෙන් පමණ සමන්විත පිරිසක් ගුරුවරයාට පහර දී පසුව කඩු වලින් කපා කොටා තුවාල සිදු කොට ඇති බවට පොලීසියට තොරතුරු ලැබී ඇති අතර පහර දීමට හේතුව මෙතෙක් වාර්තා වී නොමැත.

මෙම ප්‍රහාරයට ලක්ව ඇත්තේ සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය පිළිබදව යාපනයේ පාසල ගුරුවරයෙකි.

යාපනයේ තෙලිප්පලෙයි පොලීසිය සිද්ධිය පිළිබදව පරීක්ෂණ පවත්වා ගෙන යයි.

| | |
|---|---|
| බීමට දිය දෙන්න උල්පත් හිස | උස්සයි |
| පොඩි පැවිල්ලටත් හිස් වෙන්නට | දස්සයි |
| ඇත්තේ බොන්න වතුරත් නැති වූ | කොස්සයි |
| දැන් නම් එකම පිහිටට ඇත්තේ | වැස්සයි |



# සිලාවතුරේදී කහ අල්ලයි

**රක්ෂණ ශ්‍රියන්ත**

නීති විරෝධී ලෙස මෙරටට ගෙන්වන ලද කහ කිලෝ 826ක් සමග සැකකරුවන් දෙදෙනෙකු සිලාවතුර පොලිස් වසමේ පණ්ඩාරවේලි ප්‍රදේශයේදී පෙරේදා (04) සිලාවතුර පොලිස් ස්ථානයේ නිලධාරී පිරිසක් සිදුකළ වැටලීමකදී අත්අඩංගුවට ගෙන තිබේ.

අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 30 සහ 42 වයස්වල පසුවන සිලාවතුර ප්‍රදේශයේ පදිංචිකරුවන් බව පොලිසිය පවසයි. සැකකරුවන් ඊයේ 05) මන්නාරම මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි.



# උතුරුමැද පළාතේ මාර්ග රැසක් අලුත් වෙයි

**ක්‍රිසන්ති විතාරණ**

උතුරු මැද පළාත් ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ අනුරාධපුරය දිස්ත්‍රික්කයේ මාර්ග රැසක සංවර්ධන කටයුතු මහා මාර්ග අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ජොන්ස්ටන් ප්‍රනාන්දු සහ ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය නිමල් ලාන්සා මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් (04) ආරම්භ විය. මේ යටතේ කිලෝමීටර් විසි හතක දිගින් යුත් තලාව කැකිරාව මාර්ගය (B 213), කිලෝමීටර් හතක දිගින් යුත් කැකිරාව ගනේවල්පොල මාර්ගය (B212) කිලෝමීටර් හතළිස් පහක දිගින් යුත් ගනේවල්පොල දාච්චිහල්මිල්ලෑව මාර්ගය (B133) කාපට් අතුරා සංවර්ධනය කිරීමට නියමිතය.

මිලියන හයදහස් හත්සිය හතළිස් පහක (6745) මුළු වියදම යටතේ කිලෝමීටර් අසූවක දුරක් සංවර්ධන කෙරේ.

# සොරකම් කළ යතුරුපැදි 17ක්:

## සැකකරුට වයස 78යි

**රක්ෂණ ශ්‍රියන්ත**

දිවයිනේ විවිධ ප්‍රදේශවලින් සොරකම් කරන ලද යතුරු පැදි 17ක් සමග සැකකරුවෙකු පෙරේදා (04) අත්අඩංගුවට ගැනුණි. අරලගංවිල පොලිසිය අත්අඩංගුවටගැනීම සිදු කර තිබේ.

සැකකරු විසින් විවිධ අවස්ථාවල විවිධ ප්‍රදේශවලින් යතුරු පැදි සොරකම් කර අන් අයට විකුණා ඇති බවට පොලිසිය අනාවරණය කරගෙන ඇති අතර සැකකරු විසින් සොරකම් කරන ලද තවත් යතුරු පැදි ඇති බවට පොලිසිය සැකකරයි.

සැකකරුගේ වයස අවුරුදු 78ක් වන අතර අරලගංවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.



# බන්ධනාගාර රැඳවූවන් වෙනුවෙන් මෙට්ට හා පුටු

බන්ධනාගාර රැඳවූවන්ගේ භෞතික අවශ්‍යතා සම්පූර්ණ කිරීමේ වැඩපිළිවෙළ යටතේ නිදන මෙට්ට හා පුටු බන්ධනාගාර දෙපාර්තමේන්තුවට පිරි නැමීම පසුගියදා අධිකරණ අමාත්‍යාංශයේදි සිදු කෙරිණි.

බන්ධනාගාර රැඳවූවන්ගේ පරිහරණය සඳහා අවශ්‍ය මෙට්ට 500 ක් හා පුටු 500 ක් බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත ලබා දීම අධිකරණ අමාත්‍ය ජනාධිපති නීතිඥ අලි සබ්රි මහතාගේ හා ,සිරකරුවන් පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්තේ මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා03) පස්වරුවේ අධිකරණ අමාත්‍යාංශයේදී සිදු විය.

ජනතා ස්ටීල් ආයතනයේ අධිපති එස්. වාසුදේවන් මහතා විසින් මෙම පරිත්‍යාගය සිදු කරනු ලැබූ අතර මෙම අවස්ථාවට බන්ධනාගාර නිලධාරීහු සහභාගි වූහ.

The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2021 මාර්තු 06 සෙනසුරාදා

# පාස්කු වාර්තාව අසම්පූර්ණ ද...?

පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය සම්බන්ධයෙන් කරුණු සොයා බැලීමට පත් කළ ජනාධිපති කොමිෂන් සභාවේ නිර්දේශ ඇතුළත් වාර්තාව නිකුත් වී දින ගණනාවක් ගෙවී ඇත. රාජ්‍ය පාලනයට සම්බන්ධ කේන්ද්‍රීය ස්ථානවලට පමණක් නොව සමාජ නායකත්වය හිමිකරගත් ප්‍රධාන චරිත වෙත ද වාර්තාවේ පිටපත් ලබා දී ඇත. වාර්තාව පිළිබඳ පාර්ලිමේන්තු විවාදය ලබන දහවැනි දා ආරම්භ වීමට නියමිතය. මේ සම්බන්ධ පාර්ලිමේන්තු විවාදය තීරණාත්මක අවස්ථාවක් සේ සැලැකිය හැකිය. මන්දයත් වාර්තාවට අදාළ ඉදිරි පියවර පිළිබඳ එකඟතාවක් එහිදී ලබාගත හැකි නිසාය. කොමිෂන් සභාවක් යනු උසාවියක් නොවේ. කොමිෂන් සභා වාර්තාව යනු නඩු විභාගයක විනිශ්චය ද නොවේ.

කොමිෂන් සභාවකට කළ හැක්කේ කිසියම් සිද්ධියක් සම්බන්ධයෙන් විශ්ලේෂණයක් ඇතිකොට එහි සැබෑ තතු හෙළිදරවු කිරීම හා ඊට අදාළ ඉදිරි කටයුතු සඳහා නිර්දේශ ලබාදීම පමණි. පාස්කු ප්‍රහාරය පිළිබඳ කරුණු සොයා බැලූ කොමිෂන් සභාව සිදු කර ඇත්තේ ද ඒ ටිකය. මේ කොමිෂන් සභාව පත් කළේ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාය. ඊට අදාළ නිලධාරීන් පත් කළේ ද මෛත්‍රීපාල මහතාය. 2015 සිට 2018 දක්වා රාජ්‍ය මුදල් අවභාවිත කිරීම හා වංචා කිරීම සම්බන්ධයෙන් ජනාධිපති කොමිසමක් පත් කළේ ද මෛත්‍රීපාල සිරිසේන මහතාය. මීට අදාළ වාර්තා දෙකම හමස් පෙට්ටියට යමින් තිබියදී වත්මන් ජනාධිපතිවරයා එය නිකුත් කිරීම කඩිනම් කළේය.

පාස්කු ප්‍රහාරය යනු අංශ ගණනාවකින් රටට අහිතකර බලපෑම් ඇති කළ අඳුරු සිදුවීමකි. එක අතෙකින් ජාතික ආරක්ෂාව අභියෝගයට ලක් වූ අතර, තව අතෙකින් ආර්ථිකය පසුබෑමට ලක්විය. ප්‍රහාරය නිසා වටිනා ජීවිත තුන්සිය ගණනක් රටට අහිමි විය. පුද්ගලයෝ තුන්සිය ගණනක් තුවාල ලදහ. සිද්ධිය ජාත්‍යන්තර වශයෙන් රටට කළුපැල්ලමක් ඇති කළේය. ආගමික නොසන්සුන්තා හා ජාතීන් අතර සැකය මෝදුවීමට ද එය හේතුවක් විය. මෙබඳු සිද්ධියක් පිළිබඳ පූර්ණ පරීක්ෂණයක් සිදු කිරීමත්, අපරාධකරුවන් හඳුනාගෙන ඔවුන් නීතිය හමුවට ගෙන ඒමත් වගකිවයුතු රජයක යුතුකම වෙයි. එහෙත් යහපාලන ආණ්ඩුව එය ඉටු කිරීමට සමත් වූයේ නැත.

ප්‍රහාරය සම්බන්ධයෙන් කරුණු තුනක් ඉටුවිය යුතු බව මහජනයාගේ විශ්වාසය වෙයි. පළමු කාරණය වන්නේ අනාගතයේදී මෙබඳු ප්‍රහාරයක් සිදු නොවන ලෙස ජාතික ආරක්ෂාව තහවුරු කිරීමය. දෙවන කාරණය වන්නේ අවධානම නොසලකා හැර ප්‍රහාරයට ඉඩ-ප්‍රස්ථා ලබාදුන් දේශපාලන නායකයන්ට හා උසස් නිලධාරීන්ට දඬුවම් ලබාදිය යුතු බවය. තෙවන කාරණය වන්නේ ප්‍රහාරයට සම්බන්ධ අන්තවාදී කණ්ඩායම් පෝෂණය කළ පුද්ගලයන් හා ප්‍රහාරයේ මහ මොළකරුවන් සොයා ඔවුනට උපරිම දඬුවමක් ලබා දිය යුතු බවය. මේ එකක්වත් තවම නිසි ලෙස ඉටු වී නැත. මහජනයාට කොමිෂන් සභාවලින් වැඩක් නැත. ඔවුන්ගේ එකම අපේක්ෂාව යුක්තිය ඉටුකරවා ගැනීමය. එය ප්‍රමාද කිරීම සුදුසු නැත.

මීට අදාළ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව ගැන ද මත රාශියක් සමාජය තුළ පවතී. එක මතයකට අනුව ඉහත සඳහන් වාර්තාව අසම්පූර්ණ එකකි. තව මතයකට අනුව ඒ මඟින් ප්‍රහාරයේ ඇත්ත වගඋත්තරකරුවන් හෙළිදරවු කර නැත. තවත් මතයකට අනුව ප්‍රහාරයට ඉඩ - ප්‍රස්ථා ලබා දුන් අය පමණක් වරදකරුවන් කර ඇත. මේ සම්බන්ධයෙන් තවත් මතවාද ඉදිරිපත් වන්නට පුළුවන. මේ අතර කොමිසම පත් කළ හිටපු ජනාධිපතිවරයාම එහි නිර්දේශ ප්‍රතික්ෂේප කරන ස්ථාවරයක සිටී. එය එක අතෙකින් විස්මයට කාරණයකි. මෙහිදී එක කාරණයක් පැහැදිලි කළ යුතුය. එනම්, යහපාලන ආණ්ඩුවේ ප්‍රධානීන්ට ප්‍රහාරය පිළිබඳ වගකීමෙන් මඟ හැර යා නොහැකි බවය. ජාතික ආරක්ෂාව ශක්තිමත් වූයේ නම්, පාස්කු ප්‍රහාරයක් සිදුවීමට ඉඩක් නැත.

එකල පැවැති ආරක්ෂක මණ්ඩලය අවුල් ජාලයක් සේ හැඳින්වීම නිවැරැදිය. නියමිත දිනවල දී එම මණ්ඩලය රැස් වී නැත. අවශ්‍ය පුද්ගලයන් ආරක්ෂක මණ්ඩලයට කැඳවා නැත. ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වූ වැදගත්ම කරුණු ආරක්ෂක මණ්ඩලය තුළ සාකච්ඡා වී නැත. හෙළිදරවු වී ඇති කරුණුවලට අනුව පාස්කු ප්‍රහාරය වළක්වාගත හැකිව තිබිණි. එහෙත් නායකයන්ගේ සේම නිලධාරීන්ගේ ද නොසලකා හැරීම් නිසා අපරාධය සිදු වී ඇත. ජාතික ආරක්ෂාව පිළිබඳ වගකීම දැරූ පුද්ගලයන්ට නිවැරැදි යැයි කීමට සාධාරණ හේතු නැත. පාර්ලිමේන්තු විවාදයේදී මේ තත්ත්වය හොඳින් සංවාදයට ලක් කළ හැකිය. පාස්කු ප්‍රහාරයේ වාර්තාව පිළිබඳ පාර්ලිමේන්තු විවාදයක් පැවැත්වීම හැම අතෙකින්ම වැදගත්ය.

මේ වාර්තාව සම්බන්ධයෙන් වත්මන් ආණ්ඩුවට කළ හැක්කේ කුමක් ද යන්න තවත් ගැටලුවකි. කොමිසම පත් කළේ හිටපු ජනාධිපතිවරයාය. එහි නිලධාරීන් පත් කළේ ද හිටපු ජනාධිපතිවරයාය. ආණ්ඩුවේ එක් ප්‍රතිපත්තියක් වන්නේ අධිකරණයට, කොමිෂන් සභාවලට හා විමර්ශනවලට බලපෑම් සිදු නොකිරීමය. ඒවා ස්වාධීන ලෙස ක්‍රියා කළ යුතු යැයි ජනාධිපතිවරයා නිතර සඳහන් කරයි. කොමිසමේ වාර්තාව අසම්පූර්ණ නම් එහි නිලධාරීන් හා කොමිසම පත් කළ අය ඊට වගකිව යුතුය. ඒ සම්බන්ධයෙන් ආණ්ඩුවට හා ජනාධිපතිවරයාට ඇඟිල්ල දිගු කිරීම සාධාරණ නැත. ජනාධිපතිවරයා මීට අදාළව සිදු කළ එකම කාර්යය වන්නේ වාර්තාව විශ්ලේෂණය කිරීම සඳහා විශේෂ අනු කමිටුවක් පත් කිරීම පමණි. එවැන්නක් සිදු කිරීමේ අයිතිය ජනාධිපතිවරයාට ඇත.

අපරාධයකට හවුල් වන වරදකරුවකුට දඬුවමක් උරුම විය යුතුය. එය මඟහැර යෑමට දරන උපාය මාර්ග හැඳින්විය හැක්කේ තවත් අපරාධ ක්‍රියාවක් හැටියටය. පාස්කු ප්‍රහාරය සැලැකිය හැක්කේ ජාතික අපරාධයක් හැටියටය. එහි මහ මොළකරුවන්ට පමණක් නොව හවුල්කරුවන්ට ද දෙවියන් වහන්සේ හෝ දඬුවම් ලබා දෙනු ඇත.

### දිල්රුගෙ සීපද

| | |
|---|---|
| බැසයයි ඔක්සිජන් සීමාවෙන් | යටට |
| සුළු කොට සිතනු බෑ ඒ ගැන | කිසිවකුට |
| තව විත කළොත් පරිසරයට ගහ | කොළ ට |
| හුස්මත් ගන්න සිදුවෙයි මුදලට | අපට |

# ඇෆ්ගන් සාම වෑයම



ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීමට සතියක් තිබියදී නැඟෙනහිර ඇෆ්ගනිස්ථානයේදී මාධ්‍යවේදිනියන් තිදෙනෙක් වෙඩි තබා ඝාතනය කෙරුණේ එහි පවතින බියකරු හා අනාරක්ෂිත බව යළි පෙන්නුම් කරමිනි. ඇෆ්ගන් රජය හා අමෙරිකාව මේ ඝාතන පිළිබඳ තලේබාන් සංවිධානයට චෝදනා එල්ල කළ ද ඔවුන් එය ප්‍රතික්ෂේප කර ඇත. මේ ඝාතනවල වගකීම බාරගන්නා බව අයි.එස්. ත්‍රස්තවාදීන් පවසා තිබේ.

මේ ඝාතන සිදු වූයේ, රජය සහ තලේබාන් සංවිධානය අතර සාම වැඩපිළිවෙළ සඳහා මැදිහත්වන අමෙරිකා විශේෂ නියෝජිත ෂල්මේ ඛලීල්සාද් ඇෆ්ගන් නායකයන් හමුවීමට කාබුල් නුවරට පැමිණ සිටියදීය. ඉකුත් වසරේදී මෙම සාම ප්‍රයත්නය දියත්වීමත් සමඟ ඝාතනවල ඉහළ නැඟීමක් ඇති බව පෙනෙන්නට තිබිණි. එලෙස මරා දැමෙන අය අතර, මාධ්‍යවේදීන්, ආගමික නියෝජිතයන්, විනිසුරුවන්, ක්‍රියාකාරීන් ඇතුළු පිරිස් සිටිති. මෙවැනි පසුබිමක එම බොහෝ දෙනකුට සැඟවීමට හෝ රටින් පිටවීමට බල කෙරී ඇතැයි විදෙස් මාධ්‍ය වාර්තා කර ඇත.

## දීර්ඝතම යුද්ධය

ඇෆ්ගන් යුද්ධය අමෙරිකාවේ දීර්ඝතම යුද්ධය වන අතර, එය ඇරැඹී මේ වසරට විසි වසරකි. අමෙරිකාව ඇෆ්ගනිස්ථානය ආක්‍රමණය කළේ, 2001.09.11 ප්‍රහාරය මෙහෙය වූ අල්බයිඩා නායක ඔසාමා බින් ලාඩන් එහි සැඟැවී සිටින බව පවසමිනි. යුද්ධයක් නො ඇරඹූ එකම අමෙරිකානු ජනාධිපතිවරයා ලෙස ඉතිහාසයට ගිය ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ පාලන සමය තුළදී ඇෆ්ගන් යුද්ධය අවසන් කිරීම ගැන උනන්දුවක් දැක්වීය. එහි ප්‍රතිඵලයක් ලෙස ඉකුත් වසරේ පෙබරවාරියේ කටාර්හිදී ඇෆ්ගන් රජය හා තලේබාන් සංවිධානය අතර එකඟතාවකට අත්සන් තැබීම ද සිදු විය. එම එකඟතාවට අනුව මැයි මාසය වන විට අමෙරිකාව එරට රඳවා සිටින සිය භට පිරිස් මුළුමනින්ම ඉවත් කර ගත යුතුය. තලේබාන් සංවිධානය ඇෆ්ගනිස්ථානයේ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සඳහා ඉඩ නොතබන බවට වගබලා ගත යුතුය.

අමෙරිකාවේ නව ජනාධිපති ජෝ බයිඩ්න් යටතේ ද එම විශේෂ නියෝජිතයා ලෙස කටයුතු කරමින් සිටින්නේ ෂල්මේ ඛලීල්ෂාද්මය. තලේබාන් සහ ඇෆ්ගන් රජය අතර සාකච්ඡා වැඩපිළිවෙළ මන්දගාමීව ඉදිරියට ඇදෙමින් තිබියදී ඇෆ්ගනිස්ථානයේ අන්තර් ආණ්ඩුවක් ඇති කිරීම පිළිබඳ අමෙරිකාව උනන්දු වෙමින් සිටී. ඛලීල්ෂාද් විසින් පිළියෙළ කර ඇති මාර්ග සිතියමට අනුව, එරට තලේබාන් පාලනය 2001දී බිඳ වැටීමෙන් පසුව පැවැති බොන් සමුළුව මෙන් අන්තර්ජාතික සමුළුවක් ද පැවැත්විය යුතු වේ. එය තුර්කියේදී පැවැත්වීමට නියමිතව ඇති අතර, පාකිස්තානය, ඉරානය වැනි කලාපීය බලවතුන් ඊට සහභාගිවීමට නියමිතව තිබේ. ඛලීල්ෂාද් සිය තෙදින සංචාරය නිමා කරමින් පැවසුවේ, මේ සාම වැඩපිළිවෙළ පෙරට ගෙනයාමට හැකි විවිධ විසඳුම් සහ විකල්ප පිළිබඳ සාකච්ඡා කළ බවය. කෙසේ වුවද ඇෆ්ගන් ජනාධිපති අෂ්රෆ් ඝානි මෙන්ම තලේබාන් සංවිධානය ද අන්තර් ආණ්ඩුවක් බිහි කිරීම පිළිබඳ අදහස මීට පෙරදීම ප්‍රතික්ෂේප කර තිබිණි. එය දැනට මේ අන්දමින් හෝ ඉතිරි වී ඇති ප්‍රජාතන්ත්‍රවාදයේ සළකුණු මකා දැමීමට හේතුවනු ඇතැයි ඇෆ්ගන් ජාතිකයන් වැඩිදෙනකුගේ අදහස විය.

ඒ අතරම සාකච්ඡා ක්‍රියාවලිය පෙරට ගෙන යාමේ අවශ්‍යතාව ද තිබේ. ජනාධිපති බයිඩ්න් මේ වැඩපිළිවෙළ දිගටම පෙරට ගෙන යනු ඇති ද යන්න පිළිබඳ දැනට ඇත්තේ අවිනිශ්චිතතාවකි. අමෙරිකා භට පිරිස් මැයි මාසය වන විට මුළුමනින්ම ඉවත් කර ගන්නේ ද යන්න තීරණය වන්නේ ද ඒ අනුවය. ඇතැම් පාර්ශ්වවල අදහස රට තුළ මුළුමනින් ස්ථාවරත්වයක් ඇතිවන තුරු එම භට පිරිස මුළුමනින්ම ඉවත් කර නොගතයුතු බවය. ඇතැම් විශ්ලේෂකයන් පවසන පරිදි මැයි 1 වැනිදා වන විට එනම් ඉදිරි දෙමසක කාල සීමාව තුළ ඇෆ්ගන් යුද්ධය අවසන් කිරීමේ අවස්ථාව ජනාධිපති බයිඩ්න්ට තිබේ. දැනට පෙනෙන්නට ඇති පරිදි නම් හිටපු ජනාධිපති ට්‍රම්ප් එකඟ වූ වැඩපිළිවෙළට ජනාධිපති බයිඩ්න් ද එකඟව සිටී. දෙදෙනා අතර වෙනස්කම් කොතෙකුත් තිබුණ ද අමෙරිකා හමුදා ඇෆ්ගනිස්ථානයෙන් ඉවත් කර ගැනීම පිළිබඳ දෙදෙනාම එකඟ වන බව මාධ්‍ය වාර්තා කර තිබිණි.

### විදෙස් විත්ති විග්‍රහ

## තලේබාන් සූදානම

ඇෆ්ගනිස්ථානයේ රඳවා සිටි අමෙරිකා සෙබළ සංඛ්‍යාව ලක්ෂ සංඛ්‍යාතය. තුවාල ලැබූවන් දස දහස් සංඛ්‍යාතය. සිවිල් වැසියන් වැඩි දෙනකු ද මේ අතර සිටී. එරට රඳවා සිටින සිය භට පිරිස් වෙනුවෙන් අමෙරිකාවට දැරීමට සිදුව ඇති වියදම ඇ.ඩොලර් ට්‍රිලියන 2ක් පමණ වෙතැයි ගණන් බලා තිබේ.

අමෙරිකා හා නේටෝ හමුදාවන්ගේ ප්‍රධානී ස්කොට් මිලර් පවසන පරිදි තලේබාන්වරුන්ගේ හිංසාකාරී ක්‍රියාකාරකම්වල වැඩිවීමක් තිබේ. එවැනි තත්ත්වයන් සාම වැඩ පිළිවෙළට බලපෑම් ඇති කරයි. මේ අතර, ඇෆ්ගන් ජාතික ආරක්ෂක කවුන්සිලයේ ප්‍රකාශකයකු ද පවසා ඇත්තේ, ඔවුන් ඕනෑම යුදමය තත්ත්වයක් සඳහා සූදානමින් සිටින බවය. සිය වාර්ෂික පුහුණු සැසි නොපැවැත්වීමට සංවිධානයේ අණදෙන නිලධාරීන් පියවර ගත් බව තලේබාන් සංවිධානය පවසා තිබේ. එසේ වුවද පල්ලි තුළදී පැවැත්වෙන සාකච්ඡා, ආහාර රැස් කිරීම, නව පිරිස් බඳවා ගැනීම ආදිය දක්නට ලැබුණු බවට මෑත සති කිහිපයේදී වාර්තා විය. ඉන් අදහස් කෙරෙන්නේ යුදමය තත්ත්වයන් සඳහා තලේබාන් සංවිධානය ද සූදානම් වෙමින් ඇති බවය. මැයි 1 වැනිදා වන විට අමෙරිකා සහ නේටෝ භට පිරිස් ඉවත් නොවුණහොත් බිහිසුණු යුද්ධයකට යළි රට ගමන් කරනු ඇති බව තලේබාන් සංවිධානය පවසයි.

මීට දෙසතියකට පෙර තලේබාන් සංවිධානය විවෘත ලිපියක් මඟින් අමෙරිකාවෙන් ඉල්ලා සිටියේ, දෝහාහිදී ඇතිකරගත් එකඟතා මුළුමනින් ක්‍රියාත්මක කරන ලෙසය.

දැනට අමෙරිකා සෙබළු 2500ක් ඇතුළුව විදේශ හමුදා භට පිරිස් 10,000ක් පමණ ඇෆ්ගනිස්ථානයේ රැඳී සිටිති. නේටෝ මහලේකම් ජෙන්ස් ස්ටොල්ටන්බර්ග් පසුගියදා කියා සිටියේ, නිසි කලට පෙර ඇෆ්ගනිස්ථානයෙන් ඉවත් නොවන බවය. ඔහු වැඩිදුරටත් දක්වා තිබුණේ සම්මුතියට අනුව තලේබාන්වරුන්ට තවත් කළ යුතු දේ බොහෝ ඇති බවය.

දෙසතියකට පෙර අමෙරිකානු මධ්‍යම අණදෙන ප්‍රධානී ජෙනරාල් කෙනත් එෆ්. මැකෙන්සි, රුසියානු ජනාධිපති ව්ලැදිමීර් පුටින්ගේ ඇෆ්ගන් නියෝජිත ෂමීර් කබුලොව් සහ කටාර් විදේශ අමාත්‍යාංශයේ නියෝජිත මුට්ලක් බින් මජීඩ් අල් ඛටානි අතර හමුවක් ඉස්ලාමාබාද් නුවරදී පැවැත්විණි. මෙහිදී ඇති වූ සාකච්ඡා පිළිබඳ මාධ්‍යට කරුණු අනාවරණ නොවීය. කෙසේ වුවද ගැටුම් අඩු කර ගැනීම සහ සටන් විරාමය පවත්වා ගැනීම ගැන අවධානය යොමු වූ බව වාර්තා විය.


පවතින තත්ත්වය යටතේ ජනාධිපති බයිඩ්න්ට මේ යුද්ධය අවසන් කිරීමට ගත හැකි ප්‍රතිපත්තිමය තීරණ කිහිපයක් ඇති බව විශ්ලේෂකයන්ගේ අදහසය. ඒ අතර, මැයි මාසය වන විට සිය භට පිරිස් මුළුමනින්ම ඉවත් කර ගැනීමටද ඉඩ තිබේ. එමෙන්ම ත්‍රස්තවාදයට එරෙහි මෙහෙයුම්වල යෙදීම සඳහා තවදුරටත් යම් භට පිරිසක් රඳවා තැබීම ද කළ හැකිය. සම්මුතිය අනුව නම්, රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් නොවන සියලු විදේශීය මිලිටරි පුද්ගලයන් ඇෆ්ගනිස්තානයෙන් පිටවිය යුතුය. තවත් විකල්පයක් නම් සිය භට පිරිස් ඉවත් කර ගැනීම සඳහා නියමිතව ඇති අවසන් දිනය යම් කාලයකින් තවදුරටත් දීර්ඝ කර ගැනීමය.

## මියගිය භට පිරිස

අන්තර් ඇෆ්ගන් සාකච්ඡා කඩිනම් කිරීම ද තවත් විකල්පයකි. සාකච්ඡා ඇණහිට තිබුණ ද පසුගිය සති ගණනාවක් මුළුල්ලේ අමෙරිකා ආරක්ෂක ලේකම් ලොයිඩ් ඔස්ටින් හා ඇෆ්ගන් ජනාධිපති අෂ්රෆ් ඝානි අතර ද, අමෙරිකා ජාතික ආරක්ෂක උපදේශක ජැක් සුලෙයිවාන් සහ ඇෆ්ගන් ජාතික ආරක්ෂක උපදේශක හම්දුල්ලා මොහිබ් අතර ද වාර ගණනාවකදීම දුරකතන සංවාද සිදු වූ බව වාර්තා විය. 20 වසරක යුද්ධයෙන් මිය ගිය ඇෆ්ගන් භට පිරිස කොපමණදැයි තවමත් නිල වශයෙන් ප්‍රකාශයට පත්ව නැත. එසේ වුවද 2019 ජනවාරියේදී ජනාධිපති අෂ්රෆ් ඝානි කියා සිටියේ ඇෆ්ගන් ආරක්ෂක හමුදා භට පිරිස් 45,000 ක් 2014 සිට යුද්ධයෙන් ජීවිතක්ෂයට පත්ව ඇති බවය. මිය ගිය අන්තර්ජාතික හමුදා භට පිරිස් 3500ට ආසන්නය. එම සංඛ්‍යාව 2001 සිටය. ඒ අතරින් 2300කට වැඩි පිරිසක් අමෙරිකානුවෝ වෙති. යුද්ධයෙන් මිය ගිය සිවිල් වැසියන්ගේ සංඛ්‍යාව නිශ්චිතව ගණනය කිරීම ද දුෂ්කර වී තිබේ. 2019 පෙබරවාරි නිකුත් වූ එක්සත් ජාතීන්ගේ සංවිධාන වාර්තාවක එය 32,000කට වැඩි විය හැකි බව සඳහන් විය. බ්‍රවුන් සරසවිය ගණන් බලා ඇති පරිදි එම සංඛ්‍යාව 42000ක් පමණ වේ.

ඇෆ්ගනිස්ථානයේ භූමියෙන් 90% ක්ම 1998 වන විට පැවැතියේ ද තලේබාන් සංවිධානයේ පාලනයට නතුවය. 2001දී තලේබාන් පාලනය බිඳවැටීමත් සමඟ එම බලය විශාල ලෙස සීමා විය. මේ වන විට නැවතත් ඔවුන් යම් මට්ටමකට බලවත්ව සිටී.

යම් හෙයකින්, සම්මුතියට අනුව අමෙරිකා හා විදෙස් හමුදා මැයි 1 වැනිදා වන විට ඇෆ්ගනිස්ථානයෙන් ඉවත් වුවහොත් එය එරටට සාමය උදාකිරීමට අවශ්‍ය පසුබිම ඇති කරනු ඇත. එසේ වුවද විසි අවුරුද්දක් තිස්සේ පැවැති යුදමය තත්ත්වය යටතේ රට පත්වී ඇති තත්ත්වය තුළ ත්‍රස්තවාදීනට ඉඩ නොතැබීම සඳහා ඇෆ්ගන් රජයට ඇති හැකියාව මත ඊළඟ පරිච්ඡේදය ලියැවෙනු ඇත. එතැනදී තලේබාන් සංවිධානය ද සිටිය යුතු වන්නේ ත්‍රස්තවාදයට එරෙහිව රජය සමඟය. එය එසේ සිදු වේද යන්න නම් නිශ්චිතව කිව නොහැකිය.




ධම්මික සෙනෙවිරත්න



# නිවසින් කළ යුතු ආහාර සුරක්ෂිතතාව

ආහාර මිනිසාගේ මූලික අවශ්‍යතාවයකි. එසේ වුවත් ලෝකයේ සෑම තැනෙකම වෙසෙන මිනිසුන්ට ආහාර එක හා සමාන ආහාර ප්‍රමාණයක් ලැබෙන්නේ නැත. එපමණක් නොව එක හා සමාන ගුණාත්මකභාවයෙන් යුත් ආහාර ලෝකයේ සෑම කලාපයකට ම ලැබෙන්නේ ද නැත. එවැනි තත්ත්වයක් මතුව තිබියදී අපි සැවොම දැන හෝ නොදැන හෝ ආහාර නාස්ති කරමින් සිටින්නෙමු.

සෑම වසරකම ආහාර මෙට්‍රික් ටොන් මිලියන 931ක් ඉවත හෙළන බව එක්සත් ජාතීන්ගේ සංවිධානය පෙන්වා දෙයි. මේ අන්දමට ඉවත හෙළන අහාර ප්‍රමාණයෙන් සෑම වසරක ම ට්‍රක් රථ මිලියන 23ත් 40ත් අතර ප්‍රමාණයක් පුරවා දමන්නට පුළුවන. ඉවත හෙළන ආහාර ප්‍රමාණය ඉහළට නෙරුමක් ("බම්ප්" එකක් මෙන්) සිටින පරිදි පෘථිවිය වටා ගොඩගසා ගෙන ගියහොත් පෘථිවිය වටා වට අටක් ගොඩගැසිය හැකි බව ජගත් සංවිධාන බලධාරීහු පවසති. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පරිසර වැඩසටහන ආහාර නාස්තිය පිළිබඳ දර්ශකයක් ද ඉදිරිපත් කර තිබේ.

## කුණු කූඩයට යන ආහාර

ලෝ පුරා නිෂ්පාදනය කෙරෙන ආහාර ප්‍රමාණයෙන් 17%කට ආසන්න ප්‍රමාණයක් අපතේ යන බව එම දර්ශකයේ සඳහන් වේ. පරිභෝජනය සඳහා වෙළඳපොළට එවන ආහාර වැඩිපුර ම ඉවත හෙළනු ලබන්නේ සිල්ලරට ආහාර අලෙවි කරන සාප්පු, නිවාස සහ ආපනශාලා මඟිනි. ඒවායෙන් ඉවත ලන ආහාර සෘජුවම ගමන් කරන්නේ කුණු කූඩයට බව සඳහන් වේ. ඉවත හෙළන ආහාරවලින් 61%කට ආසන්න ප්‍රමාණයක් අපතේ යන්නේ නිවෙස්වලිනි. ඉවත ලන ආහාරවලින් 26%ක් පමණ ඉවත ලන්නේ ආහාර හා සම්බන්ධ සේවාවන් සපයන ආයතනයන් බව අනාවරණය වී තිබේ. අපතේ යවන ආහාරවලින් 13%කට සමාන ප්‍රමාණයක් ඉවත හෙළන්නේ ආහාර අලෙවියේ නියුතු සිල්ලර වෙළඳ ආයතනයි.

ආහාර අපතේ යෑම සම්බන්ධයෙන් කටයුතු කරන "රැප්" (WRAP) නැමැති අන්තර්ජාතික සංවිධානය කියා සිටින්නේ මෙයට පූර්වයෙන් ඇස්තමේන්තු කර තිබුණාට වඩා වැඩි ආහාර ප්‍රමාණයක් මේ වනවිට අපතේ යන බවයි.

එතරම් ආහාර ප්‍රමාණයක් අපතේ යෑම ගෝලීය අර්බුදයක් වී ඇති බව ද එම සංවිධානය පෙන්වා දෙයි.

ආහාර සම්බන්ධයෙන් කටයුතු කරන ගෝලීය ආයතන මේ වනතුරු විශ්වාස කළේ ආහාර වැඩි ප්‍රමාණයක් අපතේ යන්නේ සංවර්ධිත රටවලින් පමණකැයි කියා ය. සංවර්ධිත රටක ජීවත් වන පුද්ගලයකු, එක් පුද්ගලයකු පරිභෝජනය කරන ආහාර ප්‍රමාණයට වඩා වැඩි ආහාර ප්‍රමාණයක් සෑමවිට ම මිලදී ගන්නා බව සමීක්ෂණවලින් තහවුරු වූ නිසා එවැනි මතයක් ඇති වී තිබිණ. එහෙත් දරිද්‍රතාවයෙන් පීඩාවට පත් රටවල සහ ධනවත් රටවල ආහාර පරිභෝජකයන් ඉවත හෙළන්නේ එක හා සමාන ආහාර ප්‍රමාණයක් බව, වර්තමානයේ කෙරෙන පර්යේෂණවලින් අනාවරණය වී ඇත.



ඉවත හෙළන ආහාරවලින් 61%කට ආසන්න ප්‍රමාණයක් අපතේ යන්නේ නිවෙස්වලිනි. ඉවත ලන ආහාරවලින් 26%ක් පමණ ඉවත ලන්නේ ආහාර හා සම්බන්ධ සේවාවන් සපයන ආයතනයන් බව අනාවරණය වී තිබේ. අපතේ යවන ආහාරවලින් 13%කට සමාන ප්‍රමාණයක් ඉවත හෙළන්නේ ආහාර අලෙවියේ නියුතු සිල්ලර වෙළඳ ආයතනයි.

එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකාර්මික සංවිධානය ආහාර අපතේ යෑම පිළිබඳ පර්යේෂණයක් 2011 වසරේදී සිදු කළේ ය. සෑම වසරකම පරිභෝජනයට ගත නොහැකි හෝ අපතේ යන හෝ ආහාර ප්‍රමාණය එම වසරේ සමස්ත ආහාර නිෂ්පාදනයෙන් තුනෙන් එකකට ආසන්න බව එම පර්යේෂණයෙන් අනාවරණය වූයේ ය.

## පසු අස්වනු

ආහාර හානිය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකාර්මික සංවිධානය ආහාර සංවිධානය සකස් කළ දර්ශකයේ සඳහන් වන අන්දමට ආහාරවලින් 14%කට ආසන්න ප්‍රමාණයක් අපතේ යන්නේ පසු අස්වනු (post-harvest) කාර්යාවලිය හරිහැටි සිදු කර නොගැනීම නිසයි.

ආහාර අපතේ යෑම පිළිබඳව ඇමෙරිකාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ද ඇස්තමේන්තුවක් සකස් කර තිබේ. හතර දෙනෙකුගෙන් යුත් පවුලක් සෑම වසරකට ම ඇමෙරිකා ඩොලර් 1500කට ආසන්න වටිනාකමෙන් යුත් ආහාර ප්‍රමාණයක් අපතේ හරින බව එම දෙපාර්තමේන්තුව කළ ගණනය කිරීම් වලින් අනාවරණය වේ. ආහාර අපතේ යෑමේ සත්‍ය තත්ත්වය ගණනය කර දැක්විය නොහැකි බව ඇමෙරිකා එක්සත් ජනපද ආධාර වැඩපිළිවෙළේ ආහාර පිළිබඳ පර්යේෂක ජීන් බස්බි පවසයි.

ලෝක ආහාර නිෂ්පාදනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අපතේ යන බව ආහාර සම්බන්ධයෙන් ක්‍රියාකරන ගෝලීය සංවිධාන සෑම එකක් ම වාගේ පිළිගනියි. ලෝක ජනගහනය වැඩිවෙමින් පවතින නිසා ද ලෝකයේ කුස ගින්නෙන් පෙළෙන පිරිස වැඩිවෙමින් පවතින නිසා ද ආහාර අපතේ යෑම අඩු කර ගත යුතු බව ලෝක සංවිධාන තරයේ පෙන්වා දෙයි. දැනට අපතේ යන ආහාර ප්‍රමාණය 2030 වනවිට අඩකින් පමණ අඩු කර ගතයුතු බව එක්සත් ජාතීන්ගේ සංවිධානය කියා සිටී.

මේ අතර, ආහාර අපතේ යන කාරණා කවරේ ද? යන්න සම්බන්ධයෙන් ද විද්‍යාඥයන් අධ්‍යනයන් සිදු කර ඇත. ඔවුන් කියා සිටින්නේ හරිතාගාර වායු විමෝචනය හේතුවෙන් ආහාරවලින් 8%ත් 10%ත් අතර ප්‍රමාණයක් විනාශ වන බවකි. ආහාර ප්‍රවාහනය කිරීමේදී ද ඒ හා සමාන ම ආහාර ප්‍රමාණයක් විනාශයට පත්වන බව විද්‍යාඥයෝ පවසති. අනෙක් අතට, ආහාර නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලියේදී හා ආහාර ඇසුරුම් කිරීමේදී පරිසරයට විශාල හානියක් සිදු වේ. ඒ, වනාන්තර එළිපෙහෙළි කිරීම, ඉන්ධන දහනය කිරීම ආදිය නිසයි.

## මිල කළ නොහැකි සම්පත්

එසේම නරක් වූ ආහාර පරිසරයට හෙළීම නිසා එමගින් හරිතාගාර වායු විමෝචනය කෙරේ. එනිසා වායුගෝලය දූෂණය වේ. ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය හා බැඳුණු මේ තත්ත්වයන් සෑම රජයක් මෙන්ම සෑම පුද්ගලයකුම අවබෝධ කරගත යුතු බව විද්‍යාඥයෝ පවසති. එසේ නොවුණහොත්, කාලගුණ විපර්යාස, ස්වභාදහම, ජෛව විවිධත්වය, පරිසර දූෂණය වැනි කරුණු සම්බන්ධයෙන් ද නොසලකා හැරීමක් සිදු වනු ඇත.

මේ කාරණා ගැන සලකා බලන විට පෙනී යන්නේ අප සතු විශාල සම්පත් ප්‍රමාණයක් - සමහරවිට මිල කළ නොහැකි තරමේ සම්පත් ප්‍රමාණයක් ආහාර නිෂ්පාදනය කිරීම සඳහා විනාශ කරන බවක් නොවේ ද? එසේ නිෂ්පාදනය කරගත් ආහාරවලින් සැලකිය යුතු ආහාර ප්‍රමාණයක් පරිභෝජනයට නොගෙන අපතේ යවන්නේ නම් අපි තවත් කියමු ද? එනිසා ආහාර සුරක්ෂිතතාව ආරම්භ කළ යුත්තේ තම නිවෙසිනි; පෞද්ගලික පරිභෝජනය සඳහා භාවිතයට ගන්නා ආහාර ප්‍රමාණය නිවැරදිව කළමනාකරණය කරගනිමිනි.

**මංජුලා විජයරත්න**
Aljazeera ඇසුරෙනි.




# වසංගතය සමඟ පැමිණි කල් ඉකුත් වූ ගැටලු



සාරා ෂ්ටුට්න් සතුව ශාස්ත්‍රපති උපාධි දෙකකි. ඉන් එකක් ව්‍යාපාර පරිපාලනය පිළිබඳය. ඒ කොලොම්බියානු සරසවියෙනි. ඇ වෘත්තියෙන් සෞඛ්‍ය සේවා උපදේශිකාවකි. පසුගිය වසරේ කොරෝනා වසංගතය පැමිණ සැමගේ ජීවිත උඩුයටිකුරු කළ පසු සාරාට තම රැකියාවට සමුදීමට සිදු විය. ඇගේ සැමියාගේ රැකියාව වඩාත් සුනම්‍ය කාල රාමුවල තිබීමත්, ඔහුගේ මාසික වේතනය සාරාගේ වේතනයට වඩා ඉහළ වීමත් යන කාරණා ද්විත්වය මේ සාමූහික තීරණයට බලපෑවේය. සාරා දිගටම රැකියාවට යාමට තීරණය කළහොත් ඇට තම රාජකාරි වේලාවෙන් හරි අඩක් නිවාඩු දමා නිවෙසේ රැඳිමට සිදුවීම අනිවාර්ය විය. එය කළ නොහැක්කක් හෙයින් ඇ තම රැකියාවට සමුදීමට තීරණය කළේය. ඔවුන්ගේ දරු දෙදෙනා වයස 06ට අඩු අතර වසංගත තත්ත්වය හේතුවෙන් නිවෙසේ සිට අධ්‍යාපන කටයුතු කරගෙන යනු ලැබීය.

පළමුව කිසි අපහසුතාවයකින් තොරව දරු දෙදෙනාගේ ක්‍රියාකාරකම් හසුරුවා ගැනීමට ඇට හැකි විය. එළිමහනේ ක්‍රීඩා කිරීමට ඔවුන්ට වැඩි කාලයක් ලැබුණු අතර ඒ ගෙවුණු මුල් කාලය අතිශය ප්‍රීතිමත් එකකි. එහෙත් පෙබරවාරි මාසය වන විට සාරාගේ පාර්ශ්වයෙන් මේ අතිශය ප්‍රීතිය මදින් මද ක්ෂය වී යන්නට පටන් ගති. "මම හිතුවෙ නෑ ලොක් ඩවුන් කාලය මේ තරම් දිග වෙයි කියලා. දැන් නම් මම සම්පූර්ණයෙන්ම හෙම්බත්වෙලයි ඉන්නේ."

කොරෝනා වසංගත කාලයේ මෙවන් කතාන්දරයක් ඇසීම මේ වන විට අතිශය සාමාන්‍යය. කොටින්ම සාරා කියන මේ කතාන්දරය දැන් කල් ඉකුත් වූ ගැටලුවකි. ලොව පුරා සිටින මවුවරු මිලියනයකට ආසන්න ප්‍රමාණයක් වසංගතයේ මුල් කාර්තුවේදීම ස්වකීය රැකියා හැරපියා නිවසේ නතර වී ඇත. ඊට අමතරව තවත් මව්වරු බහුතරයකට තමන්ගේ රැකියා වේලාවෙන් සැලකිය යුතු පැය ගණනක් දරුවන් බලා ගැනීමට කැප කරන්නට සිදුව ඇත. රැකියාවැති මව්වරුන් සම්බන්ධයෙන් වසංගත තත්ත්වය නිමැවූයේ තෙරක් නොමැති ගැටලු කන්දරාවකි. දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආදිය වසා දැමීම, පාසල් වසා දැමීම හේතුවෙන් රැකියාවට පිටත්ව නැවත නිවෙසට පැමිණෙන කාලය අතරතුර දරුවන් රැකබලා ගැනීමට ක්‍රමයක් නැති වීම ලෝකය පුරා අලුතින් මතුව ආ ගැටලුවකි. ඒ සඳහා විසඳුම්ද අලුතින්ම සොයාගත යුතු විය.

ඇමරිකානු කම්කරු දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව වසංගත තත්ත්වය ඇතිවීමත් සමග රැකියා කළ කාන්තාවන්ගේ ප්‍රතිශතය 56%ක් තෙක් පහළ බැස ඇත. මේ ප්‍රතිශතය 2020 වසරේදී 58%කි. මේ හේතු නිසාම කාන්තාවන් සම්බන්ධයෙන් රැකියා ස්ථානවල ඇති පොදු නීති රාශියක් ලිහිල් කිරීමට පවා කටයුතු කර ඇති බව සමාජ විද්‍යාඥවරියක වන ජූලී කෝලර් පවසා ඇත. "මේ ගැන දිගින් දිගටම හිතනකොට පෙනුණෙ අවුරුදු 30ක් පුරාම ක්‍රම ක්‍රමයෙන් වැඩිවෙමින් තිබ්බ කාන්තා ව්‍යවසායකත්වය අවුරුද්දකට අඩු කාලෙකින් අඩු වෙලා ගිහිල්ලා කියලයි."

80 දශකය සලකා බලන විට පුරුෂයන් හා සාපේක්ෂව කාන්තාවන් රැකියාවල නිරතව ඇත්තේ අඩු ප්‍රතිශතයකිනි. අදට වඩා දෙගුණයක් වැඩ කිරීමට 60 දශකයේදී විවාහක පුරුෂයන්ට සිදුව ඇත. විවාහක පුරුෂයන්ට සාපේක්ෂව කාන්තාවන් දෙගුණයක් පමණ නිවෙසේ වැඩවල නිරතව සිට ඇත. එහෙත් 80 දශකයෙන් පසුව මේ තත්ත්වය ක්‍රමිකව වෙනස්වීමට භාජනය වී ඇත. පසුගිය වසර 15 පුරාම ඇති වූ වෙනස්කම් සලකා බලන විට නිවෙසට අවශ්‍ය ආහාරපාන රැගෙන ඒම, රෙදි සේදීම, ඉවුම්-පිහුම් කිරීම, භාජන සේදීම සහ නිවෙස ශුද්ධ පවිත්‍ර කිරීම ආදී වගකීම් කාන්තාවන්ට පැවරීමේ ප්‍රවණතාව වෙනස්ව ඇත. සමාජ විද්‍යාඥයන්, මනෝ විද්‍යාඥයන්ට අනුව නිවෙසක වැඩ කටයුතු සිදු කිරීමේ ක්‍රියා පටිපාටිය බෙදෙන ආකාරය දරුවන්ගේ වර්ධනයට වැඩි බලපෑමක් සිදු කරනු ලබයි. දරුවන්ගේ අනාගත ජීවිත හැඩගස්වා ගැනීමට මෙමඟින් ඔවුන්ට අවිඥාණිකව ලැබෙන අනුබලය සුළුවෙන් තැකිය යුතු නැති බවත් ඔවුන් තව දුරටත් පවසයි.

මේ සියලු ක්‍රමික සමාජ විකාශන අතර හදිසියේ කඩා වැදී වසංගතය සියල්ල අවුල් කර දැමීමට සමත් වී ඇතැයි විශේෂඥයෝ පවසති. වසර 30ට ආසන්න කාලයක් මුළුල්ලේ තිබූ සමාජ තත්ත්වය සහ සමානාත්මතාව අර්බුදයකට පත්ව ඇතැයි ඔවුන් ඉඟි කරයි. සියලු අනාගතවාදී දර්ශන නැවත ආපස්සට කැරකැවෙතැයි ඔවුන් බිය පළ කර ඇත. නිවෙසේ කටයුතු සිදු කිරීමේ සාමාන්‍ය පිළිවෙත් උඩු යටිකුරු වීමෙන් දරුවන්ගේ මානසික සෞඛ්‍ය කෙරෙහි ද යම් බලපෑමක් සිදු කරනු ඇති බවට මේ විශේෂඥයෝ පවසා ඇත. වසංගත තත්ත්වය හේතුවන් මවුපියන් ගනු ලැබූ තීරණ විසින් දරුවන්ට ඇති කළ හැකි ධනාත්මක බලපෑම අල්ප වනු ඇතැයි පැවැසේ.

මනෝවිද්‍යාව පිළිබඳ මහාචාර්යවරියක වන මාර්ටි හැස්ල්ටන්ට අනුව පියා මත යැපෙන මවුවරුන් දකින දරුවන්ගේ ආකල්ප බොහෝ විට සාම්ප්‍රදායික වීමට ඉඩ තිබේ. මව නිවෙසේ වැඩකටයුතු බලා කියා ගනිමින් දරුවන් උස් මහත් කිරීමත්, පියා රැකියාවට පිටත්ව යාමත් යන සංසිද්ධිය දකිමින් උස්මහත් වන දරුවන්ගේ අනාගත ජීවිත පැවැත්මට එය හිතනවාටත් වඩා බලපානු ලබයි. රැකියාවට නිවෙසින් පිටව කාලය ගත කළ මවුවරුන්ට සාපේක්ෂව රැකියාවක නිරත නොවී නිවෙසේ රැඳුණු මවුවරුන්ගේ දරුවන් නිවෙසේ වැඩ කටයුතු කිරීමේ වැඩි ප්‍රවණතාවක් දක්නට ලැබේ. මේ පවුල්වල පිරිමි දරුවන්ගේ තත්ත්වය ද මේ අකාරමය.

එහෙත් පසුගිය තිස් වසර පුරා මේ ක්‍රියාදාමය වෙනස් අතකට හැරුණි. කාන්තාවන් රැකියා කිරීමේ ප්‍රවණතාව වැඩි වීමත් සමඟ පුරුෂයන්ට වඩා වැඩි වේතන ලැබීම ආදී කරුණු වෙතින් සාම්ප්‍රදායික පසුබිම වෙනස් කරනු ලැබීය. පවුල තුළ ස්ත්‍රිය සහ පුරුෂයා කරනු ලබන කටයුතුවල පැහැදිලි බෙදීම් රේඛා නොතිබුණි. මීට සමගාමීව දරුවන් තුළ ද වෙනස්කම් දැකගත හැකි විය. මේ මවුවරුන්ගේ දියණියන් සමාජයේ කැපී පෙනෙන රැකියා කිරීමටත්, සමාජ ක්‍රියාකාරිණියන් ලෙස හැසිරීමේ ප්‍රවණතාවයක් ඇති බව හාවර්ඩ් සරසවිය විසින් කළ සමීක්ෂණයකින් අනාවරණය විය.

මේ පසුබිම කොරෝනා වසංගතය විසින් වෙනස් කිරීමත් සමඟ සමාජය තුළ ස්ථාපිතව පැවැති නව ජීවන රටාව නොසිතූ ලෙස බිඳ වැටුණි. එය තව දුරටත් නොවෙනස්ව පැවතියහොත් අනාගත දරු පරපුරට එහි අනිසි බලපෑම අත්විඳීමට සිදුවනු ඇත. විශේෂඥයන් වඩාත් සැලකිලිමත් වන්නේ ඒ කාරණය සම්බන්ධයෙනි. අනාගතයේදී දරුවන්ට සමානාත්මතාවය පිළිබඳ වැරැදි අදහසක් සම්ප්‍රේශණය වීමේ ඉඩකඩ වැඩිවීම වඩාත් අවාසනාවන්තය.

"මේවා අම්මා කරන වැඩ, මේවා තාත්තා කරන වැඩ." යනුවෙන් දරුවන් කීමට පුරුදු වීමේ සම්භාවිතාව වැඩි වුවහොත් ඒ සම්බන්ධයෙන් ගත යුතු තීරණය සමාජය සතු වනු ඇත. කොරෝනා වසංගතය ඒ සියල්ලට වගකිව යුතුය.

අතොරක් පවුල්වල මව රැකියාවට පිටත්ව යන විට පියා දරුවන් බලා කියාගෙන නිවෙසේ සිටින වාතාවරණද නැත්තේ නොවේ. එවන් පසුබිමක් දරුවන්ගේ සිතීමේ රටාවේ නොසිතන වෙනසක් ද ඇති කරවන බව තව දුරටත් පැවසේ. එසේම හදිසියේම රැකියා අතැර නිවෙසේ වැඩකටයුතුවලට සිරවූ මවුවරුන්ගේ මානසික සෞඛ්‍ය පිළිබඳ මීට වඩා විශාල සැලකිල්ලක් දැක්විය යුතුය. එය ද හදිසි අවස්ථාවක් සේ සලකා කටයුතු කළ යුතුය. පියවරුන් සම්බන්ධයෙන් ද ඒ තත්ත්වයේ වෙනසක් නැත. සරලව කිවහොත් වසංගත තත්ත්වය විසින් අප කලින් දැන සිටි ලෝකය කඩා දමා අලුත් ලෝකයක් නිමවා ඇත. ස්ත්‍රී, පුරුෂ දෙපාර්ශ්වයේම වැඩ කටයුතු පෙර පැවැති ආකාරයෙන් වෙනස්ව ඇත. ඒවා අත්දකින දරුවන්ගේ ජීවන රටාවේද සැලකිය යුතු වෙනසක් සිදු කර ඇත. දැන් අපේ මුවවිටට පැමිණ තිබෙන ගැටලුව වන්නේ අප කුමක් කළ යුතුද යන්නයි. එහෙත් කුමක් කළ යුතුද යන්න සම්බන්ධයෙන් කිසිවකුට නිශ්චිත අදහසක් නොමැති වීම ද තව අලුත් ගැටලුවක්. ගැටලුවක් විසඳීමට යන තැන අලුත් ගැටලුවක් නිර්මාණය වීමේ උභතෝකෝටිකයට දැන් අප මුහුණ දිය යුතුය.

**නැෂනල් ජියොග්‍රැෆික් ඇසුරෙනි**
**කාංචනා අමිලානි**

# එන්නතෙන් පසු දින 2කට වැඩියෙන් උණ නම් වෛද්‍ය උපදෙස් ගන්න

## වෛද්‍ය හේමන්ත හේරත්

**සන්ධ්‍යා කරුණාරත්න**

කොවිඩ් එන්නත ගැනීමෙන් පසු කිසියම් පුද්ගලයකුට උණ ස්වභාවය දින දෙකකට වඩා පවතින්නේ නම් වෛද්‍ය උපදෙස් ලබා ගත යුතු බව නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සෞඛ්‍ය සේවා) විශේෂඥ වෛද්‍ය හේමන්ත හේරත් මහතා පැවසුවේය.

එන්නත ගැනීමෙන් පසු පැය 48ක් පමණ ගත වන තෙක් ඇඟපත වේදනාව, උණ, හිසරදය, හන්දි වේදනාව, බඩේ වේදනාව යනාදී රෝග ලක්ෂණ ඇති වන බවද ඒ මහතා පැවසුවේය.

කොවිඩ් එන්නත ගැනීමෙන් පසු මරණ දෙකක් වූ බවට වන ප්‍රචාරයේ සත්‍යතාවක් නොමැති බවත් ඒ මහතා ප්‍රකාශ කළේය.

එන්නතක් ගත් පසු ඇති විය හැකි අතුරු ආබාධ සම්බන්ධයෙන් ලෝකයේ පිළිගත් ක්‍රමවේද පවතින අතර සිදුව ඇතැයි කියන මරණ සම්බන්ධයෙන් ඒ අනුව විමර්ශන කෙරෙන බවත් ඒ මහතා කියා සිටියේය.

# කොවිඩ් සිරුරු භූමදානයට හොඳම තැන මුසලි

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

කොරෝනා මළසිරුරු මිහිදන් කිරීම සඳහා ඉරණතිව් දූපත යොදා ගැනීම නිසා හටගෙන තිබෙන අර්බුදයට හොඳම විසඳුම එම මළසිරුරු මන්නාරමේ මුසලි ප්‍රදේශයේ මිහිදන් කිරීම බවට මුසලි ප්‍රාදේශීය සභාවේ සභාපති ඒ. ජී. එච්. සුබිකන් මහතා රජයට යෝජනා කොට තිබේ.

කොරෝනා මළ සිරුරු මිහිදන් කිරීම සඳහා මුලින්ම අදහසක් පැමිණි අවස්ථාවේදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ විශේෂඥ වෛද්‍ය කණ්ඩායමක් මන්නාරමේ මුසලි ප්‍රදේශයට පැමිණ කොරෝනා මළ සිරුරු මිහිදන් කිරීම සඳහා සුදුසු ස්ථානයක් හඳුනා ගෙන රජයට එම ස්ථානය පිළිබඳ තොරතුරු දැනුම් දී ඇතැයිද මුසලි ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ප්‍රකාශ කරයි.

තමන් මේ සම්බන්ධයෙන් ලිපියක් රාජ්‍ය බලධාරීන් වෙත යොමු කළ බවත් ඉරණතිව් දූපතේ කොරෝනා මළසිරුරු මිහිදන් කිරීමට යෑමේදී ඇති විය හැකි බරපතළ හා අවාසනාවන්ත තත්ත්වයන් මේ අවස්ථාවේදී වළක්වා ගත යුතු බවත් එම ලිපියේ සඳහන් කළ බවද සුබිකන් මහතා කියා සිටියේය.

කිළිනොච්චිය ඉරණතිව් දූපතේ ජීවත් වන වැසියන් සියලු දෙනාම දෙමළ වැසියන් වීම නිසා කොරෝනා මළසිරුරු මිහිදන් කිරීම සම්බන්ධයෙන් ඇති වන විරෝධය තව තවත් තීව්‍ර වීම හැරෙන්නට සහනයක් බලාපොරොත්තු විය නොහැකි බව පවසන සභාපතිවරයා ඉරණතිව් දූපතේ පළමු කොරෝනා මළ සිරුර භූමදානය කිරීමට පෙර රජය ඉතා ඉක්මන් හා බුද්ධිමත් තීරණයක් ගත යුතුව ඇති බවද පැවසීය.

# බඩ ඉරිඟු වගාවට දුන් ඉඩම් අයිති මහවැලියටයි

**නෙල්කා මැදගෙදර**

මහියංගනය රඹකැන් ඔය ආශ්‍රිතව බඩ ඉරිඟු වගා කිරීම සඳහා දී ඇත්තේ මහවැලි සංවර්ධන අධිකාරියට අයත් භූමි ප්‍රදේශයක් බව නීතිපතිවරයා අභියාචනාධිකරණයට ඊයේ (05) දන්වා සිටියේය.

ඒ සම්බන්ධ ඔප්පු ඇතුළු ලියකියවිලි ඉදිරියේදී අධිකරණයට ඉදිරිපත් කරන බවද නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි අතිරේක සොලිසිටර් ජෙනරාල් පාරින්ද රණසිංහ මහතා පැවසීය.

රඹකැන් ඔය ආශ්‍රිත වනාන්තරයේ ඇති සිය පාරම්පරික නිජ භූමියට අයත් අක්කර පන් දහසකට අධික ඉඩම් ප්‍රමාණයක් මහවැලි සංවර්ධන අධිකාරියට පවරාගෙන බඩ ඉරිඟු වගා කිරීම සඳහා මහා පරිමාණ පෞද්ගලික සමාගම්වලට දීම බල රහිත කරන රිට් ආඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලා ආදිවාසී නායක ඌරුවරිගේ වන්නිලැත්තෝ ඇතුළු තිදෙනකු ගොනු කළ රිට් පෙත්සම කැඳවූ අවස්ථාවේදී අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා මේ බව කීය.

අභියාචනාධිකරණ සභාපති විනිසුරු අර්ජුන ඔබේසේකර සහ විනිසුරු මායාදුන්නේ කොරයා යන මහත්වරුන් හමුවේ මේ පෙත්සම් කැඳවනු ලැබිණි.

එහිදී නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි අතිරේක සොලිසිටර් ජෙනරාල් පාරින්ද රණසිංහ මහතා අධිකරණයට කරුණු දක්වමින් කියා සිටියේ දැනට ලැබී ඇති තොරතුරු අනුව සිද්ධියට අදාළ භූමි ප්‍රදේශය මහවැලි සංවර්ධන අධිකාරියට අයිති බවය. ඒ සම්බන්ධයෙන් ලියකියවිලි ඉදිරි පත් කළ හැකි බවද ඒ මහතා සඳහන් කළේය.

පෙත්සමේ 6වෙනි වගඋත්තරකාර ආර්. ඒ. එන්. ප්ලාන්ටේෂන් සමාගම වෙනුවෙන් පෙනී සිටි නීතිඥ පුලස්ති රූපසිංහ මහතා කියා සිටියේ මහවැලි සංවර්ධන අධිකාරියට අයත් අක්කර 50ක් පමණක් එළි පෙහෙළි කොට අදාළ ව්‍යාපෘතිය සඳහා ගෙන ඇතත් පෙත්සම්කරුවන් කියනා පරිදි වන රක්ෂිතයකට හා වන ජීවීන්ට හානියක් වී නැති බවය.

මෙහිදී පෙත්සම්කාර පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ රවීන්ද්‍රනාත් දාබරේ මහතා අධිකරණයෙන් ඉල්ලා සිටියේ මේ භූමියේ කිසිදු කටයුත්තක් නොකරන ලෙස වගඋත්තරකරුවන්ට නියෝගයක් කරන ලෙසය.

ඊට පිළිතුරු දුන් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා දැනට මේ භූමියේ කිසිදු කටයුත්තක් සිදු නොවන බව සඳහන් කළේය.

# කොවැක්ස් පහසුකමේ පළමු මාත්‍රා තොගය හෙට මෙරටට

**මහින්ද අලුත්ගෙදර**

යුනිසෙෆ් ආයතනය කොවැක්ස් (COVAX) පහසුකම යටතේ දෙන ඇස්ට්‍රාසෙනිකා මාත්‍රා මිලියන 1. 44ක ප්‍රමාණයෙන් මාත්‍රා 264,000 ක තොගයක් හෙට (07) මෙරටට ලැබීමට නියමිතය.

යුනිසෙෆ් සංවිධානය විසින් වැඩිහිටි ජනගහනය සඳහා ප්‍රමුඛතාව දෙමින් කොවැක්ස් පහසුකම යටතේ මේ එන්නත් මිලියන 1. 44ක ප්‍රමාණය මෙරටට දීමට පියවර ගෙන තිබේ.

ඒ අනුව මේ මාත්‍රා තොගය එන්නත් කිරීමේ කාර්යය ලබන සතියේ සිට ආරම්භ කිරීමට නියමිතය.

සෞඛ්‍ය අමාත්‍යාංශය සහ COVAX පහසුකම අතර ඇති කර ගත් ගිවිසුමේ කොටසක් ලෙස සහ නිෂ්පාදකයන්ගෙන් ලැබෙන පරිදි සහ ලෝක සෞඛ්‍ය සංවිධානයේ හදිසි භාවිත ලැයිස්තුවෙන් බලය පැවරෙන පරිදි මාත්‍රා මිලියන 1.44 යුනිසෙෆ් ආයතනය විසින් 2021 මැයි මස අවසානය දක්වා අදියරෙන් අදියර මෙරටට දීමට නියමිතය.

# ඉරණතිව් භූමදානය ජාතිවාදයට පාර කැපීමක් - බිමල්

**නදී මාණික්කගේ**

කොවිඩ් මරණ ඉරණතිව්හි භූමදානය කිරීමට තීරණය කිරීම ජාතිවාදී ගැටුමක් නිර්මාණය කිරීමට පාර කැපීමක් බව ජනතා විමුක්ති පෙරමුණේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක මහතා දිනමිණට ඊයේ (05) පැවසුවේය.

මුස්ලිම් හා දෙමළ ජාතිවාදී ගැටුමක් නිර්මාණය වීමට මේ තීරණය හේතුවෙන් පිඹුරුපත් සැකසෙන බවත් අවුරුද්දක් පමණ මුස්ලිම් මරණ පුලුස්සා දැමූ ආණ්ඩුව ජිනීවාවලට බියෙන් මේ නව තීරණය ගෙන ඇති බවත් පැවසූ ඒ මහතා රජයෙහි වෛද්‍ය මතයට එරෙහි ප්‍රතිපත්ති හෙළා දකින බව කියා සිටියේය.

කල්මුනේ හා සම්මන්තුරේ යන ප්‍රදේශ මේ මරණ භූමදානයට මුස්ලිම් සංවිධාන විසින් එකඟතාව පළ කර තිබියදී කොළඹින් කිලෝමීටර 300ක් ඈත කුඩා දූපතක මේ කොවිඩ් මරණ භූමදානය කිරීමට තෝරා ගැනීම ගැටලුසහගත බවත් ලෝකයේ කිසිම රටක මෙවැනි දේ සිදු නොවන බවත් පැවසූ හෙතෙම නාසිවාදීන්ගේ ජාතිවාදී ක්‍රියාකලාපයට සමාන තත්ත්වයක් මෙහිදී හඳුනා ගත හැකි බව පැවසීය.

# අපරාධ මඬින්න සතියක් මෙහෙයුම්

**රුවන්ත නිතුල්ගස්පිටිය**

සංවිධානාත්මක අපරාධ, මත්ද්‍රව්‍ය ජාවාරම සහ කප්පම්කරුවන් මර්දනය කිරීමේ අරමුණින් පොලිස් විශේෂ කාර්ය බළකාය, යුද හමුදාව සහ පොලිසිය ඒකාබද්ධ කර දිවයින පුරා සතියක විශේෂ 'අපරාධ මඬින රැල්ලක්' ක්‍රියාත්මක කිරීමට මහජන ආරක්ෂක අමාත්‍යාංශය සැලසුම් කර තිබේ.

මහජන ආරක්ෂක අමාත්‍යාංශයේදී ඊයේ (5) පැවැති මාධ්‍ය හමුවකට එක්වෙමින් විෂය භාර ඇමැති රියර් අද්මිරාල් (විශ්‍රාමික) ආචාර්ය සරත් වීරසේකර මහතා මේ බව පැවසීය.

බුද්ධි අංශයන්ගේ පූර්ණ දායකත්වය සහ ජනතා සහයෝගයද සහිතව කිරීමට නියමිත මේ විශේෂ මෙහෙයුමට පොලිස් හදිසි දුරකථන අංක 118 සහ 119 ඔස්සේ තොරතුරු දීමට හැකියාව පවතින බවත් සාමාන්‍ය ජනතාවට බියක් සැකයක් නොමැතිව ජන ජීවිතය ගෙන යෑමට පහසුකම් සැලසීම මේ මෙහෙයුමේ අරමුණ බවත් ඇමැතිවරයා කීය.

# කළු අත්පටියක් පැලඳ කළු ඉරු දිනට සහාය දෙන්න

## අගරදගුරු පදවි පූජක සංඝය ඉල්ලයි

**වත්තල විශේෂ ජෝශප් පයස්**

'කළු ඉරු දින' ලෙස ප්‍රකාශයට පත් කළ 07 වැනි ඉරිදා (හෙට) 'පාස්කු ඉරිදා ප්‍රහාරය' පිළිබඳ සාමකාමීව විරෝධය දැක්වීම සඳහා ඉරිදා දේව මෙහෙයන්ට සහභාගි වන සියලු සැදැහැවතුන් කළු හෝ සුදු ඇඳුමින් සැරසී කැමති අයට කළු අත්පටියක් පැලඳ සහභාගි වන ලෙස අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ප්‍රමුඛ කොළඹ අගරදගුරු පදවි පූජක සංඝය මඟින් විශේෂ නිවේදනයක් නිකුත් කරමින් දැනුවත් කොට ඇත.

කොළඹ අගරදගුරු පදවියට අයත් කොළඹ, කළුතර හා ගම්පහ යන පරිපාලන දිස්ත්‍රික් බල ප්‍රදේශයේ සියලු දෙව්මැදුරුවල ඉකුත් ඉරිදා (පෙබ. 28දා) දේව මෙහෙයන්හිදී මේ විශේෂ නිවේදනය අදාළ මීසම්පති පියවරුන් මඟින් එම මීසම්වල කිතුනු සැදැහැවතුන් හට දැනුවත් කෙරුණි.

පාස්කු ඉරිදා ඝාතන සැලැසුම් මෙහෙය වූ මහ මොළකරුවන් කවුරුන්ද යන්න සොයා බැලීමට පත් කළ ජනාධිපති පාස්කු කොමිසමේ වාර්තාව පිළිබඳ කතෝලික සභාව පූර්ණ ලෙස සෑහීමට පත් නොවන බැවිද එම නිවේදනයෙන් පෙන්වා දෙනු ලැබිණි.

ලබන මස අප්‍රේල් 21 දින දෙවැනි වර්ෂ පූර්ණ සිහි කිරීම පවත්වන්නට පෙර අමු අමුවේ ඝාතනය කරනු ලැබූ අහිංසක සොයුරු සොයුරියන්ට යුක්තිය හා සාධාරණත්වය අදාළ බලධාරීන්ගෙන් ඉල්ලා සිටින බවත්, එසේ නොවුණහොත් ජාතික මට්ටමින් මේ විරෝධතා වැඩපිළිවෙළ අඛණ්ඩව කරන බවත් එම විශේෂ නිවේදනයෙන් වැඩි දුරටත් දැනුවත් කර තිබිණි.

1 පිටුවෙන් ...

## ගුවන් හමුදාවේ ...

ජාතියේ සුරක්ෂිතභාව අඛණ්ඩව රැක ගැනීම ගුවන් හමුදාව ඇතුළු සන්නද්ධ සේවාවන්හි මූලික වගකීම බව කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරේ පැවති ජනාධිපති වර්ණ ප්‍රදානෝත්සවය අමතමින් ජනාධිපතිවරයා එසේ සඳහන් කළේය.

'සුරකිමු ලකඹර' තේමා කර ගනිමින් දශක 07ක ප්‍රෞඩ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අංක 05 ප්‍රහාරක ගුවන් බලඝනයට සහ අංක 06 ප්‍රවාහන හෙලිකොප්ටර් යානා බලඝනයට රාජපක්ෂ මහතා අතින් වර්ණ ප්‍රදානය කළේය.

සේනාධිනායකයා සන්නද්ධ හමුදාවකට පිරිනමන ඉහළම ගෞරව සම්මානය ජනාධිපති වර්ණ ප්‍රදානය වන අතර මේ සමඟ ශ්‍රී ලංකා ගුවන් හමුදාව ජනාධිපති වර්ණ 13කින් පිදුම් ලබා ඇත.

මනුෂ්‍යත්වයේ අගය වටහාගත් අව්‍යාජ ජාත්‍යන්තර සහයෝගීතාව තුළින් දේශ සීමාවෙන් ඔබ්බට පැතිරෙන අභියෝගයනට සාර්ථකව මුහුණ දිය හැකි බව පෙන්වා දුන් ජනාධිපතිවරයා සංකීර්ණ ගෝලීය පරිසර අභියෝග ජය ගැනීමට මනාව සූදානම් වීමේ අවශ්‍යතාව අවධාරණය කළේය.

ගුවන් හමුදාවේ 70 වැනි සංවත්සරය වර්ණවත් කිරීමට පැමිණි විදේශීය ගුවන් හමුදා සාමාජිකයන්ට ප්‍රශංසාව පුද කළ රාජපක්ෂ මහතා ජාතීන් අතර මිත්‍රශීලි සබැඳියාව එමගින් ප්‍රදර්ශනය වන බවත්, එම බැඳීම් අඛණ්ඩව පවත්වාගෙන යමින් තවදුරටත් ශක්තිමත් කළ යුතු බවත් සඳහන් කළේය.

වර්ණ ප්‍රදානයෙන් අනතුරුව කටුනායක මූලික ගුවන් කඳවුරේ සී-130 කඳවුරේ අංක 02 සහ අංක 05 බලඝන ජනාධිපතිවරයා විසින් නිරීක්ෂණය කළේය.

ඉන්දීය ගුවන් හමුදාවට අයත් ගුවන් යානා නිරීක්ෂණය කළ රාජපක්ෂ මහතා ගුවන් නියමුවන් සමඟ සමූහ ඡායාරූපයකට පෙනී සිටියේය.

'ගුවන් හමුදාවේ 70 වසරක ගුවන් බලය' තේමා කොට ගෙන එයාර් කමාන්ඩර් කොමදෝරු චන්න දිසානායක මහතා විසින් රචිත ග්‍රන්ථය ජනාධිපතිවරයා වෙත පිළිගන්වනු ලැබිණි.

ගුවන් හමුදාපති එයාර් මාර්ෂල් සුදර්ශන පතිරණ මහතා ජනාධිපතිවරයා වෙත සමරු තිළිණයක් පිළිගැන්වූ අතර ගුවන් හමුදා අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ ඡායාරූපයකට පෙනී සිටීමෙන් අනතුරුව හෙතෙම ශ්‍රී ලංකා ගුවන් හමුදා විශේෂ අමුත්තන්ගේ සමරු පොතෙහි සටහනක් තැබීය.

බස්නාහිර පළාත් ආණ්ඩුකාර මාර්ෂල් ඔෆ් ද එයාර් ෆෝස් රොෂාන් ගුණතිලක, ආරක්ෂක ලේකම් විශ්‍රාමික ජෙනරාල් කමල් ගුණරත්න, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි සහ යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා, නාවික හමුදාපති වයිස් අද්මිරාල් නිශාන්ත උළුගේතැන්න, ගුවන් හමුදාපති එයාර් මාර්ෂල් සුදර්ශන පතිරණ, පොලිස්පති සී. ඩී. වික්‍රමරත්න යන මහත්වරු සහ බංග්ලාදේශ, පාකිස්තාන, එක්සත් ජනපද ෆැසිපික් ගුවන් හමුදා ප්‍රධානීහු, හිටපු ගුවන් හමුදාපතිවරු සහ ගුවන් හමුදාවේ ජ්‍යෙෂ්ඨ සහ සෙසු නිලයන්, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

# ශ්‍රීලනිපයට කළමනාකාර කමිටුවක්

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සඳහා නව කළමනාකාර කමිටුවක් පත් කිරීමට තීරණය කර තිබේ.

පක්ෂ සභාපති හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ප්‍රධානත්වයෙන් ඊයේ (04) රාත්‍රියේ රැස්වූ පක්ෂයේ නියෝජිත හමුවේදී මේ පියවර ගත් බව පාර්ලිමේන්තු මන්ත්‍රී ශාන් විජේලාල් ද සිල්වා මහතා ප්‍රකාශ කළේය.

අදාළ හමුවෙන් අනතුරුව මාධ්‍ය වෙත අදහස් දැක්වූ ශාන් විජේලාල් ද සිල්වා මන්ත්‍රීවරයා පැවසුවේ පක්ෂයේ සංවිධාන වැඩපිළිවෙළ ශක්තිමත් කිරීමේ අරමුණින් මේ වන විට තීරණ රැසක් ගෙන ඇති බවය.

"නව නිලධාරි මණ්ඩලය පත් වෙලා ප්‍රථම වතාවට පක්ෂයට නව කළමනාකාර කමිටුවක් පත් කර ගනු ලැබුවා. ඉදිරි වසරක් එකහමාරක කාලයක් තුළ නිශ්චිත වැඩපිළිවෙළක් පසුවිපරම් සහිතව ක්‍රියාත්මක කරන්නයි අපේක්ෂා කරන්නේ."

මෙහිදී මාධ්‍ය වෙත අදහස් දක්වමින් රාජ්‍ය ඇමැති දුමින්ද දිසානායක මහතා පැවැසුවේ ආණ්ඩුවෙන් ඉවත්වීමේ කිසිදු සාකච්ඡාවක් මෙතෙක් පක්ෂය තුළ නොමැති බවය.

## කුරුවිට තරුණියගේ හිස ...

ඝාතක උප පොලිස් පරීක්ෂකවරයා මාර්තු 1 වැනිදා සවස 4.10ට පමණ කොළඹ පෞද්ගලික බස් නැවතුම් පොළෙන් මොනරාගල දක්වා ධාවනය වන බස් රථයකට නැග තිබුණු බව සී. සී. ටී. වී. දර්ශන ඔස්සේ පොලිසිය කරන ලද විමර්ශන අනුව අනාවරණය වී ඇත. එම බස් රථයේ යන විට උප පොලිස් පරීක්ෂකවරයාගේ කරේ තවත් මල්ලක් එල්ලාගෙන යන බවට සී. සී. ටී. වී. දර්ශන මගින් අනාවරණය කර ගෙන තිබුණි.

පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති, නීතිඥ අජිත් රෝහණ මහතා පැවසුවේ අදාළ බස් රථය එදින රාත්‍රියේ පැල්මඩුල්ල ප්‍රදේශයේදී ආහාර ගැනීම සඳහා නවතා ඇති බවය.

රාත්‍රි 11. 30ට පමණ බුත්තල නගරයෙන් ඔහු බස් රථයෙන් බැස ඇති බවටද අනාවරණය වී තිබේ.

ඒ සම්බන්ධ ඇතැම් සී. සී. ටී. වී. දර්ශන මේ වන විට ලැබී ඇති බවත් ඒ ඔස්සේ පොලිස් විමර්ශන සිදු කෙරෙන්නේ ඔහු පැළඳ සිටින බෑගයේ ඝාතනයට ලක්වූ කාන්තාවගේ හිස තිබුණේ දැයි අනාවරණය කර ගැනීමේ අරමුණින් බව පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පැවසීය. මේ වන විට ඔහු ගමන් ගත් සහ බසය නැවැත්වූ ස්ථානයන්ද පොලිසියේ දැඩි විමර්ශනයකට ලක් වෙමින් පවතී.

සිය දිවි නසා ගත් උප පොලිස් පරීක්ෂකවරයා නිවෙසට පැමිණෙන අවස්ථාවේ හැඳ සිටි යැයි සැක කෙරෙන කමිසයක් පුලුස්සා දමා තිබියදී ඔහුගේ වත්තේ තිබී පොලිසිය විසින් සොයාගෙන ඇත.

මීට කලින් ඔවුන් දෙදෙනා ලැගුම් ගත් නවාතැන කැලණි ගඟට සමීපව පිහිටි එකක් නිසා කැලණි ගඟ සහ අවට ප්‍රදේශයේද මේ කාන්තාවගේ හිස ඇති දැයි සොයා පොලිසිය විසින් විමර්ශන කරන ලද අතර මේ වන තුරුත් හිස සම්බන්ධ පැහැදිලි තොරතුරක් අනාවරණය කර ගෙන නොතිබුණි.

## 'ගම සමඟ පිළිසඳර' ...

දිස්ත්‍රික්කයේ මැති ඇමැතිවරු ප්‍රමුඛ මහජන නියෝජිතයන්, අමාත්‍යාංශ ලේකම්වරුන්, විවිධ ආයතන ප්‍රධානීහු සහ නිලධාරීහු ජනාධිපතිවරයා සමඟ ඊට එක් වෙති.

දේශපාලන බලධාරීන් හා නිලධාරීන් කැටුව ගමට ගොස් ගැමි ජනතාව පෙළෙන ආර්ථික සමාජ ගැටලු සියැසින් දැක ඒවාට සවන් දී කඩිනම් විසඳුම් දීමෙන් ග්‍රාමීය ජනතාවගේ අභිවෘද්ධිය සැලසීමේ අරමුණ ඇතිව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් මේ වැඩසටහන සැලසුම් කර තිබේ.

ගැමි ජනතාව පීඩාවට පත් කරන ප්‍රශ්න එක් පාර්ශ්වයක කෝණයෙන් පමණක් බලා තේරුම් කිරීම විසඳුම් පමාවට හේතුවක් බව ජනාධිපතිවරයා අදහස් කරයි. නිලධාරීහු එක් ආකාරයකටත්, ගැමියෝ තවත් ආකාරයකටත් ප්‍රශ්නය දකිති. ප්‍රශ්නයේ සියලු පැති නිවැරදිව හඳුනා ගැනීමෙන් විසඳුම් දීම පහසු බවත්, කඩිනම් කළ හැකි බවත් ජනාධිපතිවරයා පෙන්වා දෙයි. මෙතෙක් පැවති 'ගම සමඟ පිළිසඳර" වැඩසටහන්වලදී මේ මාදිලිය උපයෝගි කර ගනිමින් ප්‍රශ්න ගණනාවකට එසැණින් සහ පසුකාලීන විසඳුම් දීමට හැකි විය.

ගිරිබාව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් ගම්මානවල ජනතාව පොදු ප්‍රශ්න රැසකින් පීඩා විඳින අතර පානීය සහ වගා ජල හිඟය, වන අලි උවදුර, මාර්ග හා ප්‍රවාහන දුෂ්කරතා, වැව් අමුණු කැඩ බිඳී යෑම, පාරම්පරික වගා ඉඩම් නිරවුල් කර ගැනීම, අධ්‍යාපන හා සෞඛ්‍ය අවශ්‍යතා සපුරා ගැනීම, යටිතල පහසුකම් ඌනතා ඒ අතර ප්‍රධාන තැනක් ගනී.

# කාන්තා හිංසන පිටු දකින්න පනතකට යෝජනා

**අසේල කුරුළුවංශ**

සේවා ස්ථාන තුළදී කාන්තාවන්ට වන හිංසන පිටු දැකීම සඳහා පනතක් ගෙන ඒම පිණිස වන යෝජනාවක් අන්තර්ජාතික කාන්තා දිනයට සමාගාමීව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බව මාතලේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහිණී කවිරත්න මහත්මිය පවසයි.

වැඩ කරන කාන්තාවන්ගේ ලෝකයේ ප්‍රචණ්ඩත්වය සහ ලිංගික හිරිහැර අවසන් කිරීම සඳහා අන්තර්ජාතික කම්කරු සම්මේලනයේ 108 වැනි සංවත්සරයේදී ජත්‍යන්තර කම්කරු සංවිධනය විසින් සී.190 නම් සම්මුත්තිය ඉදිරිපත් කළ බවත් එය මෙරට තුළ බලාත්මක කිරීම මඟින් කාන්තාවන්ට වැඩ බිමේදී වන හිංසන පිටු දැකීමට හැකි වනු ඇති බවත් ඇය පැවසුවාය.

අන්තර්ජාතික කාන්තා දිනය නිමිත්තෙන් මහනුවර රජන හෝටලයේදී පෙරේදා (04) පැවැති උත්සවයකදී මන්ත්‍රීවරිය මේ බව ප්‍රකාශ කළාය. එක්සත් ජාතික පක්ෂයේ මහනුවර දිස්ත්‍රික් නායිකා ශාන්තිනී කෝන්ගහගේ මහත්මිය විසින් මේ උත්සවය සංවිධාන කර තිබිණි.

## මේ වසර අවසානයේ ...

මේ වන විට රටේ විදුලිය අවශ්‍යතාවයෙන් සියයට 99.8 කට විදුලිය දී අවසන් බව පෙන්වා දෙන ඒ මහතා තවත් පවුල් 84,000 කට පමණ විදුලිය දිය යුතු බවද මේ වසර අවසන් වන විට මෙරට විදුලිය දීමේ වැඩපිළිවෙළ සියයට 100කින් අවසන් කිරීමට බලාපොරොත්තු වන බවද සඳහන් කරයි.


අගමැතිවරයා මේ බව සඳහන් කළේ කෙරවලපිටියේ ඉදි වන ශ්‍රී ලංකාවේ පළමු ස්වභාවික ද්‍රව වායු (LNG) විදුලි බලාගාරය සඳහා මුල්ගල තැබීමේ අවස්ථාවට ඊයේ (05) පෙරවරුවේ එක්වෙමිනි.

ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 350ක් එක්ව මේ විදුලි බලාගාරයේ පළමු අදියරේ කටයුතු මාස 21ක් තුළ නිමා කිරීමට නියමිතව තිබෙන අතර එම අදියරේදී මෙගාවොට් 220ක් ද තවත් මාස 12ක් තුළ අවසන් වන මේ ව්‍යාපෘතියේ දෙවැනි අදියරේදී මෙගාවොට් 130ක් ද ජාතික විදුලිබල පද්ධතියට එක්වීමට නියමිතය.

## දහම් පාසල් අවසාන ...

අයදුම්කරුවන්ගේ ප්‍රවේශ පත්‍ර මේ වන විට තැපැල් කර යවා ඇති අතර, එසේ නොලැබුණු අපේක්ෂකයකු වෙතොත් වෙබ් අඩවියට පිවිස තම ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදිව ඇතුළත් කිරීමෙන් බාගත කර ගැනීමට පහසුකම් සලසා ඇති බව විභාග දෙපාර්තමේන්තුව පවසයි. මේ සම්බන්ධ විමසීම් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවේ 0112785230, 0112786150 දුරකථන අංක ඇමතීමෙන් කළ හැකිය.

# පරකන්දෙණියේ ධීරානන්ද හිමිගේ මෑණියන්ගේ අවසන් කටයුතු හෙට



ගම්පහ අමුණුගොඩ ශ්‍රී පරාක්‍රමබාහු රාජමහා විහාරාධිකාරි පරකන්දෙණියේ ධීරානන්ද හිමියන් ඇතුළු සහෝදර සහෝදරියන්ගේ මෑණියන් වන ඇස්.ඒ.සීලවතී මහත්මිය අභාවප්‍රාප්ත වූවාය. දේහය පිළිබඳ අවසන් කටයුතු හෙට (07) සවස සිදු කෙරේ.

## මානව හිමිකම් කවුන්සිලයේදී ...

ශ්‍රී ලංකාව තම රටේ සමීපතම මිතුරකු වන අතර ජගත් මානව හිමිකම් කවුන්සලයේදී පමණක් නොව අන්තර්ජාතික වශයෙන් අවශ්‍ය ඕනෑම සහායක් දීමට තම රට සූදානම් බව චීනයේ විදේශ සබඳතා නියෝජ්‍ය ඇමැති ලුඕ ෂාඕහුයි මහතා චීනයේ ශ්‍රී ලංකා තානාපති ආචාර්ය පාලිත කොහොන මහතා හමුවේ ප්‍රකාශ කර තිබේ. බීජිං හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ පැවැති මේ හමුවේදී කොරෝනා වසංගත තත්ත්වය කළමනාකරණයට සහාය දීමට සහ මෙරට සංචාරක කර්මාන්තය ඉහළ නැංවීමට අවශ්‍ය සහාය දෙන බවටද චීන විදේශ සබඳතා නියෝජ්‍ය ඇමැතිවරයා ප්‍රකාශ කර ඇත.

## කොවිඩ් සිරුරු 2ක් ...

කොවිඩ් 19 වයිරසය හේතුවෙන් මියගිය පුද්ගලයන් දෙදෙනකුගේ දේහයන් සෞඛ්‍ය නිර්දේශ යටතේ භූමදාන කටයුතු කළ බව එම මධ්‍යස්ථානයේ ප්‍රධානි යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා දිනමිණට ඊයේ (5) පැවසීය.

1 පිටුවෙන් ...

## 'මියන් කුමාර'...

අභියාචනාධිකරණ සභාපති විනිසුරු අර්ජුන ඔබේසේකර සහ විනිසුරු මායාදුන්නේ කොරයා යන මහත්වරුන් හමුවේ මේ පෙත්සම කැඳවනු ලැබිණි

විනිවිද පෙරමුණේ මහ ලේකම් නාගානන්ද කොඩිතුවක්කු මහතා විසින් මේ පෙත්සම ගොනු කර තිබේ.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් චන්දන සූරිය බණ්ඩාර, පොලිස්පති චන්දන වික්‍රමරත්න, බෙල්ලන්විල රජ මහ විහාරාධිපති බෙල්ලන්විල ධම්මරතන හිමි මෙහි වගඋත්තරකරුවෝ වෙති.

නාගානන්ද කොඩිතුවක්කු මහතා පෙත්සම්කරු වෙනුවෙන් පෙනී සිටියේය.

## පාස්කු දා ප්‍රහාරයට පෙර ...

මේ කඩු තොගයක් මෙරටට ගෙන ඒමේ සිද්ධිය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වන ලෙස ඉල්ලා කොළඹ අගරදගුරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ගොනු කළ රිට් පෙත්සම කැඳවූ අවස්ථාවේදී අභියාචනාධිකරණය මේ නියෝගය කරන ලදි.

අභියාචනාධිකරණ සභාපති විනිසුරු අර්ජුන ඔබේසේකර සහ විනිසුරු මායාදුන්නේ කොරයා යන මහත්වරුන් හමුවේ මේ පෙත්සම කැඳවනු ලැබිණි.

එහිදී නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥ ආචාර්ය අවන්ති පෙරේරා සඳහන් කළේ මේ පෙත්සමේ වගඋත්තරකාර ආරක්ෂක ලේකම් සහ පොලිස්පති වෙනුවෙන්ද තමන් පෙනී සිටින බවය. මේ පෙත්සමට පාදක වන කරුණ සම්බන්ධයෙන් වන විමර්ශන පිළිබඳ ඔවුන්ගේ උපදෙස් ගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කල් දෙන ලෙස ඇය අධිකරණයෙන් ඉල්ලා සිටියාය. මෙහිදී පෙත්සම්කාර කාදිනල් හිමි වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මහතා සඳහන් කළේ පාස්කු දින වූ ත්‍රස්ත ප්‍රහාරය සම්බන්ධයෙන් කොමිෂන් වාර්තාව සිය සේවාදායකයාට ලැබී ඇති බවය.

එම ප්‍රහාරයට පෙර මේ කඩු තොගය මෙරටට ආනයනය කර ඇති බවට තොරතුරු ලැබී ඇති නිසා ඒ පිළිබඳ විමර්ශනය කිරීම අත්‍යවශ්‍ය බවද ඒ මහතා සඳහන් කළේය. කරුණු සලකා බැලූ අධිකරණය අදාළ උපදෙස් ගැනීමට මේ මස 31 වැනිදා තෙක් කල් දීමට තීරණය කළේය.

මේ පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස පොලිස්පති සී. ඩී. වික්‍රමරත්න, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නිශාන්ත සොයිසා, ආරක්ෂක ලේකම් ජනරාල් කමල් ගුණරත්න, ජාතික බුද්ධි සේවා ප්‍රධානි ජීවන රුවන් කුලතුංග, රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂ සුරේෂ් සාලේ, රේගු අධ්‍යක්ෂ ජනරාල් මේජර් ජනරාල් විජිත රවිප්‍රිය යන මහත්වරුන් නම් කරනු ලැබ සිටිති.

## ග්‍රෑන්ඩ්පාස් ...

මෙසේ අත්අඩංගුවට ගත් දුම්වැටිවල වටිනාකම රුපියල් කෝටි 9ක් බව රේගු අධ්‍යක්ෂ ජනරාල් විජිත රවිප්‍රිය මහතා ප්‍රකාශ කළේය. යකඩ බටවල සඟවා කාටුන් 18,000ක් පමණ මෙරටට ගෙන්වා ඇති බවත් එම දුම්වැටි තොගය චීනයේ සිට මෙරටට ප්‍රවාහනය කර ඇති බවත් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා කියා සිටියේය. මෙලෙස නීති විරෝධි අයුරින් යකඩ බටවල සඟවා ගෙන්වන ලද දුම්වැටි තොගය අඩංගු බහාලුම නිදහස් කර ගැනීමට පැමිණි පුද්ගලයකුද අත්අඩංගුවට ගෙන ඇති අතර ඔහුගෙන් ප්‍රකාශ ගන්නා බව රේගුව කියා සිටි අතර සිද්ධිය සම්බන්ධයෙන් රේගු පරීක්ෂණ සිදු කෙරේ.

# ගම්පොළ නගරයට නවීන සහසුකම්වලින් සමන්විත අධිකරණ සංකීර්ණයක්

## රාජ්‍ය ඇමැති අනුරාධ ජයරත්නගේ මැදිහත් වීමෙන් ඉදි කිරීම් කඩිනම් වෙයි

**නුවන් කොඩිකාර**

වත්මන් ආණ්ඩුව බලයට පත්වීමත් සමඟ සෑම අංශයකම සංවර්ධනය වේගවත් කර තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස ගම්පොළ නගරයේ දැනට පවතින අධිකරණ සංකීර්ණය වෙනුවට නවීන පහසුකම්වලින් සමන්විත අධිකරණ සංකීර්ණයක් ඉදිකරමින් පවතී. 1939 වසරේ ඉදිකළ ගම්පොළ අධිකරණ සංකීර්ණයේ මේ වන විට ප්‍රමාණවත් පහසුකම් නැති බව එහි නීතිඥ සංගම් පෙන්වාදීමත් සමඟ ඊට අවධානය යොමු කළ ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය ඇමැති, නීතිඥ අනුරාධ ජයරත්න මහතාගේ සෘජු මැදිහත්වීමෙන් නව අධිකරණ සංකීර්ණය ඉදිකිරීම කඩිනම් කර ඇත.විශේෂයෙන්ම දැනට පවතින අධිකරණ සංකීර්ණයේ සිවිල් නඩු සහ අපරාධ නඩු කටයුතු විභාග කිරීමත්, ප්‍රමාණවත් පහසුකම් නැති වීමත් හේතුවෙන් එහි සේවය සපයන නීතිඥවරුන් මෙන්ම සේවය ලබාගැනීමට පැමිණෙන ජනතාව ද දැඩි අපහසුතාවන්ට පත්ව සිටිති. මේ සියලු කරුණු සැලකිල්ලට ගනිමින් ගම්පොළ නව අධිකරණ සංකීර්ණයක් ස්ථාපිත කිරීමට රජය තීරණය කළේය. ඒ අනුව ගම්පොළ පිහිටි සියලුම රාජ්‍ය ආයතන හා සේවා සපයන ස්ථාන නවීන පහසුකම්වලින් සමන්විතව සංවර්ධනය කිරීම සිය ඉලක්කය බව අනුරාධ ජයරත්න මහතා පැවසීය. තමන්ට ද නීතිඥවරයකු ලෙස අධිකරණවල ඇති පහසුකම් පිළිබඳ හොඳ අවබෝධයක් තිබෙන නිසා ගම්පොළ නීතිඥ සංගමය සමඟ කළ ඉල්ලීමට අනුව නව අධිකරණ සංකීර්ණය කඩිනමින් ස්ථාපිත කිරීමටත්, එහි යාබදව නීතිඥවරුන්ට කාර්යාල සංකීර්ණයක් ලබාදීමටත් හැකිවීම මහත් සතුටට කරුණක් බව කීය.

1939 වසරේ ඉදිකළ අධිකරණ සංකීර්ණයක් තමයි ගම්පොළට තිබෙන්නේ. ඒකේ පහසුකම් ඉතාමත් අවමයි. ඒ නිසා අප විශේෂ ඉල්ලීමක් කළා. නව අධිකරණ සංකීර්ණයක් ලබාදෙන්න කියා. මෙය කාලයක් තිස්සේ කළ ඉල්ලීමක්. ඒ සඳහා භූමි භාගයක් තිබුණේ නැහැ. එවකට හිටපු අගමැති දි.මු. ජයරත්න මහතාගේ මඟපෙන්වීමත් අනුරාධ ජයරත්න මහතාගේ මැදිහත්වීමත් සමඟ 2013 වසරේදී දැනට අධිකරණ සංකීර්ණය ඉදිවන භූමිය අත්පත් කරගෙන තිබෙන්නේ. ඒ වගේම 2016 මුල්ගල තැබීමක් සිදුවුණත් නීතිඥ කාර්යාල සඳහා එහි ස්ථානයක් තිබුණේ නැහැ. අනුරාධ ජයරත්න මහතා සමඟ කළ සාකච්ඡා මත තමයි අධිකරණ සංකීර්ණයට යාබදව නීතිඥ කාර්යාල ලබාදෙන්න කටයුතු කළේ. එම කාර්යාල සංකීර්ණය ඉදිකිරීමට අධිකරණ ඇමැතිවරයාගේ සහභාගිත්වයෙන් 2021 පෙබරවාරි 02 මුල්ගල තැබුවා. කාර්යාල 64 ක් සකස් කරන්න යෝජනා වී තිබෙනවා. එම ස්ථානය ලබාදීම සම්බන්ධව රාජ්‍ය ඇමැති අනුරාධ ජයරත්න මහතාට අපගේ ස්තූතිය පිරිනමනවායැයි ගම්පොළ නීතිඥ සංගමයේ සභාපතිනි හිමාලි දෙහිගලගේ මහත්මිය පැවසුවාය.

නීතිඥයකු ලෙස නව අධිකරණ සංකීර්ණයේ වැදගත් බව ප්‍රායෝගිකව අවබෝධ වුණේ මහනුවර සහ ගලගෙදර නව අධිකරණ සංකීර්ණවල වැඩ කිරීමෙන්. අධිකරණ ශාලා නිහඬ වුවත් අධිකරණ පද්ධතියේ සේවයේ යෙදෙන විනිසුරුවරුන්, නීතිඥවරුන්, කාර්ය මණ්ඩලය සහ ජනතාව අභ්‍යන්තරව කලබලකාරී මානසිකත්වයකින් තමයි සිටින්නේ. ඒ නිසා මූලිකව ඔවුන්ට ලබාදෙන පහසුකම් සහ මානසිකව සහනශීලී වටපිටාවක් වැදගත් වෙනවායැයි නීතිඥ සුපුන් රාජපක්ෂ මහතා පැවසීය. වර්ධනය වන නඩු ප්‍රමාණය සහ සහභාගි වන මහජන සංඛ්‍යාව නිසා අධිකරණ ශාලා මෙන්ම එහි පහසුකම් වල ප්‍රමාණවත් වර්ධනයක් විය යුතුයැයි ද හෙතෙම කියා සිටියේය. එසේම අධිකරණ සංකීර්ණයට යාබදව ඉදිවන නීතිඥ කාර්යාල සංකීර්ණය ද නීතිඥවරුන් ලෙස අපගේ වෘත්තීය ගෞරවනීය ලෙස පවත්වාගෙන යන්න මහෝපකාරී වෙනවා. ඒ සඳහා ශක්තිය දුන් රාජ්‍ය ඇමැති අනුරාධ ජයරත්න මහතාට අපගේ ස්තූතිය පුදකර සිටිනවායැයි ද රාජපක්ෂ මහතා කීය.



නීතිඥ සුපුන් රාජපක්ෂ

# දහම් පාසල් අවසානය ලියන අපේක්ෂකයන්ට නොමිලේ සම්මන්ත්‍රණයක් අද-හෙට

දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාග අපේක්ෂකයන් වෙනුවෙන් නොමිලේ පැවැත්වෙන දෙදින උපකාරක සම්මන්ත්‍රණය කළුතර බෝධි භාරකාර ධර්මශාලාවේදී අදත් හෙටත්(06- 07) පැවැත්වේ.

2019 මාර්තු මාසයේ පැවැත්වීමට නියමිතව තිබූ දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය කොරෝනා වසංගතය හේතුවෙන් කල්දමා තිබූ අතර එය ලබන 13 හා 14 දෙදින පැවැත්වීමට විභාග කොමසාරිස්වරයා තීරණය කර ඇත.

දහම් පාසල් නොපැවැත්වීම හේතුවෙන් මග හැරුණු විෂය කරුණු මේ සම්මන්ත්‍රණයේදි සාකච්ඡා කරන බව ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරි ගෝනදූවේ ගුණානන්ද හිමියෝ පැවසූහ.

කළුතර උතුර ශාසනාරක්ෂක බල මණ්ඩලය සංවිධානය කරන මේ සම්මන්ත්‍රණය පිළිබඳ දහම් පාසල් ප්‍රධාන ආචාර්යවරුන්ට,විභාග අපේක්ෂකයන්ට දුරකථන අංක 0382232205 හෝ 0382232868 ඇමතීමෙන් වැඩි විස්තර ලබා ගත හැකිය.

# කුලරත්න මැදි විදුහලේ හෙට ලේ දන් දීමේ පින්කමක්

ගොඩකවෙල කුලරත්න මධ්‍ය මහා විද්‍යාලයේ හෙට (07) ලේ දන් දීමේ පින්කමක් පැවැත්වේ.

විද්‍යාල පරිශ්‍රයේ එදින දවස පුරා පැවැත්වෙන ලේ දන් දීමේ පින්කම ආදී ශිෂ්‍යයන් විසින් සංවිධාන කරනු ලැබේ.


## ගොවි සෙත නිල ප්‍රතිඵල

NLB NATIONAL LOTTERIES

දිනුම් වාරය 2711 | දිනුම් අදින ලද දිනය 2021 / 03 / 04

ඉංග්‍රීසි අක්ෂරය: W | ජයග්‍රාහී අංක: 10 37 68 73

| | සංයෝගය | තෑගි මුදල | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 ත්‍යාගය | අංක 4 ම නිවැරදි | රු. 1,000,000.00 | - |
| 2 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමග අංක 3 ක් නිවැරදි | රු. 100,000.00 | 10 |
| 3 ත්‍යාගය | අංක 3 ක් පමණක් නිවැරදි | රු. 2,000.00 | 186 |
| 4 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමග අංක 2 ක් නිවැරදි | රු. 1,000.00 | 409 |
| 5 ත්‍යාගය | අංක 2 ක් පමණක් නිවැරදි | රු. 100.00 | 10,337 |
| 6 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමග අංක 1 ක් නිවැරදි | රු. 40.00 | 6,829 |
| 7 ත්‍යාගය | අංක 1 ක් පමණක් නිවැරදි | රු. 20.00 | 170,767 |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් නිවැරදි | රු. 20.00 | 31,149 |

මෙම දිනුම් වාරයේ බිහි වූ ජයග්‍රාහකයන් ගණන 219,687

මෙවර දිනා ඇති මුළු තෑගි මුදල
රු. 7,126,180.00

ලබන දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය
රු. 70,171,482.40

ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6කෙ කාල සීමාවකට පමණි. රුපියල් ලක්ෂ 05 ට වැඩි ත්‍යාග රජයේ බදු නීති වලට යටත්වේ. ත්‍යාග මුදල් ලබා ගැනීමේ දී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යවේ.



ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
නො. 32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන : 0114 607 000, 0112 324 324
ෆැක්ස් : 0114 663 416 වෙබ් : www.nlb.lk




# කලාකෙත අස්වැද්දීමට සුසැදි කොළඹ සරසවියේ සංස්කෘතික මධ්‍යස්ථානය

**(කොළඹ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික මධ්‍යස්ථානයට හෙටට (07) විසිවසරක් සපිරෙයි. මේ ලිපිය ඒ නිමිත්තෙනි.)**

සාරධර්ම පිරි සමාජයක් බිහි කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන වර්ෂ 2001 ක් වූ මාර්තු මස 07 වැනි දින හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ මඟපෙන්වීම මත කොළඹ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික මධ්‍යස්ථානය ස්ථාපිත කෙරිණි. හරවත් තුලනාත්මක සංවර්ධනයක් උදෙසා වූ ක්‍රියාවලියට සමගාමීව සංස්කෘතිය නගා සිටුවීමේ අරමුණ ද බද්ධ කර ගැනීමේ වැදගත්කම හඳුනාගෙන සංස්කෘතික සංරක්ෂණය ප්‍රවර්ධනය හා ව්‍යාප්තිය සඳහා දිවයින පුරා සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීමේ වැඩපිළිවෙළ ක්‍රියාවට නැංවිණි. ඒ අනුව සංස්කෘතික කටයුතු ඇමැති මො.කු. ගොපල්ලව මහතාගේ සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය ඇමැති ටී. බී. ඒකනායකගේ මහත්වරුන්ගේ උපදේශකත්වයෙන් කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපතිනි මහාචාර්ය සාවිත්‍රි ගුණසේකර මහත්මියගේ මෙහෙයවීමෙන් කොළඹ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික මධ්‍යස්ථානය පිහිටුවන ලදී. එමෙන්ම එවකට විශ්වවිද්‍යාලයීය කලා මණ්ඩලයේ සභාපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආර්.එම්. දිසානායක මහතාගේත් ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය අනුශාසක මහාචාර්ය චන්දන ජයරත්න මහතාගේත් පූර්ණ කැප කිරීම හා ආශිර්වාදය මෙහිලා විශාල ශක්තියක් විය. කොළඹ විශ්වවිද්‍යාලයීය කලා මණ්ඩලයේ අධීක්ෂණය යටතේ කටයුතු කරන සංස්කෘතික මධ්‍යස්ථානය මේ වන විට විශ්වවිද්‍යාල ප්‍රජාවේ සමාජ සංස්කෘතික ජීවිතය පෝෂණය කරමින් සුවිශාල මෙහෙවරක යෙදී සිටී.



ශ්‍රී ලාංකේය සාම්ප්‍රදායික කලාවේ උන්නතිය උදෙසා දීප ව්‍යාප්ත කාර්යභාරයක් ඉටු කිරීම අරමුණු කොට ගත් සංස්කෘතික මධ්‍යස්ථානය මගින් විද්‍යාර්ථීන්ට සෞන්දර්ය විෂයන් මූලික කොටගත් නොමිලේ පුහුණු පාඨමාලා පවත්වයි. නැටුම් කලාව, සංගීතය, චිත්‍ර කලාව, නාට්‍ය හා රංග කලාව, බෙර වාදනය, දෙමළ භාෂාව, සිංහල භාෂාව, භරත නාට්‍යම්, ජ්‍යොතිෂය ආදී පාඨමාලා මෙහි දී කැපී පෙනේ. ඉන් පරිබාහිරව සාමාජීය හා සංස්කෘතික වශයෙන් සිදු කරන මෙහෙවර ද ඉමහත්ය. විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ට පමණක් නොව අධ්‍යයන අනධ්‍යයන කාර්ය මණ්ඩල නිලධාරීන්ට ද පාඨමාලා සඳහා සහභාගි විය හැකි අතර පුස්තකාල පහසුකම් ද අප මධ්‍යස්ථානය සතුව පවතී.

සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ සිදු වන්නා වූ දිස්ත්‍රික්, පළාත් සහ ජාතික මට්ටමේ තරග සහ ක්‍රියාකාරකම් මෙහි දී කැපී පෙනේ. එපමණක් නොව අන්තර්ජාතික තලය දක්වාම අපගේ සිසු දරුදැරියන්ගේ දක්ෂතා පෙන්නුම් කිරීමට අවකාශ ලබාදීමට හැකිවීම පිළිබඳ අපට ඇත්තේ නිහතමානී ආඩම්බරයකි.

"ප්‍රතිභා" අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන සංගීත හා නර්තන තරග, නාට්‍ය තරගාවලිය ද සුවිශේෂී වූවකි. විවිධ තරග ශීර්ෂ යටතේ අප මධ්‍යස්ථාන සම්පත්දායක මහත්ම මහත්මීන් හා සිසු දරු දැරියන් විසින් ජයග්‍රහණ හිමි කර ගැනීමට ලැබීම සම්බන්ධයෙන් ද අප ආයතනයෙන් දුන් දායකත්වය මෙහිලා සඳහන් කරනු වටී.

2021 මාර්තු 07 වැනි දින විසිවස් සපුරන කොළඹ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික මධ්‍යස්ථානය බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම් මහාචාර්ය කපිල ගුණවර්ධන මහතාගේ මඟපෙන්වීමත් විශ්වවිද්‍යාලයීය කලා මණ්ඩලයේ සභාපති ආචාර්ය එම්.ටී.එම්. මහීස් මහතාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. ස්ථානභාර නිලධාරිනිය සුභාෂිනී කේෂවන් මහත්මිය හා සහකාර සංස්කෘතික නිලධාරිනිය වන එස්.එච්.ජී. පියුමිකා දිනුෂිනී ගයත්‍රි මෙණෙවියගේ මෙහෙයවීමෙන් ක්‍රියාත්මක වන මේ ආයතනය සම්පත් දායකයන් දස දෙනෙකුගෙන් සේවය ලබා ගනිමින් විද්‍යාර්ථීන්ගේ සමාජ සංස්කෘතික ජීවිත පෝෂණය කරමින් මහඟු මෙහෙවරක නියැළී සිටියි.

විසිවස් සපිරෙන මේ මොහොතේ සහකම්පනයෙන් යුත් සංවේදී සිසු පිරිසක් බිහි කිරීමේ උදාර පරමාර්ථය පෙරදැරි කොටගත් කොළඹ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික මධ්‍යස්ථානය වඩා විශිෂ්ට සේවයක් වෙනුවෙන් ඇපකැප වී කටයුතු කරයි.

**සංස්කෘතික මධ්‍යස්ථානය**
**කොළඹ විශ්වවිද්‍යාලය**


www.nlb.lk

## 2021-03-04 - ජාතික ලොතරැයි මණ්ඩලය බිහිකල මුළු ත්‍යාග ලාභීන් සංඛ්‍යාව 741,799

ජයග්‍රාහකයින් අතර බෙදාදුන් මුළු ත්‍යාග මුදල 31,438,080.00

රු. 2,000,000.00 ත්‍යාග 02 රු. 1,000,000.00 ත්‍යාග 01 රු. 100,000.00 ත්‍යාග 31

NLB NATIONAL LOTTERIES

## මෙගා පවර් (Mega POWER) - දිනුම් වාරය 781 - නිල ප්‍රතිඵල

ට්‍රිපල් ජෙක්පොට්
දිනය: 2021.03.04

ඔබ දිනවන ඔබේ විශ්වාසය

ඉංග්‍රීසි අකුර: R | සුපිරි අංකය: 26 | ජයග්‍රාහී අංක: 18 40 67 69

| | ත්‍යාග රටාව | ත්‍යාග මුදල රු. | ජයග්‍රාහකයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 වන ත්‍යාගය | අංක 4 ක් පමණක් ගැළපේ නම් | 1,000,000.00 | 01 |
| 2 වන ත්‍යාගය | අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 100,000.00 | 04 |
| 3 වන ත්‍යාගය | අංක 3 ක් පමණක් ගැළපේ නම් | 1,000.00 | 97 |
| 4 වන ත්‍යාගය | අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 500.00 | 250 |
| 5 වන ත්‍යාගය | අංක 2 ක් පමණක් ගැළපේ නම් | 100.00 | 5,640 |
| 6 වන ත්‍යාගය | අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 40.00 | 3,766 |
| 7 වන ත්‍යාගය | අංක 1 ක් පමණක් ගැළපේ නම් | 20.00 | 91,988 |
| 8 වන ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම් | 20.00 | 16,927 |

ලංකාවේ විශාලතම සුපිරි ත්‍යාගය පිරිනැමූ ලොතරැයියේ...

මීළඟ මෙගා සුපිරි ත්‍යාගය රු. 120,321,978.00

මීළඟ පවර් සුපිරි ත්‍යාගය රු. 20,938,204.80

මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය රු. 32,869,777.60

දිනා ඇති මුළු මුදල රු. 4,514,940.00

- රු. ලක්ෂ 5 වැඩි ත්‍යාග රජයේ බදු නීති රීති වලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6 ක කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
නො. 32,එන්.ඩබ්.ජේ මුදලිගේ මාවත, කොළඹ 01
දුරකථන: 011-2 470 662, 011-4 607 000, 0112-458 585
ෆැක්ස්: 0112 433 631,
වෙබ් අඩවිය: www.nlb.lk

## මහජන සම්පත - දිනුම් වාරය - 4416 - නිල ප්‍රතිඵල

දිනය: 2021-03-04

ජයග්‍රාහී අක්ෂරය: V | ජයග්‍රාහී අංක: 3 6 8 2 9 4

ත්‍යාග රටාව - අග සිට මුලට

| ත්‍යාගය | රටාව | ත්‍යාග මුදල | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 වැනි ත්‍යාගය | 3 6 8 2 9 4 | රු. 2,000,000/- | 02 |
| 2 වැනි ත්‍යාගය | 6 8 2 9 4 | රු. 100,000/- | 13 |
| 3 වැනි ත්‍යාගය | 8 2 9 4 | රු. 10,000/- | 130 |
| 4 වැනි ත්‍යාගය | 2 9 4 | රු. 1,000/- | 1,301 |
| 5 වැනි ත්‍යාගය | 9 4 | රු. 100/- | 12,982 |
| 6 වැනි ත්‍යාගය | 4 | රු. 20/- | 128,918 |

ත්‍යාග රටාව - මුල සිට අගට

| ත්‍යාගය | රටාව | ත්‍යාග මුදල | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 7 වැනි ත්‍යාගය | 3 6 8 2 9 | රු. 10,000/- | 15 |
| 8 වැනි ත්‍යාගය | 3 6 8 2 | රු. 1,000/- | 129 |
| 9 වැනි ත්‍යාගය | 3 6 8 | රු. 100/- | 1,280 |
| 10 වැනි ත්‍යාගය | 3 6 | රු. 50/- | 12,872 |
| 11 වැනි ත්‍යාගය | V | රු. 20/- | 51,424 |

දිනා ඇති මුළු ත්‍යාග මුදල - රු. 13,856,640.00

රුපියල් ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ. ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්යය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගුවන්නේ දිනුම් අදින දින සිටමාස 06ක කාල සීමාවකට පමණි.

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 10,158,746.00

ජීවිතයේ සිහිනයට - වාසනාවේ ආශිර්වාදය

ජාතික ලොතරැයි මණ්ඩලය
32, දේශමාන්‍ය N. W. J. මුදලිගේ මාවත, කොළඹ - 01
දුරකථන: 011-4607000, 011-2324324. Fax: 011-4669416.
www.nlb.lk

## සෙවණ - නිල ප්‍රතිඵල

ඔබට ගෙවල් - අතට මුදල්

දිනය 2021/03/04
දිනුම් වාරය 319

ඉංග්‍රීසි අකුර: Z | ජයග්‍රාහී අංක: 28 29 30 68

| | සංයෝග | තෑගි | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| සුපිරි ත්‍යාගය | අංක 04 සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 14,000,000/- | - |
| 1 ත්‍යාගය | අංක 04 ගැලපේ නම් | රු. 1,000,000/- බැගින් | - |
| 2 ත්‍යාගය | අංක 3 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 100,000/- බැගින් | - |
| 3 ත්‍යාගය | අංක 3 ක් ගැලපේ නම් | රු. 1,000/- බැගින් | 80 |
| 4 ත්‍යාගය | අංක 2 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 200/- බැගින් | 167 |
| 5 ත්‍යාගය | අංක 2 ක් ගැලපේ නම් | රු. 100/- බැගින් | 4,216 |
| 6 ත්‍යාගය | අංක 1 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 50/- බැගින් | 2,280 |
| 7 ත්‍යාගය | අංක 1 ක් ගැලපේ නම් | රු. 20/- බැගින් | 57,969 |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැලපේ නම් | රු. 20/- බැගින් | 8,878 |

මෙවර දිනා ඇති මුළු ත්‍යාග මුදල
රු. 1,985,940/-

රුපියල් ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ. ත්‍යාග මුදල් ලබාගැනීමේදී හැඳුනුම්පත අනිවාර්යය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගුවන්නේ දිනුම් අදින දින සිට මාස 06ක කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය / தேசிய லொத்தர் சபை / NATIONAL LOTTERIES BOARD
Office: No.32,Deshamanya N.W.J.Mudalige Mw, Colombo 01.Sri Lanka
Tel: 011 4607000,011 2324324
Fax: 011 4669416
www.nlb.lk

## ධන නිධානය - නිල ප්‍රතිඵල

දිනය - 2021/03/04
දිනුම් වාරය - 453

ඉංග්‍රීසි අක්ෂරය: E | ජයග්‍රාහී අංක: 31 57 63 74

| | සංයෝග | තෑගි | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 ත්‍යාගය | අංක 04 ගැලපේ නම් | රු. 1,000,000.00 | - |
| 2 ත්‍යාගය | අංක 3 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 100,000.00 | 04 |
| 3 ත්‍යාගය | අංක 3 ක් ගැලපේ නම් | රු. 3,000.00 | 101 |
| 4 ත්‍යාගය | අංක 2 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 1,000.00 | 241 |
| 5 ත්‍යාගය | අංක 2 ක් ගැලපේ නම් | රු. 100.00 | 5,695 |
| 6 ත්‍යාගය | අංක 1 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 60.00 | 3,651 |
| 7 ත්‍යාගය | අංක 1 ක් ගැලපේ නම් | රු. 20.00 | 93,549 |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැලපේ නම් | රු. 20.00 | 17,542 |

දිනා ඇති මුළු ත්‍යාග මුදල රු 3,954,380.00
බිහිවූ මුළු ජයග්‍රාහකයන් ගණන 120,783

මීළඟ වාරයේ සුපිරි ත්‍යාගය
රු. 85,756,977.60

- රු. ලක්ෂ 5 ට වැඩි ත්‍යාග රජයේ බදු නීතිරීතිවලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාලසීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය / தேசிய லொத்தர் சபை / NATIONAL LOTTERIES BOARD
අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ.මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන 011 460 7000 011 232 4324

# යාපනයේ මක්කුම්බාන්හි බෝට්ටු නිෂ්පාදනාගාරය හා පුහුණු මධ්‍යස්ථානය විවෘත වෙයි

**බුද්ධිකා ඉඹුලාන**



යාපනයේ මක්කුම්බාන් ප්‍රදේශයේ නව බෝට්ටු නිෂ්පාදනාගාරය හා පුහුණු මධ්‍යස්ථානය ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා මහතාගේ ප්‍රධානත්වයෙන් විවෘත විය.

ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා මහතාගේ ඉල්ලීමකට අනුව පෞද්ගලික ආයෝජකයකු විසින් මේ බෝට්ටු නිෂ්පාදනාගාරය හා පුහුණු මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලදී.

ධීවර කර්මාන්තය විශාල වශයෙන් කෙරෙන උතුරු පළාතේ බෝට්ටු නිෂ්පාදනයට හා ඒ සඳහා අවශ්‍ය ශ්‍රමිකයන් පුහුණු කිරීමේ ස්ථානයක් නොමැතිවීමෙන් ධීවර කාර්මිකයන් මහත් අසීරුතාවට පත්වී සිටි අවස්ථාවක මේ බෝට්ටු නිෂ්පාදනාගාරය හා පුහුණු මධ්‍යස්ථානය ස්ථාපිත කෙරිණි.

මෙහිදී ඇමැතිවරයා කියා සිටියේ පසුගිය රජය සමයේ උතුරු පළාතේ පමණක් නොව මුළු රටේම ධීවර කර්මාන්තයට සැලකිය යුතු සේවයක් නොවීම හේතුවෙන් ධීවර ජනතාව විශාල ලෙස පසුබෑමකට ලක්ව සිටි බවයි. වත්මන් රජය බලයට පත්වීමත් සමඟ ධීවර කර්මාන්තය වෙනුවෙන් විශාල සේවයක් සිදුකරමින් සිටින අතර ධීවර කාර්මිකයාගේ සුබසාධන කටයුතු කෙරෙහි ද අවධානය යොමු කර ධීවර කර්මාන්තය නඟා සිටුවීමට කටයුතු කරන බවද ඇමැතිවරයා කීය.

# පබ්බත විහාර කියන්නේ දුරින් පිහිටි විහාරවලටයි

## පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය අනුර මනතුංග

**උපාලි කරුණාරත්න**

පබ්බත විහාර යනු පාර්වත නොහොත් දුරින් පිහිටි විහාර බව පුරා විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය අනුර මනතුංග මහතා පැවැසීය. අධ්‍යක්ෂ ජනරාල්වරයා එසේ ප්‍රකාශ කළේ පෙරේදා (04) කොළඹ පුරාවිද්‍යා දෙපාර්තමේන්තු මූලස්ථානයේ පැවැති පුරා පැය මාර්ගගත සම්මන්ත්‍රණ මාලාවේ සමාරම්භයට සහභාගි වෙමිනි. මේ අවස්ථාවට ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය ඇමැති විදුර වික්‍රමනායක මහතාද සහභාගි විය.

පුරා විද්‍යා දෙපාර්තමේන්තුව අලුත් දැනුම සොයා යන, දැනුම බෙදාහරින ශාස්ත්‍රාලයක් විය යුතුයැයිද අධ්‍යක්ෂ ජනරාල්වරයා කීය.

මහාචාර්ය අනුර මනතුංග මහතා වැඩිදුරටත් මෙසේද කීය.

පබ්බත විහාර කියන එක පර්වතත් සමඟ සම්බන්ධයක් නැහැ කියන එක අපට පෙනී ගොස් තිබෙනවා. පාර්වත කියා වචනයක් තිබෙනවා. පාර්වත කියන්නේ ඈතින් පිහිටි යන්නයි. දුරස්ථ, සමීපවීමට නොහැකි යන්න එහි අර්ථයයි. මේ තේරුමෙන් තමයි පබ්බත විහාර හැදී තිබෙන්නේ. ඒ කියන්නේ ඈතින් පිහිටි විහාර, දුෂ්කර විහාර යන්නයි. කඳු ආශ්‍රිත විහාර යන්න මෙයින් අදහස් නොවේ. පාර්වත යන්න තමයි පබ්බත වී තිබෙන්නේ. පබ්බත විහාර කියන්නේ කඳු පර්වත සමඟ සම්බන්ධ නොවන දෙයක් බව මෙයින් අපට පැහැදිලි වෙනවා.

මෙවැනි දේශන අප දිගින් දිගටම ඉදිරියට පවත්වනවා. එයින් ජනතාවට පුරා විද්‍යාව පිළිබඳ නිවැරැදි දේ දැන ගත හැකියි. පාසල් සිසුන්ට පුරා විද්‍යාව පිළිබඳ නිවැරැදි දැනුමක් ලබාදීම අපේ අරමුණක්. අත්සන් කරන එකයි, දුරකතනයට පිළිතුරු දෙන එක අපට එපා වෙලා.

එයින් අප වෙනස් වන්න ඕනෑ. පුරාවිද්‍යා ක්ෂේත්‍රය ක්‍රමවත්ව ඉදිරියට ගෙන යාමට රජය ගෙනයන වැඩපිළිවෙළට අප සහයෝගය දෙනවායැයිද කීය.


## තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

## තොරතුරු තාක්ෂණ සහකාර

ඉහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් :**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පස්වැනි (05) මට්ටමට නොඅඩු මට්ටමක තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වයස** : අවුරුදු 18 නොඅඩු හා 45 ට නොවැඩි

**වැටුප් ක්‍රමය** : MA 2-1 රු. (30,310 - 10x300 - 7x350 - 4x495 - 20x660 - 50,940)

**පොදු කොන්දේසි**

1. රාජ්‍ය හෝ සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල / කොමිෂන් සභාවල සේවය කරන අය තම අයදුම්පත ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතුය.
2. තෝරාගනු ලබන අය 1956 අංක 22 රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති යටතේ පනවා ඇති නීති රීතිවලට යටත් වේ.
3. පත් කරනු ලබන දින සිට සේවක අර්ථ සාධක අරමුදලට දායක කරනු ලැබේ.
4. සියලු තනතුරු සඳහා රජය අනුමත දීමනා හිමි වේ.

අයදුම්කරුවන් සහතිකවල ඡායා පිටපත් සමග තමන් විසින් පිළියෙල කර ගන්නා ලද ජීව දත්ත අඩංගු අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් **2021-03-19 දිනට පෙර** ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව,**
**කාමර අංක 203-204,**
**ගොඩනැගිලි අංක 02,**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,**
**කොළඹ 07.**


### පරිසරය ගැන නොසිතා වැඩ කිරීමේ අනිසි ප්‍රතිඵල අද රටටම අත්විඳීමට සිදු වෙලා:

# නවදිල්ලියේ මිනිසුන් ඔක්සිජන් ටැංකි පිටේ බැඳගෙන යනවා වගේ කොළඹ මිනිසුන්ටත් එහෙම කරන්න නුදුරේදීම සිදු වේවි

## තාරකා විද්‍යාඥ අනුර සී. පෙරේරා

**රත්නසිරි පතිරණ**

පරිසරය පිළිබඳ නිසි කළමනාකරණයක් නැතිව කටයුතු කිරීමේ අනිසි ප්‍රතිඵල අද රටටම අත්විඳීමට සිදුවී ඇති බවත්, ඉන්දියාවේ නවදිල්ලි නුවර මිනිස්සු ඔක්සිජන් ටැංකි පිටේ බැඳගෙන යනවා වගේ කොළඹ මිනිස්සුන්ටත් එසේ කරන්නට නුදුරේදීම සිදුවනු ඇතැයි ප්‍රකට තාරකා විද්‍යාඥයකු වන විද්‍යාකීර්ති අනුර සී. පෙරේරා මහතා සඳහන් කරයි.

රටක් සංවර්ධනය විය යුත්තේ කොන්ක්‍රීට් ගොඩනැගිලිවලින් විතරක් නොවෙයි. ගහකොළ සතා සිවුපාවුන්ටත් හානියක් නොවන විදියට ස්වභාවික පරිසරය ආරක්ෂා වන විදියට මේ කටයුතු සිදු විය යුතුයි. අපේ රට ලෝකයේ ස්වභාවික සුන්දරත්වය අතින් ඉහළම තැනක තිබූ රටක්.ඒත් නිදහසින් පසුව වසරින් වසර අපේ ස්වාභාවික පරිසරය විනාශ කරන්න පටන් ගත්ත. බෞද්ධයෝ කියන්නේ පරිසරය සමඟ බොහොම නිවී සැනසිල්ලේ ජීවත්වන ජන කොට්ඨාසයක්. බුදුන් වහන්සේ ලෝකයට දෙසූ දහමේ ස්වභාවධර්මය රකින එක අංක එකට ගෙනත් තිබෙනවා. අපි උන්වහන්සේගේ දහමට අනුව ජීවත් වුණා නම් පරිසරයට මේ වගේ විපතක් සිදුවන්නේ නෑ. ලෝකයේ හිටපු ශ්‍රේෂ්ඨ පරිසරවේදියා තමයි බුදුන් වහන්සේ. උන්වහන්සේගේ දහමට පිටින් ගිය නිසා අද ලෝකය අපි අතින් විනාශ කරගත් බවද අනුර සී. පෙරේරා මහතා සඳහන් කළේය.

වැඩිදුරටත් පෙරේරා මහතා මෙසේද කීය. 'ඉන්දියාවේ නවදිල්ලිනුවර ඉතා වේගයෙන් පරිසරය දූෂණය වන නගරයක්. අද ඒ නගරයේ මිනිසුන්ට නිදහසේ හුස්ම ගන්න විදියක් නෑ. ඔක්සිජන් ටැංකි පිටේ බැඳගෙන යන තැනට ඒ රටේ මිනිසුන් පත්වෙලා. අපේ අගනුවර වන කොළඹටත් ඒ තත්ත්වය අත්වීම ඉතා කනගාටුදායකයි. පන්සලක බෝධියක් ඇරුණම වෙන කිසිම ගසක් දකින්නට බැරිතැනට අගනුවර පත්වෙලා. ඉවක් බවක් නැතිව තට්ටු සිය ගණන් උස කොන්ක්‍රීට් ගොඩනැගිලි ඉදිවෙනවා. මේක විතරද සංවර්ධනය කියන්නේ.'

තවත් ප්‍රමාද නොවී කොළඹ නගරය පුරා අපේ රටට ආවේණික මී, කොහොඹ, කුඹුක්, මඟුල් කරඳ වැනි ගස් සිටුවීමට පියවර ගත යුතු බවත් අධික වාහන තදබදය අවම කිරීමට දිගුකාලීන වැඩපිළිවෙළක් සකස් කළ යුතු බවද ඒ මහතා සඳහන් කරයි. එසේම අත්තිඩිය, මුතුරාජවෙල පරිසර පද්ධති ආරක්ෂා කිරීමට වහා පියවර ගත යුතු බවත් මුළු රටේම පරිසරය ආරක්ෂා කර ගැනීමේ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට තවත් ප්‍රමාද විය යුතු නැති බවද ඒ මහතා වැඩිදුරටත් සඳහන් කළේය.

# ඉරණතිව් දූපත් වැසියෝ තවදුරටත් විරෝධතාවේ ධීවරයෝත් එක්වෙති

**උතුරු පළාත් විශේෂ- රසුල දිල්හාර ගමගේ**

කිලිනොච්චිය ඉරණතිව් දූපතේ ධීවරයෝ මුහුදු යෑමෙන් වැළකී පෙරේදා(04)සවස සිට විරෝධතාවක් ආරම්භ කොට තිබේ. දූපත් වැසියෝ කියා සිටින්නේ ඔවුන් වාසය කරන පළාතේ කොරෝනා මළසිරුරු මිහිදන් කිරීමට එරෙහිව මේ විරෝධතාව ක්‍රියාත්මක කර ඇති බවයි.

කොරෝනා මළසිරුරු මිහිදන් කිරීම නිසා ඒවායේ විෂබීජ ජලය සමඟ මුසු වී තම දූපතේ සෞඛ්‍ය තත්ත්වය නරක අතකට හැරෙන බව පවසන ඉරණතිව් ධීවරයෝ එම තත්ත්වය ඔවුන්ගේ ධීවර කර්මාන්තයට විශාල හානියක් වන බවද කියා සිටිති. ඉරණතිව් දූපතේ ධීවරයන් විසින් ආරම්භ කොට ඇති මේ විරෝධතාවට සහය දීමට අවශ්‍ය කරුණු සාකච්ඡා කිරීමට උතුරේ එක්සත් ධීවර සංගමයේ විශේෂ රැස්වීමක් අද (06) පෙරවරුවේ යාපනයේදී පැවැත්වේ.




## වාරිමාර්ග අමාත්‍යාංශය

## මොරගහකන්ද - කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය

## භාවිතයෙන් ඉවත්කළ ඉදිකිරීම් ද්‍රව්‍ය අපහරණය 2020 - I

## භාවිත නොකළ සහ භාවිතයෙන් ඉවත්කළ ඉදිකිරීම් ද්‍රව්‍ය අලෙවි කිරීම සඳහා මිල ගණන් කැඳවීම

01. මොරගහකන්ද – කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියට අයත් භාවිතයෙන් ඉවත් කරන ලද ඉදිකිරීම් ද්‍රව්‍ය අලෙවි කිරීම සඳහා මිල ගණන් භාර ගැනීම සිදු කෙරේ. මෙම භාණ්ඩ මොරගහකන්ද – කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියේ වැල්ලෙවල ගබඩාවේදී සහ මොරගහකන්ද ගබඩාවේදී, 2021/03/08 දින සිට 2021/03/29 දින දක්වා සඳුද, බදාදා සහ සිකුරාදා දින වල පෙ.ව. 09.30 ත් ප.ව. 3.00 ත් අතර කාලය තුළ පරීක්ෂා කර බැලිය හැක.
02. මිල ගණන් ඉදිරිපත් කරන අයෙකුට එක් ඉල්ලුම්පතක් මගින් එක් භාණ්ඩයක් සඳහා හෝ භාණ්ඩ කිහිපයක් සඳහා හෝ සියලුම භාණ්ඩ සඳහා මිල ගණන් ඉදිරිපත් කළ හැකිය.
03. අදාළ අයදුම්පත් රු. 1,000/– ක ආපසු නොගෙවන තැන්පත් මුදලක් මොරගහකන්ද – කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියේ මුදල් භාරකරු වෙත ගෙවා ලබා ගත් ලදුපත ඉදිරිපත් කොට මොරගහකන්ද – කළුගඟ සංවර්ධන ව්‍යාපෘති කාර්යාලයේ ගණකාධිකාරී වෙතින් 2021/03/08 වෙනි දින පෙ.ව. 09.00 සිට 2021/03/29 දින ප.ව. 03.00 දක්වා ලබාගත හැක.
04. සෑම අයදුම්පත්‍රයක් සමගම විකිණීම සඳහා ඇති භාණ්ඩ පිළිබඳ විස්තරයක් සපයනු ලැබේ.
05. උනන්දුවක් දක්වන අයදුම්කරුවන්ට වැඩිදුර විස්තර අවශ්‍ය වේ නම් 066–2057854 / 066–2053605 / 066 – 2053606 යන දුරකථන අංකයන්ට අමතා ලබා ගත හැක.
06. නිසිලෙස සම්පූර්ණ කළ අයදුම්පත රු. 10,000 ආපසු ගෙවනු ලබන තැන්පත් මුදලක් සමග ඉදිරිපත් කළ යුතුය.
07. මිල ගණන් භාරගැනීම 2021.03.30 දින පෙ.ව. 9.30 ට අවසන් කරනු ලබන අතර, එම වේලාවට පසුව ලැබෙන මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
08. 2021.03.30 දින පෙ. ව. 10.00 ට මිල ගණන් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට අයදුම්කරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට පමණක් සහභාගි විය හැක.
09. භාවිත නොකළ සහ භාවිතයෙන් ඉවත්කළ ඉදිකිරීම් ද්‍රව්‍ය අලෙවි කිරීම සම්බන්ධ සියලුම කටයුතු කොවිඩ් – 19 සෞඛ්‍ය ආරක්ෂණ විධිවිධාන යටතේ සිදු කරන අතර, මෙම සියලු කටයුතු සඳහා අයදුම්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු පමණක් සම්බන්ධ විය යුතුය.

**ඉංජි. ඩී. බී. විජයරත්න**
**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**මොරගහකන්ද - කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය,**
**කෝන්ගහවෙල.**



## වාරිමාර්ග අමාත්‍යාංශය

## මොරගහකන්ද - කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය

## අබලි ද්‍රව්‍ය අපහරණය 2020 - II

## අබලි ද්‍රව්‍ය අලෙවි කිරීම සඳහා මිල ගණන් කැඳවීම

01. මොරගහකන්ද – කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියට අයත් භාවිතයෙන් ඉවත් කරන ලද අබලි ද්‍රව්‍ය අලෙවි කිරීම සඳහා මිල ගණන් භාර ගැනීම සිදු කෙරේ. මෙම භාණ්ඩ මොරගහකන්ද – කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියේ වැල්ලෙවල ගබඩාවේදී සහ මොරගහකන්ද ගබඩාවේදී, 2021/03/08 දින සිට 2021/03/29 දින දක්වා සඳුද, බදාදා සහ සිකුරාදා දින වල පෙ.ව. 09.30 ත් ප.ව. 3.00 ත් අතර කාලය තුළ පරීක්ෂා කර බැලිය හැක.
02. මිල ගණන් ඉදිරිපත් කරන අයෙකුට එක් ඉල්ලුම්පතක් මගින් එක් භාණ්ඩය කාණ්ඩයක් සඳහා හෝ කාණ්ඩ කිහිපයක් සඳහා මිල ගණන් ඉදිරිපත් කළ හැකිය.
03. අදාළ අයදුම්පත් රු. 1,000/– ක ආපසු නොගෙවන තැන්පත් මුදලක් මොරගහකන්ද – කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියේ මුදල් භාරකරු වෙත ගෙවා ලබා ගත් ලදුපත ඉදිරිපත් කොට මොරගහකන්ද – කළුගඟ සංවර්ධන ව්‍යාපෘති කාර්යාලයේ ගණකාධිකාරී වෙතින් 2021/03/08 වෙනි දින පෙ.ව. 09.00 සිට 2021/03/29 දින ප.ව. 03.00 දක්වා ලබාගත හැක.
04. සෑම අයදුම්පත්‍රයක් සමගම විකිණීම සඳහා ඇති භාණ්ඩ පිළිබඳ විස්තරයක් සපයනු ලැබේ.
05. උනන්දුවක් දක්වන අයදුම්කරුවන්ට වැඩිදුර විස්තර අවශ්‍ය වේ නම් 066–2057854 / 066–2053605 / 066 – 2053606 යන දුරකථන අංකයන්ට අමතා ලබා ගත හැක.
06. නිසිලෙස සම්පූර්ණ කළ අයදුම්පත රු. 10,000.00 ආපසු ගෙවනු ලබන තැන්පත් මුදලක් සමග ඉදිරිපත් කළ යුතුය.
07. මිල ගණන් භාරගැනීම 2021.03.30 දින ප. ව. 01.30 ට අවසන් කරනු ලබන අතර, එම වේලාවට පසුව ලැබෙන මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
08. 2021.03.30 දින ප. ව. 02.00 ට මිල ගණන් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට අයදුම්කරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට පමණක් සහභාගි විය හැක.
09. අබලි ද්‍රව්‍ය අපහරණය සම්බන්ධව සියලුම කටයුතු කොවිඩ් – 19 සෞඛ්‍ය ආරක්ෂණ විධිවිධාන යටතේ සිදු කරන අතර, මෙම සියලු කටයුතු සඳහා අයදුම්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු පමණක් සම්බන්ධ විය යුතුය.

**ඉංජි. ඩී. බී. විජයරත්න**
**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**මොරගහකන්ද - කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය,**
**කෝන්ගහවෙල.**



## දැන්වීමයි

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

## මාරවිල දිසා අධිකරණයේදීය

නාත්තන්ඩියේ සුජිත් ලාල් ප්‍රනාන්දු
අංක 07, ගම්සභා මාවත, දූම්මලකොටුව,
දන්කොටුව.

**පැමිණිලිකරු**

ඇස්කිසි අංක : 36/19
නඩු අංකය : 2699/ එම්
වර්ගය : මුදල් (වන්දි)
වටිනාකම් : රු. 2,500,000.00
ක්‍රියාපටිපාටිය : සාමාන්‍ය

**එදිරිව**

01. ප්‍රියන්ත චමින්ද බස්නායක
අංක 383, උඩවැව, මහගොල්ල,
දියතලාව.
02. ජයසිංහගේ අසංක ශ්‍රීමාල් ගුණතිලක,
අංක 29, විජේරත්න වත්ත,
දූම්මලකොටුව, දන්කොටුව,
03. ගොරවල විතානගේ සුපුන් ප්‍රියංකර,
අංක 56, වලව්වත්ත, දන්කොටුව,
04. ඕමන්තගේ ශිරාන් සුජිත් කුමාර
අංක 59, සෙන්දිරියාමුල්ල, යෝගියාන.
05. දෙන් ඩිලාන් රංගන හපුආරච්චි
අංක 22, සඳසරණ මාවත,
දූම්මලකොටුව, දන්කොටුව.

**විත්තිකරුවන්**

ඉහත නම් සඳහන් නඩුවේ මා වෙත නිකුත් වී ඇති ඇස්කිසි නියෝගය අනුව 03 **වන විත්තිකරු වන ගොරවල විතානගේ සුපුන් ප්‍රියංකර සහ 4 වන විත්තිකරු වන ඕමන්තගේ ශ්‍රිරාන් සුජිත් කුමාර** නමැති අය පැමිණිලිකරු වන නාත්තන්ඩිගේ සුජිත් ලාල් ප්‍රනාන්දු නැමැත්තාට එක් විත්තිකරුවෙකුගෙන් රුපියල් දෙලක්ෂ පනස් දහසක (රු. 250,000/=)ක මුදලක් ගෙවිය යුතු බවට මාරවිල දිසා අධිකරණයේ අංක 2699/ එම් දරන නඩුවේ නඩු තීන්දුව අනුව නියම කර ඇති අතර, එම තීන්දුව ඉටු කිරීමට 03 වන සහ 04 වන විත්තිකරුවන් දෙදෙනා අපොහොසත් වී ඇත. එබැවින් මා විසින් තහනම් කරන ලද පහත පළමුවන උපලේඛනයේ සඳහන් දේපළ.

01. තට්ටු 02 ලී කැබිනට් 01
02. ඇඳි ප්ලාස්ටික් පුටු 05
03. Rexten වර්ගයේ Setup 01
04. Samsun අඟල් 21 TV 01
05. TV Stand 01
06. ලී අල්මාරි 01
07. අයන් බෝඩ් 01
08. ලී කණ්නාඩි මේස 01
09. AC Cooler 01
10. Singer තනි දෙරේ ශීතකරණ 01

**වර්ෂ 2021 ක් වූ මාර්තු මස 18 වන දින ප.ව. 1.00 ට**

**03 වන විත්තිකරු පදිංචි අක 56, දන්කොටුව, වලව්වත්ත**

දරන ලිපිනයේ පිහිටි භූමියේදී මා විසින් පිස්කල් වෙන්දේසියේ විකුණනු ලබන බවටත් දෙවන උපලේඛනයේ සඳහන් පහත සඳහන් දේපළ.

01. බිලියට් මේස 01
02. NW BGB 2829 Bajaj Pulser Bike 01
03. යකඩ පුටු 04 සහිත මේස 01
04. වේවැල් හාන්සි පුටු 01
05. PPO FF බෞල් 02
06. දෙර දෙකේ වානේ කබඩ් 07
07. ක්පේෂර් 01
08. NW XX 5516 Honda Dio Scooty Bike 01

**වර්ෂ 2021 ක් වූ මාර්තු මස 18 වන දින ප.ව. 2.30ට**

**04 වන විත්තිකරු පදිංචි යෝගියාන සෙන්දිරියමුල්ල අංක 59**

දරන ලිපිනයේ පිහිටි භූමියේදී මා විසින් පිස්කල් වෙන්දේසියේ විකුණනු ලබන බවටත් මෙයින් දන්වනු ලැබේ.

**විමසීම්** : මාරවිල දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර් මහතා – 032–2254291



# ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යායතනය සරසවියක් වෙයි

## සමාරම්භක උලෙළ ජනපති ප්‍රධානත්වයෙන් BMICH හිදී

**නුවන් කොඩිකාර**

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යායතනය විශ්ව විද්‍යාලයක් බවට පත් කිරීමේ සමාරම්භක උලෙළ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පෙරේදා (04) කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ අන්තර්ජාතික සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විණි.

ආයුර්වේද විද්‍යාව හදාරණ සිසුනට ආයුර්වේද ක්‍රමය න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව ඉගැන්වීමේ අරමුණින් ආයුර්වේද චක්‍රවර්ති පණ්ඩිත ජී.පී. වික්‍රමාරච්චි මහතා විසින් 1929 වසරේදී ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය පිහිටවනු ලැබූ අතර එහි ප්‍රථම ශිෂ්‍ය කණ්ඩායමට 20 දෙනෙක් අයත් වූහ.

වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යායතනය 1995 වසරේදී කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ විශ්ව විද්‍යාල ආයතනයක තත්ත්වයට උසස් කරනු ලැබීමෙන් පසු දකුණු ආසියානු කලාපයේ දේශීය වෛද්‍ය අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2021 මාර්තු 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි "ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව" යන නාමය යටතේ ස්ථාපනය කර තිබේ.

මෙය ශ්‍රී ලංකාවේ 16 වැනි විශ්වවිද්‍යාලය වන අතර ඊට එක්කර ඇති නව උපාධි පාඨමාලා සංඛ්‍යාව 07කි. කණ්ඩායමකට සිසුන් 50ක් බැගින් 2021 වසර සඳහා සිසුහු 350ක් ඇතුළත් කර ගැනෙති. 2020 වසරේ පැවති අ.පො.ස උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදු කෙරේ.

විශ්ව විද්‍යාල වෙබ් අඩවිය සක්‍රිය කළ ජනාධිපතිවරයා විශ්ව විද්‍යාල අමුත්තන්ගේ පොතේ අත්සන් තැබීමෙන් අනතුරුව නිල ලාංඡනය, ධජය සහ ගීතය එළිදැක්වීම ද ඊට සමගාමීව සිදු කෙරිණි.

විශ්වවිද්‍යාලයේ ප්‍රථම කුලපති මල්වතු පාර්ශ්වයේ අනුනායක ආචාර්ය අතිපූජ්‍ය නියංගොඩ විජිතසිරි නා හිමියන්ට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් විජ්නිපත පිළිගැන්වීය.

විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සමග සමූහ ඡායාරූපයකට පෙනී සිටී ජනාධිපතිවරයාට විශ්වවිද්‍යාලයේ උපකුලපතිනි ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ මහත්මිය ජනාධිපතිවරයාට, අගමැතිවරයාට සහ අධ්‍යාපන ඇමැතිවරයාට සමරු සිහිවටන පිළිගැන්වූවාය. මහා සංඝරත්නය, සෙසු ආගමික පූජකවරුන්, ඇමැතිවරුන් වන මහාචාර්ය ජී.එල්. පීරිස්, සරත් වීරසේකර, රාජ්‍ය ඇමැතිවරුන් වන සීතා අරඹේපොළ, ලසන්ත අලගියවන්න, සිසිර ජයකොඩි, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී යුද හමුදාපති ජෙනරල් ශවේන්ද්‍ර සිල්වා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමේ සභාපති මහාචාර්ය සම්පත් අමරතුංග මහත්ම මහත්මීන් සහ විශ්ව විද්‍යාලකුලපතිවරුන්, උපකුලපතිවරුන්, ආචාර්යවරුන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට සහභාගි වූහ.

# රටක සාමය හා ආරක්ෂාව නැති නම් ජනතාවගේ නිදහස අනතුරකයි

## දෛනික වැඩට සිදු වන බලපෑමත් එසේමයි

### ගුවන් හමුදා ජනාධිපති වර්ණ ප්‍රදානෝත්සවයේදී ජනපති කියයි



**නුවන් කොඩිකාර**

රටක සාමය හා ආරක්ෂාව නැතිනම්, ජනතාවගේ නිදහස පැහැදිලිවම අනතුරට ලක් වන බවත් අප අතීතයේ දී දැක ඇති පරිදි පෞද්ගලික හා රාජ්‍ය දෙඅංශයේම දෛනික කටයුතුවලට ඉන් විශාල බාධාවක් වනු ඇති බවත් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පැවසීය.

රටේ සංවර්ධනයට ජාතික ආරක්ෂාව අතිශයින්ම වැදගත් බව සිය ප්‍රතිපත්ති ලේඛනය ජනතාව වෙත ඉදිරිපත් කරමින් ප්‍රකාශ කළ බව පැවැසූ ජනාධිපතිවරයා ජාතික ආරක්ෂාව සහතික කළ නොහැකි රටකට කිසිදු ආයෝජකයකු නොපැමිණෙන බව කීය.

මෙය සහ තවත් බොහෝ හේතු නිසා ජාතික ආරක්ෂාව යථා තත්ත්වයට පත් කිරීමට සහ සමාජයේ නීතිය හා සාමය සහතික කිරීමට ප්‍රමුඛතාව දීමට අප රජය තීරණය කළ බව කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරේ ඊයේ (05) පැවති ජනාධිපති වර්ණ ප්‍රදානෝත්සවයේදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සඳහන් කළේය.

අපේ රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන "සෞභාග්‍යයේ දැක්මේ" අන්තර්ගත මූලධර්ම මත පදනම්ව ශ්‍රී ලංකාව සිය අනාගතය සකස් කරගනිමින් සිටින මෙකල අපේ ගුවන් හමුදාව සහ සෙසු සන්නද්ධ සේවා ජාතික ආරක්ෂාව පවත්වාගෙන යෑමෙහිලා තමන්ට පැවරී ඇති ප්‍රධාන කාර්යභාරය අඛණ්ඩව ඉටුකළ යුතු යැයි හෙතෙම කියා සිටියේය.

සියලු පුරවැසියන්ගේ සුරක්ෂිතබව හා ඔවුන්ට බියෙන් සහ සැකයෙන් තොරව ජීවත්විය හැකි සුරක්ෂිත පරිසරයක් සහතික කිරීම රජයේ මූලික ප්‍රමුඛතාවක් බව ද රාජපක්ෂ මහතා සඳහන් කළේය.

ජනාධිපතිවරයා වැඩිදුරටත් මෙසේද කියා සිටියේය.

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ඓතිහාසික වර්ණ සම්මාන ප්‍රදානෝත්සවයේ දී ඔබ ඇමතීමට ලැබීම ජනාධිපති සහ ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවේ සේනාධිනායකයා වශයෙන් මට මහත් සතුටක්.

මේ අවස්ථාව අපගේ ගුවන් හමුදාවේ කැපවීමෙන් යුත් කීර්තිමත් පියාසර ආකෘතීන් දෙකක් අත්කරගත් සුවිශේෂී විශිෂ්ටත්වය සලකුණු කරනවා.

අංක 05 ප්‍රහාරක බල ගණය ශ්‍රී ලංකාවේ පළමු සුපර්සොනික් බලගණය ලෙස 1991 දී ස්ථාපනය කර තිබෙනවා.



## ජාතික ආරක්ෂාව සහතික නොකළ රටකට කිසිම ආයෝජකයෙක් එන්නේ නෑ

එතැන් පටන් ජාතියේ ගුවන් බලය ප්‍රහාරාත්මකව උපයෝගී කරගැනීමේ පදනම වූයේ එයයි. ත්‍රස්තවාදයට එරෙහි අපේ සටන අතරතුර එය ජාතියට විශාල සේවයක් කළ අතර එය අපේ ජාතියේ ගුවන් ආරක්ෂක හැකියාව පවත්වාගෙන යාමේ ප්‍රධාන අංගයක් ලෙස පැවැතුණා. වර්තමාන ගුවන් හමුදා අණදෙන නිලධාරී එයාර් මාෂල් සුදර්ශන පතිරණ මේ බල ගණයේ ආරම්භක සාමාජිකයකු වූ බව සඳහන් කළ යුතුයි.

MI 17 හෙලිකොප්ටර් යානා මෙහෙයවන අංක 06 හෙලිකොප්ටර් බළ ගණය 1993 දී ස්ථාපනය කළ දින සිට යුද්ධයේදීත්, සාමකාමී කාලවලත් ජාතියට විශිෂ්ට සේවාවක් ඉටුකර තිබෙනවා. අර්බුදකාරී කාලවලදී සහ ජාතියේ යහපත පිණිස විවිධ මෙහෙයුම්වලදී එය විශාල සහායක් ලබාදී තිබෙනවා. මධ්‍යම අප්‍රිකානු ජනරජයේ සහ දකුණු සුඩානයේ එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් සඳහා ගුවන් හමුදා භටයන් සැපයීමෙන් බල ගණය ජාත්‍යන්තර වශයෙන් ද සිය හැකියාව ප්‍රදර්ශනය කර තිබීම විශේෂත්වයක්.

අද මේ විශිෂ්ට බලගණ දෙකට ජනාධිපති වර්ණ ප්‍රදානය, ඔවුන්ගේ සුවිශේෂී සේවය සහ ජාතියට කරන ලද දායකත්වය අගයමින් ශ්‍රී ලංකාවේ ගුවන් හමුදාවේ තෝරාගත් ඒකක සමූහයකට ඔවුන් ඔසවා තැබීමකි. මේ විශිෂ්ට ගෞරවය අත්කරගැනීම පිළිබඳ මේ බලගණවලට සහ ඔවුන්ගේ අතීත සහ වර්තමාන කාර්ය මණ්ඩලයට මගේ උණුසුම් සුබ පැතුම් පිරිනමනවා. ඉදිරි වසරවල ඔවුන්ගේ විශිෂ්ටත්වය අඛණ්ඩව විදහා දැක්වීමට මා ඔවුන්ව දිරිමත් කරනවා.

අද ප්‍රදානය කෙරෙන ජනාධිපති වර්ණ, ගුවන් හමුදාවේ මේ බලඝණ දෙක ජාතිය වෙනුවෙන් කළ විශිෂ්ට සේවය ඇගයීමක්. එම බලඝණවල සිටින මීට පෙර සේවය කළ සහ වර්තමානයේ සේවය කරන සෑම නිලධරයකුටම සහ භටයකුටම මගේ සුභාශිංසන මේ අවස්ථාවේදී පුද කරනවා. ඒ වගේම ඉදිරියටත් තම විශිෂ්ටත්වය රැකගෙන කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

අද වර්ණ ප්‍රදානය සිදු වනුයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාව සිය හැත්තෑ වැනි සංවත්සරය සැමරීමෙන් දෙදිනකට පසුවයි. මෙය එහි පොහොසත් ඉතිහාසයේ තවත් කැපී පෙනෙන සන්ධිස්ථානයකි. රාජකීය ගුවන් හමුදාවේ කණ්ඩායම් කපිතාන් ජී.සී. බ්ලැඩන්, අලුතින් පිහිටුවන ලද රාජකීය ලංකා ගුවන් හමුදාවේ අණදෙන නිලධාරී පදවිය භාරගත් 1951 දී සිදු වූ එහි සරල ආරම්භයේ සිට මේ ආයතනය අපේ මාතෘ භූමියට මනාව සේවය කරන කීර්තිමත්, වෘත්තීය සහ විශිෂ්ට හමුදා සංවිධානයක් දක්වා වර්ධනය වී තිබෙනවා

ශ්‍රී ලංකා ගුවන් හමුදාව දශක හතක, කැපවීමෙන් යුත් සිය සේවා කාලයේ ඉහළ මට්ටමේ වෘත්තීය නිපුණතාවක් සහ එහි මෙහෙයුම්වල විශිෂ්ටත්වයක් පවත්වාගෙන යනවා. අපේ ඉතිහාසයේ විවිධ අවස්ථා වලදී එය ප්‍රශංසනීය ලෙස තම කාර්යභාරය ඉටුකළ අතර ජාතියේ ඇගැයීම සහ ගෞරවය ද දිනාගෙන තිබෙනවා.

අපේ ජාතියේ සාමය සහතික කිරීම සඳහා අවසාන පරිත්‍යාගය ඇතුළුව ඉමහත් පරිත්‍යාග කළ ගුවන් හමුදාවේ

## රටේ සංවර්ධනයට ජාතික ආරක්ෂාව අතිශයින්ම වැදගත්

බොහෝ වූ සාමාජිකයන්ට මම උපහාර පුද කර සිටිනවා. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සේවය කළ තම ජීවිතය පවා පුද කළ සෑම ගුවන් හමුදා සාමාජිකයකුටම අපේ ජාතිය වෙනුවෙන් මගේ ගෞරවාචාරය පිරිනමනවා.

මේ සන්දර්භය තුළ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට සුවිශේෂි වූ කාර්යභාරයක් ඉටුකිරීමට සිදුව ඇත්තේ ශ්‍රී ලංකා දේශභූමිය තුළ පමණක් නොව, ශ්‍රී ලංකාවේ යහපැවැත්මට ද බලපාන ඉන්දීය සාගර කලාපයේ ස්වාධීන සහ සාමකාමී පරිසරය පවත්වාගෙන යෑමට, විස්තීර්ණ වූ අපගේ ආර්ථික කලාප සුරක්ෂිත කරලීමේ වගකීම ද ඉටු කළ යුතුව ඇත.

මාස හයකට අඩු කාලවකවානුවක අපගේ සමීපතම මිතුරා සහ සගයා වන ඉන්දීය නාවික සහ වෙරළ ආරක්ෂකයන් සමඟ සහයෝගීතාවයෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාව, නාවික හමුදාව සහ වෙරළ ආරක්ෂකයන් ගත් ප්‍රයත්නයක ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා මුහුද මතුපිට ගිනිගත් තෙල් නෞකාවක මතු වූ ගිනිදැල් නිවා දැමීමට සමත් වූ අතර එය මහා ව්‍යසනකාරී පාරිසරික උවදුරක් මගහැරවීමට උපකාරී වුණා.

මෙය කවර මොහොතක හෝ ඇතිවිය හැකි විවිධ වූ අභියෝගයන්ට නිදසුනකි. මේ සිදුවීම සංකීර්ණ, ගතික, නිරතුරු අභියෝගාත්මක ගෝලීය පරිසරයට මුහුණදීමට දැඩිව සූදානම් වීමේ අවශ්‍යතාව මෙහිදි පෙන්වා දිය යුතුයි.

එම නිදර්ශනය මෙන්ම වර්තමානයේ පවතින වසංගත තත්ත්වය අප මුහුණ දෙන තර්ජන බොහොමයක් ජාතික දේශසීමාවන්ගෙන් ඔබ්බට පැතිරෙනවා. මේ අභියෝගයන්ට සාර්ථකව මුහුණ දිය හැක්කේ අපගේ සාරධර්ම සහ සහයෝගී මනුෂ්‍යත්වයේ අගය වටහාගත් අව්‍යාජ අන්තර්ජාතික සහයෝගිතාවකින් පමණයි.

මෙහිදී මම විශේෂයෙන් මේ අවස්ථාව වර්ණවත් කිරීමට පැමිණි අප මිත්‍ර විදේශීය ගුවන් හමුදා සාමාජිකයන්ට ප්‍රශංසාව පුද කරනවා. බංග්ලාදේශයේ, ඉන්දියාවේ, පාකිස්තානයේ සහ අමෙරිකා එක්සත් ජනපදයේ ශාන්තිකර කලාපීය ගුවන් හමුදා ප්‍රධානීන්ට හා ඔවුන්ගේ නියෝජිතයන්ට වර්තමානයේ පවතින අභියෝග හමුවේ වුවද, මෙහි පැමිණීම පිළිබඳ ස්තුතිවන්ත වෙනවා. ඔබගේ පැමිණීම අප ජාතීන් අතර පවතින මිත්‍රශීලී සබැඳියාව පිළිබිඹු කරන සාක්ෂියක් වන අතරම මේ බැඳීම් පවත්වාගෙන යාමේ හා තවදුරටත් ශක්තිමත් කිරීමේ වැදගත්කම නැවත වරක් තහවුරු කරනවා.

අවසාන වශයෙන්, නැවත වරක් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අංක 05 සහ අංක 06 ගුවන් භට කණ්ඩායම්වලට, ඔවුන් ජනාධිපති වර්ණලාභීන් වීම පිළිබඳ සුබ පතනවා.

එමෙන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදාව වසර 70ක් මුළුල්ලේ ශ්‍රී ලාංකේය ජාතියට ඉටු කළ සුවිශේෂී මෙහෙවර අගය කරන අතරම, එයාර් මාෂල් පතිරණ මහතාට ඔහු ගන්නා ඉදිරි පියවර සියල්ලම සාර්ථක වේවායි පතනවා. රැස්ව සිටින සියලු දෙනාටත් ඔවුන්ගේ අනාගතය සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවායි පතනවා.



# පාස්කු කොමිෂන් වාර්තාවේ පිටපත් රාමඤ්ඤ සහ අමරපුර මහනාහිමිවරුන්ට පිළිගන්වයි





**මහින්ද අලුත්ගෙදර**

පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ කොමිෂන් වාර්තාව රාමඤ්ඤ, අමරපුර මහ නා හිමිවරුන් වෙත පිළිගන්වා තිබේ. ඒ අනුව ජනාධිපතිවරයා වෙත භාරදුන් පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ පිටපත් රාමඤ්ඤ මහා නිකායේ මහා නායක අග්ගමහා පණ්ඩිත මකුලෑවේ විමල හිමිපාණන්ට සහ අමරපුර මහා නිකායේ වැඩබලන උත්තරීතර මහානායක ගංතුනේ අස්සජි හිමිපාණන්ට පිළිගැන්වූහ.

රාමඤ්ඤ නිකායේ මහානායක හිමියන් වැඩ වෙසෙන මීරිගම, මිනීඔළුව, විද්‍යාවාස පිරිවෙන වෙත පෙරේදා (04) පස්වරුවේ සහ අමරපුර මහා නිකායේ වැඩබලන මහානායක හිමියන් වැඩවෙසෙන කෑගල්ල, ගන්තුන උග්ගල පුරාණ විහාරය වෙත ඊයේ (05) පෙරවරුවේ ගිය ජනාධිපති නීති අධ්‍යක්ෂ ජනරාල් හරිගුප්ත රෝහණධීර මහතා විසින් උන්වහන්සේ වෙත වාර්තාවේ පිටපත් වාර්තා පිළිගැන්වීය.

# නවීකරණය කළ ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථා සුපිරි සංකීර්ණය අගමැති අතින් විවෘත වෙයි





සී/ස ලංකා ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාවේ කොළඹ 12 සංඝරාජ මාවතේ පිහිටි නවීකරණය කරන ලද සුපිරි වෙළෙඳ සංකීර්ණය අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් ඊයේ (05) විවෘත කෙරිණි.

සෞභාග්‍යයේ දැක්ම සංකල්පය යටතේ දේශීය නිෂ්පාදන ආර්ථිකයට රට පෙළගැස්වීමේ කාර්යය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව මේ සුපිරි වෙළෙඳ සංකීර්ණය නවීකරණය කර තිබේ.

අගමැතිවරයා වෙළෙඳ සංකීර්ණය විවෘත කිරීම සංකේතවත් කරමින් එහි වූ සමරු ඵලකය නිරාවරණය කරමින් නව ගොඩනැඟිලි පරිශ්‍රයට ඇතුළු විය. ලෝක ජනාවාස දිනය වෙනුවෙන් ලංකා ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාවේ සේවක මහත්ම මහත්මීන්ගේ දරු දැරියන් වෙනුවෙන් පැවැත්වූ චිත්‍ර තරගය ජයග්‍රහණය කළ දරුවන්ට අගමැතිවරයා අතින් ත්‍යාග හා සහතික ප්‍රදානය කෙරිණි.

අනතුරුව ලංකා ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාවේ නවීකරණය කළ සුපිරි වෙළෙඳ සංකීර්ණයේ වෙළෙඳ ප්‍රදර්ශන කුටි අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ නිරීක්ෂණයට ලක් විය.

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැඟිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ, ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාවේ සභාපති මහේන්ද්‍ර විජේසේකර, සාමාන්‍යාධිකාරී දිලුම් රත්නායක මහත්වරුන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

**ඡායාරූප - සුලෝචන ගමගේ**

# ක්‍රිකට් ඡන්ද අපේක්ෂකයන්ට එරෙහිව විරෝධතා 36ක්

**ප්‍රින්ස් ගුණසේකර**

ශ්‍රී ලංකා ක්‍රිකට් නිලවරණයේ නාම යෝජනාවලට එරෙහිව විරෝධතා 36ක් එල්ල වෙයි. ක්‍රිකට් නිලවරණයේ නාම යෝජනාවලට එරෙහිව විරෝධතා භාර ගැනීම ඊයේ පස්වරු 3.30ට අවසන් වූ අතර, ප්‍රධාන නිලතල සියල්ලටම විරෝධතා ගොනු වී තිබිණි. ක්‍රිකට් නිලවරණ කමිටු සභාපති විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරු මාලනී ගුණරත්න මහත්මිය හා විශ්‍රාමික උපරිමාධිකරණ විනිසුරු ශිරෝමී පෙරේරා හා හිටපු ජ්‍යෙෂ්ඨ ලේකම්වරයකු වූ ආචාර්ය ඩී.එම්.ආර්.බී. දිසානායක යන මහත්ම මහත්මීන් ලැබී ඇති විරෝධතා විමර්ශනයකට ලක් කරනු ඇත.

විරෝධතා සම්බන්ධව නිලවරණ කමිටුව විසින් ගනු ලබන තීරණ මේ මස 15 වැනිදා ප්‍රකාශයට පත් කිරීමට නියමිත අතර, අනතුරුව අවසන් නාමලේඛනය අප්‍රේල් මස 20 වැනිදා නිවේදනය කෙරේ.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ඉදිරි වසර දෙකක කාලසීමාව සඳහා නිලධාරීන් පත් කර ගැනීමට නාමයෝජනා භාර ගැනීම පසුගිය 24 වැනිදා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේදී සිදු කෙරිණි. සභාපති, උපසභාපතිවරු දෙදෙනකු, ලේකම්, උපලේකම්, භාණ්ඩාගාරික සහ උපභාණ්ඩාගාරික තනතුරු සඳහා නාමයෝජනා කැඳවා තිබිණි.

සභාපති තනතුර සඳහා වත්මන් සභාපති ෂම්මි සිල්වා, මොහාන් ද සිල්වා, ජයන්ත ධර්මදාස හා කේ. මතිවානන් යන මහත්වරුන් නාමයෝජනා ඉදිරිපත් කර තිබූ අතර, මේ සියලු දෙනාටම එරෙහිව විරෝධා ගොනු කොට ඇතැයි පැවැසේ. එමෙන්ම අනෙකුත් ප්‍රධාන තනතුරු කිහිපයකටම පාර්ශ්ව කිහිපයකින් විරෝධතා ගොනු වී ඇතැයි වාර්තා විය.

උප සභාපති තනතුර සඳහා නාම යෝජනා භාර දුන් බත්තරමුල්ලේ සීලරත්න හිමියන්ගේ නාම යෝජනාව කලින්ම ප්‍රතික්ෂේප වූ අතර, ක්‍රිකට් ව්‍යවස්ථාව අනුව එහි ප්‍රධාන තනතුරු සඳහා පත් වීමට නම් ප්‍රමුඛ පෙළ ක්‍රිකට් ක්‍රීඩා කර තිබීම අනිවාර්ය වීම හේතුවෙන් සීලරත්න හිමිගේ නාම යෝජනාව විරෝධතා නොමැතිවම ප්‍රතික්ෂේප වූහ.

වත්මන් ලේකම් මොහාන් ද සිල්වා මහතා එම තනතුරට මෙවරත් තරග වදින අතර, නලීන් අපොන්සු, බන්ධුල දිසානායක හා නිශාන්ත රණතුංග යන මහත්වරු ද ලේකම් තනතුර සඳහා සටනට පිවිස සිටිති.

මෙවර ශ්‍රී ලංකා ක්‍රිකට් නිලවරණයේ උප සභාපති තනතුරු දෙක සඳහා නාමයෝජනා 6ක් ලැබී ඇති අතර, වත්මන් උප සභාපතිවරුන් වන රවීන් වික්‍රමරත්න, ජයන්ත ධර්මදාස, නලීන් අපොන්සු, බන්ධුල දිසානායක හා බන්දුල වර්ණපුර යන මහත්වරු එම සටනට පිවිස සිටිති. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලවරණයට ලියාපදිංචි ඡන්ද 144ක් ඇති අතර, පළාත් ක්‍රිකට් සංගම් 8ක්, දිස්ත්‍රික් ක්‍රිකට් සංගම් 44ක්, පරිපාලන ක්‍රීඩා සමාජ 58ක්, අනුබද්ධිත ක්‍රීඩා සමාජ 22ක් සහ ක්‍රිකට් සංගම් 12ක් ඡන්දය දීමට පැමිණෙනු ඇත.

## ගමේ ක්‍රීඩාවට අපෙන් තැනක්

ඔබේ ගම් පළාතේ ක්‍රීඩා ප්‍රවෘත්තියට වැඩි ඉඩක් දෙන්න 'දිනමිණ' සූදානම්. අදම ඔබේ ක්‍රීඩා පුවත ඡායාරූප ඇත් නම් ඒ සමඟ අපට යොමු කරන්න.

ලිපිනය - දිනමිණ ක්‍රීඩා පිටුව, ලේක්හවුස්, කොළඹ 10
විද්‍යුත් තැපැල - sports.dinamina@lakehouse.lk
දුරකතනය - 0112 429253

# රට පුරා ක්‍රීඩා පිටි සංවර්ධනය කරද්දී මුල්ගල් තැබීමේ ප්‍රතිපත්තියට තිත

**ප්‍රින්ස් ගුණසේකර**

වත්මන් රජය ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීම ආරම්භ කරද්දී මුල්ගල් තැබීමේ සාම්ප්‍රදායික ප්‍රතිපත්තියෙන් ඉවත්ව ඇතැයි ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතා පවසයි. පසුගියදා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම අංග සම්පූර්ණ ක්‍රීඩා පිටිය බැගින්, ක්‍රීඩා පිටි 342 ක් සංවර්ධනය කිරීමේ කටයුතු ආරම්භ කළද මුල්ගල් නොතැබූ බව ඒ මහතා පැවසීය.

ක්‍රීඩා අමාත්‍යාංශ ඩන්කන් වයිට් ශ්‍රවණාගාරයේදී පසුගියදා පැවැති මාධ්‍ය හමුවකදී ඒ මහතා මේ බව පැවසීය. ජාතික ක්‍රීඩා සංවර්ධන සැලැස්ම එළිදැක්වූ අවස්ථාවේ ටොරින්ටන් පිටිය ආරම්භ කරන බවට වූ සඳහනක් සම්බන්ධයෙන් මාධ්‍යවේදියකු නැගූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ඇමැතිවරයා මේ බව පැවසීය.

ඉතිහාසයේ අවස්ථා දෙකකදී ටොරින්ටන් ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම උදෙසා දෙවතාවක් මුල්ගල් තැබූවද එම ක්‍රීඩා පිටිය තවමත් නිසි පරිදි සම්පූර්ණ කිරීමට අපොහොසත් වී ඇතැයි මාධ්‍යවේදියා ප්‍රශ්නයක් නගමින් පෙන්වා දුන් අතර, ඇමැතිවරයා පැවසුවේ එම ක්‍රීඩා පිටිය ඉදිකිරීම සඳහා පිළිගත් ටෙන්ඩර් පටිපාටිය අනුව කටයුතු දැනටමත් ආරම්භ කර ඇති බවයි.



"ටොරින්ටන් ක්‍රීඩා පිටියට මුල්ගල් තියන්නේ නෑ. එම ඉදිකිරීමට අවශ්‍ය කැබිනට් පත්‍රිකාව සකස් කර තිබෙනවා. අගමැතිතුමා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වෙන්කොටදී අවසන්. එහි මංතීරු 6ක සින්තටික් ධාවන පථයක් ඉදි වෙනවා. රාත්‍රී කාලයේ පුහුණු විය හැකි අයුරින් නවීනතම විදුලි ආලෝක ධාරා පද්ධතියක් සකස් කරනවා. ඉදිරියේදී වැඩ පටන් ගන්නවා" නාමල් රාජපක්ෂ මහතා පැවසීය.

ක්‍රීඩා අමාත්‍යාංශයේ නව සැලසුම යටතේ ඉදිරියේ රට පුරා ජාතික ක්‍රීඩා සංකීර්ණ 4ක් ඉදිවන අතර, දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 12ක්, පාසල් පිහිනුම් තටාක සමඟ ක්‍රීඩාංගණ 8ක් හා වොලිබෝල් ක්‍රීඩා පිටි 22ක් ඉදිකිරීමට කටයුතු යෙදේ. ඉහළ ක්‍රීඩා මධ්‍යස්ථාන සංවර්ධන ආකෘතින් අතර දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණය ජාතික ක්‍රීඩා මධ්‍යස්ථානය ලෙස සංවර්ධනය වන අතර පළාත් 9ක පළාත් කේන්ද්‍රීය ක්‍රීඩා මධ්‍යස්ථාන ස්ථාපිත වේ. මේවා සියල්ලම සින්තටික් ධාවන පථ සහිත අංග සම්පූර්ණ ක්‍රීඩා මධ්‍යස්ථාන වනු ඇත.

# නෙට්බෝල් නැඟෙන තරු හෙට පායයි




(වමේ සිට) පද්මා සිරිවර්ධන - අධ්‍යක්ෂ (පාලන) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, අමල් එදිරිසූරිය (අධ්‍යක්ෂ ජනරාල් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව), තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම් අනුරාධ විජේකෝන්, අශානි සේනාරත්න (අලෙවි ප්‍රධානි - සන්නාම කළමනාකරණ - ඩයලොග් ආසිආටා පීඑල්සී) සහ නෙට්බෝල් සම්මේලනයේ සභාපතිනී වික්ටෝරියා ලක්ෂ්මී.

අන්තර්ජාතික කාන්තා දිනය සැමරීම පිණිස, මෙරට ප්‍රමුඛතම සන්නිවේදන ආයතනයක් වන ඩයලොග් ආසිආටා පීඑල්සී, ශ්‍රී ලංකා නෙට්බෝල් සම්මේලනය හා එක්ව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමෙන්තුවේ සංවිධානයෙන් 'ඩයලොග් නෙට්බෝල් නැඟෙන තරු 2021' (Dialog Netball Rising Stars 2021) නමින් තරගාවලියක් පැවැත්වීමට කටයුතු යොදා තිබේ. ඉදිරියේදී අන්තර්ජාතික පිටිය ජයගත හැකි යොවුන් දක්ෂතා හඳුනාගෙන සංවර්ධනය කිරීම මේ තරගාවලියේ අරමුණයි.

දිවයිනේ පළාත් 9 නියෝජනය කරමින් ක්‍රීඩිකාවන් 150කගෙන් සමන්විතව කණ්ඩායම් 9ක් තරග වදින මේ තරගාවලිය හෙට (7) සහ අනිද්දා (8) දෙදින කොළඹ ටොරින්ටන් පිටියේදී පැවැත්වේ. තරගාවලියේ අවසන් මහා තරගය 8 වැනිදා පස්වරු 3.30ට ඇරඹීමට නියමිතය.

මේ තරගාවලියේ මූලික තරග ලීග් ක්‍රමයට පැවැත්වෙන අතර, අර්ධ අවසන් පූර්ව වටයේ සිට පිළිමළුන් පිටුදැකීමේ ක්‍රමයට තරග පැවැත්වේ. තෙවැනි ස්ථානය සහ අවසන් මහා තරගය කාර්තු 4කින් යුත් මිනිත්තු 40 තරග ලෙස පැවැත්වීමට නියමිතය.

ජාතික නෙට්බෝල් කණ්ඩායම ඉකුත් වසර කිහිපයේදී පැහැදිලි ප්‍රගතියක් පෙන්නුම් කළ අතර, ඒ අනුව අන්තර්ජාතික ශ්‍රේණිගත කිරීමේ 18 වැනි තැනට සහ ආසියා ශ්‍රේණිගත කිරීමේ පළමු තැනට පැමිණීමට සමත් විය.

"පසුගිය වසර කිහිපය පුරා අප විසින් සංවර්ධනය කරනු ලැබූ නව දක්ෂතා සංචිතය සමඟින් ආසියානු කලාපයෙන් ඔබ්බටත් ඉතාම හොඳින් දක්ෂතා දැක්වීමේ හැකියාව ශ්‍රී ලංකාව සතු වනවා මෙන්ම එහි ප්‍රගමනය සඳහා මේ තරගාවලිය ලොකු පිටිවහලක් වෙනවා." යැයි ශ්‍රී ලංකා නෙට්බෝල් සම්මේලනයේ සභාපතිනිය වික්ටෝරියා ලක්ෂ්මී මහත්මිය පැවසුවාය.

"කොරෝනා වසංගතය හේතුවෙන් මතු වූ බාධක මධ්‍යයේ වුවද මේ අයුරින් අන්තර්ජාතික කාන්තා දිනය සැමරීමට හැකිවන සේ තරගාවලියක් සංවිධාන කිරීමට අප සමඟ එක්වීම වෙනුවෙන් නෙට්බෝල් සම්මේලනයට මෙන්ම ඩයලොග් ආසිආටා සමාගමට මගේ ස්තුතිය පිරිනැමෙනවා." යැයි ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් අමල් එදිරිසූරිය මහතා පවසයි.

ශ්‍රී ලංකාවට ගෞරවයක් ගෙන ඒම පිණිස ශ්‍රී ලංකාවේ පළාත් නවයෙන්ම දක්ෂතා සපිරි ක්‍රීඩිකාවන්ගේ සංචිතයක් පිහිටුවා එහි වර්ධනය වෙනුවෙන් නෙට්බෝල් සම්මේලනය හා එක් වී කටයුතු කිරීමට හැකිවීම පිළිබඳ ඩයලොග් ආසිආටා සමාගම ආඩම්බර වන මේ තරගාවලිය පිළිබඳ අදහස් දක්වමින් ඩයලොග් ආසිආටා අලෙවි ප්‍රධානී අශානි සේනාරත්න මහතා කියා සිටී.

# කොළඹ හොකී අවසන් ගැටුම ඉරිදා

කොළඹ හොකී සංගමයේ මෙහෙයවීම වන කොළඹ අන්තර් ක්‍රීඩා සමාජ පිළිමළුන් පිටුදැකීමේ පිරිමි හොකී තරගාවලියේ ප්‍රමුඛ පෙළ අවසන් මහා තරගය හෙට (07) පස්වරු 4.00ට කොළඹ රීඩ් මාවත කෘත්‍රිම ක්‍රීඩාංගණයේදී පැවැත්වේ.

මේ තරගාවලිය 2019 වසරට අදාළ පැවැත්වීමට නියමිත වූ තරගාවලිය වන අතර කොරෝනා වසංගතය හේතුවෙන් මෙහි මූලික වටයේ තරග මේ වසරේ මුල් කාර්තුවේදී ක්‍රියාත්මක කෙරිණි. අවසන් තරගය සඳහා කොළඹ ආදි නාලන්දීය පිල මේ වන විටත් සුදුසුකම් ලබා ඇති අතර ඔවුන්ගේ ප්‍රතිවාදී අද පැවැත්වෙන දෙවැනි අවසන් පූර්ව තරගයෙන් තීරණය වීමට නියමිතය. එම තරගය සීඑච් ඇන්ඩ් එෆ්සී කණ්ඩායමට එරෙහිව බීආර්සී කණ්ඩායම අතර පැවැත්වේ. නාලන්දීය පිල අවසන් තරගයට පිවිසියේ පළමු අවසන් පූර්ව තරගයේදී කොළඹ රාජකීය ක්‍රීඩා සමාජය ගෝල් 4 - 1 ක් ලෙස පරාජයට පත් කරමිනි.

මේ තරගාවලියේ 'බී' කොටසේ අවසන් තරගයේදී කොළඹ ඩීඑස් සේනානායක පිල සහ කොළඹ සහිරා ක්‍රීඩා සමාජය හෙට (07) පස්වරු 02.30ට තරග වදින අතර, ආදි ආනන්දීය පිල සහ ආදි වෙස්ලි පිල 'සී' කොටසේ අවසන් තරගයට එක් වන්නේ අද පස්වරු 2.30ටය.

# ඔස්ට්‍රේලියාව තරගාවලිය සම කරයි

නවසීලන්ත ක්‍රිකට් කණ්ඩායම සමඟ වෙලින්ටන්හිදී ඊයේ පැවැති සිව්වැනි විස්සයි20 තරගයෙන් ලකුණු 50ක ජයක් අත් කර ගැනීමට සංචාරක ඔස්ට්‍රේලියානු පිල සමත් විය.

මේ සමඟින් තරග 5කින් සමන්විත විස්සයි20 තරගාවලිය 2-2ක් ලෙස සම කර ගැනීමට ද සංචාරයක්ට හැකි විණි.

තරගයේ පළමුව පන්දුවට පහර දුන් ඔස්ට්‍රේලියාව කඩුලු 6ක් දැවී ලකුණු 156ක් රැස් කළ අතර, එම ඉලක්කය හඹාගිය නවසීලන්තයට ඕවර 18.5කදී සියල්ලන් දැවී රැස් කළ හැකි වූයේ ලකුණු 106ක් පමණි. පන්දු 18කින් ලකුණු 30ක් රැස් කළ කයිල් ජේමිසන් නවසීලන්ත පිළිතුරු ඉනිමේ වැඩිම ලකුණු ලාභියා විය. ටිම් සෙයිෆර්ට් ලකුණු 19ක් සහ ඩෙවෝන් කොන්වේ ලකුණු 17ක් ඉනිමට එක් කළ අතර, සෙසු පිතිකරුවන්ට ලකුණු 10 සීමාව ඉක්මවීමට ඔස්ට්‍රේලියානු පන්දු යවන්නන්ගෙන් ඉඩක් නොලැබිණි.

පන්දු යැවීමේදී කේන් රිචඩ්සන් කඩුලු 3ක් බිඳ දැමූ අතර, ඇෂ්ටන් අගාර්, ග්ලේන් මැක්ස්වෙල් සහ ඇඩම් සම්පා කඩුලු 2 බැගින් දවා ගත්හ. හුදෙකලා සටනක නිරත වෙමින් පළමුව පන්දුවට පහර දුන් ඔස්ට්‍රේලියානු ඉනිමට සාර්ථක ආරම්භයක් දුන් නායක ආරොන් ෆින්ච් නොදැවී ලකුණු 79ක් රැස් කරමින් කණ්ඩායම ලකුණු 150 සීමාවෙන් එපිටට ගෙන ගියේය.

14 වැනි විස්සයි20 අර්ධ ශතකය සඳහා පන්දු 47ක් වැය කළ ෆින්ච් ඉතිරි ලකුණු 29 රැස් කිරීමට වැය කළේ පන්දු 8ක් පමණි. තෙවැනි තරගයේදී ප්‍රවේගකාරී ඉනිමක් දියත් කළ ග්ලේන් මැක්ස්වෙල්ට ඊයේ රැස් කළ හැකි වූයේ පන්දු 9කින් ලකුණු 18ක් පමණි.

ෆින්ච් සමඟ එක්ව සාර්ථක සබඳතාවක් ගොඩනැගුවේ ජෙයි රිචඩ්සන් පමණි. ඔවුන් දෙදෙනා අතර 7 වැනි කඩුල්ලට පන්දු 21කින් ලකුණු 42ක සබඳතාවක් ගොඩනැගුණ ද රිචඩ්සන් රැස් කළේ පන්දු 4කින් ලකුණු 7ක් පමණි. පන්දු යැවීමේදී ඉෂ් සෝදි කඩුලු 3ක් සහ ට්‍රෙන්ට් බෝල්ට් කඩුලු 2ක් දවා ගත්තේය.

දෙපිල අතර, තීරණාත්මක පස්වැනි සහ අවසන් විස්සයි20 තරගය හෙට (7) වෙලින්ටන්හිදීම පැවැත්වේ.



ආරොන් ෆින්ච්

# රිෂාබ්ගේ ශතකයෙන් ඉන්දියාව ඉදිරියට



රිෂාබ් පාන්ට්ගේ සටන්කාමී ශතකය හේතුවෙන් සංචාරක එංගලන්ත ක්‍රිකට් කණ්ඩායම සමඟ අහමදාබාද්හිදී පැවැත්වෙන සිව්වැනි සහ අවසන් ටෙස්ට් තරගයේ පළමු ඉනිම ක්‍රීඩා කරන ඉන්දියාව ඊයේ දිනයට ක්‍රීඩාව නතර කරන විට කඩුලු 7ක් දැවී ලකුණු 294ක් රැස් කර තිබිණි.

එංගලන්ත පළමු ඉනිම ලකුණු 205කට සීමා වූ අතර, ඒ අනුව කඩුලු 3ක් අතැතිව සිටින ඉන්දියාව එංගලන්ත පළමු ඉනිමට වඩා ලකුණු 89ක් ඉදිරියෙන් සිටී. දෙවැනි දිනයට ක්‍රීඩාව නතර කරන විට වොෂිංටන් සුන්දර් ලකුණු 60ක් සහ අක්ෂාර් පටේල් ලකුණු 11ක් රැස් කරමින් නොදැවී කඩුල්ලේ රැඳී සිටිති. තෙවැනි ටෙස්ට් අර්ධ ශතකය වාර්තා කළ සුන්දර් පන්දු 117කදී හතරේ පහර 8ක් ඉනිමට එක් කර තිබිණි.

ලකුණු 146කට කඩුලු 6ක් බිඳ වැටී තිබියදී පිටියේ එක් වූ රිෂාබ් සහ වොෂිංටන් සුන්දර් ලකුණු 113ක සබඳතාවක් සමඟින් මුළු ලකුණු සංඛ්‍යාව 259 දක්වා ඉදිරියට ගෙන ගියේය.

ඊයේ සිය තෙවැනි ටෙස්ට් ශතකය ලෙස ලකුණු 101ක් රැස් කළ පාන්ට් දැවී යෑමෙන් එම සබඳතාව නිමා විය. පන්දු 118කට මුහුණ දුන් ඔහු හතරේ පහර 13ක් සහ හයේ පහර 2කින් ඉනිම වර්ණවත් කර ගත්තේය.

රෝහිත් ශර්මා ලකුණු 49ක් ඉනිමට එක් කළ අතර, නායක විරාට් කෝලිට ලකුණු රැස් කිරීමට නොහැකි විය.

පන්දු යැවීමේදී ජේම්ස් ඇන්ඩර්සන් කඩුලු 3ක් දවා ගත්තේය. අද තරගයේ තෙවැනි දිනයයි.

# අන්තර් සමාජ විස්සයි20 ලන්කන් පිලට ගුවන් ප්‍රහාරයක්

**නිරෝෂාන් ප්‍රියංකර**

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මෙහෙයවන අන්තර් සමාජ විස්සයි20 ක්‍රිකට් තරගාවලිය දෙවැනි දිනය වූ ඊයේ පෙරවරුවේ පැවැති තරගයකින් ලන්කන් පිල පරදවා කඩුලු 6ක ජයක් අත් කර ගැනීමට ගුවන් හමුදා කණ්ඩායම සමත් විය.

තරගයේ පළමුව පන්දුවට පහර දුන් ලන්කන් පිල කඩුලු 6ක් දැවී ලකුණු 137ක් රැස් කළ අතර, එම ඉලක්කය හඹාගිය ගුවන් හමුදා ක්‍රීඩකයෝ කඩුලු 4ක් දැවී තිබියදී ජය හිමිකර ගත්තේ ඕවර 17.1කදීය. ලන්කන් පිලේ නායක හර්ෂ කුරේ අර්ධ ශතකයක් රැස් කළ ද එය තරගය ජය ගැනීමට ප්‍රමාණවත් නොවීය.

මේ අතර, ඊයේ පෙරවරුවේ පැවැති අනෙක් තරගවලින් ජයග්‍රහණ හිමිකර ගැනීමට මීගමුව, සැරසන්ස්, මුවර්ස් කණ්ඩායම් සමත් විය.

හලාවත මේරියන්ස්, රාගම සහ එන්සීසී ජය ගත්තේ පස්වරුවේ පැවැති තරගවලිනි. කටුනායක මේරියන්ස් ක්‍රීඩාංගණයේ පැවැති තරගයේදී මීගමුව පිල හමුවේ බීආර්සී ක්‍රීඩා සමාජය ලකුණු 47කින් පරාජයට පත් විය. එහිදී රොස්කෝ තැට්ටිල් ලකුණු 23කට කඩුලු 5ක් බිඳ දමමින් මීගමුව ජය පහසු කළේය. සැරසන්ස් පිල සරා පිටියේදී පාණදුර ක්‍රීඩා සමාජය කඩුලු 8කින් පරාජයට පත් කිරීමට සමත් වූ අතර, මුවර්ස් පිල හමුවේ පොලිසිය කඩුලු 6කින් පරාජය විය. එම තරගය එන්සීසී පිටියේදී පැවැත්විණි.

පස්වරුවේ පැවැති තරගවලදී පිළිවෙළින් කළුතර නාගරික (කඩුලු 3කින්), සෙබස්තියනයිට්ස් (කඩුලු 8කින්) සහ වරාය අධිකාරිය (කඩුලු 8කින්) පරාජයට පත් විය. මේ අතර, තරගාවලිය ආරම්භ කරමින් පෙරේදා (4) පැවැති තරගවලින් ජයග්‍රහණය අත් කර ගැනීමට රාගම, එස්එස්සී, නුගේගොඩ, එන්සීසී, සීසීසී, කෝල්ට්ස්, ටැමිල් යුනියන් සහ කුරුණෑගල යූත් කණ්ඩායම් සමත් වූහ.

මේ තරගවලදී පිළිවෙළින් නාවික හමුදාව, කළුතර නාගරික, බදුරලිය, බ්ලූම්ෆීල්ඩ්, ගාල්ල, වරාය අධිකාරිය, යුද හමුදාව සහ හලාවත මේරියන්ස් කණ්ඩායම් පරාජයට පත් වූහ.

තරගාවලියේ තෙවැනි දිනය යටතේ අද (6) තරග 8ක් පැවැත්වෙන අතර, හෙට දිනයේදීත් තරග 8ක් පැවැත්වීමට නියමිතය.

# කොරෝනා පීඑස්එල් කල් යවයි

පාකිස්තාන ක්‍රිකට් ආයතනය මෙහෙයවන පාකිස්තාන සුපර් ලීග් (පීඑස්එල්) විස්සයි20 ක්‍රිකට් තරගාවලිය කොරෝනා වසංගත හේතුවෙන් කල් දමයි.

මේ තරගාවලිය පසුගිය මස 20 වැනිදා ආරම්භ වූ අතර, තරගාවලිය අතරතුර 7 දෙනකුට කොරෝනා වයිරසය ආසාදනය වීමත් සමඟ ඇති වූ තත්ත්වය සැලකිල්ලට ගනිමින් කණ්ඩායම් හිමිකරුවන් හා කළමනාකරුවන් අතර පැවැති සාකච්ඡාවලින් පසු මෙලෙස තරගාවලිය කල් දැමීමට පාකිස්තාන ක්‍රිකට් ආයතනය කටයුතු කළේය. වයිරසය ධනාත්මක වූ 7 දෙනාගෙන් 6 දෙනකුම ක්‍රීඩකයන්ය.

මේ තරගාවලිය යටතේ තරග 34ක් පැවැත්වීමට නියමිත අතර, මේ වන විට නිමා වී ඇත්තේ මූලික වටයේ තරග 30න් 14ක් පමණි.

මේ අතර, කණ්ඩායම්වල සියලු සාමාජිකයන්ට නැවත පීසීආර් පරීක්ෂණ කිරීමටත්, එන්නත් දීමටත් අවශ්‍ය කටයුතු කරන බව පාකිස්තාන ක්‍රිකට් ආයතනය පවසයි.

# තෙවැනි කඩුල්ලට රාජකීයෙන් ත්‍රිත්ව ශතකයක්

මහනුවර ත්‍රිත්ව විදුහල් පිල සමඟ කොළඹ රාජකීය විදුහල් පිටියේ පැවැති තරගයේ පළමුව පන්දුවට පහර දුන් රාජකීය විදුහල වෙනුවෙන් තෙවැනි කඩුල්ලට ලකුණු 362ක විශිෂ්ට සබඳතාවක් ගොඩනැඟීමට අහන් වික්‍රමසිංහ සහ සදීෂ රාජපක්ෂ සමත් වූහ.

පන්දු 223කට මුහුණ දුන් අහන් හතරේ පහර 17ක් සහ හයේ පහර 2ක් සමඟින් නොදැවී ලකුණු 210ක් රැස් කළ අතර, හතරේ පහර 10ක් සමඟ නොදැවී ලකුණු 152ක් රැස් කළ සදීෂ පන්දු 259කට මුහුණ දී තිබිණි.



ඡායාරූපය - හිරන්ත ගුණතිලක

### කතෝලිකයන් හා බෞද්ධයන් අතර විරසකයක් හදන වෑයමක්දැයි සැකයි

# කොමිසම පාස්කු ප්‍රහාරය කළ ත්‍රස්තවාදීන් මඟහැර, බෞද්ධ සංවිධාන පස්සේ දුවලා

## රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා



මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීමේදී මතභේදයට තුඩු දුන් කෑෘඩියා සිලනිකා ශාඛය එම ස්ථානයේ ම තබා, මාර්ග සැලසුම වෙනස් කිරීමට මහජන මුදල් රුපියල් ලක්ෂ 80,000ක් අමතරව වැය වන බව ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා මහතා පවසයි.

මේ මුදල් ජනතාවගේ බදු මුදල් බැවින් ඒ සඳහා ගතයුතු ක්‍රියාමාර්ගය පිළිබඳ ජනතාව තීන්දු කළ යුතු බවද රාජ්‍ය ඇමැතිවරයා සඳහන් කරයි.

රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා මේ බව පැවසුවේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීමේ අවස්ථාවට පසුගියදා (4) සහභාගී වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය අමාත්‍ය නිමල් ලාන්සා මහතා, මධ්‍යම අධිවේගී මාර්ගය හදා ගෙන යද්දී දුර්ලබ කෑෘඩියා සිලනිකා නම් ගස හමු වුණා. රටේ ජනතාව ඉල්ලනවා ගහ ආරක්ෂා කරන්න කියලා. ජනතාවට ඇහුම්කන් දීලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න කැබිනට් ඇමැතිවරයා, අප සියලු දෙනා කටයුතු කරනවා. මේ මහජනතාවගේ මුදල්. මේ සැලැස්ම වෙනස් කිරීම කළහොත් බිලියන අටක් ජනතාවගේ මුදල් වැය වෙනවා. මේ ගහ ගලවලා වෙනත් තැනක සිටුවන්න පුළුවන් කියලා පරිසර සංවිධාන එක් වෙලා කියලා තියෙනවා. නමුත් අපට ඒ කටයුත්ත කරන්න බැහැ. ඒ ගස හොල්ලන්න එපා කියලා විශාල සමාජ මතයක් තියෙනවා. එහෙමනම් ලක්ෂ 80,000ක් වියදම් කරලා සැලැස්ම වෙනස් කරන්න අපට සිදු වෙනවා. මේ ජනතාවගේ සල්ලි නිසා ජනතාව තීන්දු කරන්න ඕනෑ මොකක්ද කළ යුත්තේ කියලා. ගස එසේම තබා සැලැස්ම වෙනස් කරන්න අප මේ වන විට සාකච්ඡා කර ගෙන යනවා. ඒ පිළිබඳ අවසන් තීන්දුවක් තවම අරගෙන නැහැ.

පාස්කු කොමිසමේ වාර්තාව පිළිබඳ විවිධ අය විවිධ අදහස් ප්‍රකාශ කරනවා. පාස්කු ප්‍රහාරය එල්ල වුණේ පසුගිය යහපාලන ආණ්ඩුව කාලයේදී. පාස්කු කොමිසම පත් කළේ යහපාලන ආණ්ඩුවේ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා. ඒක ගෝඨාභය රාජපක්ෂ මහතා පත් කළ කොමිසමක් නොවෙයි. සමහර අය මේක අමතක කරලා කතා කරනවා. සමහර අය පාස්කු ප්‍රහාරය වුණේ අපේ කාලයේ වගේ කතා කරනවා.

මේ කොමිසමේ වාර්තාව පිළිබඳ අපට විශාල ප්‍රශ්නයක් තියෙනවා. ත්‍රස්තවාදී ක්‍රියාව සිදුකළ, ඒ සඳහා උදවු කළ පිටුපස සිටින අය සොයා ගැනීමයි අපේ කාදිනල් හිමිපාණන් බලාපොරොත්තු වුණේ. මෙහි බෞද්ධ සංවිධාන ටිකක් අල්ලගෙන තියෙනවා. පාස්කු ප්‍රහාරය එල්ල කළේ බෞද්ධ සංවිධාන නොවෙයි. බෞද්ධ සංවිධාන ගැන නම් කරල තිබෙන්නේ මොකටද කියලා මම දන්නෙ නැහැ. කතෝලික මන්ත්‍රීවරු විදියට, කතෝලික සභාව විදියට අපි ඉල්ලුවේ පාස්කු ප්‍රහාරය සිද්ධ කළ ත්‍රස්තවාදීන් අල්ලා ගන්න කියලා. අපට උදවු කරපු සිංහල බෞද්ධ සංවිධාන ගැන නොවෙයි අපි කතා කළේ. කතෝලික සහ බෞද්ධ ජනතාව අතර ප්‍රශ්නයක් ඇති කරන්න කවුරුහරි මැදිහත් වුණාද කියලා අපට හිතෙනවා. මියගිය අහිංසක මිනිසුන් වෙනුවෙන් ඒ සාධාරණත්වය ඉටු වුණේ නැහැ කියලා පැහැදිලිවම කියන්න ඕනෑ.

කාදිනල්තුමා මේ ඉරිදා කළු ඉරිදාවක් ලෙස ප්‍රකාශයට පත් කර තියෙනවා. ඒක ඉතාමත් සාධාරණ වැඩපිළිවෙළක්. මිය ගිය අහිංසක ජනතාවට සාධාරණයක් ඉල්ලන එක අයිතියක්. ඒ අයිතිය වෙනුවෙන් තමයි මේ ඉරිදා ගෙවල්වල කළු කොඩියක් ඔසවන්න කියලා, පල්ලියට කළු ඇඳගෙන එන්න කියලා ඒ කටයුත්ත කරන්නේ. එයින් අදහස් කරන්නේ බෝම්බ ප්‍රහාරවලින් මියගිය ජනතාවට සාධාරණයක් ඉටු කරන්න විතරයි. ජනාධිපතිවරයාත්, අප සියලු දෙනාත් විශාල මහන්සියක් වෙනවා පාස්කු ප්‍රහාරයට සම්බන්ධ සියලු දෙනා නීතිය ඉදිරියට ගේන්න. එය කඩිනම් කිරීමට අපි ජනාධිපතිරයාගෙන් ඉල්ලා සිටියා. අපි කිසිකෙනෙක් ඒ අය ආරක්ෂක කරන්න මැදිහත් වෙන්නේ නැහැ. මේ ඉරිදා කාදිනල් හිමිපාණන් කරන වැඩපිළිවෙළ ඉතාමත් සාධාරණයි කියලා පැහැදිලිවම කියන්න ඕනෑ.

## කොවිඩ් මරණ භූමිදානයට ඉඩ දීම ගැන ප්‍රසාදය පළ කරනවා

### මුස්ලිම් ලෝක ලීගය

**මහින්ද අලුත්ගෙදර**

කොවිඩ් - 19 වයිරසය ආසාදනය වීම හේතුවෙන් මියයන පුද්ගලයන්ගේ සිරුරු භූමදානය කිරීමට ශ්‍රී ලංකා රජය ගත් තීරණය සම්බන්ධයෙන් මුස්ලිම් ලෝක ලීගය ප්‍රසාදය පළ කරයි.

ඉස්ලාමීය ඉගැන්වීම්වලට අනුකූලව කොවිඩ් - 19 ආසාදිත මියගිය මුස්ලිම්වරුන්ගේ සිරුරු ආදාහනය නොකරන ලෙස ලීගයේ ඉල්ලීමට ශ්‍රී ලංකා රජය දැක්වූ ප්‍රතිචාරය මුස්ලිම් ලෝක ලීගය අගය කර තිබේ.

ශ්‍රී ලංකා විදේශ ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා සමග පැවති දුරකතන සංවාදයක දී මුස්ලිම් ලෝක ලීගයේ මහලේකම් ෂෙයික් මුහම්මද් අල්-ඊසා මේ බව ප්‍රකාශ කර තිබේ. ඉස්ලාමීය ප්‍රජාවන් සඳහා ගෝලීය යොමු කිරීමක් නියෝජනය කරන ශ්‍රී ලංකා රජය සහ මුස්ලිම් ලෝක ලීගය අතර පවතින සමීප සම්බන්ධතාව ශක්තිමත් වනු ඇති බවද හෙතෙම පෙන්වා දී ඇත.

මේ අතර, ඉස්ලාමීය සහයෝගීතා සංවිධානයේ මහලේකම් කාර්යාලය ද ශ්‍රී ලංකා රජයේ තීරණය පිළිගෙන තිබෙන අතර වසංගතය අතරතුර අවස්ථා කිහිපයක දීම මුස්ලිම්වරුන් ආදාහනය කිරීමෙන් වළකින ලෙසත් ඔවුන්ට ඉස්ලාමීය සුසාන භූමියක් දෙන ලෙසත් ශ්‍රී ලංකා බලධාරීන්ගෙන් ඉල්ලා සිටි බවද හෙතෙම සඳහන් කර තිබේ.

# බටහිර රටවල යෝජනාවලට ආණ්ඩුව පාර්ශ්වකරුවකු නොවිය යුතුයි

## ජාතික සංවිධාන එකමුතුව

**උපාලි කරුණාරත්න**



වත්මන් රජය පෙරළා දැමීමට බටහිර රටවල් උත්සාහ කරන බවත්, කොළඹ වරායේ නැගෙනහිර ජැටිය නැවත ඉන්දියාවට දීමට ඇතැම් කණ්ඩායම් උත්සාහ කරන බවත් ජාතික සංවිධාන එකමුතුවේ නියමුවෝ කියා කියා සිටිති.

මේ බැව් අනාවරණය වූයේ ඊයේ (04දා) රාජගිරිය ජාතික සංවිධාන එකමුතු කාර්යාලයේ පැවැති මාධ්‍ය හමුවක දීය. මෙහිදී අදහස් දැක්වූ ජාතික සංවිධාන එකමුතුවේ කැඳවුම්කරු ආචාර්ය ගුණදාස අමරසේකර මහතා මෙසේ පැවසීය.

ජිනීවාවල සිදුවන දේ පිළිබඳ ජනතාව දැනුවත් වීම අඩු බව පෙනෙනවා. ඒ වගේම එහි ක්‍රියකාරීත්වය පිළිබඳ තොරතුරු ලැබීමද අඩුයි. එම නිසා එහිදී අපට අහිතකර යෝජනා ගෙන එයිද යන්න ගැන සැකය පවතිනවා. අප කිසිම බටහිර යෝජනාවකට සම්බන්ධ නොවිය යුතුයි. ජිනීවා මානව හිමිකම් සම්මන්ත්‍රණයේ බටහිර උගුල් පිළිබව අප විමසිලිමත් වන්න ඕනෙ.

වෛද්‍ය වසන්ත බණ්ඩාර මහතා - වත්මන් රජය සම්බන්ධයෙන් අපට යම් යම් ගැටලු පවතිනවා. පාස්කු කොමිෂන් වාර්තාව පිළිබඳව ගැටලු තිබෙනවා. ඉස්ලාම් අන්තවාය කියන්නෙ අන්තර්ජාතික ක්‍රියාවලියක්. හැබැයි එය බෞද්ධ සංවිධානවල ක්‍රියාකාරීත්වය නිසා ඇති වූවක් නොවේ. ටී.එන්.ජේ සහ මුස්ලිම් කොංග්‍රසය පිළිබඳ මේ රටේ ජනතාව විමසිලිමත් වන්න ඕනෙ. මොවුන් වෙනම කලාප ඉල්ලනවා. මොවුන් සමඟ පෙරට ඒමට කටයුතු කරන්නන් පිළිබඳ සැළකිලිමත් විය යුතුයි.

එල්ටීටීඊ ත්‍රස්තවාදය විනාශ කිරීමේදී එම ප්‍රදේශවල ජනතාව ආරක්ෂා කර ගැනීමට හමුදාව ක්‍රියා කළ ආකාරය පිළිබඳ නිවැරැදි අවබෝධයක් ලෝකයාට දෙන්න ඕනෙ. මේවා ගැන කතා නොකළොත් පසුගිය රජය සිදුකළ විවිධ පාවාදීම් නිසා ඇති විය හැකි ගැටලුවලට මුහුණ දෙන්න අපට සිදු වෙනවා. ඒ වගේම රට විනාශ කිරීමට ක්‍රියා කරන ඔත්තුකරුවන්ට අප නොරැවටිය යුතුයි.

මෙහිදී අදහස් දක්වමින් නීතිඥ කල්‍යානන්ද තිරාණගම මහතා සඳහන් කළේ ශ්‍රී ලංකාව බෙදීමේ වැඩපිළිවෙළ සූක්ෂම අන්දමින් ක්‍රියාත්මක වන බවයි. පළාත් සභා යනු බෙදුම්වාදයට දොරටු විවෘත කිරීමක් යයිද තිරාණගම මහතා පැවසීය.

## මෛත්‍රීගේ කොමිසම හැර පාස්කු ප්‍රහාර ගැන කිසිම පියවරක් ගෙන නැහැ

### පා.ම. ජේ.සී. අලවතුවල



**පහන් විජේසේකර**

පාස්කු ප්‍රහාරයට සම්බන්ධ වූ සියලු දෙනාට දඬුවම් දෙන බව පවසා බලය පැමිණි ආණ්ඩුව, ඒ සම්බන්ධයෙන් මෙතෙක් කිසිම ක්‍රියාමාර්ගයක් ගෙන නැතැයි විපක්ෂනායක කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදී අදහස් දක්වමින් සමගි ජනබලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ජේ.සී. අලවතුවල මහතා පෙරේදා (04) පැවැසීය. එහිදී අදහස් දැක් වූ ඒ මහතා මෙසේ ද කීවේය.

මේ රටේ සෑම කාරණාවක්ම ඉතාම ව්‍යාකූල තත්ත්වයට පත්වෙලා. පාස්කු ප්‍රහාරය සම්බන්ධව රජයට ලොකු වගකීමක් තියෙනවා. 69 ලක්ෂයක් ඡන්දය අරන්, රටේ ජාතික ආරක්ෂා කරන බව කියලා ආණ්ඩුව බලය ගත්තා. පාස්කු ප්‍රහාරයට සම්බන්ධ සියලු දෙනාට දඬුවම් දෙනවා කිව්වා. නමුත් රජය මේ දක්වා ගත්ත ක්‍රියාමාර්ගයක් නැහැ.

මෙතෙක් තිබුණේ මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් පත් කර කොමිසම පමණයි. එම කොමිසම් වාර්තාවේ මහ මොළකරුවන් ගැන නැහැ. එය හෙළිදරව් වෙයි කියලා විශාල බලාපොරොත්තුවක් ජනතාව තුළ තිබුණා.

කාදිනල් උන් වහන්සේ පවා කොමිසම් වාර්තාව ප්‍රතික්ෂේප කරලා. ඒ වෙනුවෙන් කළු ඉරිදාවක් ප්‍රකාශයට පත් කරලා. ප්‍රහාරය සම්බන්ධයෙන් තවම එම ජනතාවට සාධාරණයක් ඉටු වෙලා නැහැ. එය ඉටුවෙයි කියලා එම ජනතාව ඡන්දය මේ ආණ්ඩුවට දුන්නා. ප්‍රහාරයට අනුබල දුන්න මුදල් දුන්න අය සම්බන්ධයෙන් නිසි සාධාරණයක් ඉටු වී නැහැ. එම ප්‍රහාරයෙන් 300කට ආසන්න පිරිසක් මිය ගියා. තවත් පිරිසක් තුවාල ලැබුවා.

ප්‍රහාරය නිසා හෝටල්, පල්ලිවලට විශාල හානියක් සිදු වුණා. ආගමක්, ජාතියක් වශයෙන් නෙමෙයි සමස්ත රටටම විශාල හානියක් සිදු වුණා. ජනතාව ජාති බේද, ආගම් බේද අමතක කර ඡන්දය දුන්නේ එයට සාධාරණයක් වේය යන විශ්වාසයෙන්. නමුත් ආණ්ඩුව එය දේශපාලන වාසි ගන්න යොදා ගත්තා. තවම කොමිසම් වාර්තාවේ දීල තියෙන්නේ එක වෙළුමයක් පමණයි.

කාදිනල් උන් වහන්සේ ඇතුළු කතෝලික ජනතාවට සාධාරණයක් ඉටු කිරීමට රජය අපොහොසත් වෙලා. රජයට වුවමනාවක් නැහැ සැබෑ කණ්ඩායම සොයන්න. මෙහි වාසිය කාටද ලැබුණේ, මුදල් ගෙවලා සහරාන් තියා ගත්තේ කවුද, බෝම්බකරුගේ බිරිඳ යැයි කියන කාන්තාව ඉන්දියාවට යැව්වේ කවුද මේවගේ ප්‍රහාරය පසුපස තියෙන අබිරහස් තැන් සොයන්න ආණ්ඩුව කටයුතු කරන්නේ නැහැ යැයි මන්ත්‍රීවරයා කීය.

# එජාප ආණ්ඩු කාන්තා අයිතිවාසිකම් රැක්කා

## එජාප සභාපති, හිටපු ඇමැති වජිර අබේවර්ධන

**ශිරෝමි අබයසිංහ**



කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරැකීමට පැවති සියලුම එක්සත් ජාතික පක්ෂ රජයන් යටතේ සාධනීය පියවර රැසක් ගත් බව එම පක්ෂයේ සභාපති හිටපු ඇමැති වජිර අබේවර්ධන මහතා පවසයි. මාධ්‍ය වෙත අදහස් දක්වමින් අබේවර්ධන මහතා මේ බව සඳහන් කළේය.

ප්‍රථම වතාවට කාන්තා කටයුතු අමාත්‍යාංශයක් පිහිටුවීම, කාන්තා ප්‍රඥප්තියක් සකස් කිරීම සහ පළාත් පාලන ආයතන තුළ සියයට විසි පහක් කාන්තා නියෝජනය අනිවාර්ය කිරීම වැනි පියවර මගින් ජේ.ආර්. ජයවර්ධන, ආර්. ප්‍රේමදාස සහ රනිල් වික්‍රමසිංහ මහත්වරුන් නායකත්වය දැරූ පාලන කාලය තුළ කාන්තා සුබ සාධනය සඳහා ඉමහත් සේවාවක් සිදු කළ බවත් වජිර අබේවර්ධන මහතා පැවසීය.

ජේ.ආර්. ජයවර්ධන මහතාගේ රජය මගින් කාන්තා අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගෙන සම්මත කළ අතර 1980 ජූලි 11 වන දින කාන්තාවන් පිළිබඳ ඉදිරිපත් වූ ජාත්‍යන්තර සම්මුතීන් වන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය සහ ආර්ථික සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය පිළිගත් බවත් අබේවර්ධන මහතා සිහිපත් කළේය.

එසේම කාන්තාවන්ට එරෙහි වෙනස්කම් තුරන් කිරීමේ සම්මුතියටද අත්සන් තබා 1981 ඔක්තෝබර් 05 වන දා සිට එය බලාත්මක කළ බවත් 1982 දී ඉදිරිපත් වූ සියලුම ආකාරයේ වාර්ගික වෙනස්කොට සැළකීම් පිටු දැකීමේ ජාත්‍යන්තර සම්මුතියටද අත්සන් තබා පිළිගත් බව කී අබේවර්ධන මහතා ජේ.ආර්. ජයවර්ධන මහතාගේ රජය මගින් වනිතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයක් බිහි කළ බවත් 1993 දී රණසිංහ ප්‍රේමදාස මහතාගේ ජනාධිපති ධූර කාලයේදී, කාන්තා ප්‍රඥප්තියක් සකස් කර සම්මත කර කාන්තාවට සහන රැසක් ලබා දුන් බවත් පැවසීය.

පරිපාලන සේවයේ නියෝජනය 20%ක් වූ කාන්තා නියෝජනය එම තත්ත්වයෙන් මුදා හැර සුදුසු අයුරින් පත් කර ගැනීමට ඉඩ කඩ ලබා දීම, ප්‍රසූත නිවාඩුවට හිමි වූ දින 42, දින 85 ක් දක්වා දීර්ඝ කිරීම, රාත්‍රී වැඩ මුරයේ යෙදෙන කාන්තාවන් සඳහා ප්‍රවාහන පහසුකම් ලබා දීමට සැලස සහ කාන්තාවන්ට පුරුෂයන් හා සමානව වැටුප් ගෙවීමට සැලසීම ආදී සහන රාශියක් එම ප්‍රඥප්තිය මගින් ලබා දුන් බවත් අබේවර්ධන මහතා කීය.

# ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් ගොඩනැගීම අපේ අරමුණයි



## පා.ම. කපිල නුවන් අතුකෝරළ

**ත්‍රිකුණාමලය විශේෂ - ඒ.එම්.ඒ. ෆරීඩ්**

පෞද්ගලික න්‍යාය පත්‍රවලට යට නොවී, රට සංවර්ධනය කිරීමට සියලු දෙනාම අත්වැල් බැඳගෙන කටයුතු කළයුතු බව ත්‍රිකුණාමල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හා සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපති කපිල නුවන් අතුකෝරල මහතා පැවසීය.

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ප්‍රථම සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන නිල වශයෙන් ආරම්භ කිරීමේ සමාරම්භක වැඩසටහන කන්තලේ අග්බෝපුර ගම්මානයේදී පෙරේදා (4දා) පැවැති අවස්ථාවේදී ඒ මහතා මේ බව පැවසීය. එහදී තවදුරටත් අදහස් දක්වමින් මන්ත්‍රීවරයා මෙසේ කියා සිටියේය.

සෞභාග්‍යයේ දැක්ම වැඩසටහන් යටතේ ව්‍යවසායකයන් දිරි ගැන්වීමේ අරමුණින් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. ඒ හරහා දැනට ව්‍යවසායකත්ව කටයුතුවල නිරත වන ජනතාව දිරිගැන්වීම සිදු කරනවා. එමගින් ඔවුන්ගේ ආදායම වැඩි කිරීමට අවශ්‍ය වෙළෙඳපළ පුළුල් කිරීමට අවශ්‍ය සහයෝගය ආණ්ඩුවෙන් ලැබෙනවා.

ඒ හරහා ජනතා කේන්ද්‍රී ආර්ථිකයක් ගොඩනැගීමට අවස්ථාව සැලසෙනවා. සමහර දේශපාලන පක්ෂ සහ ජාතිවාදී කල්ලි රට විනාශ කිරීමේ අරමුණින් ජනතාව රවටමින් සිටිනවා. එම රැවටීම් වලට හසු නොවී ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය සංවර්ධිත දිස්ත්‍රික්කයක් ලෙස පරිවර්තනය කිරීමට සියලු දෙනාම අවශ්‍ය සහයෝගය ලබා දීම කාලීන අවශ්‍යතාවක්.

# පාස්කු ප්‍රහාරය අන්තවාදය පෝෂණය කිරීමේ ප්‍රතිඵලයක්



## පා.ම. මොහොමඩ් මුසම්ල්

2019 අප්‍රේල් 21 වැනිදා මෙරට කතෝලික පල්ලි තුළ බෝම්බ අටක් පුපුරුවා හරිමින් තුන්සියයකට අධික පිරිසකට ජීවිත අහිමි වීම සිදු වන්නේ සමස්ත ලංකා ජමියතුල් උලමා සභාව පෝෂණය කළ අන්තවාදයේ ප්‍රතිඵලයක් ලෙස බව පාර්ලිමේන්තු මන්ත්‍රී මොහොමඩ් මුසම්ල් මහතා පවසයි.

සිංහල දෙමළ, මුස්ලිම් ජනතාවගේ සැබෑ සහජීවනය, සංහිඳියාව ඔස්සේ ගොඩනැගෙන ජාතික සමගිය වෙනුවෙන් සෑම විටම පෙනී සිටින තමන් එම විවේචනය එල්ල කිරීමට කිසිසේත් පසුබට නොවන බවද මොහොමඩ් මුසම්මිල් මහතා සමස්ත ලංකා ජමියතුල් උලමා සභාවේ වැඩබලන මහලේකම් වෙත ලිපියක් යොමු කරමින් සඳහන් කරයි.

ශ්‍රී ලංකාව තුළ මුස්ලිම් පල්ලි, සාම්ප්‍රදායික මුස්ලිම් ජනයාට සාමකාමී සහජීවනයට මඟ පෙන්වමින් කටයුතු කළ තත්ත්වය කනපිට හරවා ඒවා තම ග්‍රහණයට ගෙන, තමන්ට වුවමනා ආකාරයට හසුරුවමින් කටයුතු කිරීමට මුල් වූ ඔබ සංවිධානය පාර කැපුවේ ජාතික සංහිඳියාව දෙසට නොව අන්තවාදී ත්‍රස්තවාදය දෙසට බව ද එහි දැක්වේ.

# බන්ධනාගාරවල මත්ද්‍රව්‍ය භාවිතය නවතන්න අලුත් වැඩසටහනක්



## රැඳවූවන්ගෙන්ම තෝරාගත් කණ්ඩායම් පුහුණු කරවති

**බුද්ධිකා ඉඹුලාන**

මතින් තොර බන්ධනාගාර (Drugs Free Prisons )සංකල්පය හඳුන්වා දෙමින් රැඳවූවන්ගේ නායකත්වය තුළින්ම මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වැඩපිළිවෙළේ ප්‍රථම අදියර බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය , බන්ධනාගාර කොමසාරිස් (පාලන හා පුනරුත්ථාපන) චන්දන ඒකනායක මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් වැලිකඩ බන්ධනාගාරයේදී පසුගියදා (03) ආරම්භ කෙරිණි.

අන්තරායකර ඖෂධ පාලක මණ්ඩල හා බන්ධනාගාර දෙපාර්තමේන්තුව එක්ව ,බන්ධනාගාර තුළ මත්ද්‍රව්‍ය අවම කිරීම සඳහා ක්‍රියාත්මක කරන වැඩපිළිවෙළෙහි එක් පියවරක් ලෙස රැඳවූවන්ගේ කණ්ඩායම් නායකයන් පුහුණු කිරීමට වැලිකඩ, කොළඹ රිමාන්ඩ් හා මැගසින් යන බන්ධනාගාර වල දෙදින පුහුණු වැඩසටහන් පැවැත්වීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුව තීරණය කර ඇත.

එහි නියමු වැඩසටහන ලෙස වැලිකඩ බන්ධනාගාරයේ පුහුණු සැසිය පසුගියදා (03) ඇරැඹූ අතර මෙම පුහුණුව මගින් බන්ධනාගාර තුළ බන්ධනාගාර ගතවූ පසු විවිධ ක්‍රම මගින් මත්ද්‍රව්‍ය ලබා ගැනීමට විරුද්ධව කටයුතු කරන නේවාසික කණ්ඩායමක් ඔවුන්ගේ නායකත්වය යටතේ බිහිකර එම කණ්ඩායම මගින් අනෙකුත් නේවාසිකයන් දැනුවත් කිරීම මෙහි අරමුණ වෙයි.

රැඳවූවන් අතරින් කණ්ඩායම් නායකයන් ලෙස තෝරා ගන්නා ලද රැඳවූවන්ගේ හැකියාවන් හා දක්ෂතාවයන් හඳුනා ගැනීමත් නායකයකු සතු ලක්ෂණ හා වගකීම් පිළිබඳවත් මත්ද්‍රව්‍ය හඳුනා ගැනීම හා නිවාරණය, ජීවිතාවබෝධය, රසවින්දනය හා පෞරුෂත්ව වර්ධනය කිරීම යන මාතෘකා ඔස්සේ ඉතා වටිනා පුහුණුවක් මෙම දින දෙක ඇතුළත ලබාදෙයි.

වැලිකඩ බන්ධනාගාර පුහුණු සැසියේ ආරම්භක උත්සවය සඳහා , වැලිකඩ බන්ධනාගාර අධිකාරී ගාමිණී බී. දිසානායක මහතා ඇතුළු බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීන් රැසක් ද අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය නියෝජනය කරමින් සහකාර අධ්‍යක්ෂක රෝෂන් ගුණවර්ධන , සහකාර අධ්‍යක්ෂක ඉසුරු සමරකෝන් , කලමනාකරු සනත් දිනසේකර මහත්වරුන් ඇතුළු උපදේශන සහකාර නිලධාරී මහත්ම මහත්මීහු රැසක් සහභාගී වූහ.

# කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානය රාජ්‍ය ඇමැතිනියගේ නිරීක්ෂණයට



ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග සහ කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය ඇමැතිනී විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය බිංගිරිය වයඹ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ පවත්වාගෙන යන කොවිඩ් - 19 ප්‍රතිකාර මධ්‍යස්ථානය නිරීක්ෂණය කළ අයුරු.

බිංගිරිය වයඹ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ පවත්වාගෙන යන කොවිඩ් - 19 ප්‍රතිකාර මධ්‍යස්ථානය ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග සහ කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය ඇමැතිනී විශේෂඥ වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මියගේ නිරීක්ෂණයට ලක්විය.

එහි ප්‍රතිකාර ලබමින් සිටින පිරිස් සඳහා පවතින පහසුකම් පිළිබඳව සොයා බැලීමට එක් වූ අමාත්‍යවරිය ඔවුන් සමඟ සුහද කතා බහක යෙදුණාය.

ප්‍රතිකාර ලබමින් සිටින පිරිස අමාත්‍යවරියට සඳහන් කර සිටියේ එහි පවතින පහසුකම් සහ සේවාව පිළිබඳව තමන් සතුටු වෙන බවය.

අමාත්‍යවරිය සමඟ කතාබහ කළ පිරිස දින 8ත් 10ත් අතර ප්‍රමාණයක් වයඹ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ ප්‍රතිකාර ලබමින් සිටින පිරිසකි. එහිදී අමාත්‍යවරිය ඔවුන්ගෙන් ඉල්ලා සිටියේ කොවිඩ් වයිරසයෙන් ආරක්ෂා වීම සඳහා අනුගමනය කළ යුතු සෞඛ්‍ය උපදෙස් පිළිබඳව හැකි සෑමවිටම තම හිතවතුන් ඥාතීන් දැනුවත් කරන ලෙසය.

ප්‍රතිකාර මධ්‍යස්ථානයේ සේවය කරන සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ කටයුතු පිළිබඳව ද සොයා බැලූ අමාත්‍යවරිය ඔවුන්ගේ සැපදුක් විමසා බැලීමට ද කටයුතු කළාය. එමෙන්ම ඔවුන් ඉටු කරන සේවය පිළිබඳව සිය කෘතවේදීත්වය පිරිනැමීමට ද අමතක නොකළාය. බිංගිරිය වයඹ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ පවත්වාගෙන යන ප්‍රතිකර මධ්‍යස්ථානය භාරව කටයුතු කරනුයේ ශ්‍රී ලංකා යුද හමුදාවය. එම මධ්‍යස්ථානය පිරිසිදුව පිළිවෙළකට පවත්වාගෙන යෑම පිළිබඳව සිය ප්‍රසාදය පළ කළ රාජ්‍ය අමාත්‍යවරිය කොවිඩ් 19 මර්දනය සඳහා යුද හමුදාව ඇතුළු ත්‍රිවිධ හමුදාවත්, පොලිසියත් සිදු කරන කාර්ය භාරය පිළිබඳව විශේෂ ස්තුතියක් මෙහිදී පළ කළාය.

බිංගිරිය වයඹ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ පවත්වාගෙන යන ප්‍රතිකාර මධ්‍යස්ථානයේ ඇඳන් 550ක ප්‍රමාණයක් පවතින අතර මේ දක්වා ප්‍රතිකාර, ලැබීමට 5211ක පිරිසක් ඇතුළත්ව සිටි අතර සුව වී නිවෙස් වෙත ගිය ප්‍රමාණය 5069කි. මෙම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර ලැබූ කිසිවෙකු මරණයට පත්ව නොමැති අතර මේ වන විට 60 දෙනෙකු ප්‍රතිකාර ලබමින් සිටියි. හලාවත මහ රෝහලේ අධීක්ෂණය යටතේ මෙම ප්‍රතිකාර මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සිදු වේ.

මෙම අවස්ථාවට ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග සහ කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අමල් හර්ෂ ද සිල්වා, හලාවත මහ රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය කපිල මල්ලවාරච්චි, වයඹ පළාත භාර යුද හමුදා අණ දෙන නිලධාරී බ්‍රිගේඩියර් සජිත් ලියනගේ, වයඹ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ පීඨාධිපති රමණී අබේනායක, මේජර් විරාජ් කුමාර, ප්‍රතිකාර මධ්‍යස්ථානය භාරව කටයුතු කරන කැප්ටන් එන්.කේ. නිරිඇල්ල යන මහත්ම මහත්මීහු සහභාගී වූහ.

# ආරක්ෂක ලේකම් හා බංග්ලාදේශ ගුවන් හමුදාපති සාකච්ඡාවක



**රක්ෂණ ශ්‍රියන්ත**

ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න මහතා (විශ්‍රාමික) සහ බංග්ලාදේශ ගුවන් හමුදා ප්‍රධානී එයාර් චීෆ් මාෂල් මසිහුස්සමාන් සෙර්නියාබාත් මහතා අතර හමුවක් පෙරේදා ( 04) අමාත්‍යාංශයේදී පැවත්විණි.

එහිදී ආරක්ෂක ලේකම්වරයා සමඟ බංග්ලාදේශ ගුනක හමුදාපතිවරයා රටවල් ද්විත්වය සඳහාම වැදගත් වන කරුණු පිළිබඳව සාකච්ඡාවක නිරත විය.

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 70 වන සංවත්සර සැමරුමට සමගාමීව මෙම හමුවීම පැවැත්විණි.

ශ්‍රී ලංකා ගුවන් හමුදාපති එයාර් මාෂල් සුදර්ශන පතිරණ මහතා ද මෙම අවස්ථාවට සහභාගී විය.

මෙම අවස්ථාව සටහන් කිරීම සඳහා ආරක්ෂක ලේකම් සහ බංග්ලාදේශ ගුවන් හමුදාපතිවරයා අතර සිහිවටන හුවමාරු කර ගැනීමක්ද සිදුවිය.

# නිෂ්පාදන ගම්මාන බිහි කිරීම අනුරාධපුරයෙන් ඇරැඹේ

**ජයසිරි මුණසිංහ**

වසර 2021 අය වැයෙන් රජය යෝජනා කළ එක් දිස්ත්‍රික්කයක අවම වශයෙන් නිෂ්පාදන ගම්මාන 2ක් බිහි කිරීමේ වැඩපිළිවෙළ සෞභාග්‍යයේ සතියට සමගාමීව රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් ඓතිහාසික අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආරම්භ කෙරිණි.

සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක මෙම වැඩසටහන හරහා නිෂ්පාදන ගම්මාන රට පුරා 500ක් ඉදිකිරීමට සැලසුම් කොට ඇත. ඒ අනුව ඉදි කළ පළමු ගම්මානය අනුරාධපුරය, ඇලයාපත්තුව, පූසියම්කුලම ප්‍රදේශයේ මල් හා විසිතුරු පැළ වගා කිරීමේ ගම්මානයේ දී ඇරඹිණි. ඊට අමතරව අනුරාධපුර පහළගම ප්‍රදේශයේ කම්හල් කර්මාන්ත නිෂ්පාදන ගම්මානයක් සහ තන්තිරිමලේ බිල්ලෑව ප්‍රදේශයේ පළතුරු ගම්මානයක් ද ආරම්භ කිරීමට මුල පිරිණි.

ගැමි ආර්ථිකය නගා සිටුවා ඒ ඔස්සේ ජාතික ආර්ථිකයට දායකත්වය ලබා ගනිමින් ග්‍රාමීය දුප්පත්කම, විරැකියාව, ආදායම් බෙදීයාමේ විෂමතාව දුරු කිරීම මෙම වැඩපිළිවෙළේ අරමුණ වී තිබේ.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව සෞභාග්‍යමත් ආර්ථිකයක් බිහි කිරීමට මුල පුරමින් අගමැති හා මුදල් ඇමැති මහින්ද රාජපක්ෂ මහතා නිෂ්පාදන ගම්මාන 500ක් ඉදිකිරීමට මෙවර අය වැයෙන් මුදල් වෙන් කර තිබේ. එම මුදල් යොදා ගනිමින් නව වැඩපිළිවෙළ සාර්ථකව ක්‍රියාත්මක කිරීමට රජය සූදානම් බව ෂෙහාන් සේමසිංහ මහතා ප්‍රකාශ කළේය.

## යුද හමුදා ස්වේච්ඡා සේවයේ වසර 13ක් යෙදුණු සෙබළෙක් විශ්‍රාම වැටුප් පරිවර්තනයක් ඉල්ලයි

යුද හමුදා ස්වෙච්ඡා සේවයට අදාළව විශ්‍රාම වැටුප් පරිවර්තනය කරදෙන ලෙස වසර 13ක් පමණ ශ්‍රී ලංකා යුද හමුදාවේ සේවය කළ සාමාන්‍ය සෙබළඑල්.ඒ සෙනෙවිරත්න මහතා අදාළ බලධාරීන්ගෙන් ඉල්ලීමක් කරයි. වයස අවුරුදු 41 ක්ව සිටින විට 1996 වසරේ දී ශ්‍රී ලංකා යුද හමුදා සේවයට එක්ව තිබෙන ඒ මහතා 2010 වර්ෂය දක්වා විවිධ ප්‍රදේශවල රාජකාරි කර තිබෙන අතර වයස අවුරුදු 55 පිරීමත් සමඟ නීත්‍යනුකූලව හමුදා සේවයෙන් ඉවත් වී තිබේ. යුද හමුදා සේවයට එක්වීමට පෙර ඒ මහතා වසර 17ක කාලයක් කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ සේවය කර තිබෙන අතර සිවිල් සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් අනතුරුව නැවත යුද්ධ හමුදා සේවයට එක්ව ඇත.

යුද හමුදාවේ සේවය කළ සමයේ දී කිසිදු උසස්වීමක් නොලද සෙනෙවිරත්න මහතා ඔහුගේ ස්වෙච්ඡා සේවයට අදාළව විශ්‍රාම වැටුප පරිවර්තනය කර දෙන ලෙස ඉල්ලීමක් කරන අතර, මේ සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශය, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා යුද හමුදාව දැනුවත් කර තිබෙන බවද කියා සිටී.

# දේශීය බතික් කර්මාන්තය නංවන්න කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපෘතියක්





**බුද්ධි කරුණාරත්න**

කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ සහ මූල්‍ය පීඨයේ පළමු වසර විද්‍යාර්ථීන් විසින් දේශීය බතික් කර්මාන්තයේ නිරත කාන්තාවන් කණ්ඩායමකගේ ජීවනෝපාය මාර්ගය සවිබල ගන්වන්නට මනු සවිය නමින් ව්‍යාපෘතියක් සාර්ථකව සිදු කළහ. එම විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධි පාඨමාලාවේ ටීම් සිනර්ජි සිසුන් කණ්ඩායම ගිනිගත්හේන, පේරගහමුල ගම්මානයේ බතික් කර්මාන්තයේ නිරත කාන්තාවන් පිරිසක් විසින් පවත්වාගෙන යන සෞභාග්‍යා බතික් ව්‍යාපාරය ආශ්‍රිත ගැටලු හඳුනාගෙන ඒ සඳහා පිළියම් ලබා දෙමින් මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළහ.

දිරිමත් කාන්තාවන් තිස් දෙනකු අන්‍යෝන්‍ය සහයෝගයෙන් පවත්වාගෙන යන මේ කර්මාන්ත ආයතනයේ අඩුපාඩුව පැවැති මහන යන්ත්‍ර 4ක් ලබා දෙමින් වෙළෙඳපොළ අවස්ථා නිර්මාණය කර දීම ද සිදු විය. ව්‍යාපෘතියට පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ ව්‍යාපෘති සම්බන්ධීකාරක රජිශ්ත සෙනෙවිරත්න මහතා සහ කණ්ඩායමේ උපදේශිකා ආචාර්ය නිපුනි අබේසිරිවර්ධන මහත්මියගේ උපදේශකත්වය ද හිමිවිය. 2013 වර්ෂයේ සිට පැවැත එන මේ ප්‍රජා සංවර්ධන වැඩසටහන ඉතා සාර්ථක ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කර ඇත.

# සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව නවක ලේඛකයන්ගේ පොත් මිලට ගැනීම අරඹයි

**උපාලි කරුණාරත්න**

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මඟින් නවක ලේඛකයන් දිරි ගැන්වීමේ අරමුණින් ඔවුන් විසින් රචනා කරනු ලැබ ඇති පොත් මිලට ගැනීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත.

පසුගිය වසරේ (2020) රචනා කර ඇති පොත් මෙම ව්‍යාපෘතිය යටතේ මිල දී ගැනීම සිදු කරන අතර ඒ සඳහා අයැදුම්පත් භාර ගැනීම මෙම මස 31 දින දක්වා දීර්ඝ කර තිබේ.

මේ පිළිබඳ සියලු විස්තර දිස්ත්‍රික් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංස්කෘතික නිලධාරීන් හරහා මෙන්ම www.culturaldept.gov.lk වෙබ් අඩවියෙන් හෝ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 0112882667 අංකයට ඇමැතීමෙන් ලබාගත හැක.

# ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ නිල වෙබ් අඩවියට නව අංග

**මහින්ද අලුත්ගෙදර**

ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ නිල වෙබ් අඩවිය වන www.srilankan.com වෙබ් අඩවිය වැඩි දියුණු කළ විශේෂිත නව අංග සහිතව එළි දැක්වීමට පියවර ගෙන තිබේ.

මෙමගින් ශ්‍රී ලංකන් පාරිභෝගිකයන්ට විශේෂිත වූ සේවා අත්දැකීම් සහ වැඩිදියුණු කරන ලද පහසුකම් අත්විඳීමේ අවස්ථාව උදාවේ. නව වෙබ් අඩවිය ක්ෂේත්‍රයේ ප්‍රමිතීන්ට අනුව සහ උසස්ම තත්ත්වයේ භාවිතයන්ට අනුකූලව වඩා හොඳ කාර්ය සාධනයක් සහතික කරනු ඇත.

ගුවන් ගමන් ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා සහ පාරිභෝගික අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් ගුවන් සමාගම විසින් වෙබ් අඩවිය නිර්මාණය කළ අතර, බොහෝ ගමනාන්තවල නවතම ගාස්තු සහ සංචාරක තොරතුරු පහසුවෙන් බැලීමට මෙමගින් හැකිවේ. එසේම බාධාවකින් තොරව වෙබ් අඩවිය හරහා සංචාරකයන්ට ප්‍රවේශ පත්‍ර වෙන්කරවා ගැනීමට ඉඩසලසා දී තිබේ.

ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ලෝක ව්‍යාප්ත විකුණුම් අංශ ප්‍රධානී දිමුතු තෙන්නකෝන් මහතා සඳහන් කරන්නේ වැඩිදියුණු කළ srilankan.com වෙබ් අඩවිය ගනුදෙනුකරුවන්ට සෘජුවම සංචාරක කටයුතු සිදු කරලීමට හැකි අයුරින් පරිවර්තනය කර ඇති බවයි. " විශේෂයෙන් මෙම වර්තමාන ගෝලීය තත්ත්වය තුළ, ඉහළ විශ්වාසදායක සහ පහසු මෙවලමක් ලෙස ගනුදෙනුකරුවන් සඳහා මෙම වෙබ් අඩවිය ප්‍රචලිත කරලීම ඉලක්කය බව ද නව srilankan.com වඩාත් පරිශීලක-හිතකාමී, තොරතුරු සහිතවන අතර ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ කැමැත්ත පරිදි ටිකට්පත් වෙන්කරවා ගැනීමට සහ කළමනාකරණය කිරීමට හැකි බව ද පෙන්වා දෙයි.

srilankan.com වෙබ් අඩවිය දැනට සිටින සහ නව ගනුදෙනුකරුවන් සඳහා සම්පූර්ණ සංචාර කළමනාකරණ අවස්ථාවක් ලබාදෙන අතර, සංචාරක අවශ්‍යතා සහ නවතම යාවත්කාලීනයන් පිළිබඳ තොරතුරු, ටිකට් පතක් වෙන්කරවා ගැනීම, ව්‍යාපාරික පන්තියට උසස් කිරීමක් ඉල්ලා සිටීම, අමතර නිදන කාමරයක් සහිත ආසනයක් ලබාගැනීම, ආසනයක් උසස් ලෙස වෙන් කරවාගැනීම, ආහාර පිළියෙල කිරීම, මාර්ග ගත පිරික්සුම, පැය 24 පුරා සම්බන්ධතා සහාය සහ වෙනත් විකල්ප රැසක් මෙමගින් ලබා දී තිබේ. එපමණක් නොව, ගමන් මලු හැසිරවීම සහ වෙනත් සාමාන්‍ය තොරතුරු රැසක් ලබාදෙන අතර, ගුවන්තොටුපළ, ගුවන් යානයේ විස්තර සහ ජංගම යෙදුම් බාගත කිරීමේ උපදෙස් පිළිබඳ තොරතුරු ද සපයයි.

ශ්‍රී ලංකන් ෆ්ලයිස්මයිල්ස් සාමාජිකයන්ට ඔවුන්ගේ අනන්‍යතාවය සහතික කර වෙබ් අඩවියට පිවිසිය හැකි අතර ඔවුන්ගේ අභිමතය පරිදි මයිල්ස් උපයා ගැනීමටත් ඒවා භාවිත කිරීමටත් පහසුකම් සලසා දී තිබේ.

ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ තොරතුරු තාක්ෂණ අංශ ප්‍රධානී චාමර පෙරේරා මහතා සඳහන් කරන්නේ ගුවන් ගමන් සඳහා ජාත්‍යන්තර සංචාරයන් ලිහිල් කරන මොහොතක ක්ෂේත්‍රයේ නව අංගයන් ඇතුළත් කර අපගේ වෙබ් අඩවිය නැවත ආරම්භ කිරීම ගුවන් සමාගම විසින් ගනු ලැබූ කාලෝචිත පියවරක් බවත් මෙහි ඇති නව අංගයන් අපගේ ගනුදෙනුකරුවන් ඇතුළු සියලු පාර්ශවකරුවන්ට අවශ්‍ය තොරතුරු ලබාගැනීමට ඉතා පහසුවන බවත්ය. ගනුදෙනුකරුවන්ගේ ප්‍රතිචාර පිළිබඳ අපි බලා සිටින බව ද වෙබ් අඩවියේ නව දැක්ම ඔවුන්ට අප සමඟ පියාසර කිරීමට විශාල බලපෑමක් කරනු ඇති බව ද ඒ මහතා සඳහන් කරයි.

නව විශේෂාංග මඟින් පාරිභෝගිකයන්ට තොරතුරු පමණක් නොව පාරිභෝගික සහාය, කොවිඩ් -19 පිළිබඳ යාවත්කාලීන සංචාරක තොරතුරු සහ පැය 24 පුරා ක්‍රියාත්මක සේවා සහාය ලබාගැනීමේ අවස්ථාව ද ලබා දී තිබේ.

# ගැටලු සහගත පරිසර ප්‍රශ්න නිරාකරණයට අමාත්‍යාංශ සම්බන්ධීකරණ වැඩපිළිවෙළක්

**බුද්ධිකා ඉඹුලාන**

ගැටලු සහගත පරිසර ප්‍රශ්නවලට මුහුණදීම සඳහා අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ වැඩපිළිවෙළක් ආරම්භ කිරීම පරිසර අමාත්‍යාංශයේදී පෙරේදා (04) සිදු විය.පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මහතා විසින් ජනවාරි මාසයේදී ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයකට ලැබුණු අනුමැතිය අනුව මෙම වැඩපිළිවෙළේ පළමු අන්තර් අමාත්‍ය සාකච්ඡාව මෙසේ පැවැත්විණි .

මෙම අන්තර් අමාත්‍ය සම්බන්ධීකරණ වැඩසටහනට පරිසර අමාත්‍යාංශය, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය, ජල සම්පාදන අමාත්‍යාංශය, වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙළ,කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යංශය හා නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ එක් වී තිබේ.ඒ අනුව අදාළ අමාත්‍යාංශ භාර අමාත්‍යවරුන් වන මහින්ද අමරවීර, , වාසුදේව නානායක්කාර, ආචාර්ය නාලක ගොඩහේවා,විමලවීර දිසානායක රාජ්‍ය අමාත්‍යවරුන් ද, අමාත්‍යාංශ ලේකම්වරුන් වන වෛද්‍ය අනිල් ජාසිංහ මහතා සහ බන්දුල හරිස්චන්ද්‍ර මහත්වරු ද සහභාගි වූහ.



මෑතක සිට මාධ්‍ය මගින් හෙළිදරවු කරන වන විනාශයන්, හා විශේෂයෙන් මුතුරාජවෙල තෙත් බිම සංරක්ෂණය වැඩ පිළිවෙළ ද මෙහිදී සාකච්ඡාවට බඳුන් විය.

එහිදී අදහස් පළ කළ අමාත්‍ය මහින්ද අමරවීර මහතා කියා සිටියේ පරිසරය විනාශ කිරීම් පිළිබඳව කතිකාව මේ වන විට රජය හා ජනාධිපතිතුමන් ඉලක්ක කරමින් දියත් කර තිබෙන ප්‍රචාරක වැඩ පිළිවෙළක් දක්වා පුළුල් වී ඇති බවයි. ජනාධිපතිතුමා කිසිදු අවස්ථාවක කැලෑ කැපීමට කිසිදු පාර්ශ්වයකට උපදෙස් දී නැති බවත් ග්‍රාමීය අංශයේ ඇතැම් ගොවින් තමන් වගා කළ ඉඩම් නැවත ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම් සලකා බලා එම ඉඩම් නැවත වගා කිරීම සඳහා අහිංසක ගොවීන්ට ලබා දීමට කටයුතු කරන ලෙස උපදෙස් දී ඇති බවත් මෙහිදී ඇමැතිවරයා කීය.එමෙන්ම වනාන්තර හා පරිසරය විනාශ කරන ජාවාරම්කරුවන්ට එරෙහිව සෘජුවම නීතිය ක්‍රියාත්මක කරන ලෙස ජනාධිපතිතුමා උපදෙස් දුන් බවත් අමාත්‍යවරයා මෙහිදී සඳහන් කළේය.

මෙහිදී අදහස් පළ කළ රාජ්‍ය අමාත්‍ය ආචාර්ය නාලක ගොඩහේවා මහතා කියා සිටියේ මුතුරාජවෙල සංරක්ෂණය කර එය රැම්සා තෙත්බිමක් දක්වා සංරක්ෂණය කර නැවත වනජීවී අමාත්‍යාංශයට බාර දෙන බවයි. 1990 හෙක්ටෙයාර් 3060ක් වූ මුතුරාජවෙල මේ වන විට විවිධ පුද්ගලයන් අත්පත් කර ගැනීම නිසා හෙක්ටෙයාර් 1200ක් දක්වා අවම වී තිබෙන බව ද ඒ මහතා කිය. රජය මෙම තෙත් බිම නාගරික සංවර්ධන අධිකාරිය යටතට ගෙන සංරක්ෂණය කිරීමට තීරණය කළේ අන් කිසිවක් නිසා නොව දැනට මෙහි ඇතැම් ඉඩම් පවරා ගැනීමට සිදුවන නිසා ඊට කඩිනමින් මුදල් ගෙවීමේ හැකියාවක් වනජීවී අමාත්‍යාංශයට නොමැති නිසා බවත් ආචාර්ය ගොඩහේවා මහතා පැවැසීය.

ඡායාරූපය- සමන් ශ්‍රී වෙදගේ

# පොල්කටු ලන්තෑරුමෙන් එළිය බලන ලක්ෂාන්





**ඕනෑම කෙනෙක් ළඟ තමන්ටම ආවේණික වූ කලාවක් හා යම් හැකියාවක් තියෙනවා. සුදේශ් ලක්ෂාන් කියන්නේ තමන් තුළ පැවති ඒ කලාව හා හැකියාව හඳුනාගෙන අපි එදිනෙදා පාවිච්චි කර ඉවත දමන පොල් කටු නැවතත් අලංකාර කැටයම් බවට පත්කරන තරුණයෙක්. අම්මයි, තාත්තයි, මල්ලියි එක්ක සුදේශ්ගේ පදිංචිය කුරුණෑගල. සුදේශ් සිප්සතර හැදෑරුවේ වැල්ලව මධ්‍ය විද්‍යාලයෙන්.**

සුදේශ්ගේ තාත්තා විනෝදාංශය විදිහට පොල්කටු කැටයම් නිර්මාණය කරනු පුංචි කාලයේ ඉඳන්ම බලාගෙන සිටි සුදේශ් පියාගෙන් ලැබුණු ආභාෂය මතම පියාගේ විනෝදාංශය තමාගේ රැකියා අවස්ථාව බවට පත්කරගත් බව පැවසුවා. සාමාන්‍යයෙන් එදිනෙදා දකින සරල පොල්කටු කැටයම්වලට වඩා ඔහු විසින් සිදුකරන 'පොල්කටු ලන්තෑරුම' සුදේශ්ගේ කැටයම් අතර විශේෂ වෙනවා. ඔහුගේ නිර්මාණ වෙනුවෙන් මේ වන විට ඉහළ ප්‍රතිචාර හිමිවෙන අතර විශේෂයෙන්ම ලංකාවේ වෙළඳපොළට සාපේක්ෂව විදේශීය වශයෙන් ඔහුට ඉහළ වෙළෙඳපොළක් පවතින බව මතක් කළා. පොල්කටු කැටයම් යනු ඉතාමත් සංයමයකින් කළ යුතු නිර්මාණයක් බවත්, සමහර අවස්ථාවල කැටයමේ අවසාන අවස්ථාවේදී පොල්කට්ට කැඩී යාමට ඉඩ ප්‍රස්ථාව වැඩි වීමෙන් එය තමන්ට ලොකු අභියෝගයක් සහිත කාර්යයක් බව මතක් කළා. මීට පෙර සුදේශ් විසින් රැකියාවල් කිහිපයක්ම සිදු කළත් එම රැකියාවන්ගෙන් නොලැබෙන මානසික සතුටක් තමා විසින් සිදුකරන කැටයම් කලාව තුළින් ලැබෙන බව ඔහු පැවසුවේ ඉතාමත් සතුටින්.

ඔහු තම කැටයම් ආශ්‍රිත ව්‍යාපාරය ආරම්භ කළ මුල් වකවානුව තුළ තරුණයෙක් වශයෙන් එවැනි ව්‍යාපාර අවස්ථාවක් තෝරාගැනීම පිළිබඳව බොහෝ පිරිසක් ඔහුට සමච්චල් කරපු ආකාරය තමන්ගේ මේ දක්වා වූ ගමන තුළ අපූරු මතකයන් බව පැවසුවා. සුදේශ්ගේ මේ දක්වා ගමන තුළ ඔහුට අතහිත දුන් පිරිස අතරින් අම්මා, තාත්තා ඇතුළු පවුලේ සියලු දෙනාටත් විශේෂයෙන්ම ඔහුව නිතරම දිරිමත් කරන ඔහුගේ පෙම්වතියටත් වචනයකින් හරි සහයෝගය ලබා දුන් සියලු දෙනාටත් හදවතින්ම ස්තූතිවන්ත වන බව පැවසුවා.

සුදේශ්ගේ අනාගත බලාපොරොත්තුව වුණේ cocoSL නමින් පොල්කටු කැටයම් ආශ්‍රිතව ඉහළ වෙළඳ සන්නාමයක් ලංකාව තුළ පිහිටුවීමයි. අවසාන වශයෙන් අනාගතයේදී ව්‍යාපාර අවස්ථාවන් සඳහා යොමුවීමට සිටින නවකයන්ට ඔහු මෙන්න මෙහෙම පණිවිඩයක් දුන්නා.

'මට කියන්න තියෙම එකම දේ තමයි මොන රැකියාවක් කරත් ඔබේ හිත පිනවමින්ම එය සිදු කරන්න. ව්‍යාපාරයක් කරනවා නම් ක්ෂණික ලාභ එන්නේ නෑ, ටික කාලයක් මහන්සි වෙන්න ඕනි. මොන ප්‍රශ්න ආවත් අතහරින්න එපා. ඒ වගේම ඔබ උපයන මුදල් නිකරුණේ නාස්ති කරන්න එපා. කාලයට ගැළපෙන ව්‍යාපාර කරන්න. එතකොට හොඳ ආදායමක් ලබාගන්න පුළුවන් වෙනවා.'

කවි විජේසූරිය





# පෞරුෂවත් යෞවනය

**ලක් සිනිඳු ය. සුවඳවත් ය. මොලකැටි ය. එය ජීවිතයට සතුට හා සොම්නස ළඟා කරයි. කුඩා දරුවන් ද මල් වැනි යැයි කියමනක් තිබේ. අපි එහි සුන්දරත්වය අත්විඳිමු. එයට ඇලුම් කරමු. මල් පොහොට්ටුවන් ළපටි සිත්මල් විදා පෙති විකසිතව හිනැහෙන සොඳුරුතම අවිධිය වන්නේ අසිරිමත් යෞවනය යි.**

සැබවින්ම නව යෞවනය පිපුණු මලකි. එහි රුවට, චමත්කාරයට ආකාර්ෂණය නොවන්නේ කවුරුන් ද? සිතට දැනෙනා නැවුම් හැඟීම් ආදරයෙන් මුදාහරින කාලවකවානුව මෙය යි. තටු සලා ඉගිල යන්නට, නිදහස, සතුට, විනෝදය සොයා යන්නට හදවත ඉල්ලා සිටින්නේ මේ කාලයේදීම ය. ජීවිතයේ නව පිබිදීමක් ඇතිවන යුගයක් ලෙසත් උපතේ සිට ක්‍රමයෙන් සිදු වෙමින් ආ වර්ධන ක්‍රියාවලීන්ගේ පරිපූර්ණත්වය අරඹන අවධිය වන්නේ ද මෙයයි. එනම් සමාජමය උවමනාව අනුව පුද්ගලයන් ජීවිතයේ ස්විය බලාපොරොත්තු තුලනය කරගැනීමේ ඔවුන් සතු හැකියාව වර්ධනය කරගනු ලබන්නේ යෞවනය තුළදී ය.

මිනිසෙකු තවත් මිනිසකුගෙන් වෙනස් වන්නේ පෞරුෂය හේතුවෙනි. බොහෝ යෞවනයන් සිතා සිටිනුයේ හොඳ පෞරුෂයක් ඇත්තේ රූපයෙන් උස, මහත සහ වර්ණවත් සමක් හිමි අයට යනුවෙනි. එය මනෝ විද්‍යාත්මක අර්ථයෙන් බැහැර කරයි. මන්ද කෙතරම් යහපත් බාහිර ලක්ෂණ තිබුණත් යම් තරුණයකුට හෝ තරුණියකට කිසියම් ගැටලුවක් විසඳා ගත නොහැකි නම් හෝ ගැටලුවකට හෝ කිසියම් අවස්ථාවකට මුහුණ දීමට හැකියාවක් නොමැති නම් හොඳ පෞරුෂයක් තිබිය හැකි බව විශ්වාස කළ නොහැකි ය.

ඔවුන් වටහාගත යුතු වන්නේ ස්වයං ප්‍රතිරූපය නැංවූ විට තමන්ගේ පෞද්ගලික ක්‍රියාකාරීත්වය ද ඉහළ යන බව ය. පෞරුෂත්වය ස්වයං ප්‍රතිරූපය නිර්මාණයේ එක් පැතිකඩ කි.

යෞවනයින් නිර්ව්‍යාජ ලෙස තමන් කෙරෙහි කිසියම් ආදරයක්, ප්‍රියමනාප භාවයක් දක්වන්නේ නම් තමා වටිනා මිනිසකු ලෙස තමාම පිළිගන්නේ නම් ඒ තුළින් තරුණ තරුණියන්ගේ සාර්ථකත්වය පෘථුල කරයි. අභියෝගවලට මුහුණ දෙයි. ඵලදායිතාවයේ ඉහළතම මට්ටම දක්වා යාමට නිරායාසයෙන් ඔබ පෙලඹෙයි. යෞවන යෞවනියන් සඳහා මුහුණදීමට සිදුවන ඉලක්ක සහ බාධක බොහෝ ය. ඉන් සමහර ඉලක්ක ජයගනු ලබන අතර සමහර ඉලක්කයන් ජය ගැනීමට නොහැකි ය. මෙහිදී අප වටහා ගත යුතු වන්නේ අනෙකාට කළ හැකි සියලුම දේ තමන්ට කළ නොහැකි බව ය. ඉලක්ක යනු ජීවිත නිෂ්ඨාවන් වශයෙන් හඳුනාගත යුතු ය. එය පෞරුෂවත් යෞවනයේ ලක්ෂණයකි.

ජීවිතයේ වැඩ කරන අවිධිය සහ ජීවිතය විඳින අවධිය යෞවනය යි. අනාගතයට ආයෝජනයක් සිදු කරන්නේත්, ඉදිරිය අස්වද්දන්නේත් යෞවනය තුළයි. එය මනාව වටහා ගන්නේ නම් පෞරුෂවත් යෞවනයක් හිමි තරුණ තරුණියක ලෙසට සමාජය තුළ දෙපයින් නැඟී සිටීමට හැකිය. වටහාගත යුතු වන්නේ කිසිවෙකුගේ පෞරුෂය සහ හැකියාව තවත් අයෙකුට සමාන නොවන බවත්, අනෙකාගේ පෞරුෂය තමා කෙරෙහි සංසන්දනය නොකොට තමන්ට අවැසි ජීවිතය යථාර්ථවාදීව සුබවාදීව ගොඩනගා ගත යුතු බවය.

කල්පනී හෙට්ටිආරච්චි
කැලණිය විශ්වවිද්‍යාලය

දිනමිණ
සඳතතික පත්තර තාරුණ්‍යය
යොවුන් ජනතා
2021 මාර්තු 06 සෙනසුරාදා



කොලාජ් චිත්‍රය - උදයංග අමරසේකර



සත විද්දේ නැකතට ද...? PAGE 03


අලුත් දෑ තනන තරුණිය PAGE 05


social media PAGE 07


පොල්කටු ලන්තෑරුම PAGE 08

## අපි ඔබ ඉලක්ක කරන්නෙමු

යොවුන් හදවත් තුළ අර්ථවත් අකුරු නවාතැනක් වීම අප පුවත්පතෙහි මූලික අරමුණයි. තරුණයන් ඉලක්කගත කර ගනිමින්, හරසුන් දේ බලෙන් ඇගේ ගැසීම වෙනුවට අරුත්බර දේ ආදරයෙන් වැලඳ ගන්නා මාවතක් සැකසීම අපේ බලාපොරොත්තුවයි. ඕනෑම නිපැයුමක රඳා පැවැත්ම වෙනුවෙන් ඔවුන් ඉලක්ක ගත කරන්නේ ද තරුණ පරපුරයි. අපේ ඉලක්කය ද ඔබයි. ඔබේ ගමනට හරි මග සලකුණු පෙන්වීමට හැකි නම් අපේ ජයග්‍රහණය එයයි.

## එන්න, අපි හරි හරක් හදමු

සංස්කරණය - රජිත බස්නායක
younjanatha@lakehouse.lk
'යොවුන් ජනතා', දිනමිණ
අංක 35
ලේක් හවුස්
ඩී. ආර්. විජයවර්ධන මාවත
කොළඹ 10

යොවුන් ජනතා මුල් කවරය හැඩගැන්වීමට ඔබේ නිර්මාණයත්
younjanatha@lakehouse.lk
ලිපිනයට යොමු කරන්න

# යක්ෂයන් වන්නෝද දෙවියෝය

මනුෂ්‍යත්වයේ උපරිමය ආදරයයි. භෞතිකව පමණක් දියුණුවේ හිණිපෙත්තට ගිය ද අධ්‍යාත්මිකව මිනිසා පිරිහේ නම් ආදරය පලා යන්නේ සියල්ලටම පෙරය. දියුණුව වනාහි එකී කාරණා ද්විත්වයේම සමබර සම්මිශ්‍රණයක් විය යුතුය. ආදරයට කෙතරම් නිර්වචන තිබුණ ද එය ප්‍රායෝගිකව කෙතරම් දුරට ක්‍රියාත්මක වනවා ද යන්න වර්තමානය වන විට සමාජය තුළ පැන නැඟී ඇති දරුණුතම බේදවාචකයකි. එකෙක් පරයා අනෙකා නැඟී සිටින්නට උත්සහ කරනා සමාජය තුළ අනෙකා මකබෑවුණ ද එයින් පලක් නැත. දෙදෙනෙක් ආදරයෙන් බැඳුණ ද එය මරණය දක්වාම රැගෙන යනුයේ අතළොස්සකි. සම්මතය පරදා අසම්මතය ජය කෙහෙළි නංවන්නේ මෙවන් වූ පසුබිමක් තුළය. ගතේ සවි ශක්තිය තිබෙනතුරු රති කෙළියේ යෙදෙන උන් බොහෝ දෙනෙක් දරුවන් දෙතුන් දෙනෙක් ලැබූ පසුව හැසිරෙන්නේ ආගන්තුකයින් ලෙසය. ඉන් පසු ආදරණීය වදන් ඇසෙන්නේ ද ආදරයෙන් අමතන්නේ ද නැත. ආදරයේ ඇති වැරැද්දක් නැත. විඳින්නට ඇති ආදරය විඳවන්නට හේතු කාරණා සකස් කරගන්නා මිනිසුන් අවසනදී ජීවිතයෙන් වන්දි ගෙවනුයේ ආදරයේ ස්වභාවය මෙය යැයි ලොවට කියාපාමිනි. එය කොතරම් වැරදි ආදර්ශයක් වුවද බොහෝ දෙනෙක් ලබා ඇත්තේ ද ආදරය පිළිබඳ අමිහිරි අත්දැකීම්ය. කාසියක දෙපැත්තක් මෙන් බැඳී ඇති ආදරය හා වෛරය එකිනෙක නොපිටට පෙරළීමට ගත වන්නේ ඉතා කෙටි කාලයකි. හිත්වල ආදරේ ඇත්නම් අනෙකාට හානි කළ නොහැකිය. අයිති කර ගැනීම පමණක්ම ආදරය ලෙසින් වටහා ගන්නා ඇත්තෝ එය අහිමි වූ කළ හැසිරෙන්නේ උන්මන්තකයින් මෙනි. ජීවිතය උපේක්ෂාවෙන් විඳ දරාගත යුතුමය. එසේ නොවුණ කල්හි ආදරය ද සීමා ඉක්මවා කුලප්පු විය හැකිය. කිසිදා නොරිදවූ ආදරයක් තිබේනම් ඒ මව්පිය සෙනෙහස බව අප සැවොම පිළිගන්නා කාරණයකි. නමුත් එයට ද නිගා දෙන ආකාරයෙන් ඇතැම් මව්වරු කටයුතු කරන්නේ දරුවන් යනු දරුවන්ගේ උවමනාවට මෙලොවට පැමිණි උන් ලෙස සිතාය. දෙදෙනෙකුගේ ආදරයේ උත්තරීතර ඵලය වනාහි දරුවන් වේ. එම නිසා දරුවන් බිහි වනුයේ එකී ආදරයේ කැමැත්ත මතය. ඉඳින් හිංසා පීඩා කිරීමට නම් දරුවන් වැදිය යුතු නැත. දිනෙන් දින මිනිසා පිරිහෙමින් සිටින අතර අසන්නට දකින්නට ඇත්තේ සිත කම්පනය කරන සිදුවීම්ය. කවුරුන් විශ්වාස කරන්නේ ද නොකරන්නේ ද යන්න ගැටලුවක් බවට පත් වී ඇත. මන්ද හිටි ගමන් යක්ෂයන් වන්නේ ද ප්‍රසන්න පෙනුමෙන් සිටිනා දෙවියන්ය. මේ නිසා හදවත මඳක් නතර කොට මොළයෙන් තීරණ ගත යුතුය. එය කෙතරම් අසීරු තීරණයක් වුවද අපගේ ජීවිතයේ දිගු කාලීන තෘප්තිය සඳහා රුකුලක් ලබා දෙනු ඇත.

හර්ෂමාලී වීරරත්න



## යකුන් පලවා හරින සියලු දෙනා

# කට්ටඩියෝ නොවෙති



සෑම දෙනාගේ ජීවිත එක හා සමානව වටින්නේය. කල්ප කාලයක් පින් දහම් කර ලබාගන්නා මිනිස් ජීවිතය නිකරුණේ විනාශ කිරීම මෙන්ම විනාශ කර ගැනීම ද අනුවණ ක්‍රියාවකි. වර්තමාන සමාජය තුළ නිතර අසන්නට දකින්නට ලැබෙනුයේ ජීවිත විනාශ කිරීම් සහ විනාශ කර ගැනීම්ය. වැරදි මාර්ගයන්හි මං මුළාවීම් මත ජීවිත අහිමි වී යාම බොහෝ විට දක්නට ලැබෙන දෙයකි. එයට කදිම නිදසුනක් ලෙස වර්තමානයේ සිදු වූ පුංචි දියණියකගේ වියෝව පෙන්වා දිය හැකිය. මංමුළා වූ මිථ්‍යා අදහස් මත එළඹෙමින් යකුන් පලවා හැරීමට තම මල් කැකුළක් බඳු වූ පුංචි දියණියට වේවැලකින් මියයනතුරු පහර දෙන ශෝකජනක පුවත් අද වන විට අසන්නට දකින්නට ලැබේ.

මිනිසුන් මිථ්‍යා මතවලට නැඹුරුව ඉහළ ය. එයට හේතුව නම් මිනිසුන් නුවණින් ක්‍රියා කිරීම බොහෝ අඩු බැවිනි. කුමන වැරැද්දක්, බාධාවක් තම ජීවිතවලට පැමිණි විගස බොහෝ මිනිසුන් සිතන්නට පුරුදු වී ඇත්තේ එය අපලයක්, දෝෂයක් ලෙසය. එසේ සිතීම කපටි ලෙසින් මුදල් උපයන ඇත්තන්හට නම් බොහෝ වාසිදායක කරුණකි. අද සමාජය තුළ බොහෝ ඇත්තේ රැවටීම්, මුළා කිරීම්ය. එබැවින් සැම විටම සිහිනුවණින් ක්‍රියා කළ යුතුය. නැතහොත් සිදුවන්නේ තම ජීවිතය මෙන්ම තම ආදරණීයන්ගේ ජීවිත ද විනාශය කරා ගෙන යාමය. වර්තමානයේ දක්නට ඇත්තේ දියුණු තාක්ෂණයක්ය. එසේ දියුණු තාක්ෂණික සමාජයක් තුළ ජීවත්වන මිනිසුන්ගේ මනස නම් දියුණු වී නොමැත.

යකුන් පලවා හරින සියලු කට්ටඩියන් අවංකව ක්‍රියා කරන්නන් නොවේ. ඇත්ත යකා වන්නේ තම අනුවණකම සහ අලසකමය. වරක් වැරදුණු පසු නැවත එම ක්‍රියාව කිරීමට උත්සහ කිරීම කළ යුතු දෙයකි. මන්දයත් උත්සාහය පවතිනතාක් බාධක ජයගත හැකිය. බොහෝ මිනිසුන් එසේ උත්සහ නොකරති. වරක් වැරදුණු පසු එය දෝෂයක්, අපලයක් ලෙස සිතන්නට මිනිසුන් පුරුදු වී ඇත. යකා වන්නේ තමාමය. තමන්ගේ සිතය. එසේ නම් සැමවිටම සිහිනුවණින් ක්‍රියා කළ යුතුය.

අයි. ඩී. එස්. නවෝදා වීරසිංහ





## මාමලා නැන්දලා වන නැන්දලා අක්කලා වන

# social media

සමාජ මාධ්‍ය භාවිතය යනු අද වන විට සාමාන්‍යකරණය වූවකි. ළමා, තරුණ පිරිස මෙන්ම වැඩිහිටියන් ද සමාජ මාධ්‍ය පරිශීලකයන්ය . සමාජ මාධ්‍ය භාවිත නොකරන තරුණ පරපුරේ පුරුකක් අවාරේ හමුවිය හැක . එහෙත් එය අහම්බයකි. ඒ තරමටම අප සියලුදෙනාම සමාජ මාධ්‍යයන් හි ප්‍රබල පරිශීලකයන් බවට පත් වී ඇත. බහුතර වැඩහිටි ප්‍රජාව තුළ සමාජ මාධ්‍ය පිළිබඳ අසුබවාදී අදහස් සමූහයක් යුතු වුව ද ඒවා බොහෝමයක් තරුණ තරුණියන්ගේ ආරක්ෂා උදෙසාම වන බව ප්‍රත්‍යක්ෂ වන්නට කරුණු කාරණා ද බොහොමයකි.

සයිබර් අපරාධ පිළිබඳ වැඩිමනක් දෙනා කතා බහ කරයි. ඒ සයිබර් අපරාධ නිසාවෙන් කායිකව මෙන්ම මානසිකව පීඩාවට පත්වූවන් ද බොහෝමයකි. සිය ජීවිතයට සියතින්ම තිත තැබූවන් ද වෙයි. රැයේ වැටුණු වළේ දවාලේ වැටෙන්නවුන් ගැන සමාජය ක්‍රියා කරන්නේ ද විෂමාකාරී ලෙසය. ඒ මන්දයත්, සමාජය ද ඒ ආකාරයෙන්ම අවුල් වියවුල්ව සිටීම නිසාමය.



සයිබර් අවකාශයේ සිදුවන, එකී මෙකී නොකී සියලු ධන හා සෘණ තත්ත්වයන් පිළිබඳ සිදුවන බහුතර කතාබස් බොහෝය. ඒවා අතර වැළලෙන්නට යන ගැටලු රාශියක් ද ඇත. එවැනි වූ මතුපිටට නොපැමිණි අභ්‍යන්තර ගැටලු ගණනාවක් අතර එක් ගැටලුවක් වූ .....

'සමාජ මාධ්‍ය තුළින් අනිසි බලපෑම් එල්ල කිරීම' දැක්විය හැක. මෙය කාන්තා පාර්ශ්වයට වැඩි වශයෙන් ද, පිරිමි පාර්ශ්වයට සුළු බලපෑම් එල්ල කරයි.

ඒ අතර වැඩියෙන් ම අවධානය යොමුවන්නේ කාන්තාවන්ටය. ඒ මන්දයත්, ඒ තරමටම ඔවුන් විවිධ බලපෑම්වලට ලක්වන නිසාය.

ව්‍යාජත්වය තුළින් තම අනන්‍යතාවය සඟවා කටයුතු කරන පුද්ගලයන් එමටය. ඔවුන් විටෙක නළුවෙකු නිළියක ලෙස ද, විටෙක තම වයස් සීමාව බාල කරමින් ද, නැතිනම් සමීපතමයකු ලෙස ද ක්‍රියා කරයි. මෙවැනි මවාපෑම්වලට වැඩි වශයෙන් ගොදුරුවන තරුණියන්ගේ ශෝචනීය තත්ත්වය පිළිබඳ කතා කරන්නට කවරෙකුවත් ඉදිරිපත් නොවේ.

පිරිමි පාර්ශ්වය මෙන්ම කාන්තා පාර්ශ්වය ද, තමන්ට වඩා වයසින් බොහෝ ළාබාල වූවන්ට අනිසි පණිවිඩ යැවීම, නොහොබිනා ලෙස දුරකථන සංවාද සඳහා පෙලඹීම ද සිදු කරයි. පවුල් සංස්ථාව බිඳවැටීම හෝ තම පෙම්වතිය / පෙම්වතා හැර යාමේ හිඩැස තවත් අහිංසකයකුගෙන් පියවා ගැනීමට දරන වෑයම යුතු නොවේ. එක් දිනක් කතා කළ පමණින්, තරුණියක් හා හාද වූවා සේ, කෑව ද බිව්ව ද, ආදී ලෙස ආමන්ත්‍රණය කිරීම සිනාවට කරුණකි. ඇත්තෙන්ම සිතා බැලුවහොත් ඔවුන් කාලය කා දමන මුග්ධයන්ය. තම වැඩ කටයුතුවලට අවධානය නොදී අනවශ්‍ය ක්‍රියා කිරීමට වඩා පලක් ඇති යමකට පෙලඹීම කළ යුතුමය. එවිට බොහෝ දෙනා පීඩාකාරී මානසික තත්ත්වයන්ගෙන් මිදෙනු ඇත.

තම අදහස් බෙදා නොගන්නා තරුණ තරුණියන් බොහෝ දෙනා මෙලෙස පීඩා විඳිනවා ඇති. නමුත් අපගේ ද යුතුකම වන්නේ ඔවුන් පිළිබඳවත් හැකි ලෙස අවධානය යොමු කිරීමය.

ඒ අතරේම, සමාජ මාධ්‍ය පරිහරණයේදී ඇණයක් නැතිනම් කරදරකාරී ලෙස හැසිරෙන පුද්ගලයන්ට විරුද්ධ වීමට මැළි නොවන්න. මාමලා අයියලා වන්නට ද නැන්දලා, අක්කලා වන්නට උත්සහ කරද්දී සැලකිලිමත් වන්න. බිය නොවන්න. පවසන්නට ඇති දේ පැවසීමට බිය නොවන්න. මරණය තෙක් මිනිසාගේ සිතුවිලි හඳුනා ගන්නට අපහසු යන සත්‍යතාවයේ පිහිටා කල්පනාකාරී වන්න. පෞද්ගලිකත්ව ආරක්ෂා කරගන්න. තමන් ආරක්ෂා වන අතරේ නොමඟ යන මිතුරා මිතුරියට ද අතහිත දෙන්න. බැටළු වෙස් ගත් හිවලුන්ගේ රංගනයේ ගොදුරක් නොවන්න. විශ්වාස යන වීදුරුව තනන්නට පෙර දෙවරක් සිතන්න. ඕනෑ තරම් සිදුවීම් ඇස්වලට පෙනි පෙනිත් ඒ වළටම නොවැටෙන්න.

සමාජ මාධ්‍ය භාවිතයට මෙහෙව් කියා සම්මත කරගත් ආචාර ධර්ම නැතත්, අපම අපව හික්මවා ගනිමු. ලාමක බවින් තොරව පරිණත වූවෙකු ලෙස සමාජ මාධ්‍ය භාවිතයේ යෙදෙමු.

යතුර තමා සතු වුවත්
අන්ධකාරයේ සැරිසරමින්
දොර ඇර බලන්නට පෙර
දෙවරක් නොව දහස් වරක්
සිතා බලනු මැන......

දෙව්නි පෙරේරා



# Busy වෙලා ජීවිතේ මග හැර ගන්න එපා

ගොඩක් අයට තියෙන ප්‍රශ්නයක් තමයි නිතරම Busy වෙන එක. තියෙන වැඩ කන්දරාවත් එක්ක හුස්මක්වත් ගන්න වෙලාවක් නෑ කියලා බොහෝ දෙනෙක් කියනවා. තවත් අයට දවසේ පැය විසිහතරත් මදිවෙන තරමට වැඩ. Busy වෙද්දී දවසේ පැය විසිහතරට අමතරව තව පැය තුන හතරක් වැඩිපුර තිබුණ නම් කියලා හිතන වාර අනන්තයි. මේ විදියට වැඩවලට හිරවෙලා ඉන්න වුණාම ගොඩක් අයට නාන්න, කන්නවත් වෙලාවක් නෑ. ඔෆිස් යන කෙනෙක් නම් උදේ පාන්දර ගෙදරින් පිටත් වුණාම ආයේ නිවසට එන්නේ රෑ හයට හතට. ඒ ඇවිත් ඉතුරු වැඩ ටික කරලා නින්දට යන්නේ ආයෙමත් පහුවදා උදේ වැඩට යන්න බලාපොරොත්තුවෙන්. ජීවිතේ කියන්නේ අරගලයක් තමයි. ඒත් ඒ අරගලේ ඇතුළේ අපේ ජීවිත මඟ හැරගන්න හොඳ නෑ. බොහෝ දෙනෙක්ට තියෙන්නේ මේ වගේ ඒකාකාරී ජීවන රටාවන්. Busy වුණාම ඔබට ඔබව මඟ හැරෙනවා. ඔබේ පවුලේ අයව මඟ හැරෙනවා. තමන්ට ජීවිතේ විඳින්න තියෙන අවස්ථා අහිමි වෙනවා. ඒ නිසාම ගොඩක් අය ඉන්නේ පීඩනයකින්. තමන්ට කරන්න තියෙන වැඩ කන්දරාව දරාගන්න බැරි වුණා ම ඔවුන්ගේ ආතතිය වැඩි වෙනවා. හැසිරීම පවා වෙනස් වෙනවා. වැඩිපුර කේන්ති යෑම, අන් අයව නුරුස්සන ගතිය, කලබලකාරී බව නිරායාසයෙන් ම මිනිසුන්ගේ ජීවිතවලට එකතු වෙනවා. කෙටියෙන් ම කිව්වොත් තමන්ගේ පාලනයෙන් තමන්ව ගිලිගී යනවා. ඇත්තටම මේකට විසඳුමක් නැද්ද?

ඔව් Busy වෙන එක මඟ හැරගන්න විසඳුමක් තියෙනවා. ඒ තමයි වෙලාව කළමනාකරණය කරගෙන වැඩ කිරීම. ගොඩක් අය Busy වෙන්න එක හේතුවක් තමයි වෙලාව කළමනාකරණය නොකරන එක. හිතුන හිතුන වෙලාවට වැඩ කරන්න ගියාම එක වැඩක්වත් හරියට කරගන්න වෙන්නේ නෑ. දවස ගත කරන්නේ කොහොම ද කියලා ඔබට Plan එකක් නැත්නම් ඔබ Busy වෙන එක අරුමයක් නෙවෙයි. දවසට තියෙන්නේ පැය විසිහතරයි. ඒ පැය ගණන හරියට Target කරගත්ත ම ඔබ වැඩවලට හිර වෙන්නේ නෑ. ඔබට කරන්න තියෙන කාර්යයන් වර්ග කරගන්න. අත්‍යාවශ්‍ය වැදගත්, අත්‍යාවශ්‍ය වැදගත් නොවන යනාදී ආකාරයෙන් ප්‍රමුඛතාව අනුව කාර්යයන් වර්ග කරගන්න අපිට පුළුවන්. ඒ වගේ ම තමයි එදිනෙදා කරන්න තියෙන වැඩ එදාම කරන්න. මේ විදියට හැමදාම Plan එකකට අනුව වැඩ කරන්න පටන් ගත්ත ම Busy වෙන්නේ නෑ. වැඩවලට හිරවෙලා පීඩනයෙන් ඒකාකාරීව ජීවිතේ ගෙවනකොට අපේ ජීවිත නීරස වෙනවා. එතකොට හරියට අපි ජීවත් වෙන්න ඕනේ නිසා ජීවත් වෙනවා වගේ. නිවාඩු දවසට ට්‍රිප් එකක් යන්න, පවුලේ අයත් එක්ක සතුටු වෙන්න, තමන් ආස දෙයක් කරන්න. විවේකීව ඉන්නත් ඔබේ කාලයෙන් ඉඩ වෙන්කර ගන්න අමතක කරන්න එපා. Busy වෙලා ඔබේ ජීවිතය මගහැර ගන්න එපා. සතුටින් සැහැල්ලුවෙන් ජීවිතේ විඳින්න.

මධුෂිකා ජයතිලක

## ඉස්කෝලේ ආදරය

රෙජිස්ට්‍රාර් වුණේ කවුද
දන්නේ නෑ අපි තවම
ලියවුණේ කෙළවරම
මේසෙ අපෙ නම් දෙකම
ලොකු සර් වෙලා මම
ආවෙ ඊයේ හවස
ගතවෙලා හරියටම
වසර තිස් හතරක්ම
ගියා මම වටයක්ම
"පරණ නෑ එකක්වත්
ඔක්කොම අලුත් මේස"
මතක්වුණා එකවරම
බැන්දෙ නැහැ අපි තවම......

**චතුර කවීන්ද්‍ර**

## දේදුන්න

පොළෝ තලයෙන් උරා කවිකම්
අහස් තලයේ ගොතා පද වැල්
තැනූ මොළ කැටි වලා පැදි පෙළ
හඬන විට දී නැතිව තනුවක්
ඈත ක්ෂිතිජයේ පාට පාටින්
කෙටුණු එය නම්,
සොඳුරුතම ගීයක්..

**ඉමල්ක විජේසේකර**

## විසුළ රතු ලෙයට ණයගැතියි පොරණේ !

මිණි මුතු සරු පසට හවබෝගෙට ලොබ    බඳිමින්
හිණි පෙත්තෙන් ධනය ගෙනයෑමට මෙහි    ලඟිමින්
ගිනි දැල් අවුළුවා ලක පොරණේ එඩි    බිඳිමින්
දුනි පවරා උඩරටින් ගිවිසුම මත    ලියමින්

වින කටිමින් සිහළ දන සමගිය සිඳ    දැමුවා
ධන වස්තුව කොල්ල කා පෙරළා දඩ    ගැසුවා
රණ බලයන් හානි කර සුරුවන් ලෙය    නැසුවා
පණ වැනි වූ ජාති කුල ආගම් පිල්    බෙදුවා

පණ අදින රටෙහි දන දැක සඟ රුවන    එඩිලා
රණ හඬින් කෙරුණු අණ "නැගිටිව් සිහළ    නුඹලා"
රනකුරින් ලියුව වදනකි ඉතිහාසෙ    පෙරළා
ගන රුහිරු උඩින් ඇඳි'යුරු හදින්    පුදලා

පන්දම් ගෙන රැකවල් දරාන සවිය    තැබුවෝ
අංගම් පොර සටනින් විකුමන් පෑව    විරුවෝ
ඉරණම් අත් අතරින් පර ගෙල සිඳී    දැමුවෝ
පල්ලම් බැස යන්නම සුද්දගෙ තෙදය    දිරුවෝ

දන්තුරේ මුල්ලේරියා බලන යන    සටනෙත්
රන්දෙණිවල වෙල්ලස්සෙ විරුවන් එක    ලෙයකුත්
ගන්නොරුව මාතලේ පෙන්වූ බාහු    බලයත්
රැන්දුවෙ ලක් මෑණියන් හිසේ මිණි    කිරුළුත්

විරුවන් එකම ලෙස ලෙයකට ගුණදම්    පෙන්නා
වියතුන් පවා ලක සටනට අත්වැල    දුන්නා
දරුවන් කරා සුරු නිදහස් දද    කරපින්නා
අඳුරින් එළිය දැක සුද්දා මර බිය    ගන්නා

රනින් ඔපලූ මුතුහරක් වැනිය සැම    ජනයන්
රතෙන් රුහිරුත් එකමුතුව සැදී එහි    හරයන්
දැහැන් ගත වී දම්වැලක් ලෙසින් එක    සගයන්
පිනෙන් ඉපදුණු ලක රකිමු නොවී පර    ගැතියන් !

උතුළ නිදහසට හැත්තෑ තුන් වසක්    පිරුණේ
මතුල සිහිනයට සීහෙළ දද අහස    ලෙළුණේ
විසුළ රතු ලෙයට කාහල නද නිතොර    පිදුණේ
පතුල හදවතින් විරුන්ට ණය ගැතියි    පොරණේ !

**මිහිරි පැතුමන්ති**
**ගම්පහ**

## මංගල යෝජනා

නගරයේ සුප්‍රසිද්ධ ව්‍යාපාරික,
තැබෑරුම්හල් තුනක හිමිකරු,
සොයයි තම එකම දියණියට
මතින් තොර උගත් මනාළයෙක්

**නේත්‍රා දිවයානි**

## රෝස රොබරෝසි

සරසවා ගසක්
පාමුල වැටී
මියෙන්නට
මොහොතකට
පෙරත්
හිනැහෙන

**තුෂාරි ජයසිංහ**

ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට යොමු කරන්න
'යොවුන් ජනතා', දිනමිණ
අංක 35, ලේක්හවුස්, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
younjanatha@lakehouse.lk



## කොවිෂීල්ඩ්...

කොරෝනා මර බිය පරදවනට
ලක් වැසි අපටත් සැනසුම දෙමින්
කොවිෂීල්ඩ් නමින්
මිතුරෙකු ඇවිදින්
පසළොස්වක පෝදා ගියෙමි මමත්
රෝහලට හමුවන්නට කොවිෂීල්ඩ්
මිතුරු...

වමතේ ඉහළ කොටස කඩියෙකු කන කලට
මෙන් දැනුණි පොඩි රිදුමක්
හඬන්නටවත් කෑගසන්ටවත්
අමතකව මොහොතක්
මුව ගොළු වුණා මගේ...

ඇඟ රිඳුම සමඟ විටෙන් විට
උණ ගන්නා කලට කොවිෂීල්ඩ්
සතුරෙකු විලස දැනුණි මටත්
එක දවසක වේදනා නිමා කර
ගතට දැනෙයි සැනසුම් සුව දැන්නම්....

වසරක කාලයක් නිවසටම කොටු වී
ගත කළ සිරගත ජීවිතය නිමාකර
සුබ සිහින දකිනට මතු දවසක් එනු ඇත
ළඟ ළඟම අපටත්....

කොවුලනේ දැන් රස මිහිරි ගීත කියාපන්
මී අඹ ගස් පලබරව හිනැහීයන්
ළඟ එන බක්මහ මඟුලට
කඳමලු බැඳගෙන නෑගම් යන්නට
මාල ගිරවුනේ ඉතින් හනි හනිකට සැරසීයන්....

**සශිකා නිරෝෂි මහලියනගේ**

## අවර ඉර

මඩින් හැඩි වුණ සොඳුරු මල් දම් දවයි ගිනි අව්වේ හෙළා
ඇතත් කිසිවෙකු කඳුළු බිඳුවක් දුන්නෙ නෑ පොළොවට සදා
තව තවත් මේ ඉරට පහළින් මල් පිපෙනකල් මග බලා
ඉන්න හින්දම ඉරත් හවහට කලින් පිටමං වී ගියා

**පියුමි මදුභාෂිණී**

## අමාවක

මම රාත්‍රියට සවන් දෙමි...

ඔබේ හඬ
හමුවෙයි කියා
සිතිවිල්ලෙන්

ඈත එක් තරුවක්
මා සමඟ
අවදියෙන්

සඳ එයි කියා
හැඟීමෙන්

**අයූ ප්‍රනාන්දු**

## ගම හැර යනවා මා තනි වෙනවා

මා අවදිව සිටිනා රෑ තුන් යාමේ
අපගේ මතකය පිළිරුව් දෙනවා
ඒ මතකයෙ ඔබගේ පැත්තෙන්
මා ඇවිළෙනවා මා ඇවිළෙනවා

ප්‍රේමාලිංගන මුවමඬලින්
ඔබ කුසුමක් වී පිපුනා
ඒ පෙතිවල සුවඳින් අද දින
මා මත්වෙනවා මා මත් වෙනවා

සුසුදු සුමුදු ඔබෙ ළය පෙතිවල
මම, නිල් දිය මැණිකක් වූවා
ඒ සුකොමල පියුමම හෙට දා
ගම හැර යනවා මා තනි වෙනවා

**ධනංජය බණ්ඩාර**



# කන විද්දේ නැකැතට ද...?



ශ්‍රී ලාංකේය සංස්කෘතිය තුළ හඳුනාගත හැකි සිරිත් විරිත්, සම්ප්‍රදායන් බොහොමයකි. ඒ අතරින් ගැහැනු දරුවකු ඉපිද මාස කිහිපයක් ගත වූ පසුව නැකැත් බලා කන් විද කරාබු යුගලක් පැලඳවීම සාමාන්‍ය සිංහලයාගේ සිරිත ය. එනමුත් වර්තමාන සමාජය තුළ මෙය විලාසිතාවක් බවට පත්ව ඇත. විශේෂයෙන්ම බොහෝ තරුණියන් කරාබු කිහිපයක් එක් කනක පැලඳ සිටීම සුලබව දැකිය හැකිය. අනෙක් අතට වර්තමාන සමාජය තුළ පිරිමි පාර්ශ්වය ද මේ කෙරෙහි විශේෂයෙන් නැඹුරුවීම දැකගත හැකි ය. විවිධ විලාසිතාවන්ගෙන් හැඩගැන්වුණු විවිධ ආකාරයේ වෛවර්ණයෙන් සකස් වූ කරාබු යුගල පැලඳ සිටින ස්ත්‍රීන් සහ පුරුෂයන් අද සමාජය තුළ දැකිය හැකි වීම සාමාන්‍ය වූවකි. එනමුත් කන් විද කරාබු යුගලක් පලඳවන සැබෑම හේතු සාධක පිළිබඳ ඔබ දැනුවත් ද...? කන් විදීම චාරිත්‍රයක් ලෙස සංස්කෘතිය තුළ නිර්මාණය වූයේ ඇයි...? සිතා බලන්නට ඔබට ඉඩ හසර විවර ය.

'රක්ෂා භූෂණ නිමිත්තං - බාලාස්‍ය කර්ණෝ වීදාතේ' යනුවෙන් සුශ්‍රැතවාර්යතුමාණෝ සිය සංහිතාවේ සූත්‍රස්ථානයේ දහසය වන අධ්‍යායයේ ලා එහි ගුණ පණ පවසත්. ඒ අනුව ඉන් අර්ථවත් වන්නේ බාල ග්‍රහදොස් ආදියෙන් ආරක්ෂා වීමට ආභරණ පැලඳීම මෙන්ම ශරීර ශෝභාව අරමුණුකොට කන් විදීමට නිර්දේශ කළ බවයි. යම් යම් අපල උපද්‍රව, පිරිපත දුරුකර ගැනීම සඳහා විවිධ රත්න වර්ග සහ ආභරණ පැලඳීම ආයුර්වේදයේ ද අනුමත කර ඇත. ඒ අනුව කන් විද කරාබු යුගලක් පැලඳීම මුහුණට සහ කන්වලට අමුතු ඔපයක් මෙන්ම ග්‍රහ දෝෂ නිවාරණය ද අපේක්ෂා කරයි. කරාබු නැතිනම් අරුංගල් ආදී රන් ආභරණ කාන්තාවක් පලඳින්නේ කාන්තා මුහුණකට අවැසි ශෝභාව එක්කර ගැනීමටය. ඇය කරාබු යුගල ගැලවූ විට මුහුණ මැළවී යන බව අතීත ගැමියන් විශ්වාස කළේය. සාමාන්‍යයෙන් ගැහැනු දරුවෙකු ඉපිද මාස හයේ සිට අට දක්වා අතර කාලයේ දී කන් විදීම සුදුසු වන බව ගැමියන් අතර පවතින එක් මතයකි. එමෙන්ම ආචාර්ය වාග්භට සඳහන් කරන ආකාරයට ශීත ඍතුවේදී කන් විදිය යුතු බවත් සඳහන් වේ.

සාමාන්‍යයෙන් ගැහැනු දරුවකු ඉපදුණු පසු සිදුකරන කන් විදීමේ චාරිත්‍රය මහත් ගෞරව භක්තියෙන් යුක්තව සිදු කරනු ලබන්නකි. කන් විදින්නේ නැකතකට අනුව ය. මේ සඳහා සුභ මොහොතක් යොදා ගැනේ. සුබ මොහොතින් සිදු කරනු ලබන කන් විදීමේ දී ලේ නොගලයි. නොපැසවයි. තුවාලය ඉතා ඉක්මනින් සුවපත් වේ. එමෙන්ම පවතින සියලුම ග්‍රහ අපල උපද්‍රව දුරුවන බවත් ගැමියා විශ්වාස කරයි. කනෙහි විදිය යුත්තේ කුමන ස්ථානයේ ද යන්නත් මෙහිදී අවධානය යොමු කරනු ලබන සුවිශේෂී කරුණකි. කන්පෙත්තේ ස්වභාවයෙන්ම පිහිටි දෛවි කෘත සිදුර මේ සඳහා යොදා ගනී. උපතින්ම පිහිටි මෙම සිදුර තුළ සිරා, ධමනි තරුණාස්ථි ආදී කිසිවක් නොමැති බැවින් එම ස්ථානය සොයා බලා ඍජුව විධි කල්හි කිසිදු ලේ ගැනීමක් හෝ වේදනාවක් ඇති නොවේ. දෛවි කෘත සිදුර නොව කන් පෙත්තේ අන් තැනක් විදි විට ලේ ගැලීම, වේදනාව, ඉදිමීම, පැසවීම උණ ගැනීම ආදිය ඇතිවිය හැකිය. විශේෂයෙන්ම පුරාණ ගැමියා කන් විදීමේ චාරිත්‍රය සිදු කරනු ලබන්නේ දරුවා හොඳින් පිරිසුදු කොට නහවා සෙත් පිරිත් ගායනා කොට ජය මංගල ගාථා, අෂ්ටක ආදියෙන් ආශීර්වාද කොට සුබ මොහොතිනි. දෛවි කෘත සිදුර ම විද ආභරණ පැලඳවීමෙන් කර්ණවේධන සංස්කාරය සම්පූර්ණ වේ. ඉන් ගැහැනු දරුවාට ශෝභාවත් ආරක්ෂාවත් යන කරුණු දෙකම සිද්ධ වන බව ගැමි විශ්වාසයයි.

එමෙන්ම කන් විදීමේ නැකත සකස් කර ගන්නේ ද විෂ කලාව නැති දිනයක ය. ඒ සඳහා නැකතට තෝරා ගන්නා වේලාව වන්නේ ඉර මුදුන් වීමට පෙර උදෑසන කාලය ය. රාත්‍රී කාලය මේ සඳහා යොදාගන්නේ නැත. කන් විදීමේ නැකත සකස් කරගත යුතු වන්නේ සඳුදා, බදාදා, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා යන දිනවල බවත් විශ්වාසයන් අතර පවතී. කන් විදීමේ නැකත සකස් කිරීමේදී චන්ද්‍ර බලය පිළිබඳව සැලකිලිමත් විය යුතු අතර තිර රාශියකින් තොරව චර හෝ උභය හෝ රාශියක් තුළ මෙම නැකත සකස් කළ යුතු බව විශේෂයෙන් සඳහන් කර ඇත. දුරුතු මාසය හා වෙසක් මාසය ද උපන් මාසය ද යොදා ගන්නා නැකතට සම්බන්ධ දිනයද හතර, නවය, දාහතර තිථියකට සම්බන්ධ නොවිය යුතුය. පුරපසට සම්බන්ධ දිනයක්ම යොදා ගැනීම මෙහිදී වඩාත් වැදගත් වන බවත් පොතපතෙහි සඳහන් වේ.

ඒ අනුව පැහැදිලි වන කරුණ නම් කන් විදීම යනු සාමාන්‍යයෙන් අපට අවැසි ඕනෑම ආකාරයට සිදු කරන්නක් නොවන බවයි. එය සංස්කෘතිය තුළ හඳුනාගත හැකි සුවිශේෂී චාරිත්‍රයකි. විශේෂයෙන්ම ගැහැනු දරුවකුගේ ශෝභා සම්පන්න බව මෙන්ම ආරක්ෂාව උදෙසා කන් විද කරාබු යුවළක් පැලඳීම සිදුකළ ද වර්තමාන සමාජය තුළ එය විලාසිතාවන් මැන බලන ප්‍රබල අවශ්‍යතාවයක් වී ඇත. සියලු අපල උවදුරු දුරු කිරීමේ අපේක්ෂාවෙන් සුදුසු ස්ථානය සොයාගෙන, සුදුසු නැකතට කන් විදීම සිරිත වුවද අද තරුණ තරුණියන් අවශ්‍ය ඕනෑම ආකාරයකට, කනෙහි ඕනෑම ස්ථානයක් විද කරාබුවක් පැලඳීම දැකගත හැකිය. විශේෂයෙන්ම තරුණයන් අතර ද මෙය වඩාත් ප්‍රචලිත විලාසිතාවකි. විවිධ මෝස්තර සහිත කරාබු විවිධ අයුරින් පැලඳීම පිරිමි පාර්ශ්වයේ ද අවශ්‍යතාවයක් වී තිබේ. අතීතයේ දී නැකතට සුබ මොහොතින් සිදු කළ බොහෝ දේ අද සාමාන්‍ය ජීවිතයේ එතරම් තැකීමක් නොකරන සාමාන්‍ය දෑ බවට පත්ව තිබේ. ලෝකය වෙනස් වන ගමනෙහි අපද වෙනස් විය යුතු ය. ඒ යහපත් අයුරිනි. කෙසේ වෙතත් අප යමක් නවීකරණය කොට භාවිත කරන්නේ නම් එහි අතීත කතාවට පිළිබඳ අවබෝධයෙන් යුතුව නවීකරණයට සමීප වීම වඩාත් වටින්නේ ය.

> විවිධ මෝස්තර සහිත කරාබු විවිධ අයුරින් පැලඳීම පිරිමි පාර්ශ්වයේ ද අවශ්‍යතාවයක් වී තිබේ. අතීතයේ දී නැකතට සුබ මොහොතින් සිදු කළ බොහෝ දේ අද සාමාන්‍ය ජීවිතයේ එතරම් තැකීමක් නොකරන සාමාන්‍ය දෑ බවට පත්ව තිබේ.

**හංසනී දිල්හාරා**
ජනසන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

# ගැහැනුන්ට මතක හිටින්නෙ පිරිමි පිරිමින්ට මතක හිටින්නේ ගැහැනු



මානව ප්‍රේමය දිග හැරෙන සමහැරෙන සමහර කතා ඉවර වෙන්නේ තත්පරයට ඒ කතාවලට ලොකු ඉතිහාසයක් නැති උනත් මතක හිටින කාලය ගොඩක් දිගයි. පිරිමි ගැහැනු කියන දෙපිරිසක් ඉන්න ලෝකයක අපිට කතාවලදී වැඩිපුරම මතක හිටින්නේ ගැහැනු. ගැහැනුන්ට මතක හිටින්නේ පිරිමි. මේ අතරේ අසාමාන්‍ය ආකාරයට මෙය වෙනස් වෙන්නත් පුළුවන්. මේකට විවිධ නම් යොදාගන්න පුළුවන්. මේ ඔක්කොම අතරේ ආදරයක් තියෙන්නත් පුළුවන්.

ඒකට තමයි මිනිස්සු නොදන්නවා වුණාට මානව ප්‍රේමය කියන්නේ. ඔය ප්‍රේමය එක එක අතට හරවගන්න සමහරුන්ට පුළුවන්. අම්මට තාත්තට කරන ආදරයයි ගුරුවරුන්ට, මාමට නැන්දට කරන ආදරයයි මිත්‍රයට කරන ආදරයයි එකිනෙකට වෙනස්. ඒවා තුළ රාගය නැහැ. ඉතින් ගැහැනු ළමයි පිරිමි ළමයින්ටත් එහෙම ආදර කතා ජීවිතයක් තුළ තියෙන්නෙ බැරිද? එහෙම සබඳතා ආදර කතන්දර වගේ ඉවර වෙන්නේ නෑ. ඉවර කරන්නත් බෑ. කොහේ ගියත් ඒ මතක එහෙමම තියෙනවා.

මේ අහස යට ඉඳලා වෙන අහසක ඉඳලා රාග විරාග ප්‍රේම කියලා ආදරේ කොටස් දෙකකට වෙන් කළාම මානව ප්‍රේමය වැටෙන්න විරාග ගොඩට. ඒක පවතින්නේ ඕනම දේ තමයි විරාගය. නමුත් ආදරේට අමාරුකම් නැහැ. කොහොම හරි පවතිනවා. රණ්ඩුවෙලා අඬලා දොඩලා හරි. හිතන්නකෝ ආදරණියම අයට ඇරෙන්න රණ්ඩු කරලා යාළුවෙන්න පුළුවන්ද? බැහැ. මානව ප්‍රේමය ඇරෙන්න කිසිම ප්‍රේමයක් පවතින්නේ නැත්තේ ඒ නිසාමයි. කවුරු කොහේ ගියත් බැන්නත් සමාව ගත්තත් ආදරය කියන එක අඩුවක් නොවෙන්න වගබලාගත යුතුයි.

**කේ. ඒ. එච්. යශෝධා**
කැලණිය විශ්වවිද්‍යාලය

# SUPER WOMAN කෙනෙක් වෙමු

ප්‍රතිශතයක් ලෙස ගත් විට ලෝක ජනගහනයෙන් 50.2% පමණ කාන්තාවන් වන අතර ලංකාවේ ජනගහනයෙන් හරි අඩකට වැඩි කොටසක් එනම් 52.3% ක් පමණ කාන්තාවන් ය. තත්ත්වය එසේ වූවත් විශේෂයෙන් ලංකාව ඇතුළු ආසියාතික කාන්තාව තම අයිතීන් දිනා ගැනීමට හඬ නැඟීම දන්නා කාලයක පටන්ම සිදුවන්නක් බව නොරහසකි. එහි වක්‍ර අදහස නම් කුටුම්බය තුළ කාන්තාව අසතුටෙන්, පීඩනයෙන් ජීවත් වෙන්නේ පුරුෂයින්ගේ බලපෑම නිසා බවය. ඒ අතර දිනකට දික්කසාද නඩු සිය ගණනක් දක්වා ඉහළ යෑමත් ඉන් 75%කට වඩා වැඩි ප්‍රමාණයක් කාන්තා පාර්ශ්වය විසින් ගොනුකර ඇති බැවින්, ලංකාවේ බහුතර කාන්තා පාර්ශ්වය "බිරිඳ" කියන රාමුව තුළ තෘප්තිමත් නැති බව නොරහසකි.

කාන්තා දිනය පෙරටු කරගනිමින් කාන්තාවන්ගේ මිල කළ නොහැකි සේවය ගැන නිතරම කතා කරන නිසා ඉන් ඔබ්බට ගොස් කාන්තාව සතු බුද්ධිය, හැකියාව සහ ජානමය හැකියාව තුළින් පුරුෂයින්, එසේ නොමැතිනම් සැමියන් තමා වෙත නතු කරවා ගෙන යුග දිවියේ සතුට සැනසීම ආරක්ෂා කර ගත හැකි වැදගත් කරුණු කිහිපයක් වෙතට අවධානය යොමු කිරීම කාලෝචිතව ඉතාමත් වැදගත්ය .

මනෝවිද්‍යාත්මකව බැලීමේදී පිරිමින් ගැහැනුන්ට වඩා උපතින්ම සන්සන්දනාත්මකය. තත්පර කිහිපයකින් එක බැල්මකින් ගැහැනියක් සම්පූර්ණයෙන්ම මනසට ගැනීමට ඔවුන්ට හැකියාවක් ඇත. කවර වූ කාන්තාවක් කෙරෙහි හෝ කුමක් හෝ ආකර්ෂණයක් ඇති වූ විගස විවාහකයෙකු නම් තම බිරිඳ හා ක්ෂණිකව ඔවුන් සන්සන්දනය කරයි. එම ආකර්ෂණය සිතුවිල්ලකින් එහාටත් පවතිනවාද නැද්ද යන්න ඉහත කී සන්සන්දනේදී බිරිඳ හෝ පෙම්වතිය ලබාගන්නා මනෝමය ලකුණුවල ප්‍රමාණය මත බොහෝ විට පදනම් වෙයි. වැඩේ ලේසි නැති නමුත් සිතන තරම් අමාරුද නැත. මෙම කාරණා ගැන වැඩි අවධානයක් යොමු කරන කාන්තාවට විවාහයක් හෝ සම්බන්ධයක් තුළ සැප සහ සතුට වැඩි වශයෙන් විඳින්නට ලැබෙන බව නම් අනිවාර්යය. එමෙන්ම මංගල සාරිය ගලවන විට සීනි බෝල පෙම්වතියගේ හැව ගලවා ඉවත් කරගන්න මතක තබා ගන්න. අද සිට පෙම්වතා සැමියා වන අතර ඔබ පෙම්වතියගේ තනතුරෙන් උසස් වීම් ලැබ බිරිඳ ලෙස වැඩ භාරගන්න අතර, එහිදී ඔබ multi skill විය යුතුමය.

ඒ අතර කිවයුතු වැදගත්ම කරුණක් වන්නේ අත්‍යවශ්‍ය වූවොත් මිසක විවාහයෙන් පසු රැකියාවෙන් ඉවත් වීමට නොසිතන්න. සැමියා සහ තම පවුලේ ආර්ථිකය වෙනුවෙන් සම සමව ආත්ම අභිමානයෙන් යුතුව ඔබත් වෙහෙසෙන්න. හැකිනම් වැඩිදුර අධ්‍යාපනය සඳහා ද යොමුවන්න. රැකියාව යනු මුදල් පමණක්ම නොවේ. මුදල්වලට අමතරව රැකියාවක් තුළින් ආත්ම අභිමානය, නව දැනුම හා ලෝකයට විවර වීමේ හැකියාව, සමාජ පිළිගැනීම, ලැබෙන අතර පවුලේ ආර්ථික ආරක්ෂාව සහ ශක්තිය වෙනුවෙන් ඔබගේ කැපවීම හිත ඇතුළෙන් ඔහුව සනසාවී. කිසියම් හේතුවක් මත රැකියාවක් කළ නොහැකි නම් පැළයක් වවමින් ඇඳුමක් මසමින් හෝ කෙසේ හෝ ස්වයං රැකියාවක හෝ නිරතවන්න. එසේත් නැත්නම් ගෙදරට කෑමට බීමට අවශ්‍ය එළවළු, පලතුරු ටිකවත් ගෙදර වවාගෙන සැමියාට ආර්ථිකමය වශයෙන් හයියක් වෙන්න උත්සහ කරන්න. ඔහු හදවතින්ම ඔබව අගය කරාවි.

තරුණියකට වඩාත් ඔබින්නේ වැදගත් ලෙස තම ජීවිතය ගෙනයාමයි. වැදගත්කම යනු ඔසරියක් ඇඳගෙන මාලයක් දාගෙන සිටීම නොව කොතරම් සමාජය හා මුසුවී කටයුතු කළද තමාගේ ආත්ම ගෞරවය මෙන්ම සැමියාගේ ගෞරවය සුරැකීමයි.

අනේ මන් උයන්න දන්නේ නැහැ, අනේ මට බෑ නොකියා යූටියුබ් එකෙන් බලල හරි හොඳ කුක් කෙනෙක් වෙන්න. ගෙදර කුස්සිය යනු ඔබගේ ලකුණු සීග්‍රයෙන් අඩු වැඩි කරගත හැකි ස්ථානයක් වන අතර හුරතල් නොවී රසවත් කෑම බීම පිසීමට උනන්දු වන්න. උදව්වට කෙනෙක් ඉන්න විටක වුවද ඔහු වෙනුවෙන් ඔබම කෑම පිසීම තුළ පවුල් ජීවිතවල බොහෝ ප්‍රතිශතාත්මක සාර්ථකත්වයක් රඳා පවතින අතර එවිට නිතරම ඔහු එළියෙන් නොකා ගෙදරින්ම ඔබගේ කෑම කන්න ඉක්මනින් ගෙදර පැමිණේවි.

තරුණියකට වඩාත් ඔබින්නේ වැදගත් ලෙස තම ජීවිතය ගෙනයාමයි. වැදගත්කම යනු ඔසරියක් ඇඳගෙන මාලයක් දාගෙන සිටීම නොව කොතරම් සමාජය හා මුසුවී කටයුතු කළද තමාගේ ආත්ම ගෞරවය මෙන්ම සැමියාගේ ගෞරවය සුරැකීමයි.

මිතුරන් ඉදිරියේ කොන්ද කෙළින් තබා සිටගැනීමට බිරිඳගේ චරිතය සහ හැසිරීම ඉවහල් වෙයි. විවාහක බිරිඳකගේ වැදගත්කම චරිතය තුළින් පිලිබිඹු වෙයි.

## හොඳම මිතුරා වන්න.

ප්‍රයෝගික සත්‍ය නම් විවාහයෙන් පසු ඔබේ මිතුරු අසුරටද සීමාවක් තිබිය යුතුය. ඔහු තනියම එළියට යනවාට ඔබ විරුද්ධ නම් ඔබ තනියම එළියට යාම නවත්වන්න. ඔබට ඔහු අවශ්‍ය බව අඟවන්න. ඔබ මිතුරන් සීමා කර ඔහු වෙනුවෙන් කැපවන ප්‍රමාණය ඔහු මිතුරන් සීමා කර ඔබ වෙනුවෙන් කැපවන ප්‍රමාණය මත තීරණය වේ.

සියලු බිල් ගෙවීම්, අනාගත යෝජනා, ඉතුරු කිරීම, මාසික වියදම්, හිතට කොතරම් බරක් වුවද මේ සියල්ලට සමව දායක වන්න. අනේ මට මෙච්චරක් ඕනේ කියමින් මුදල් ඉල්ලමින් ඇඟ බේරා ගන්නවා වෙනුවට ප්‍රයෝගික ලෙස දෛනික ජීවිතය සහ ආදායම යෙදවීමට ඔබ මැදිහත් වන්න. එවිට සියලු ආදායම සහ වියදම විනිවිද බැවින්, වරදට පෙලඹීමක් සහ අනවශ්‍ය වියදම් දැරීමක් ඔහු තුළ නොවේවි.

## අනාගතය ගොඩනඟන්න සක්‍රියව දායක වෙන්න

ඉන්නම් වාලේ ඔහේ නොඉඳ ඔහු හා එකතුව අදට වඩා සොඳුරු හෙට දවසක් සඳහා යෝජනා ඉදිරිපත් කරන්න. ඒ සඳහා කැපවන්න. ඒ බලාපොරත්තු සඳහා ඔබත් යම් කාර්යභාරයක් ඉටු කරන්න. උදා - ඔහු ව්‍යාපාරයක් පටන් ගැනීමට අදහස් කරයි නම් ඔබ ගිණුම්කරණ පාඨමාලාවක් හදාරන්න. එවිට ඔබගේ අගය වැඩිවේවි.

එමෙන්ම පවුල් ජීවිතය තුළ වැදගත්ම කරුණක් වන්නේ ආදරය සහ රාගයයි.

වැඩිම ලකුණු සහිත වැදගත්ම කාරණාව මෙයයි. බොහෝ පිරිසකට අනුව බැන්දට පස්සේ එයා වෙනස් වෙලා අප්පා, ඉස්සර වගේ ආදරේ නෑ .

චෝදනා රැසකි. හැබැයි කාන්තා අපි පවා බැන්දට පස්සේ වෙනස් වූ බව අපට අමතකය.

ගැහැනු අපි මෙන්ම ඔවුන්ද ආදරයට අතිශය ලෝබය. එයා ඉස්සර වගේ ආදරේ නෑ කියමින් නොඉඳ ඉස්සරටත් වඩා ඔබ ඔහුට ආදරය කරන්න. ඉස්සර වගේම සලකන්න. ඉස්සර පෙරුම් පුරමින් මුණගැහුණු විට දැනුණු ආදරය තරමක් දුරට නිතර දැකීම නිසාවෙන් අඩු විය හැකි නමුත් ආදරය දිනෙන් දිනම වැඩි කර අලුත් කර ගත හැකිය.

ඔබේ කාර්යබහුල බවට ආදරය මැදට පැනීමට කිසිවිටකත් ඉඩ නොතබන්න. පිරිමින් යනු ආදරය දීමට වඩා ලබන්නට කැමති පිරිසකි. ඒ නිසා ඔබට ඔහුගේ ආදරය දිනෙන් දින වැඩි කරගැනීමට ඇති එකම ක්‍රමය නම් ඔබ ඉස්සරටත් වඩා ඔහුට ආදරය ලබා දීමය. ඉතා ඉක්මනින් ඒ සඳහා ප්‍රතිචාර ලැබේවි.

රාගය - ඇඹුල් රස, පැණි රස, තිත්ත රස, කහට රස, හෝ එකිනෙකට ආවේණික වූ වෙනස් රසයන් ගැහැනුන් තුළ ගැබ්වී ඇතත් රාගය නමැති කාරණයේදී ඔවුන් සොයන්නේ සියලු රස එක් වූ fruit salad ය. එවිට පිට කෑම ට යොමුවී ලෙඩ වීමට ඔහු නොසිතයි.

සොඳුරු සියුමැලි, හුරතල් පෙම්වතියක් පතන පෙම්වතුන් සැමියන් වූ පසු, දැනුමෙන් බුද්ධියෙන් පෙනුමෙන් මෙන්ම ආර්ථිකයෙන්ද තමාට හයියක් වන යකඩ ගැහැනියක් සොයයි. විවාහයෙන් පසු තාමත් ඔබ රඟන්නේ පෙම්වතියගේ චරිතය නම් සමහරවිට ඔහු තාවකාලික හෝ ස්ථිර replacement වලට යා හැක. මන්ද ගැහැනුන් මෙන් දුක් විඳීමට සහ ඉවසා දරාගැනීමට පිරිමින් උපතින්ම අකමැති නිසාය. මවකගේ දයාව කරුණාව ළඟ හුරතල් වන පිරිමි ආත්ම ලෙහෙසියෙන්ම දවා නිවා ගත හැක්කේ මාතෘ බිරිඳකට හෝ මාතෘ පෙම්වතියකට පමණකි. ඉති තරමටම අස්වැන්න නෙළා ගැනීමට හැකි වනවා සේම, ගැහැනියකගේ කැපවීමේ පරිමාව තුළ ඇයගේ සතුටේ පරිමාණය තීරණය වෙයි.

අනේ මල කෝලම්... කසාද බැඳලා මෙච්චර දුක් විඳින්නේ මොකටද? මෙච්චර දේවල්, කැපකිරීම් කරන්නේ මොකටද? කියලා. මෙන්න මේ කරුණු කියවලා බැලුව විට පස්සේ හිතෙයි දෙන දේ කාල වෙන දේ බලන බිරිඳක් ලෙස ඔහේ සිටිනවාද, ශරීර ශක්තියෙන් කෙසේ වෙතත් මොහොතක් ගෙදර නැති වුණත් ගෙදරම පාළු වෙලා යන ආකාරයේ සකලවිද දස්කම් ඇති super women කෙනෙක් වෙනවාද කියා ඔබට තීරණ කළ හැක.

රුධිරය කිරි කරන්නට තරම් සමත් ලොව සංවේදීම නිර්මාණය වන ගැහැනියට කළ නොහැකි යමක් මිහිමත තිබිය නොහැක. අවශ්‍ය වන්නේ ධනාත්මක සහ ප්‍රමාණාත්මක කැපවීම පමණකි .

එවිට, එක දිනයක් නොව මුළු දිවියම සතුටෙන් සැනසීමෙන් ගෙවා දැමීමට කාන්තාවට හැකි වනු ඇත.



සොඳුරු සියුමැලි, හුරතල් පෙම්වතියක් පතන පෙම්වතුන් සැමියන් වූ පසු, දැනුමෙන් බුද්ධියෙන් පෙනුමෙන් මෙන්ම ආර්ථිකයෙන්ද තමාට හයියක් වන යකඩ ගැහැනියක් සොයයි. විවාහයෙන් පසු තාමත් ඔබ රඟන්නේ පෙම්වතියගේ චරිතය නම් සමහරවිට ඔහු තාවකාලික හෝ ස්ථිර replacement වලට යා හැක.

**අනිශා ජයකොඩි**



# අලුත් දෑ තනන තරුණිය

## මදිරා ගෝවින්දි



මේ උපකරණය මඟින් අප තෙල් යොදාගෙන බැද ගන්නා ලද ආහාරයක අභ්‍යන්තරයේ මෙන් ම පිටත ද පවතින තෙල් ද ඉතා හොඳින් වෙන් කර ගෙන නැවත භාවිතයට ද ගැනීමට ද හැකියාවක් පවතී.

**බොහෝ පාසල්වල ළමයින්ගේ නව නිෂ්පාදන කරළියට ගෙන ඒමට විදුහල්පතිවරු, ගුරුවරු මෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ බලධාරීහු වර්තමානයේ මනා කැපවීමක් දක්වති. අතීතයට වඩා ළමයින්ට තාක්ෂණයේ දියුණුවත් සමඟ නව නිෂ්පාදන සිදු කිරීමට හොඳ ඉඩකඩක් නිර්මාණය වී තිබේ.**

මේ කියන්නට යන්නේ අප සමාජයේ කිසිදු කෙනකුගේ අවධානයට යොමු නොවූ ක්ෂේත්‍රයක් පිළිබඳ පාසල් ශිෂ්‍යාවකගේ දැනුමින් සැකසුණු උපකරණයක් ගැනය.

ඇත්තෙන්ම කෙනකුට මේ උපකරණය ගැන කියූ සැණින් වැඩි අවධානයකට නොගෙනම බැහැර කර හරින්නට ද පුළුවන. එහෙත් එහි ඇති සැබෑ ප්‍රයෝජනය අප මතුපිටින් බැලූ කල කෙනකුට නොවැටහුණ ද ඉන් මානව වර්ගයාගේ, සත්වයන්ගේ හා පරිසර පද්ධතීන්ගේ ආරක්ෂාවට සැලසෙන ප්‍රයෝජන අති මහත්ය.

පාසල් සිසුන් මෙන්ම ශිෂ්‍යාවන් ද මේ නව නිෂ්පාදන කෙරෙහි අද වන විට විශේෂ දක්ෂතා දැක්වීමට සමත් වී ඇත. ශිෂ්‍යාවකට යම් නව නිෂ්පාදනයක් කිරීමේදී සිසුන් මෙන් විවිධ උපකරණ සමඟ ගැටීමේ හැකියාවන් අවම වුවද වර්තමානයේ එය වෙනස් කර ඇත. අද දිනමිණ ද්වාර අතිරේකය මඟින් ඔබ වෙත කියන්නට යන්නේ එවන් ශිෂ්‍යාවක් නිපදවූ නව නිෂ්පාදනයක තොරතුරුය.

මේ Oil Saving bank නිෂ්පාදනය කිරීමට සමත් වන්නේ ඩී. ඒ. මදිරා ගෝවින්දි දුනුආරච්චි ශිෂ්‍යාවයි. ඇය ගම්පහ යසෝදරා දේවි බාලිකා විද්‍යාලයේ මෙවර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටිනා ශිෂ්‍යාවකි. ඇය විසින් නිෂ්පාදනය කළ නව නිපැයුම මඟින් නිවෙසේ මෙන්ම මහා පරිමාණ පොල් තෙල් යොදා කරනා බදින ආහාරවලින් බැහැර වන තෙල් නැවත භාවිතයට ගැනීමට හැකියාවක් පවතී.

අප සමාජයේ බොහෝ පිරිස් බෝ වන රෝගවලට වඩා වැඩි වශයෙන් බෝ නොවන රෝගවලට ගොදුරු වී තිබේ. හෘද රෝග, ස්ථුලතාව, දියවැඩියාව, කොලෙස්ට්‍රෝල් මට්ටම ඉහළ යෑම මෙන්ම පාසල් දරුවන්ගේ පවා BMI මට්ටම ඉහළ අගයක් පැවතීම අද අපට නිතරම ඇසීමට ලැබෙනා ලෙඩ රෝගය. මේ සඳහා අප ආහාරයට ගන්නා තෙල් ද බෙහෙවින් බලපාන අතර තෙල්වලින් අවම ආහාර පරිභෝජනය මින් ගැලවී සිටීමට මනා පිටිවහලකි. මේ උපකරණය මඟින් අප තෙල් යොදාගෙන බැද ගන්නා ලද ආහාරයක පවතින පිටත මෙන්ම අභ්‍යන්තරයේ තෙල් ද ඉතා හොඳින් වෙන් කරගෙන නැවත භාවිතයට ගැනීමට ද හැකියාවක් පවතී.



මෙලෙස ඉවත් කර ගන්නා තෙල් මඟින් ළිප තබන බඳුන්වල දැලි කුණු ඉවත් කිරීමට සබන් නිෂ්පාදනයට යොදා ගැනීම, පොල්තෙල් පහන් දැල්විය හැකි ප්‍රතිතෙල් නිෂ්පාදනය කිරීමට මෙන්ම සත්ව ආහාර නිෂ්පාදනයට ද යොදා ගැනීමේ හැකියාව පවතින බවට සොයා බැලීම් සිදු කර තිබේ.

සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටිනා ශිෂ්‍යාවක් අතින් මෙවැනි කිසි කෙනකුගේ අවධානයක් යොමු නොවනා ක්ෂේත්‍රයක් පිළිබඳ අවධානය යොමු කරමින් නව නිපැයුමක් සිදු කර තිබීම ඇගේ පාසලට මෙන්ම ගමට, නගරයට මෙන් සමස්ත ශ්‍රී ලංකාවටම ආඩම්බරයට කරුණකි. මෙය තව තවත් වැඩිදියුණු කර තෙල් ආශ්‍රිත නිෂ්පාදන සිදු කරන ආයතනවලට හඳුන්වා දීමට හැකි නම් මිනිසුන්ගේ ජීවිත ද ආරක්ෂා වෙනු ඇත. ඇය විසින් තවත් නිෂ්පාදන කිහිපයක් මේ වන විටත් අත්හදා බලමින් පවතින අතර විද්‍යුත් ස්වයංක්‍රිය බිත්තර තම්බන මැෂිම ද විශේෂත්වයක් ගනී. ඉන් ආපනශාලාවල එකවර විශාල ප්‍රමාණයක් බිත්තර තම්බා ගැනීමට හැකියාව පවතී. මෙමඟින් ස්වයංක්‍රියවම බිත්තරය තැම්බීමක් වන අතර අවසානයේ විදුලිය ක්‍රියා විරහිත වීමක් ද සිදු වේ.



මදිරා ගෝවින්දි දුනුආරච්චි අතින් නිමැවුණු කොවිඩ් - හැට් එකක් හා ලයිටරයක් ද පසුගිය කාලයේ තරගවලට ඉදිරිපත් කළ අතර ඉන් පදක්කමක් ද හිමි වී ඇත. මෙවැනි දක්ෂතා ඇති ශිෂ්‍යාවන් හට ඔවුන්ගේ නව නිෂ්පාදන සිදු කිරීමට දායකත්වයක් දක්වන්නේ නම් අප රට තුළ සිටිනා දක්ෂ සිසු සිසුවියන්ගෙන් රටට වැඩදායී නිෂ්පාදන තව තවත් බිහිවනු ඇත.

**ගයාන් සංජය**

# දිනමිණ The Dinamina ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

## වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
## කොළඹ විශ්වවිද්‍යාලය
## ප්‍රසම්පාදන දැන්වීමයි

## පිරිසිදු කිරීමේ හා ජැනිටෝරියල් සේවා ලබාදීම

**ලංසු අංක 01. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රධාන පරිශ්‍රය සඳහා පිරිසිදු කිරීමේ හා ජැනිටෝරියල් සේවා ලබාදීම** (PGIM/GA/CS/2021/01)

**ලංසු අංක 02. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන මධ්‍යස්ථානය සඳහා පිරිසිදු කිරීමේ හා ජැනිටෝරියල් සේවා ලබාදීම** (PGIM/GA/CS/2021/02)

කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පිරිසිදු කිරීමේ හා ජැනිටෝරියල් සේවා ලබාදීම සඳහා 2021-03-30 වන දින ප.ව. 2.30 දක්වා මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටියට අනුව ලංසු කැඳවීම සිදුකරනු ලැබේ.

අභිලාෂී ලංසුකරුවන්හට 2021-03-08 වන දින සිට පෙ.ව. 9.00 ත් ප.ව. 3.30 ත් අතර දුරකථන හෝ ඊමේල් (ජංගම දුරකථන 070-4702867/ ඊමේල් saradmin@pgim.cmb.ac.lk) මගින් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකබාධිකාරී (සාමාන්‍ය) පරිපාලන වෙතින් වැඩිදුර විස්තර ලබාගත හැකිය.

එක් එක් ලංසුව සඳහා බොරැල්ල ලංකා බැංකුවේ අධි ශ්‍රේණි ශාඛා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ගිණුම් අංක 193413 වෙත රු. 2500/- ක ආපසු නොගෙවන ගාස්තුවක් වෙන් වෙන්ව ගෙවීමෙන් අනතුරුව වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ සාමාන්‍ය පරිපාලන වෙත ගෙවීම් ලදුපතේ ස්කෑන් කළ පිටපතක් සමග ලිඛිත අයදුම්පතක් ඊමේල් (saradmin@pgim.cmb.ac.lk) මගින් ඉදිරිපත් කිරීමෙන් අභිලාෂී ලංසුකරුවන්හට සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් ඉංග්‍රීසි බසින් (PDF) ලබාගත හැකිය.

ලංසු අංක 01. සඳහා රු. 60,000/- ක වටිනාකමින් යුතු ලංසු ඇපකරයක්ද, ලංසු අංක 02. සඳහා රු. 90,000/- ක වටිනාකමින් යුතු ලංසු ඇපකරයක්ද ඉදිරිපත් කළ යුතුය. ලංසු ඇපකරය ලංකා බැංකුවේ බොරැල්ල අධිශ්‍රේණි ශාඛාවේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ගිණුම් අංක 193413 වෙත ගෙවා ලදුපත ලංසු ලිපිලේඛනයට ඇමිණිය යුතුය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අනුපිටපතක් සහිත ලංසු ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රධාන පරිශ්‍රය සඳහා "**පිරිසිදු කිරීමේ සහ ජැනිටෝරියල් සේවා ලබාදීම ලංසු අංක 01** (PGIM/GA/CS/2021/01)" හෝ "**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන මධ්‍යස්ථානය සඳහා පිරිසිදු කිරීමේ හා ජැනිටෝරියල් සේවා ලබාදීම ලංසු අංක 02** (PGIM/GA/CS/2021/02)" යනුවෙන් සඳහන් කර 2021-03-30 වන දින පෙ.ව. 9.00ත් ප.ව. 2.30 ත් අතර කොළඹ 07, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවතේ, නො.160, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ, සාමාන්‍ය පරිපාලන අංශයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය. (රටේ පවත්නා කොවිඩ් 19 තත්වය හේතුවෙන් අවසාන දිනයෙහි යම් වෙනසක් සිදුවුවහොත් ඒ බව වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (https://pgim.cmb.ac.lk) වෙබ් අඩවිය මගින් දැනුම්දෙනු ලැබේ.

2021-03-30 වන දින ප.ව. 2.30 ට වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මණ්ඩල කාමර අංක 3 හිදී මෙම අවස්ථාවට පැමිණ සිටින ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේදී ලංසු විවෘත කරනු ලැබේ. ප්‍රමාද හා අසම්පූර්ණ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය,**
**නො.160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07.**
2021-03-06

## ශ්‍රී ලංකා වරාය අධිකාරිය

## ලංසු සඳහා ආරාධනයයි (IFB)

### Tender for Dry Docking of Dredger Hansakawa for Docking, Special and Screw Shaft Surveys, Hull Cleaning, Painting and Replacement of Shaft Seals

**ටෙන්ඩර් අංකය :** EW/04/PT/2020/MA/13-4

1. ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, මීටර් 30 ක් දිග මී. 13 ක් පළල සහ 1500 GRT යාත්‍රා වියළි තටාකයට ගෙන ඒම සඳහා අවශ්‍ය පහසුකම් සහිත නැව් තටාකාංගනයන 'Dry docking of dredger Hansakawa (IMO No. 9240500) for docking, special and screw shaft surveys, hull cleaning, painting and replacement of shaft seals' සඳහා අභිලාෂී පාර්ශ්වයන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.
2. රුපියල් මිලියන 5 ඉක්මවන ටෙන්ඩර් සඳහා 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතේ විධිවිධාන අදාළ වන බව ලංසුකරුවන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. ඒ අනුව, ඉහත සඳහන් එක් එක් ටෙන්ඩරයට සම්බන්ධ වන සියලුම පාර්ශ්වයන්ට, කොන්ත්‍රාත් කාලසීමාව පුරාම එකී පනත හා සමග බැඳී කටයුතු කිරීම අවශ්‍ය වේ. ඒජන්තවරයකු / උප ඒජන්තවරයකු, නියෝජිතවරයකු වෙනුවෙන් හෝ ඒජන්තවරයකු / උප ඒජන්තවරයකු, නියෝජිතයකු හෝ නම්කළ අයකු ලෙස කටයුතු කිරීමට බලාපොරොත්තු වන ඕනෑම ලංසුකරුවකු පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් සමග ලියාපදිංචි විය යුතු අතර, යථාපරිදි සම්පූර්ණ කළ ලියාපදිංචි සහතිකය තම ලංසු ලිපිලේඛන සමග ඉදිරිපත් කළ යුතුය.
3. ලංසුකරුවන් ඉහත දී ඇති සේවාවන්ට සමාන සේවා සැපයීමේ ව්‍යාපාරයක අඩුතරමින් පසුගිය වසර 5 ක කාලය තුළ නියැලී සිටිය යුතු අතර GRT 1500 ට අඩු නොවන යාත්‍රා හෝ ඩ්‍රෙජර් වියළි තටාකයට ගෙනඒම පිළිබඳ සනාථ කළ පළපුරුද්ද සහිත අය විය යුතුය.
4. අභිලාෂී ලංසුකරුවන්ට, කොළඹ - 01, ලේඩන් බැස්ටියන් පාරේ, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, නාවික ඉංජිනේරු කොට්ඨාසයේ, ප්‍රධාන ඉංජිනේරු (නාවික) වෙතින් වැඩිමනත් තොරතුරු ලබා ගත හැකි අතර පහත සඳහන් ලිපිනයේදී කාර්යාලීය වේලාවන් තුළ ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.
5. පහත දී ඇති ලිපිනයේ ප්‍රධාන ඉංජිනේරු (නාවික) වෙත යොමු කළ ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන රු. 10,500.00 ක (8% VAT ඇතුළුව) ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් අනතුරුව 2021-03-08 දින සිට 2021-03-24 දින තෙක් කාර්යාල දිනයන්හි 09.00 පැය සිට 15.00 පැය දක්වා කොළඹ - 01, ලේඩන් බැස්ටියන් පාරේ, 45, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ, ඉංජිනේරු කර්මාන්ත ශාඛාවෙන් ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය.
6. සියලුම ලංසු සමග රු. 442,025.00 ක ලංසු සුරක්‍ෂණයක් ඉදිරිපත් කළ යුතු අතර, "Dry docking of dredger Hansakawa for docking, special and screw shaft surveys, hull cleaning, painting and replacement of shaft seals' EW/04/PT/2020/MA/13-4) යනුවෙන් මුද්‍රා තැබූ කවරයේ වම් ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.
7. මුද්‍රා තැබූ ලංසු, කොළඹ 01, ලේඩන් බැස්ටියන් මාවත, 45, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ, නාවික ඉංජිනේරු අංශ ප්‍රධාන ඉංජිනේරු (නාවික) වෙත යොමුකොට 2021-03-25 දින 14.00 පැයට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම ලිපිනයේම තබා ඇති ලංසු පෙට්ටියේ තැන්පත් කළ යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු භාර නොගැනේ.
8. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම ලිපිනයේදීම ලංසු විවෘත කෙරෙන අතර, ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගි විය හැකිය.

**ප්‍රධාන ඉංජිනේරු (නාවික),**
**නාවික ඉංජිනේරු කොට්ඨාසය,**
**ශ්‍රී ලංකා වරාය අධිකාරිය,**
**නො. 45, ලේඩන් බැස්ටියන් පාර,**
**කොළඹ 01.**

**දුරකථන : 011-2482330 / 011-2342537**
**ෆැක්ස් අංකය : 011-2342537**

## ලංසු සඳහා ආරාධනයයි (IFB)

### වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

### පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP)

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ බීට්ටු කාර්යාල, අලි පාලන ඒකක සහ ගල්ඔය ජාතික වනෝද්‍යානය සඳහා මෝටර් බයිසිකල් 55 ක් සැපයීම සහ ගෙනැවිත් භාරදීම

**කොන්ත්‍රාත් අංක : LK-ESCAMP-DWC-123593-GO-RFQ, LK-ESCAMP-DWC-123611-GO-RFQ, LK-ESCAMP-DWC-163970-GO-RFQ**

01. බත්තරමුල්ල, රජමල්වත්ත පාර, නො. 82, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - ESCAMP, ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටු (PPC) සභාපති විසින්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ බීට්ටු කාර්යාල, අලි පාලන ඒකක සහ ගල්ඔය ජාතික වනෝද්‍යානය සඳහා මෝටර් බයිසිකල් 50 ක් සැපයීම සහ ගෙනැවිත් භාරදීම සඳහා, ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය යටතේ ලංසු කැඳවනු ලැබේ.

**අවශ්‍යතාවයේ කෙටි සාරාංශයක් පහත වගුවේ දක්වා ඇත.**

| අයිතමය | ප්‍රමාණය / ඒකක |
|---|---|
| බ්‍රෑන්ඩ් නිව් මෝටර් බයිසිකල් 2020 (120 - 130 CC) | 55 |

02. ඉහත ලැයිස්තුගත කර ඇති ආකාරයට ලංසුකරුවන් විසින් සම්පූර්ණ මෝටර් බයිසිකල් ප්‍රමාණය සඳහාම ලංසු තැබීම අවශ්‍ය වේ. ලංසුවෙන් කොටසක් සඳහා ලංසු ඉදිරිපත් කළහොත්, ඒවා ප්‍රතිචාර නොදැක්වූ ලංසු ලෙස සලකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. ලංසු තැබීම, ජාතිත තරගකාරී ලංසුකරණ පටිපාටිය (NCB) භාවිත කර සිදු කරනු ලබන අතර, ශ්‍රී ලංකා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ මගින් පාලනය වනු ඇත. ලංසු ලේඛනවල දක්වා ඇති පරිදි යෝග්‍යතා සහ සුදුසුකම් අවශ්‍යතා සපුරාලන සියලුම යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් හට විවෘත වේ.

04. අභිලාෂී ලංසුකරුවන්හට මේ පිළිබඳව වැඩිදුර විස්තර, බත්තරමුල්ල, රජමල්වත්ත පාර, නො. 82, "සම්පත්පාය", ජෛව පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතිය, (ESCAMP), ප්‍රසම්පාදන අංශයෙන්, 2021.03.08 සිට 2021.03.29 දින දක්වා රාජකාරී දිනවල පෙ.ව. 9.00 - ප.ව. 3.00 ත් අතර ලබාගත හැක. ලංසු ලේඛන, ඉහත සඳහන් ලිපිනයේදී සාමාන්‍ය රාජකාරී දිනවල, මුදල් ගෙවීමකින් තොරව පරීක්ෂා කළ හැකිය. තවද පරීක්ෂා කිරීම සඳහා පමණක් ආදර්ශ ලංසු ලේඛනයක් www.escamp.lk වෙබ් අඩවියේ දක්වා ඇත. (දුරකථන අංක : 0112888426 / 0112888427)

05. අභිලාෂී ලංසුකරුවන් හට ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රිත, සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක්, "**ව්‍යාපෘති අධ්‍යක්ෂ, ජෛව පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතිය** (ESCAMP), "**සම්පත්පාය**", **නො. 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල**" යන ලිපිනයට ලිඛිත අයදුම්පත්‍රයක් 2021 මාර්තු 08 වන දින සිට 2021 මාර්තු 29 වන දින දක්වා පෙ.ව. 9.00 ත් ප.ව. 3.00 ත් අතර කාලයේදී යොමු කිරීම මගින් සහ ආපසු නොගෙවන රු. 5000 ක ගාස්තුවක් ගෙවීම මගින් ලබාගත හැක. ගෙවීමේ ක්‍රමය, ජෛව පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතියේ (ESCAMP) ව්‍යාපෘති ගණකාධිකාරී වෙත මුදල් මගිනි.

06. සම්පූර්ණ කරන ලද ලංසු අනු පිටපත් සමග වෙන්ව ලිපිකවරවල බහා "මුල් පිටපත" සහ "අනු පිටපත" ලෙස සඳහන් කර, මුද්‍රා තබා එම ලිපි කවර දෙකම නැවත එක් කවරයක බහා, කවරයේ වම්පස ඉහළ කෙළවරේ කොන්ත්‍රාත් අංකය සහ ප්‍රසම්පාදනයේ නම සඳහන් කර, පහත ලිපිනයට ලියාපදිංචි තැපැල් මාර්ගයෙන් 2021 මාර්තු 30 වන දින පෙ.ව. 10.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි එවිය යුතුය. ලංසු, බත්තරමුල්ල, රජමල්වත්ත පාර, නො. 82, "සම්පත්පාය", ජෛව පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතිය, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි රැස්වීම් ශාලාවේ (Conference Room) තබා ඇති ටෙන්ඩර පෙට්ටියට ද බහාලිය හැක. ප්‍රමාද වී ලැබෙන ලංසු සහ විද්‍යුත් මාර්ගයෙන් එවන ලද ලංසු භාර නොගන්නා අතර, ඒවා ප්‍රතික්ෂේප වේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එදිනට පැමිණෙන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේ දී ලංසු විවෘත කෙරෙනු ලැබේ.

07. සෑම ලංසුවක්ම, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ඕනෑම වාණිජ බැංකුවක් මගින් නිකුත් කළ "ලංසු සුරක්ෂණයක්" සමග එවිය යුතුය. ලංසු සුරක්ෂණයේ වටිනාකම ශ්‍රී ලං. රු. 200,000.00 ක් (VAT රහිතව) විය යුතුය. ලංසු සුරක්ෂණය 2021 ජූලි මස 31 වනදා දක්වා වලංගු විය යුතුයි. වලංගු ලංසු සුරක්ෂණයක් රහිතව හෝ ලංසු ලේඛනයේ සඳහන් ආකෘතිය පරිදි ඒවා නොමැති ලංසු ප්‍රතික්ෂේප වේ.

08. ලංසු 2021 ජූනි 30 වනදා දක්වා වලංගු විය යුතුය.

09. ලංසු සූදානම් කිරීම හෝ ලැබීමට සැලැස්වීම හා සම්බන්ධ ලංසුකරු විසින් සිදු කරන කිසිදු පිරිවැයක් හෝ වියදමක් සඳහා සේවායෝජකයා විසින් වග කියනු නොලැබේ.

10. ලංසුකරුවන් විසින් ඔවුන්ගේ ලංසු සමග PCA 3 පෝර්මය (පොදු කොන්ත්‍රාත් පනත 1987) ලබාදිය යුතුය.

11. ඕනෑම ලංසුවක් සම්පූර්ණයෙන් හෝ කොටසක් ලෙසින් භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව සතුවන අතර මේ සම්බන්ධව ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**සභාපති,**
**ව්‍යාපෘති කළමනාකරණ කමිටුව (PPC),**
**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,**
**ජෛව පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP),**
**"සම්පත්පාය", නො. 82,**
**රජමල්වත්ත පාර, බත්තරමුල්ල.**
**දු. ක. 011-2888426 / 0112888427**
**www.escamp.lk**
**2021 මාර්තු 06**

කෑගල්ල දිස්. යේ වරකාපොල ප්‍රා. ලේ. කොට්ඨාසයේ අංක 91 ඩී යද්දෙහිමුල්ල ග්‍රාම නිලධාරී වසමේ A/205, ගෙදරවෙල, දෙරවක ලිපිනයේ පදිංචි **දියුණුගල්ගේ ෂෙල්ටන් රාජරත්න** වන මම අද පටන් දියුණුගල **මුදියන්සේලාගේ ෂෙල්ටන් රාජරත්න** ලෙස භාවිත කරන බව ශ්‍රී ලංකා ජනරජවාසී සැමට මෙයින් දැනුම් දෙමි.

---

කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නො. 47/3, සුමිත්‍රාරාම මාවත, කොටහේන, කොළඹ 13 පදිංචි **රත්දෙනි මුදිත්සේලාගේ ප්‍රසන් ධනංජ** වන මම මින් ඉදිරියට **රත්දෙනි මුදියන්සේලාගේ ප්‍රසන්න ධනංජ** යනුවෙන් නම භාවිත කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

මෙයට :
**රත්දෙනි මුදියන්සේලාගේ ප්‍රසන් ධනංජ**

---

## වාසගම වෙනස් කිරීම

අනුරාධපුර දිස්ත්‍රික්කයේ රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යාය 18, පුත්තලම් පාර, රාජාංගනය ලිපිනයේ පදිංචි **දේවතන්තිරිලාගේ කුමාරතුංග** වන මම මින් ඉදිරියට **දේවතන්ත්‍රිගේ කුමාරතුංග** යන නමින් හදුන්වන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

**දේවතන්ත්‍රිගේ කුමාරතුංග.**

---

**2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නිවේදනය**

නම :
**බර්ක්වුඩ්ස් (පීවීටී) එල්ටීඩී**
අංකය : PV00233943,
ලිපිනය : අංක 187, වෝඩ් පෙදෙස, කොළඹ 07.

**2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නිවේදනය**

නම :
**කන්දේ හෝල්ඩිංස් (පීවීටී) එල්ටීඩී**
අංකය : PV00230734,
ලිපිනය :
72/7B, දෙවෙනි පටුමග, පුෂ්පාදන මාවත, මහනුවර.

**2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නිවේදනය**

නම :
**මෙත්තා නර්සිං කෙයාර් හෝම්ස් (පීවීටී) එල්ටීඩී**
අංකය : PV232915,
ලිපිනය : 31/18B, නුගගහලන්ද මාවත, කළුගෙඩිහේන.

---

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
# ප්‍රසම්පාදන දැන්වීම

පහත සඳහන් ප්‍රසම්පාදන සඳහා ප්‍රසම්පාදන කැඳවීමේ දැන්වීම 2021.03.06 වන සෙනසුරාදා සහ 2021.03.08 වන සඳුදා දිනයන්හි (Daily News) පුවත්පතේ පළකරනු ඇත.

01. Clearing Jungle of Phase - 1 of Proposed Pharmaceutical Zone At Arabokka - Hambantota
**Contract No. BOI/TS/Pharma/Ham/2021/03/09.014**

02. Supply and Laying of Internal Water Distribution Network at Bingirioya Export Processing Zone
**Contract No. BOI/TS/BgEpz/2002/08/02.002**

ඉහත ප්‍රසම්පාදන සඳහා අදාළ ටෙන්ඩර් පත් ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කර ඇති අතර, ප්‍රසම්පාදන ඉදිරිපත් කිරීමට උනන්දුවක් දක්වන කොන්ත්‍රාත්කරුවන්හට 2021.03.06 වන සෙනසුරාදා සහ 2021.03.08 වන සඳුදා දිනයන්හි (Daily News) පුවත්පතේ අදාළ දැන්වීම අනුව කටයුතු කරන ලෙස මෙයින් දැනුම් දෙමු.

**සභාපති,**
**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය.**

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/04/2021/පිටු/සැ

## ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදළ පළමුවන තීරුවේ දක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත් / පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.
02. වර්ෂ 2021-03-26 වෙනි දින සිට 2021-04-09 වෙනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලිය හැකිය.
03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2021-04-16 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

### උපලේඛනය

| ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර | ඉඩම්වල විස්තර | ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් කොට්ඨාසයේ 1206 වෙළුමේ 165 පත්‍රිරුව | බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පල්ලේ පත්තුවේ සල්පිටි කෝරළේ බෙරවාවල, බටකැත්තර සහ දෙමලදූව පිහිටි 'ගෝනමඩිත්තවත්ත නැමැති ඉඩමට බලයලත් මානක ඩබ්. අහංගම මහතා විසින් 1978.10.10 දින මැන සාදන ලද අංක 2232 දරන පිඹුරේ ලොට් 01 සඳහා මායිම්.<br>**උතුර :** ලොට් 05 අඩි (අඩි 10 පළල පාර) ලොට් 02<br>**නැගෙනහිර :** ලොට් 02 සහ 03<br>**දකුණ :** ඩී.ඩී. ජයසිංහට අයිති ඉඩම හා එච්.එල්. එස්. වික්‍රමසිංහට අයිති ඉඩම<br>**බස්නාහිර :** එච්.එල්.එස්. වික්‍රමසිංහට අයිති ඉඩම හා ගෝනමඩිත්ත පාර, ලොට් 02.<br>**බිම් ප්‍රමාණය :** අ:03 රූ:00 ප: 07 | 01. ඩබ්ලිව්.සී. බොතේජු ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1978.12.04 දින අංක 30499 දරන තෑගි ඔප්පුව. |

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,**
**නො. 234/ඒ3,**
**ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**

**ඩබ්ලිව්.එම්.එම්.බී. වීරසේකර**
**රෙජිස්ට්‍රාර් ජනරාල්.**

---

# මිල ගණන් කැඳවීමයි
## NA-7658 ටාටා බස් රථය සහ 148-6940V-50 යමහා යතුරු පැදිය විකිණීම

සී/ස පූජාපිටිය විවිධ සේවා සමුපකාර සමිතියට අයත් පහත සඳහන් බස් රථය සහ යතුරු පැදිය විකිණීම සඳහා ටෙන්ඩර් මිල ගණන් කැඳවනු ලැබේ.

| වාහනය | වර්ගය | නිෂ්පාදිත වර්ෂය | ටෙන්ඩර් තැන්පතුවේ ස්වභාවය | |
|---|---|---|---|---|
| | | | ආපසු ගෙවන තැන්පත් | ආපසු නොගෙවන තැන්පත් |
| NA-7658 බස් රථය | ටාටා | 2009 | 5,000.00 | 2,500.00 |
| 148-8694 යතුරු පැදිය | V-50 යමහා | 1995 | 1,000.00 | 500.00 |

ඉරිදා දින හැර අනෙකුත් දිනයන් තුළ පෙ.ව. 8.30 සිට ප.ව. 3.30 දක්වා සමිති කාර්යාලයට පැමිණ ඉහත වාහන පරීක්ෂා කළ හැකිය.

සියලුම මිල ගණන් මුද්‍රා, තැබූ කවරවල බහා ලියාපදිංචි තැපෑල මගින් 2021.03.20 දින දහවල් 12.30 ට පෙර පහත ලිපිනයට එවිය යුතුය. ලිපි කවරය වම්පස ඉහළ කෙළවරේ ඔබ මිලදී ගන්නා වාහන අංකය හෝ යතුරු පැදි අංකය සඳහන් කර තිබිය යුතුය.

රජයේ තක්සේරු වටිනාකමට හෝ ඊට වැඩි ලංසුව සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්පත් අනුව විකිණීම තීරණය කිරීම සිදුවේ.

**සභාපති.**

**ලිපිනය :**
**සභාපති,**
**සී/ස පූජාපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය,**
**පූජාපිටිය.**

---

1 TEAM NATION Sri Lanka Cricket

කැමැත්ත ප්‍රකාශ කිරීම (EOI)

## රූපවාහිනී දේශීය විකාශන හිමිකම්
## බංගලාදේශ තරග සංචාරය - 2021



## රූපවාහිනී විකාශනය හිමිකම්

ශ්‍රී ලාංකික ක්‍රිකට් ක්‍රීඩාවේ පාලනාධිකාරිය ලෙසින් කටයුතු කරනු ලබන 'ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය' 2021 වසරේ අප්‍රේල් මස 21 වන දින පැවැත්වීමට නියමිත බංග්ලාදේශයට එරෙහිව තරග 2 කින් සමන්විත ටෙස්ට් තරගාවලියට අදාළ දේශීය රූපවාහිනී විකාශන හිමිකම ලබා ගැනීමට අපේක්ෂාවෙන් පසුවන කීර්තිමත් දේශීය මාධ්‍ය ආයතන වෙතින් 'කැමැත්ත ප්‍රකාශ කිරීම' අපේක්ෂාවෙන් සිටියි.

**හිමිකම් සඳහා අදාල තොරතුරු:**

විකාශන හිමිකම් පිළිබඳ විස්තර සවිස්තරාත්මකව දක්වමින් ලංසු ඉදිරිපත් කිරීමට අදාලව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අවශ්‍යතා හා මාර්ගෝපදේශ ඇතුලත් ටෙන්ඩර් කැඳවීමේ ආරාධනයක් මේ සඳහා උනන්දුවක් දක්වන ආයතනයන් වෙත ලබා දීමට කටයුතු කෙරේ.

**කැමැත්ත ප්‍රකාශ කිරීම (EOI) ඉදිරිපත් කිරීමේ පිළිවෙල:**

2021 මාර්තු 11 වන දින සවස 1.00 ට හෝ ඊට පෙර ඔබ අයදුම් කිරීමට අදහස් කරන අයිතිය පිළිබඳව සඳහන් කරමින් ආයතනයේ/ සමාගමේ සංක්ෂිප්ත හැඳින්වීමක් සහිතව **sponsorship@srilankacricket.lk**, යන විද්‍යුත් ලිපිනය හරහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ලැබීමට සළස්වන්න. වැඩි විස්තර සඳහා 0764 127 253 අළෙවි කළමනාකාරිණී අමතන්න.

කිසිදු දැනුම් දීමකින් තොරව මෙම ඉදිරිපත් කිරීම් (EOI) අවලංගු කිරීමේ, සංශෝධනය කිරීමේ හෝ වෙනස්කම්වලට භාජනය කිරීමේ පූර්ණ අභිමතය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සතුවේ.

ප්‍රධාන විධායක නිලධාරී - ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය

---

# ලංසු සඳහා ආරාධනයයි (2021/01)
## පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, උතුරු පළාත

01. පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත වගුවේ විස්තර කොට ඇති ඉදිකිරීම් කර්මාන්ත සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා,තබන ලද ලංසු කැඳවනු ලැබේ.
02. ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.
03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර පහත වගුවේ සඳහන් ශ්‍රේණිය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.
04. සුදුසුකම් අවශ්‍යතා ලංසු ලිපිලේඛනයේ 4 වන කොටසේ සඳහන් කර ඇත. අතිරේක විස්තර ලංසු දත්ත හා කොන්ත්‍රාත් දත්තවල (5 වන කොටසේ) ලබා දී ඇත.
05. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු පහත 6 වන ඡේදයේ ලබා දී ඇති ලිපිනයෙන් ලබා ගත හැකි අතර, එම ස්ථානයේ දී ඕනෑම රාජකාරී දිනයක පෙ.ව. 9.00 හා ප.ව. 4.00 අතර ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.
06. ආපසු ගෙවනු නොලබන රු. 10,000.00 ක ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2021-03-08 වෙනි දින සිට 2021-03-28 වෙනි දින දක්වා පෙ.ව. 9.00 සහ ප.ව. 3.00 අතර යාපනය, පන්නයි, සෞඛ්‍ය ග්‍රාමයේ, උතුරු පළාත, පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත දුරකථනය : 021-2220819, ෆැක්ස් : 021-2220818. ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් මුදලින් සිදුකළ යුතුය.
07. ලංසු (මුල් පිටපත, අනු පිටපත) 2021-03-29 වෙනි දින පෙ.ව 10.30 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි "**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, උතුරු පළාත, සෞඛ්‍ය ග්‍රාමය, පන්නයි, යාපනය**" යන ලිපිනය වෙත ගෙනැවිත් භාරදීමට හෝ ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය. ලංසු බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලංසු අංකය සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.
08. පූර්ව ලංසු රැස්වීමක් 2021-03-16 වෙනි දින ප.ව. 2.30 ට යාපනය, පන්නයි, සෞඛ්‍ය ග්‍රාමයේ උතුරු පළාතේ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේදී පැවැත්වේ.
09. ලංසු සමග, පහත වගුවේ ලබා දී ඇති තොරතුරු ප්‍රකාර වූ ලංසු ඇපකරයක් අමුණා එවිය යුතුය.

| ලංසු අංකය | වැඩ විස්තරය | ඇස්තමේන්තු ගත පිරිවැය (රු. මිලියන) | කොන්ත්‍රාත් කාලය | අවශ්‍ය ශ්‍රේණිය | අවශ්‍ය ලංසු ඇපකරය | |
|---|---|---|---|---|---|---|
| | | | | | ඇපකරයේ වටිනාකම | වලංගු කාලය |
| NP/B/ KI/02/2021 | පල්ලයි දිසා රෝහලේ කාර්ය මණ්ඩල නිල නිවාස ඉදිකිරීම | 30.3 | දින 217 යි | සී 5 හෝ සී 4 (ගොඩනැගිලි) | 303,000.00 | 2021-07-25 දක්වා |
| NP/B/ KI/03/2021 | කිලිනොච්චිය මුලංකාවිල් මූලික රෝහලේ වෛද්‍ය නිලධාරීන්ගේ චමරි නිල නිවාස | 30.4 | දින 217 යි | සී 5 හෝ සී 4 (ගොඩනැගිලි) | 304,000.00 | 2021-07-25 දක්වා |
| NP/B/ KI/04/2021 | කිලිනොච්චිය වේරවිල් දිසා රෝහලේ බාහිර රෝගී අංශ ගොඩනැගිල්ල ඉදිකිරීම | 39.6 | දින 224 යි | සී 5 හෝ සී 4 (ගොඩනැගිලි) | 396,000.00 | 2021-07-25 දක්වා |
| NP/B/ MU/01/2021 | මල්ලාවි, මූලික රෝහලේ කාමර 10 ක් සහිත (දෙමහල්) වෛද්‍ය නිලධාරීන්ගේ නිල නිවාස ඉදිකිරීම. | 42.8 | දින 231 යි | සී 5 හෝ සී 4 (ගොඩනැගිලි) | 428,000.00 | 2021-07-25 දක්වා |

"ජාතික තරගකාරී ලංසුකරණය මගින් ලංසු මෙහෙයවනු ලැබේ. මෙම ප්‍රසම්පාදනය යටතේ ඉටු කරනු ලබන කර්මාන්තයේ ඇස්තමේන්තුගත අගය රු. මිලියන 50 ට (වැට් සහ අනෙකුත් බදු හැර) අඩු බැවින් අංක 04/2016(iii) දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ සඳහන් පරිදි ප්‍රාදේශීය ප්‍රමුඛතාවය සහ CIDA ශ්‍රේණී ප්‍රමුඛතාවය අදාළවනු ඇති අතර පිළිවෙලින් 2020-10-09 සහ 2021-01-11 දතම අංක 03/2020 සහ 03/2020(i) දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛද අදාළ වනු ඇත.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,**
**උතුරු පළාත.**

---

# දැන්වීමයි
# ගාල්ල මහා නගර සභාව
## රථ වාහන සේවා කිරීම සඳහා මිල ගණන් කැඳවීම

ගාල්ල මහා නගර සභාව සතු පහත සඳහන් රථ වාහන හා යන්ත්‍රෝපකරණ 2021 වසර තුළ සේවා කිරීම සඳහා මුද්‍රා, තැබූ මිල ගණන් මෙයින් කැඳවනු ලැබේ. මේ සඳහා ගාල්ල දිස්ත්‍රික්කයේ රථ වාහන සේවා කිරීමේ ආයතනවලට ඉදිරිපත් විය හැක.

| අනු අංකය | වාහන වර්ගය හා සංඛ්‍යාව | | අනු අංකය | වාහන වර්ගය හා සංඛ්‍යාව | | අනු අංකය | වාහන වර්ගය හා සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | ජීප් රථ | 1 | 10 | ටිපර් රථ | 6 | 19 | කම්පැක්ටර් ටේලර් | 1 |
| 2 | වෑන් රථ | 1 | 11 | ඩම්ප් ට්‍රක් රථ | 2 | 20 | වතුර බවුසර් ටේලර් | 1 |
| 3 | බස් රථ | 1 | 12 | කුඩා ලොරි රථ | 2 | 21 | අත් ට්‍රැක්ටර් | 2 |
| 4 | මෝටර් රථ | 2 | 13 | වතුර බවුසර් රථ | 1 | 22 | බැකෝ ලෝඩර් | 2 |
| 5 | ඩබල් කැබ් රථ | 5 | 14 | ගලි බවුසර් රථ | 2 | 23 | එක්ස්කැවේටර් යන්ත්‍ර | 4 |
| 6 | කෲ කැබ් රථ | 6 | 15 | ගිනි නිවන රථ | 6 | 24 | ස්කිඩ් ස්ටියර් ලෝඩර් | 3 |
| 7 | ත්‍රී රෝද රථ | 1 | 16 | කම්පැක්ටර් රථ | 12 | 25 | වයිබ්රේෂන් රෝලර් | 1 |
| 8 | යතුරු පැදි | 5 | 17 | ට්‍රැක්ටර් | 27 | 26 | වීල් ඩම්පර් | 1 |
| 9 | ගිලන් රථ | 4 | 18 | ට්‍රැක්ටර් ට්‍රේලර් | 24 | 27 | රෝඩ් රෝලර් | 1 |

**අයදුම්පත් නිකුත් කරන අවසාන දිනය හා වේලාව : 2021-03-31 ප.ව. 3.00**
**මිල ගණන් භාර ගන්නා අවසාන දිනය හා වේලාව : 2021-04-01 පෙ.ව. 10.00**
**මිල ගණන් විවෘත කරනු ලබන දිනය හා වේලාව : 2021-04-01 පෙ.ව. 10.30**

01. වැඩි විස්තර සතියේ වැඩ කරන දිනයන්හිදී කාර්යාල වේලාව තුළ ගාල්ල මහා නගර සභාවේ නාගරික ඉංජිනේරු (යාන්ත්‍රික) දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැකිය. දුරකථන අංක : 091-5703530/ 091-2222009
02. ඉදිරිපත් කරනු ලබන ගාස්තු ප්‍රමාණ, එම මිල ගණන් විවෘත කරනු ලබන දින සිට ඉදිරි වර්ෂයක කාලයක් සඳහා වලංගු විය යුතුය.
03. ආපසු නොගෙවන රු. 1,000/- ක මුදලක් ගාල්ල මහා නගර සභාවේ තැන්පත් කිරීමෙන් අනතුරුව මිල ගණන් ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍ර හා අදාළ ලියවිලි ලබා ගත හැක. (මුදල් භාරගැනීම සතියේ වැඩ කරන සෑම දිනකම පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා)
04. 2021-04-01 දින පෙ.ව. 10.00 දක්වා මිල ගණන් භාර ගන්නා අතර, එම වේලාවෙන් පසුව ලැබෙන මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
05. මුද්‍රා, තැබූ මිල ගණන් 2021-04-01 දිනට පෙර හෝ එදින පෙ.ව. 10.00 ට පෙර නාගරික කොමසාරිස් ගාල්ල මහා නගර සභාව නමට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගාල්ල මහා නගර සභාවේ නාගරික කොමසාරිස් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදුකළ හැක. මිල ගණන් ඉදිරිපත් කරනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ "**2021 වසර සඳහා රථවාහන සේවා කිරීම**" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.
06. මිල ගණන් විවෘත කිරීම 2021-04-01 දින පෙ.ව. 10.30 ට සිදු කරනු ලබන අතර, ආයතන හිමිකරුන්ට හෝ බලය පවරනු ලැබූ නියෝජිතයන්ට එම අවස්ථාවට සහභාගී විය හැක.
07. අඩු පාඩු සහිත මිල කියුම් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ. තවද මිල ගණන් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ගාල්ල මහා නගර සභාවේ ටෙන්ඩර් මණ්ඩලය සතුය.

**රනිල් වික්‍රමසේකර**
**නගරික කොමසාරිස්,**
**ගාල්ල මහා නගර සභාව.**

**2021-03-04 දින**
**ගාල්ල මහා නගර සභා**
**කාර්යාලයේදී.**




# නවසීලන්තයට ප්‍රබල භූමිකම්පාවක්



සෙසු කම්පන තුනකුත්

සුනාමි අනතුරු ඇඟවීමක්



රික්ටර් මාපක 8.1 ක්



## උතුරු දූපතේ වෙරළබඩ ප්‍රදේශවලින් දහස් ගණනක් ඉවත් කරති

සිකුරාදා නවසීලන්ත වෙරළට ඔබ්බෙන් ඇති වූ ප්‍රබලතම භූමිකම්පාව ඇතුළුව භූමිකම්පා තුනක්, නිසා දැන් සුනාමි අනතුරු ඇඟවීම් සිදුකර තිබේ. තුන්වන, රික්ටර් මාපක 8.1 ක භූමිකම්පාවකින් පසු උතුරු දූපතේ සමහර වෙරළබඩ ප්‍රදේශවලින් දහස් ගණනක් ඉවත් කර ඇත. මිනිසුන් ඉහළ ස්ථානවලට පැමිණීමට උත්සාහ කරන විට රථවාහන තදබදය ඇතිවිය. පළමු භූමි කම්පාවෙන් පැය 13කට පමණ පසු ජාතික සුනාමි අනතුරු ඇඟවීම 15:43 ට ඉවත් කරන ලදී. සමහර රළ පහරවල් වෙරළබඩ ප්‍රදේශවලට පහර දුන් නමුත් සිකුරාදා දහවල් වන විට බලධාරීන් පැවසුවේ විශාලතම රළ පසු වී ඇති බවයි. නිවැසියන්ට ආපසු ගෙදර යා හැකි බව පැවසූ නමුත් මුහුදු වෙරළෙන් ඈත්ව සිටින ලෙසට අනතුරු අඟවා ඇත. නිව් කැලිඩෝනියාවේ සහ වනුවාටුහි දකුණු පැසිෆික් දූපත් සමූහයට අනතුරුදායක රැළි සඳහා සූදානම් වන ලෙස අනතුරු අඟවා ඇත. ඔවුන්ගේ වෙරළ තීරයේ මීටර් 3 (අඩි 10) ක් තරම් ඉහළ තරංග ආයාමයක් දැකිය හැකි අතර, පේරු, ඉක්වදෝරය සහ චිලී ඇතුළු දකුණු ඇමරිකාවේ සමහර ප්‍රදේශවලට ඔවුන්ගේ මුහුදු වෙරළට මීටර් 1 ක රළ දැකිය හැකි බවට අනතුරු අඟවා තිබුණි. හවායි හි පැසිෆික් සුනාමි අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය පැවසුවේ "සුනාමි රළ නිරීක්ෂණය කර ඇති" නමුත් තවමත් කිසිදු හානියක් වාර්තා වී නොමැති බවයි.

# හොංකොංහි මැතිවරණ ක්‍රමය අහෝසි කරනවා

## චීනය කියයි



හොංකොං දේශය "දේශප්‍රේමීන්"ගේ භාරයේ තිබෙන බව සහතික කිරීම සඳහා හොංකොං හි මැතිවරණ ක්‍රමය අහෝසි කරන බව චීනය සිය විශාලතම දේශපාලන රැස්වීමේදී නිවේදනය කළේය. මේ ප්‍රතිසංස්කරණ පැමිණෙන්නේ හොංකොං පාලනය මර්දනය කිරීමෙන් පසුව යැයි බටහිර මාධ්‍ය පවසයි. සතියක් පුරා පැවැත්වෙන ජාතික මහජන සම්මේලනය (එන්.පී.සී.) සමයේ කෙටුම්පත් තීරණයක් සාකච්ඡා කරනු ඇත. බීජිංහි මේ රැස්වීම සඳහා නීති සම්පාදකයන් දහස් ගණනක් රැස්ව සිටියහ. හොංකොං තීරණයට අමතරව, පාර්ලිමේන්තුව ද මධ්‍යම රජයේ ආර්ථික වර්ධන ඉලක්ක සහ පාරිසරික ප්‍රතිපත්ති සාකච්ඡා කර අනුමත කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. එන්.පී.සී. උප සභාපති වැන්ග් චෙන් සිකුරාදා නිවේදනය කළේ බීජිං විසින් නගරයේ නීති සම්පාදනය කරන ආයතනය වන ව්‍යවස්ථාදායක සභාව (ලෙග්කෝ) පිහිටුවන ආකාරය මෙන්ම හොංකොං නායකයා තෝරා පත් කර ගන්නා ආකාරය ද වෙනස් කරන බවයි. බෙයිජිං ආධාරකරුවන් සමඟ ගොඩගැසී ඇති නගරයේ මැතිවරණ කමිටුවට ලෙග්කෝ අපේක්ෂකයන් නම් කිරීමට සහ එහි සාමාජිකයන්ගෙන් "සාපේක්ෂව විශාල" කොටසක් තෝරා ගැනීමට නව බලතල ඇති බව ඔහු පැවසීය. 70 දෙනෙකුගෙන් යුත් ලෙග්කෝහි ආසන වැඩිවීමක් දක්නට ලැබෙන බව ප්‍රාදේශීය මාධ්‍ය වාර්තා කළ අතර මේ අතිරේක සාමාජිකයන් මැතිවරණ කමිටුව විසින් තෝරා ගනු ඇත. මහජනයා විසින් කෙලින්ම තේරී පත්වන ලෙග්කෝ සාමාජිකයන්ගේ සංඛ්‍යාව ඵලදායී ලෙස තනුක කරනු ඇත. තවත් යෝජිත වෙනසක් මගින් නගරයේ ප්‍රධාන විධායකයා තෝරා ගන්නා මැතිවරණ කමිටුව තුළ බීජිනයේ බලපෑම තවදුරටත් ශක්තිමත් වනු ඇත.




# දියණියගේ හිස ගසා දැමුවැයි සැක පුද්ගලයා අත්අඩංගුවට

තම දියණියගේ හිස ගසා දැමූ බවට සැක කෙරෙන පුද්ගලයකු උතුරු ඉන්දියාවේ උත්තර් ප්‍රදේශ්හි පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ. 17 හැවිරිදි දැරියගේ හිස කපාගෙන පොලිස් ස්ථානයක් දෙසට යමින් සිටියදී සර්වේෂ් කුමාර් නම් ඒ තැනැත්තා අත්අඩංගුවට ගෙන තිබේ. පොලිසිය විසින් රූගත කර ඇති වීඩියෝවකදී, තම දියණිය තමා අකමැති මිනිසෙකු සමඟ ඇතිකරගත් සම්බන්ධයක් නිසා ඔහු කෝපයට පත් වූ බව පවසනු අසන්නට ලැබේ. ඉන්දියාවේ සෑම වසරකම සිය ගණනක් දෙනා ආදරයෙන් බැඳී සිටීම හෝ ඔවුන්ගේ පවුල්වල කැමැත්තට විරුද්ධව විවාහවීම නිසා මිය යති. වීඩියෝවේ, සිටි මිනිසා පවසන්නේ මේ දියණියගේ සම්බන්ධතාව පිළිබඳ තමා මෑතකදී දැනගත් බවත් එය ඔහුට දැඩි කෝපයක් ඇති කළ බවත්ය. ඔහු ඇයව නිවෙසේ තනිවම සොයාගෙන කාමරයකට කොටු කර තියුණු ආයුධයකින් හිස ගසා දැමූ බව ඔහු කියා ඇත. මිනිසෙකු හිස කපාගෙන සිටිනු දුටු බියට පත් ප්‍රදේශවාසීන් පොලිසියට අනතුරු අඟවා තිබේ. මෘත දේහය සහ මිනීමැරුමට යොදාගත් ආයුධය කාමරයේ තබා ඇති අතර ඔහු පොලිසියට යමින් සිටියදී අත්අඩංගුවට ගෙන තිබේ. පොලිසිය පවසන්නේ තවදුරටත් පරීක්ෂණ සිදු කරන බවයි.






# ඔක්ස්ෆර්ඩ්-ඇස්ට්‍රාසෙනෙකා එන්නත ඕස්ට්‍රේලියාවට අපනයනය ඉතාලිය අවහිර කරයි



ඔක්ස්ෆර්ඩ්-ඇස්ට්‍රාසෙනෙකා එන්නත ඕස්ට්‍රේලියාවට අපනයනය කිරීමට නැව්ගත කිරීම ඉතාලි රජය විසින් අවහිර කර තිබේ. මේ තීරණය ඉතාලියේ ඇස්ට්‍රාසෙනෙකා මධ්‍යස්ථානයක නිපදවන එන්නත මාත්‍රාව 250,000කට බලපායි. එන්නත් සපයන සමාගම යුරෝපා සංගමයට ඇති බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වුවහොත් අපනයන නැවැත්වීමට ඉඩ සලසන නව රෙගුලාසි භාවිතා කරන පළමු යුරෝපා සංගමයට අයත් රට ඉතාලිය වේ. ඕස්ට්‍රේලියාව පැවසුවේ "එක් නැව්ගත කිරීමක්" අහිමි වීම එහි පැවැත්මට අහිතකර ලෙස බලපාන්නේ නැති බවයි. මේ පියවර සඳහා යුරෝපා කොමිසමේ සහාය ලැබී ඇතැයි වාර්තා වේ. වසරේ මුල් මාස තුන තුළ සාමාජික රටවලට එකඟ වූ සැපයුමෙන් 40% ක් පමණක් සැපයීමට ඇස්ට්‍රාසෙනෙකා කටයුතු කරමින් සිටී. එහි හිඟය සඳහා නිෂ්පාදන ගැටලු උපුටා දක්වා ඇත. ජනවාරි මාසයේදී එවකට ඉතාලි අගමැති ගුසෙප් කොන්ටේ ඇස්ට්‍රාසෙනෙකා සහ ෆයිසර් යන සමාගම් විසින් එන්නත් සැපයීම ප්‍රමාද කිරීම "පිළිගත නොහැකි" යැයි විස්තර කළ අතර සමාගම් ඔවුන්ගේ ගිවිසුම් උල්ලංඝණය කළ බවට චෝදනා කළේය. යුරෝපා සංගමය එහි එන්නත් කිරීමේ වැඩසටහනේ මන්දගාමී වේගය පිළිබඳ පුළුල් ලෙස විවේචනයට ලක් විය.






# එක්සත් ජනපදය ළදරු පිපිරීමක් මැද

## දරු උපත් පහතට

වසංගතය හේතුවෙන් වැසියන් නිවෙසේ වැඩි කාලයක් ගත කළද, එක්සත් ජනපදය සිටින්නේ ළදරු පිපිරීමක් මධ්‍යයේය. එක්සත් ජනපදයේ දරු උපත් දශකයකට ආසන්න කාලයක් තිස්සේ පහත වැටී ඇති අතර 2019 දී අවුරුදු 35ක් තුළ අඩුම දරු උපත් දක්නට ලැබුණද 2020 සඳහා වන අවසාන සංඛ්‍යාව ඊටත් වඩා පහත වැටෙනු ඇත. 2021 දී ඇස්තමේන්තු ගත ළදරුවන් 300,000 ක් අඩු වනු ඇතැයි බෘකින්ස් ආයතනයේ බුද්ධි මණ්ඩලය කරන ලද අධ්‍යයනයකට අනුව හෙළි වී තිබේ. එය පැමිණෙන්නේ වසංගතය නිසා වැඩකරන කාන්තාවන්ට අසමාන ලෙස හානියක් වන කැළඹිලි සහිත ශ්‍රම වෙළෙඳපොළක් නිර්මාණය වී ඇති බැවිනි. පසුගිය වසරේදී කාන්තාවන් ශ්‍රම බළකායේ පිරිමින්ට වඩා මඳක් වැඩි වූ නමුත් ඔවුන්ගේ ශ්‍රම වෙළෙඳපොළ සහභාගිත්වය මේ වන විට 57% දක්වා පහත වැටී ඇති අතර එය 1988 න් පසු පහළම මට්ටම බව ජාතික කාන්තා නීති මධ්‍යස්ථානය පවසයි. පුළුල් පාසල් හා දිවා සුරකුම් වසා දැමීම් මෙන්ම මහජන රැස්වීම්වල සීමා මධ්‍යයේ, මිලියන ගණනක් කාන්තාවන්ට තම දරුවන්ට වැඩ සහ වෙනත් වගකීම් අධීක්ෂණය හා ඉගැන්වීම සමතුලිත කිරීමට බල කෙරී ඇත. සමීක්ෂණවලින් හෙළි වූයේ බොහෝ යුවළ ගැබ් ගැනීම ප්‍රමාද කරන බවත්, අඩුවෙන් ලිංගිකව හැසිරෙන බවත්, වසංගතය සහ එහි ආර්ථික පිරිවැය නිසා අඩු දරුවන් ප්‍රමාණයක් අවශ්‍ය බවත් තීරණය කිරීමයැයි ගට්මාකර් ආයතනය පවසයි.



# සැන් ඩියාගෝ සත්ත්ව උද්‍යානයේ මහා වානරයන්ට කොරෝනා

## පරීක්ෂණාත්මක කොවිඩ් එන්නතක් නික්ෂේපණය කරයි



සැන් ඩියාගෝ සත්ත්ව උද්‍යානයේ සිටින මහා වානරයන් කීපදෙනෙකුට කොරෝනා පැතිරීමෙන් පසු සතුන් සඳහා නිර්මාණය කරන ලද පරීක්ෂණාත්මක කොවිඩ් -19 එන්නතක් නික්ෂේපණය කර ඇත. පශු ඖෂධ සමාගමක් වන සොයිටිස් විසින් සාදන ලද එන්නත් මාත්‍රාවක් ඔරන්ගුටාන් හතරකට සහ බෝනොබෝ පහකට මාත්‍රා දෙකක් බැගින් විදීමට සූදානම් කර තිබේ. මේ සත්ත්වෝද්‍යානයේ සිටි ගෝරිල්ලන් අට දෙනෙකු ජනවාරි මාසයේ දී කොවිඩ් සඳහා ධනාත්මක බව පරීක්ෂා කළ ලොව පළමු මහා වානරයන් බවට පත්විය. ඔවුන් දැන් සුවය ලබමින් සිටී. මහා වානරයන්ට කොවිඩ් -19 තර්ජනය ඇති වීම ගැන සංරක්ෂකයන් සැලකිලිමත් වේ. අයි.යූ.සී.එන් රතු ලැයිස්තුවේ බරපතළ තර්ජනයට ලක්ව ඇති ජනගහනයක් ඇති ගෝරිල්ලන්ට ඇති අන්තරාය ගැන ඔවුහු විශේෂයෙන් කනස්සල්ලට පත්ව සිටිති.

සැන් ඩියාගෝ සත්ත්වෝද්‍යාන වනජීවී සන්ධානයේ ප්‍රධාන සංරක්ෂණ නිලධාරි නාඩින් ලැම්බර්ස්කි නැෂනල් ජෝග්‍රැෆික් පුවත්පතට පැවසුවේ "මෙය සාමාන්‍ය දෙයක් නොවේ. මගේ වෘත්තීය ජීවිතය තුළ, මේ ක්‍රියාවලියේ මුල් අවධියේදී මට පර්යේෂණාත්මක එන්නතක් ලබා ගැනීමට නොහැකි වී ඇති අතර, එය භාවිතා කිරීමට අවශ්‍ය තරම් අධික ආශාවක් මා තුළ නොතිබුණි. 1994 දී විවෘත හෘදය සැත්කම් කළ ලොව ප්‍රථම ඔරංඔටාන් ජාතික කැරන් ද එන්නතක් ලබා ගත් අය අතර විය. ලැම්බර්ස්කි මහත්මිය පැවසුවේ වානරයන්ට කිසිදු අහිතකර ප්‍රතික්‍රියාවක් සිදුවී නොමැති බවත්, වෙඩි තැබීම් සාර්ථකද යන්න තීරණය කිරීම සඳහා ප්‍රතිදේහ සඳහා ඉක්මනින් පරීක්ෂා කරන බවත්ය.



ඒ. පී. දයාචන්ද්‍ර - ඌරුබොක්ක විශේෂ

# දැළුක්ගල ආරණ්‍ය සේනාසනයේ චෛත්‍යයේ කොත පැළඳවූ දා...



ඌරුබොක්ක, මැකිලියතැන්න, දැළුක්ගල චිත්ත සමාධි ආරණ්‍ය සේනාසනයේ අභිනවයෙන් ඉදි කරනා දැළුක්ගල චිත්ත සමාධි ආරණ්‍ය සේනාසනයේ චෛත්‍යයේ කොත පැළඳවීම සහ චෛත්‍යයේ නිදන් වස්තු තැන්පත් කිරීම පසුගියදා (26) සිදු කරන ලදි. දැළුක්ගල චිත්ත සමාධි ආරණ්‍ය සේනාසනාධිපති පූජ්‍ය මැකිලියතැන්නේ සිරිනන්ද ස්වාමීන්වහන්සේගේ අනුශාසනා පරිදි ආරණ්‍ය සේනාසන දායක සභාව සහ ප්‍රදේශවාසීන්ගේ ධන පරිත්‍යාගයෙන් ඉදි කරනා ලද චෛත්‍යයේ කොත පැළඳවීම සිදු වූයේ ඌරුබොක්ක තුසිත විහාරස්ථානය සහ තුසිත පිරිවෙනෙහි පරිවේණාධිපති ආචාර්ය පූජ්‍ය ඌරුබොක්කේ සුගතසාර නායක ස්වාමීන් වහන්සේ විසිනි. චෛත්‍යයේ කොත පැළඳවීමට සමගාමීව අභිනවයෙන් ඉදි කරනා ලද අටවිසි බුද්ධ මන්දිරය සඳහා බුද්ධ ප්‍රතිමා වහන්සේලා තැන්පත් කිරීම ද සිදු විය. චෛත්‍යයේ කොත පැළඳවීම ඇතුළු පින්කම් සඳහා දැළුක්ගල චිත්ත සමාධි ආරණ්‍ය සේනාසනයේ දායක සභාව, ප්‍රදේශවාසීහු ඇතුළු විශාල පිරිසක් සහභාගී වී සිටියහ.

මීගහකිවුල සමූහ - එන් නවරත්න

# ආරවුල දුරදිග ගිහින්
# සැමියා බිරියගේ දත් ටික බඩට යවලා

මීගහකිවුල ඇල්ලන්ද ප්‍රදේශයේදී දත් කැඩෙන්නට සිය බිරියට පහර දුන් 33 හැවිරිදි පුද්ගලයෙකු ඊයේ (05) උදෑසන ඔහුගේ නිවසේදීම සැකපිට අත්අඩංගුවට ගත් බව කන්දකැටිය පොලිසිය පවසයි.

මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ මීගහකිවුල වත්තේගෙදර ඇල්ලන්ද පදිංචි පුද්ගලයෙකි.

පහරකෑමට ලක් වූ බව කියන 28 හැවිරිදි ඔහුගේ බිරිය ප්‍රතිකාර සඳහා බදුල්ල පළාත් මහ රෝහල වෙත ඇතුළත් කර ඇත.

බීමත්ව පැමිණි මෙම පුද්ගලයා හා බිරිය අතර පවුල් ආරවුලක් සම්බන්ධයෙන් ඇතිවූ සුලු කතාබහක් දුර දිග යාමෙන් මෙම පහරදීම සිදුව ඇති බව මූලික විමර්ශණවලදී ආවරණය වූ බව පොලීසිය පවසයි.

සිද්ධිය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් සැකකාර ස්වාමිපුරුෂයා ඊයේ (05) දින බදුල්ල අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිනි. කන්දකැටිය පොලිසිය පරීක්ෂණ පවත්වයි.

සිසිල ගුණතිලක - ගම්පහ දිස්ත්‍රික් විශේෂ

# දොම්පේ අඩු ආදායම්ලාභී පවුලකට නිවෙසක්



නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක "ඔබට ගෙයක් - රටට හෙටක්" නිවාස වැඩසටහන යටතේ දොම්පේ මැතිවරණ කොට්ඨාසයේ මණ්ඩාවල ඉහළ ලුණුගම 116/3/A පදිංචි කේ. සුජීවා දර්ශනී නමැති අයට නව නිවෙසක් පරිත්‍යාග කිරීම පසුගියදා සිදුකෙරිණි.

මේ නිවසේ අවුරුදු 12ක සහ 16ක දරුවන් දෙදෙනකු සහ වයෝවෘද්ධ මව්පියෝ වාසය කරති. මේ උත්සවය ග්‍රාමීය නිවාස, ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය, කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය ඉන්දික අනුරුද්ධ සහ ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මිලාන් ජයතිලක යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

මේ අවස්ථාවට දොම්පේ ප්‍රාදේශීය සභාවේ සභාපති නීතිඥ පියසේන කාරියවසම්, නිවාස සංවර්ධන අධිකාරියේ ගම්පහ දිස්ත්‍රික් කළමනාකාර අනිල් ප්‍රියන්ත, දොම්පේ නිවාස සංවර්ධන නිලධාරී කේ. එච්. එස්. කේ. ජයතිලක යන මහත්වරුන් ඇතුළු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු හා ප්‍රදේශවාසීහු විශාල පිරිසක් සහභාගී වී සිටියහ.

ටී. කේ. මහින්ද - වැලිගම සමූහ

# මුදුගමුව නැණසලට මුල්ගල්



වැලිගම ප්‍රාදේශීය බල ප්‍රදේශයේ මුදුගමුව ප්‍රදේශයේ තරුණ, තරුණියන්ට අඩුවක්ව පැවති පරිගණක දැනුමෙන් අනාගතය කරා යෑමේ අරමුණ සාක්ෂාත් කරන්නට වැලිගම ප්‍රදේශීය සභාව මඟින් නැණසලක් ආරම්භ කිරීමට පියවර ගෙන ඇත. වැලිගම, මුදුගමුව ප්‍රදේශයේ ප්‍රදේශීය සභා අරමුදලින් රුපියල් ලක්ෂ 61ක් වැය කරමින් මෙය ඉදි කෙරෙනා අතර එහි පරිගණක මධ්‍යස්ථානය හා කියවීම් ශාලාවක් ද ඉදි කිරීමට සැලසුම් කර ඇත.

ඒ සඳහා මුල්ගල් තැබීම පසුගියදා වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපති පුෂ්පකුමාර මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි. මේ අවස්ථාවට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු පිරිසක් ද සහභාගි වී සිටියහ.

ධර්මදාස සිරිවර්ධන
ගාල්ල දිස්ත්‍රික් සංචාරක

# ගණිකා නිවාසයේ සිටි කතුන්ගෙන් එක් කාන්තාවකට ඒඩ්ස්

අම්බලන්ගොඩ නගරයේ හා අවට සිදු කරනා ලද මෙහෙයුමකදී ගණිකා වෘත්තියේ යෙදුණු කාන්තාවන් 5 දෙනකු අම්බලන්ගොඩ පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන තිබූ අතර ඉන් එක් කාන්තාවකට ඒඩ්ස් වැළඳී තිබූ බව වාර්තා වී ඇති බවත් මෙය භයානක තත්ත්වයක් බවත් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති රැස්වීමකදී අනාවරණය කෙරිණි.

මේ බව පැවසුවේ පාර්ලිමේන්තු මන්ත්‍රී ශාන් විජයලාල් ද සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී අම්බලන්ගොඩ ප්‍රජා පොලිස් ඒකකයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රශාන්ත ද සිල්වා මහතා විසිනි.

ඒ මහතා එසේ කීවේ සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිනියගේ මහතා විසින් අම්බලන්ගොඩ බස් නැවතුම්පළ හා අවට ගණිකා වෘත්තියේ යෙදෙනා කාන්තාවන් විශාල වශයෙන් ගැවසෙනා බවත් ඊට යොදා ඇති පිළියම් ගැනත් ප්‍රශ්න කළ අවස්ථාවකදීය.

සී. එම්. ආරියපාල - තඹුත්තේගම සමූහ

# තඹුත්තේගම පහළ තලාව විදුහලේ
# අක්‍රමිකතාවලට එරෙහිව මව්පියෝ උද්ඝෝෂණයක

තඹුත්තේගම අධ්‍යාපන කලාපයේ පහළ තලාව විදුහලේ දරුවන්ගේ මව්පියෝ ඉකුත්දා විදුහල ඉදිරිපිටදී විදුහලේ නියෝජ්‍ය විදුහල්පතිවරයාට සහ තවත් ගුරුවරුන් කීපදෙනකුට එරෙහිව උද්ඝෝෂණයක නිරත වූහ. එහිදී ඔවුන් ඉල්ලා සිටියේ දිගු කලක් මේ විදුහලේ සේවය කරනා බවත් ඔවුන්ගෙන් සේවාවක් නොලැබෙනා බවත් විදුහලේ සිටිය විදුහල්පතිවරයා සිදු කර ඇතැයි කියනා මුදල් වංචාව පිළිබඳ ක්‍රමවත් පරීක්ෂණයක් මේ වනතුරු සිදු කර නැති බවත් වැඩ නොකරන ගුරුවරුන් ස්ථාන මාරු කරනා ලෙසටත් මුදල් වංචාව පිළිබඳ පරීක්ෂණයක් පවත්වන ලෙසත්ය.

පාසලේ වැඩ කරන ගුරුවරුන්ට කරදර කොට ඔවුන්ට විදුහල එපාකොට ස්ථාන මාරු කර වීමට කටයුතු කරනා බවත් ඔවුහු වැඩිදුරටත් පෙන්වා දුන්හ. පැය ගණනාවක් උද්ඝෝෂණය පැවැත්වුවත් බලධාරීන් කිසිවකු නොපැමිණි අතර පසුව ඔවුහු විසිර ගියහ.



නවරත්න සමරතුංග - දමන විශේෂ

# යාල රක්ෂිතයේ කංසා වැවූ සැකකරුවන් සොයා පරීක්ෂණ

යාල රජයේ රක්ෂිත වනය තුළ අක්කර දෙකක පමණ සරුවට වගා කර තිබූ කංසා හේනක් වටලා කංසා ගස් හතළිස්දහසක් තම භාරයට ගෙන පසුගියදා (24) ගිනි තබා විනාශ කළ බව බුත්තල පොලිස් විශේෂ කාර්ය බළකාය ප්‍රකාශ කළේය. එසේම එම හේනට යාබද වාඩියක තිබී වියළි කංසා කිලෝ 36යි ග්‍රෑම් 505ක් ද මේ කංසා හේන පවත්වාගෙන ගිය සැකකරුවන් සතු ජංගම දුරකතන දෙකක්, සිම් කාඩ්පත් හතරක් සහ හැඳුනුම්පතක් ද සොයා ගැනීමට හැකි වී ඇත. වැටලීම සිදු කළ අවස්ථාවට පෙර සැකකරුවන් ප්‍රදේශයෙන් පලාගොස් සිටි අතර ඔවුන් අත්අඩංගුවට ගැනීම සඳහා සෝදිසි මෙහෙයුම් සිදු කෙරේ.

අඩි පහක් පමණ උසට වැඩුණු මේ කංසා ගස් ගිනි තබා විනාශ කර ඇති අතර අධිකරණයට කරුණු වාර්තා කිරීම සඳහා එහි සාම්පල් සහ අනෙකුත් නඩු භාණ්ඩ සමග වැඩිදුර විමර්ශන කටයුතු පිණිස ගෝනගංආර පොලිසියට භාර දී ඇත. පොලිස් විශේෂ කාර්ය බළකායේ අණ දෙන නිලධාරී නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර මහතාගේ අධීක්ෂණය මත කලාප අණ දෙන නිලධාරී (අම්පාර) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සේනාධීර මහතාගේ උපදෙස් පරිදි ප්‍රාදේශීය අණ දෙන නිලධාරී සහකාර පොලිස් අධිකාරී (මොනරාගල) එස්. ටී. බන්දුසිරි මහතාගේ මෙයෙවීමෙන් පොලිස් පරීක්ෂක බණ්ඩාර මහතාට ලැබුණු තොරතුරක් මත බුත්තල කඳවුරේ දෙවැනි අණ දෙන නිලධාරී පොලිස් පරීක්ෂක සුරංග මහතා ඇතුළු දහසය දෙනකුගෙන් යුත් භට පිරිසක් වැටලීමට එක්ව සිටියහ.

සුමිත්‍රා කුමාරිහාමි - කන්තලේ සමූහ

# ත්‍රිකුණාමල ක්‍රීඩා සංගම්වලට උපකරණ

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ක්‍රීඩා සංගම් වෙත ක්‍රීඩා උපකරණ බෙදා දීමේ උත්සවයක් නැගෙනහිර පළාත් ආණ්ඩුකාර අනුරාධා යහම්පත් මහත්මියගේ ප්‍රධානත්වයෙන් පසුගියදා සෙල්වනායගපුරම් ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත්විණි. එම ගෘහස්ථ ක්‍රීඩාංගණය ද එදිනම ආණ්ඩුකාරවරිය අතින් විවෘත කිරීම සිදු වූ අතර එය සංකේතවත් කරමින් බැඩ්මින්ටන් තරගයක් පැවැත්වීම ද විශේෂත්වයක් විය. නැගෙනහිර පළාත් ක්‍රීඩා අංශ විසින් මේ කටයුතු සංවිධාන කළ අතර එම අවස්ථාවට නැගෙනහිර පළාත් නිවාස අධිකාරියේ සභාපති ජේ. ජෙගනාදන් මහතා ඇතුළු පිරිසක් සහභාගි වී සිටියහ.



සමන්තා කංකානම්ගේ - බෙලිහුල්ඔය සමූහ

# රත්නපුර පැරඩයිස් ඉසුරු සෙවණ ළමා නිවාසයට උපකරණ

කාන්තා හා ළමා සංවර්ධන, පෙරපාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය යටතේ වන මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය මඟින් දිවයිනේ පවතින මූලික අවශ්‍යතා හා පහසුකම් අඩුව පවතින, විශේෂ අවධානයක් යොමු නොවූ දරුවන් සඳහා අවශ්‍ය උපකරණ දිස්ත්‍රික් මට්ටමින් සපයා දීමට සැලසුම් කර ඇත. මේ වැඩසටහන යටතේ රත්නපුර, පැරඩයිස් ප්‍රදේශයේ ඉසුරු සෙවණ ළමා නිවාසය සඳහා අවශ්‍ය උපකරණ රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී, රත්නපුර දිස්ත්‍රික් ලේකම් මාලනී ලොකුපෝතාගම මහත්මිය විසින් ඉසුරු සෙවණ ළමා නිවාසයේ ස්ථානභාර නිලධාරී ආර්. එම්. ආර්. සමන්ලතා මහත්මියට ලබාදීම සිදු කෙරිණි.

මේ අවස්ථාවට රත්නපුර අතිරේක දිස්ත්‍රික් ලේකම් ජී. ඩී. එල්. උදය කුමාරි මෙණෙවිය, රත්නපුර දිස්ත්‍රික් මුල් ළමාවිය සංවර්ධන නිලධාරී ඩබ්ලිව්. එම්. එම්. සඳරුවණී සමරකෝන් හා සංවර්ධන නිලධාරී ඩබ්ලිව්. ආර්. නිරෝෂණී යන මහත්මීහු සහභාගි වී සිටියහ.

නාඋල සමූහ

# මැණික් පතල් කම්කරුවන්ට විශ්‍රාම වැටුප් ක්‍රමයක්



ඉතිහාසයේ පළමු වරට මැණික් කර්මාන්තයේ නියැළෙනා ගැහැනු සහ පිරිමි පතල් කම්කරුවන් උදෙසා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ආරම්භ කිරීමට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පියවර ගෙන තිබේ.

ඉකුත්දා (23) එහි මූලික සාකච්ඡාව ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්විණි. ලංකාවේ ප්‍රධානතම මැණික් හමුවන ප්‍රදේශ වන ලග්ගල සහ රත්නපුරය ඇතුළු දිස්ත්‍රික්ක රැසක මැණික් රැකියාවේ නිරත වී පසුව අසරණ භාවයට පත්වන කම්කරුවන් වෙනුවෙන් මෙය මහඟු පිළිසරණක් බව ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ නාඋල ප්‍රාදේශීය නිලධාරී ඒ. ඩී. සංජීව මහතා කියා සිටියේය.

මෙහි මූලික සාකච්ඡාව සඳහා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි කේ. ඒ. ඒස්. පී. කළුආරච්චි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි කල්හාරි ද සිල්වා, දිස්ත්‍රික් නිලධාරී සී. එස් .කුමාර, ලග්ගල ප්‍රාදේශීය ලේකම් එස්. විජයකුමාර් යන මහත්ම මහත්මීන් සහ ලග්ගල මැණික් පතල් කම්කරුවන්ගේ සංගමයේ නියෝජිතයන් ද මැණික් ලැබෙන ග්‍රාම නිලධාරී වසම් 14ක ග්‍රාම නිලධාරීහු ද එක්ව සිටියහ. මේ වැඩසටහන සාර්ථක කර ගැනීමට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපති තිලක් වීරසිංහ සහ අධ්‍යක්ෂ ජනරාල් හර්ෂ ඉලුක්පිටිය මහත්වරුන්ගේ ද මාර්ගෝපදේශය ලැබී තිබේ.

ජයසිරි ජේදුරුආරච්චි - ගන්දර සමූහ

# සීතගල්ල මුහුදු තටාකය ප්‍රතිසංස්කරණයට පියවර





දෙවිනුවර මැතිවරණ බල ප්‍රදේශයේ බෙලිවත්ත, සීතගල්ල මුහුදු තටාකයේ ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගෙන ඇත. තටාකය නැරඹීම සඳහා පැමිණෙන පිරිසට අවශ්‍ය පහසුකම් ඇති වන ආකාරයට සංවර්ධන කටයුතු සිදු කෙරේ. පිහිනුම් තටාකය වර්ෂය පුරාම භාවිතයට යොදාගත හැකි සහ පිරිසුදුව තබා ගැනීමට අවශ්‍ය නවීකරණ කටයුතු සිදු කිරීම අපේක්ෂාව බව ධීවර රාජ්‍ය අමාත්‍ය කංචන විජේසේකර මහතා පැවසීය.

ස්වාභාවික මුහුදු තටාකයක් වන සීතගල්ල මුහුදු තටාකය දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ නඩත්තුව හා පරිපාලනය යටතේ ක්‍රියාත්මක වේ. රාජ්‍ය අමාත්‍ය කංචන විජේසේකර මහතා ඇතුළු නිලධාරී කණ්ඩායමක් තටාකයේ සංවර්ධන කටුයුතු සිදු කළ යුතු ආකාරය පිළිබඳව සොයා බැලීමේ නිරීක්ෂණ චාරිකාවකට එක්වූ අතර එහිදී ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව ද සාකච්ඡා කෙරිණි.

2021 මාර්තු 06 සෙනසුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

දිනමිණ
සදුනතික පත්තර තාරුණ්‍යය

# යොවුන් ජනතා

2021 මාර්තු 06 සෙනසුරාදා




කොලාජ් චිත්‍රය - උදයංග අමරසේකර

PAGE 03




කන විද්දේ නැකතට ද...?

PAGE 05



අලුත් දෑ තනන තරුණිය

PAGE 07



social media

PAGE 08



පොල්කටු ලන්තෑරුම

## අපි ඔබ ඉලක්ක කරන්නෙමු

**යොවුන් හදවත් තුළ අර්ථවත් අකුරු නවාතැනක් වීම අප පුවත්පතෙහි මූලික අරමුණයි. තරුණයන් ඉලක්කගත කර ගනිමින්, හරසුන් දේ බලෙන් ඇඟේ ගැසීම වෙනුවට අරුත්බර දේ ආදරයෙන් වැලඳ ගන්නා මාවතක් සැකසීම අපේ බලාපොරොත්තුවයි. ඕනෑම නිපැයුමක රඳා පැවැත්ම වෙනුවෙන් ඔවුන් ඉලක්ක ගත කරන්නේ ද තරුණ පරපුරයි. අපේ ඉලක්කය ද ඔබයි. ඔබේ ගමනට හරි මඟ සලකුණු පෙන්වීමට හැකි නම් අපේ ජයග්‍රහණය එයයි.**

## එන්න, අපි හරි පාරක් හදමු

**සංස්කරණය - රජිත බස්නායක**

younjanatha@lakehouse.lk

**'යොවුන් ජනතා', දිනමිණ**
**අංක 35**
**ලේක් හවුස්**
**ඩී. ආර්. විජයවර්ධන මාවත**
**කොළඹ 10**

**යොවුන් ජනතා මුල් කවරය හැඩගැන්වීමට ඔබේ නිර්මාණයත් younjanatha@lakehouse.lk ලිපිනයට යොමු කරන්න**

# යක්ෂයන් වන්නෝද දෙවියෝය

මනුෂ්‍යත්වයේ උපරිමය ආදරයයි. භෞතිකව පමණක් දියුණුවේ හිණිපෙත්තට ගිය ද අධ්‍යාත්මිකව මිනිසා පිරිහේ නම් ආදරය පලා යන්නේ සියල්ලටම පෙරය. දියුණුව වනාහි එකී කාරණා ද්විත්වයේම සමබර සම්මිශ්‍රණයක් විය යුතුය. ආදරයට කෙතරම් නිර්වචන තිබුණ ද එය ප්‍රායෝගිකව කෙතරම් දුරට ක්‍රියාත්මක වනවා ද යන්න වර්තමානය වන විට සමාජය තුළ පැන නැඟී ඇති දරුණුතම බේදවාචකයකි. එකෙක් පරයා අනෙකා නැඟී සිටින්නට උත්සහ කරනා සමාජය තුළ අනෙකා මකබෑවුණ ද එයින් පලක් නැත. දෙදෙනෙක් ආදරයෙන් බැඳුණ ද එය මරණය දක්වාම රැගෙන යනුයේ අතළොස්සකි. සම්මතය පරදා අසම්මතය ජය කෙහෙළි නංවන්නේ මෙවන් වූ පසුබිමක් තුළය. ගතේ සවි ශක්තිය තිබෙනතුරු රති කෙළියේ යෙදෙන උන් බොහෝ දෙනෙක් දරුවන් දෙතුන් දෙනෙක් ලැබූ පසුව හැසිරෙන්නේ ආගන්තුකයින් ලෙසය. ඉන් පසු ආදරණීය වදන් ඇසෙන්නේ ද ආදරයෙන් අමතන්නේ ද නැත. ආදරයේ ඇති වැරැද්දක් නැත. විඳින්නට ඇති ආදරය විඳවන්නට හේතු කාරණා සකස් කරගන්නා මිනිසුන් අවසනදී ජීවිතයෙන් වන්දි ගෙවනුයේ ආදරයේ ස්වභාවය මෙය යැයි ලොවට කියාපාමිනි. එය කොතරම් වැරදි ආදර්ශයක් වුවද බොහෝ දෙනෙක් ලබා ඇත්තේ ද ආදරය පිළිබඳ අමිහිරි අත්දැකීම්ය. කාසියක දෙපැත්තක් මෙන් බැඳී ඇති ආදරය හා වෛරය එකිනෙක නොපිටට පෙරළීමට ගත වන්නේ ඉතා කෙටි කාලයකි. හිත්වල ආදරේ ඇත්නම් අනෙකාට හානි කළ නොහැකිය. අයිති කර ගැනීම පමණක්ම ආදරය ලෙසින් වටහා ගන්නා ඇත්තෝ එය අහිමි වූ කළ හැසිරෙන්නේ උන්මන්තකයින් මෙනි. ජීවිතය උපේක්ෂාවෙන් විඳ දරාගත යුතුමය. එසේ නොවුණ කල්හි ආදරය ද සීමා ඉක්මවා කුලප්පු විය හැකිය. කිසිදා නොරිදවූ ආදරයක් තිබේනම් ඒ මව්පිය සෙනෙහස බව අප සැවොම පිළිගන්නා කාරණයකි. නමුත් එයට ද නිගා දෙන ආකාරයෙන් ඇතැම් මව්වරු කටයුතු කරන්නේ දරුවන් යනු දරුවන්ගේ උවමනාවට මෙලොවට පැමිණි උන් ලෙස සිතාය. දෙදෙනෙකුගේ ආදරයේ උත්තරීතර ඵලය වනාහි දරුවන් වේ. එම නිසා දරුවන් බිහි වනුයේ එකී ආදරයේ කැමැත්ත මතය. ඉඳින් හිංසා පීඩා කිරීමට නම් දරුවන් වැදිය යුතු නැත. දිනෙන් දින මිනිසා පිරිහෙමින් සිටින අතර අසන්නට දකින්නට ඇත්තේ සිත කම්පනය කරන සිදුවීම්ය. කවුරුන් විශ්වාස කරන්නේ ද නොකරන්නේ ද යන්න ගැටලුවක් බවට පත් වී ඇත. මන්ද හිටි ගමන් යක්ෂයන් වන්නේ ද ප්‍රසන්න පෙනුමෙන් සිටිනා දෙවියන්ය. මේ නිසා හදවත මඳක් නතර කොට මොළයෙන් තීරණ ගත යුතුය. එය කෙතරම් අසීරු තීරණයක් වුවද අපගේ ජීවිතයේ දිගු කාලීන තෘප්තිය සඳහා රුකුලක් ලබා දෙනු ඇත.

**■ හර්ෂමාලී වීරරත්න**



# යකුන් පලවා හරින සියලු දෙනා කට්ටඩියෝ නොවෙති



සැමගේ ජීවිත එක හා සමානව වටින්නේය. කල්ප කාලයක් පින් දහම් කර ලබාගන්නා මිනිස් ජීවිතය නිකරුණේ විනාශ කිරීම මෙන්ම විනාශ කර ගැනීම ද අනුවණ ක්‍රියාවකි. වර්තමාන සමාජය තුළ නිතර අසන්නට දකින්නට ලැබෙනුයේ ජීවිත විනාශ කිරීම් සහ විනාශ කර ගැනීම්ය. වැරදි මාර්ගයන්හි මං මුළාවීම් මත ජීවිත අහිමි වී යාම බොහෝ විට දක්නට ලැබෙන දෙයකි. එයට කදිම නිදසුනක් ලෙස වර්තමානයේ සිදු වූ පුංචි දියණියකගේ වියෝව පෙන්වා දිය හැකිය. මංමුළා වූ මිථ්‍යා අදහස් මත එළඹෙමින් යකුන් පලවා හැරීමට තම මල් කැකුළක් බඳු වූ පුංචි දියණියට වේවැලකින් මියයනතුරු පහර දෙන ශෝකජනක පුවත් අද වන විට අසන්නට දකින්නට ලැබේ.

මිනිසුන් මිථ්‍යා මතවලට නැඹුරුව ඉහළ ය. එයට හේතුව නම් මිනිසුන් නුවණින් ක්‍රියා කිරීම බොහෝ අඩු බැවිනි. කුමන වැරැද්දක්, බාධාවක් තම ජීවිතවලට පැමිණි විගස බොහෝ මිනිසුන් සිතන්නට පුරුදු වී ඇත්තේ එය අපලයක්, දෝෂයක් ලෙසය. එසේ සිතීම කපටි ලෙසින් මුදල් උපයන ඇත්තන්හට නම් බොහෝ වාසිදායක කරුණකි. අද සමාජය තුළ බොහෝ ඇත්තේ රැවටීම්, මුළා කිරීම්ය. එබැවින් සැම විටම සිහිනුවණින් ක්‍රියා කළ යුතුය. නැතහොත් සිදුවන්නේ තම ජීවිතය මෙන්ම තම ආදරණීයන්ගේ ජීවිත ද විනාශය කරා ගෙන යාමය. වර්තමානයේ දක්නට ඇත්තේ දියුණු තාක්ෂණයක්ය. එසේ දියුණු තාක්ෂණික සමාජයක් තුළ ජීවත්වන මිනිසුන්ගේ මනස නම් දියුණු වී නොමැත.

යකුන් පලවා හරින සියලු කට්ටඩියන් අවංකව ක්‍රියා කරන්නන් නොවේ. ඇත්ත යකා වන්නේ තම අනුවණකම සහ අලසකමය. වරක් වැරදුණු පසු නැවත එම ක්‍රියාව කිරීමට උත්සහ කිරීම කළ යුතු දෙයකි. මන්දයත් උත්සාහය පවතිනතාක් බාධක ජයගත හැකිය. බොහෝ මිනිසුන් එසේ උත්සහ නොකරති. වරක් වැරදුණු පසු එය දෝෂයක්, අපලයක් ලෙස සිතන්නට මිනිසුන් පුරුදු වී ඇත. යකා වන්නේ තමාමය. තමන්ගේ සිතය. එසේ නම් සැමවිටම සිහිනුවණින් ක්‍රියා කළ යුතුය.

**■ අයි. ඩී. එස්. නවෝදා වීරසිංහ**

# කන විද්දේ නැකැතට ද...?

විවිධ මෝස්තර සහිත කරාබු විවිධ අයුරින් පැලඳීම පිරිමි පාර්ශ්වයේ ද අවශ්‍යතාවයක් වී තිබේ. අතීතයේ දී නැකතට සුබ මොහොතින් සිදු කළ බොහෝ දේ අද සාමාන්‍ය ජීවිතයේ එතරම් තැකීමක් නොකරන සාමාන්‍ය දෑ බවට පත්ව තිබේ.



ශ්‍රී ලාංකේය සංස්කෘතිය තුළ හඳුනාගත හැකි සිරිත් විරිත්, සම්ප්‍රදායන් බොහොමයකි. ඒ අතරින් ගැහැනු දරුවකු ඉපිද මාස කිහිපයක් ගත වූ පසුව නැකැත් බලා කන් විද කරාබු යුගලක් පැලඳවීම සාමාන්‍ය සිංහලයාගේ සිරිත ය. එනමුත් වර්තමාන සමාජය තුළ මෙය විලාසිතාවක් බවට පත්ව ඇත. විශේෂයෙන්ම බොහෝ තරුණියන් කරාබු කිහිපයක් එක් කනක පැලඳ සිටීම සුලබව දැකිය හැකිය. අනෙක් අතට වර්තමාන සමාජය තුළ පිරිමි පාර්ශ්වය ද මේ කෙරෙහි විශේෂයෙන් නැඹුරුවීම දැකගත හැකි ය. විවිධ විලාසිතාවන්ගෙන් හැඩගැන්වුණු විවිධ ආකාරයේ වෛර්ණයෙන් සකස් වූ කරාබු යුගල පැලඳ සිටින ස්ත්‍රීන් සහ පුරුෂයන් අද සමාජය තුළ දැකිය හැකි වීම සාමාන්‍ය වූවකි. එනමුත් කන් විද කරාබු යුගලක් පලඳවන සැබෑම හේතු සාධක පිළිබඳ ඔබ දැනුවත් ද...? කන් විදීම චාරිත්‍රයක් ලෙස සංස්කෘතිය තුළ නිර්මාණය වූයේ ඇයි...? සිතා බලන්නට ඔබට ඉඩ හසර විවර ය.

'රක්ෂා භූෂණ නිමිත්තං - බාලාස්‍ය කර්ණෝ වීදාතේ' යනුවෙන් සුශ්‍රැතචාර්යතුමාණෝ සිය සංහිතාවේ සූත්‍රස්ථානයේ දහසය වන අධ්‍යායයේ ලා එහි ගුණ පණ පවසත්. ඒ අනුව ඉන් අර්ථවත් වන්නේ බාල ග්‍රහදොස් ආදියෙන් ආරක්ෂා වීමට ආභරණ පැලඳීම මෙන්ම ශරීර ශෝභාව අරමුණුකොට කන් විදීමට නිර්දේශ කළ බවයි. යම් යම් අපල උපද්‍රව, පිරිපත දුරුකර ගැනීම සඳහා විවිධ රත්න වර්ග සහ ආභරණ පැලඳීම ආයුර්වේදයේ ද අනුමත කර ඇත. ඒ අනුව කන් විද කරාබු යුගලක් පැලඳීම මුහුණට සහ කන්වලට අමුතු ඔපයක් මෙන්ම ග්‍රහ දෝෂ නිවාරණය ද අපේක්ෂා කරයි. කරාබු නැතිනම් අරුංගල් ආදී රන් ආභරණ කාන්තාවක් පලඳින්නේ කාන්තා මුහුණකට අවැසි ශෝභාව එක්කර ගැනීමටය. ඇය කරාබු යුගල ගැලවූ විට මුහුණ මැළවී යන බව අතීත ගැමියන් විශ්වාස කළේය. සාමාන්‍යයෙන් ගැහැනු දරුවෙකු ඉපිද මාස හයේ සිට අට දක්වා අතර කාලයේ දී කන් විදීම සුදුසු වන බව ගැමියන් අතර පවතින එක් මතයකි. එමෙන්ම ආචාර්ය වාග්භට සඳහන් කරන ආකාරයට ශීත සෘතුවේදී කන් විදිය යුතු බවත් සඳහන් වේ.

සාමාන්‍යයෙන් ගැහැනු දරුවකු ඉපදුණු පසු සිදුකරන කන් විදීමේ චාරිත්‍රය මහත් ගෞරව භක්තියෙන් යුක්තව සිදු කරනු ලබන්නකි. කන් විදින්නේ නැකතකට අනුව ය. මේ සඳහා සුභ මොහොතක් යොදා ගැනේ. සුබ මොහොතින් සිදු කරනු ලබන කන් විදීමේ දී ලේ නොගලයි. නොපැසවයි. තුවාලය ඉතා ඉක්මනින් සුවපත් වේ. එමෙන්ම පවතින සියලුම ග්‍රහ අපල උපද්‍රව දුරුවන බවත් ගැමියා විශ්වාස කරයි. කනෙහි විදිය යුත්තේ කුමන ස්ථානයේ ද යන්නත් මෙහිදී අවධානය යොමු කරනු ලබන සුවිශේෂී කරුණකි. කන්පෙත්තේ ස්වභාවයෙන්ම පිහිටි දෛව කෘත සිදුර මේ සඳහා යොදා ගනී. උපතින්ම පිහිටි මෙම සිදුර තුළ සිරා, ධමනි තරුණාස්ථි ආදී කිසිවක් නොමැති බැවින් එම ස්ථානය සොයා බලා සෘජුව විධි කල්හි කිසිදු ලේ ගැනීමක් හෝ වේදනාවක් ඇති නොවේ. දෛව කෘත සිදුර නොව කන් පෙත්තේ අන් තැනක් විදි විට ලේ ගැලීම, වේදනාව, ඉදිමීම, පැසවීම උණ ගැනීම ආදිය ඇතිවිය හැකිය. විශේෂයෙන්ම පුරාණ ගැමියා කන් විදීමේ චාරිත්‍රය සිදු කරනු ලබන්නේ දරුවා හොඳින් පිරිසුදු කොට නහවා සෙත් පිරිත් ගායනා කොට ජය මංගල ගාථා, අෂ්ටක ආදියෙන් ආශීර්වාද කොට සුබ මොහොතිනි. දෛව කෘත සිදුර ම විද ආභරණ පැලඳවීමෙන් කර්ණවේධන සංස්කාරය සම්පූර්ණ වේ. ඉන් ගැහැනු දරුවාට ශෝභාවත් ආරක්ෂාවත් යන කරුණු දෙකම සිද්ධ වන බව ගැමි විශ්වාසයයි.

එමෙන්ම කන් විදීමේ නැකත සකස් කර ගන්නේ ද විෂ කලාව නැති දිනයක ය. ඒ සඳහා නැකතට තෝරා ගන්නා වේලාව වන්නේ ඉර මුදුන් වීමට පෙර උදෑසන කාලය ය. රාත්‍රී කාලය මේ සඳහා යොදාගන්නේ නැත. කන් විදීමේ නැකත සකස් කරගත යුතු වන්නේ සඳුදා, බදාදා, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා යන දිනවල බවත් විශ්වාසයන් අතර පවතී. කන් විදීමේ නැකත සකස් කිරීමේදී චන්ද්‍ර බලය පිළිබඳව සැලකිලිමත් විය යුතු අතර තිර රාශියකින් තොරව චර හෝ උභය හෝ රාශියක් තුළ මෙම නැකත සකස් කළ යුතු බව විශේෂයෙන් සඳහන් කර ඇත. දුරුතු මාසය හා වෙසක් මාසය ද උපන් මාසය ද යොදා ගන්නා නැකතට සම්බන්ධ දිනයද හතර, නවය, දාහතර තිථියකට සම්බන්ධ නොවිය යුතුය. පුරපසට සම්බන්ධ දිනයක්ම යොදා ගැනීම මෙහිදී වඩාත් වැදගත් වන බවත් පොතපතෙහි සඳහන් වේ.

ඒ අනුව පැහැදිලි වන කරුණ නම් කන් විදීම යනු සාමාන්‍යයෙන් අපට අවැසි ඕනෑම ආකාරයට සිදු කරන්නක් නොවන බවයි. එය සංස්කෘතිය තුළ හඳුනාගත හැකි සුවිශේෂී චාරිත්‍රයකි. විශේෂයෙන්ම ගැහැනු දරුවකුගේ ශෝභා සම්පන්න බව මෙන්ම ආරක්ෂාව උදෙසා කන් විද කරාබු යුවළක් පැලඳීම සිදුකළ ද වර්තමාන සමාජය තුළ එය විලාසිතාවන් මැන බලන ප්‍රබල අවශ්‍යතාවයක් වී ඇත. සියලු අපල උවදුරු දුරු කිරීමේ අපේක්ෂාවෙන් සුදුසු ස්ථානය සොයාගෙන, සුදුසු නැකතට කන් විදීම සිරිත වුවද අද තරුණ තරුණියන් අවශ්‍ය ඕනෑම ආකාරයකට, කනෙහි ඕනෑම ස්ථානයක් විද කරාබුවක් පැලඳීම දැකගත හැකිය. විශේෂයෙන්ම තරුණයන් අතර ද මෙය වඩාත් ප්‍රචලිත විලාසිතාවකි. විවිධ මෝස්තර සහිත කරාබු විවිධ අයුරින් පැලඳීම පිරිමි පාර්ශ්වයේ ද අවශ්‍යතාවයක් වී තිබේ. අතීතයේ දී නැකතට සුබ මොහොතින් සිදු කළ බොහෝ දේ අද සාමාන්‍ය ජීවිතයේ එතරම් තැකීමක් නොකරන සාමාන්‍ය දෑ බවට පත්ව තිබේ. ලෝකය වෙනස් වන ගමනෙහි අපද වෙනස් විය යුතු ය. ඒ යහපත් අයුරිනි. කෙසේ වෙතත් අප යමක් නවීකරණය කොට භාවිත කරන්නේ නම් එහි අතීත කතාවව පිළිබඳ අවබෝධයෙන් යුතුව නවීකරණයට සමීප වීම වඩාත් වටින්නේ ය.

හංසනි දිල්හාරා
ජනසන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

# ගැහැනුන්ට මතක හිටින්නෙ පිරිමි පිරිමින්ට මතක හිටින්නේ ගැහැනු



මානව ප්‍රේමය දිග හැරෙන සමහැරෙන සමහර කතා ඉවර වෙන්නේ තත්පරයට ඒ කතාවලට ලොකු ඉතිහාසයක් නැති උනත් මතක හිටින කාලය ගොඩක් දිගයි. පිරිමි ගැහැනු කියන දෙපිරිසක් ඉන්න ලෝකයක අපිට කතාවලදී වැඩිපුරම මතක හිටින්නේ ගැහැනු. ගැහැනුන්ට මතක හිටින්නේ පිරිමි. මේ අතරේ අසාමාන්‍ය ආකාරයට මෙය වෙනස් වෙන්නත් පුළුවන්. මේකට විවිධ නම් යොදාගන්න පුළුවන්. මේ ඔක්කොම අතරේ ආදරයක් තියෙන්නත් පුළුවන්.

ඒකට තමයි මිනිස්සු නොදන්නවා වුණාට මානව ප්‍රේමය කියන්නේ. ඔය ප්‍රේමය එක එක අතට හරවගන්න සමහරුන්ට පුළුවන්. අම්මට තාත්තට කරන ආදරයයි ගුරුවරුන්ට, මාමට නැන්දට කරන ආදරයයි මිත්‍රයට කරන ආදරයයි එකිනෙකට වෙනස්. ඒවා තුළ රාගය නැහැ. ඉතින් ගැහැනු ළමයි පිරිමි ළමයින්ටත් එහෙම ආදර කතා ජීවිතයක් තුළ තියෙන්නෙ බැරිද? එහෙම සබඳතා ආදර කතන්දර වගේ ඉවර වෙන්නේ නෑ. ඉවර කරන්නත් බෑ. කොහේ ගියත් ඒ මතක එහෙමම තියෙනවා.

මේ අහස යට ඉඳලා වෙන අහසක ඉඳලා රාග විරාග ප්‍රේම කියලා ආදරේ කොටස් දෙකකට වෙන් කළාම මානව ප්‍රේමය වැටෙන්න විරාග ගොඩට. ඒක පවතින්නේ ඕනම දේ තමයි විරාගය. නමුත් ආදරේට අමාරුකම් නැහැ. කොහොම හරි පවතිනවා. රණ්ඩුවෙලා අඬලා දොඩලා හරි. හිතන්නකෝ ආදරණියම අයට ඇරෙන්න රණ්ඩු කරලා යාළුවෙන්න පුළුවන්ද? බැහැ. මානව ප්‍රේමය ඇරෙන්න කිසිම ප්‍රේමයක් පවතින්නේ නැත්තේ ඒ නිසාමයි. කවුරු කොහේ ගියත් බැන්නත් සමාව ගත්තත් ආදරය කියන එක අඩුවක් නොවෙන්න වගබලාගත යුතුයි.

කේ. ඒ. එච්. යශෝධා
කැලණිය විශ්වවිද්‍යාලය

# SUPER WOMAN කෙනෙක් වෙමු

ප්‍රතිශතයක් ලෙස ගත් විට ලෝක ජනගහනයෙන් 50.2% පමණ කාන්තාවන් වන අතර ලංකාවේ ජනගහනයෙන් හරි අඩකට වැඩි කොටසක් එනම් 52.3% ක් පමණ කාන්තාවන් ය. තත්ත්වය එසේ වුවත් විශේෂයෙන් ලංකාව ඇතුළු ආසියාතික කාන්තාව තම අයිතීන් දිනා ගැනීමට හඬ නැඟීම දන්නා කාලයක පටන්ම සිදුවන්නක් බව නොරහසකි. එහි වක්‍ර අදහස නම් කුටුම්බය තුළ කාන්තාව අසතුටෙන්, පීඩනයෙන් ජීවත් වෙන්නේ පුරුෂයින්ගේ බලපෑම නිසා බවය. ඒ අතර දිනකට දික්කසාද නඩු සිය ගණනක් දක්වා ඉහළ යෑමත් ඉන් 75%කට වඩා වැඩි ප්‍රමාණයක් කාන්තා පාර්ශ්වය විසින් ගොනුකර ඇති බැවින්, ලංකාවේ බහුතර කාන්තා පාර්ශ්වය " බිරිඳ " කියන රාමුව තුළ තෘප්තිමත් නැති බව නොරහසකි.

කාන්තා දිනය පෙරටු කරගනිමින් කාන්තාවන්ගේ මිල කළ නොහැකි සේවය ගැන නිතරම කතා කරන නිසා ඉන් ඔබ්බට ගොස් කාන්තාව සතු බුද්ධිය, හැකියාව සහ ජානමය හැකියාව තුළින් පුරුෂයින්, එසේ නොමැතිනම් සැමියන් තමා වෙත නතු කරවා ගෙන යුග දිවියේ සතුට සැනසීම ආරක්ෂා කර ගත හැකි වැදගත් කරුණු කිහිපයක් වෙතට අවධානය යොමු කිරීම කාලෝචිතව ඉතාමත් වැදගත්ය .

මනෝවිද්‍යාත්මකව බැලීමේදී පිරිමින් ගැහැනුන්ට වඩා උපතින්ම සන්සන්දනාත්මකය. තත්පර කිහිපයකින් එක බැල්මකින් ගැහැනියක් සම්පූර්ණයෙන්ම මනසට ගැනීමට ඔවුන්ට හැකියාවක් ඇත. කවර වූ කාන්තාවක් කෙරෙහි හෝ කුමක් හෝ ආකර්ෂණයක් ඇති වූ විගස විවාහකයෙකු නම් තම බිරිඳ හා ක්ෂණිකව ඔවුන් සන්සන්දනය කරයි. එම ආකර්ෂණය සිතුවිල්ලකින් එහාටත් පවතිනවාද නැද්ද යන්න ඉහත කී සන්සන්දනේදී බිරිඳ හෝ පෙම්වතිය ලබාගන්නා මනෝමය ලකුණුවල ප්‍රමාණය මත බොහෝ විට පදනම් වෙයි. වැඩේ ලේසි නැති නමුත් සිතන තරම් අමාරුද නැත. මෙම කාරණා ගැන වැඩි අවධානයක් යොමු කරන කාන්තාවට විවාහයක් හෝ සම්බන්ධයක් තුළ සැප සහ සතුට වැඩි වශයෙන් විඳින්නට ලැබෙන බව නම් අනිවාර්යය. එමෙන්ම මංගල සාරිය ගලවන විට සීනි බෝල පෙම්වතියගේ හැව ගලවා ඉවත් කරගන්න මතක තබා ගන්න. අද සිට පෙම්වතා සැමියා වන අතර ඔබ පෙම්වතියගේ තනතුරෙන් උසස් වීම් ලැබ බිරිඳ ලෙස වැඩ භාරගන්න අතර, එහිදී ඔබ multi skill විය යුතුමය.

ඒ අතර කිවයුතු වැදගත්ම කරුණක් වන්නේ අත්‍යවශ්‍ය වූවොත් මිසක විවාහයෙන් පසු රැකියාවෙන් ඉවත් වීමට නොසිතන්න. සැමියා සහ තම පවුලේ ආර්ථිකය වෙනුවෙන් සම සමව ආත්ම අභිමානයෙන් යුතුව ඔබත් වෙහෙසෙන්න. හැකිනම් වැඩිදුර අධ්‍යාපනය සඳහා ද යොමුවන්න. රැකියාව යනු මුදල් පමණක්ම නොවේ. මුදල්වලට අමතරව රැකියාවක් තුළින් ආත්ම අභිමානය, නව දැනුම හා ලෝකයට විවර වීමේ හැකියාව, සමාජ පිළිගැනීම, ලැබෙන අතර පවුලේ ආර්ථික ආරක්ෂාව සහ ශක්තිය වෙනුවෙන් ඔබගේ කැපවීම හිත ඇතුළෙන් ඔහුව සනසාවී. කිසියම් හේතුවක් මත රැකියාවක් කළ නොහැකි නම් පැළයක් වවමින් ඇඳුමක් මසමින් හෝ කෙසේ හෝ ස්වයං රැකියාවක හෝ නිරතවන්න. එසේත් නැත්නම් ගෙදරට කෑමට බීමට අවශ්‍ය එළවළු, පලතුරු ටිකවත් ගෙදර වවාගෙන සැමියාට ආර්ථිකමය වශයෙන් හයියක් වෙන්න උත්සහ කරන්න. ඔහු හදවතින්ම ඔබව අගය කරාවි.

තරුණියකට වඩාත් ඔබින්නේ වැදගත් ලෙස තම ජීවිතය ගෙනයාමයි. වැදගත්කම යනු ඔසරියක් ඇඳගෙන මාලයක් දාගෙන සිටීම නොව කොතරම් සමාජය හා මුසුවී කටයුතු කළද තමාගේ ආත්ම ගෞරවය මෙන්ම සැමියාගේ ගෞරවය සුරැකීමයි.

අනේ මන් උයන්න දන්නේ නැහැ, අනේ මට බෑ නොකියා යූටියුබ් එකෙන් බලල හරි හොඳ කුක් කෙනෙක් වෙන්න. ගෙදර කුස්සිය යනු ඔබගේ ලකුණු සීග්‍රයෙන් අඩු වැඩි කරගත හැකි ස්ථානයක් වන අතර හුරතල් නොවී රසවත් කෑම බීම පිසීමට උනන්දු වන්න. උදව්වට කෙනෙක් ඉන්න විටක වුවද ඔහු වෙනුවෙන් ඔබම කෑම පිසීම තුළ පවුල් ජීවිතවල බොහෝ ප්‍රතිශතාත්මක සාර්ථකත්වයක් රැඳා පවතින අතර එවිට නිතරම ඔහු එළියෙන් නොකා ගෙදරින්ම ඔබගේ කෑම කන්න ඉක්මනින් ගෙදර පැමිණේවි.

තරුණියකට වඩාත් ඔබින්නේ වැදගත් ලෙස තම ජීවිතය ගෙනයාමයි. වැදගත්කම යනු ඔසරියක් ඇඳගෙන මාලයක් දාගෙන සිටීම නොව කොතරම් සමාජය හා මුසුවී කටයුතු කළද තමාගේ ආත්ම ගෞරවය මෙන්ම සැමියාගේ ගෞරවය සුරැකීමයි.

මිතුරන් ඉදිරියේ කොන්ද කෙළින් තබා සිටගැනීමට බිරිඳගේ චරිතය සහ හැසිරීම ඉවහල් වෙයි. විවාහක බිරිඳකගේ වැදගත්කම චරිතය තුළින් පිලිබිඹු වෙයි.

## හොඳම මිතුරා වන්න.

ප්‍රයෝගික සත්‍ය නම් විවාහයෙන් පසු ඔබේ මිතුරු අසුරටද සීමාවක් තිබිය යුතුය. ඔහු තනියම එළියට යනවාට ඔබ විරුද්ධ නම් ඔබ තනියම එළියට යාම නවත්වන්න. ඔබට ඔහු අවශ්‍ය බව අඟවන්න. ඔබ මිතුරන් සීමා කර ඔහු වෙනුවෙන් කැපවන ප්‍රමාණය ඔහු මිතුරන් සීමා කර ඔබ වෙනුවෙන් කැපවන ප්‍රමාණය මත තීරණය වේ.

සියලු බිල් ගෙවීම්, අනාගත යෝජනා, ඉතුරු කිරීම, මාසික වියදම්, හිතට කොතරම් බරක් වුවද මේ සියල්ලට සමව දායක වන්න. අනේ මට මෙච්චරක් ඕනේ කියමින් මුදල් ඉල්ලමින් ඇඟ බේරා ගන්නවා වෙනුවට ප්‍රයෝගික ලෙස දෛනික ජීවිතය සහ ආදායම යෙදවීමට ඔබ මැදිහත් වන්න. එවිට සියලු ආදායම සහ වියදම විනිවිද බැවින්, වරදට පෙලඹීමක් සහ අනවශ්‍ය වියදම් දැරීමක් ඔහු තුළ නොවේවි.

## අනාගතය ගොඩනඟන්න සක්‍රියව දායක වෙන්න

ඉන්නම් වාලේ ඔහේ නොඉඳ ඔහු හා එකතුව අදට වඩා සොඳුරු හෙට දවසක් සඳහා යෝජනා ඉදිරිපත් කරන්න. ඒ සඳහා කැපවන්න. ඒ බලාපොරොත්තු සඳහා ඔබත් යම් කාර්යභාරයක් ඉටු කරන්න. උදා - ඔහු ව්‍යාපාරයක් පටන් ගැනීමට අදහස් කරයි නම් ඔබ ගිණුම්කරණ පාඨමාලාවක් හදාරන්න. එවිට ඔබගේ අගය වැඩිවේවි.

එමෙන්ම පවුල් ජීවිතය තුළ වැදගත්ම කරුණක් වන්නේ ආදරය සහ රාගයයි.

වැඩිම ලකුණු සහිත වැදගත්ම කාරණාව මෙයයි. බොහෝ පිරිසකට අනුව බැන්දට පස්සේ එයා වෙනස් වෙලා අප්පා, ඉස්සර වගේ ආදරේ නෑ .

චෝදනා රැසකි. හැබැයි කාන්තා අපි පවා බැන්දට පස්සේ වෙනස් වූ බව අපට අමතකය.

ගැහැනු අපි මෙන්ම ඔවුන්ද ආදරයට අතිශය ලෝබය. එයා ඉස්සර වගේ ආදරේ නෑ කියමින් නොඉඳ ඉස්සරටත් වඩා ඔබ ඔහුට ආදරය කරන්න. ඉස්සර වගේම සලකන්න. ඉස්සර පෙරුම් පුරමින් මුණගැහුණු විට දැනුණු ආදරය තරමක් දුරට නිතර දැකීම නිසාවෙන් අඩු විය හැකි නමුත් ආදරය දිනෙන් දිනම වැඩි කර අලුත් කර ගත හැකිය.

ඔබේ කාර්යබහුල බවට ආදරය මැදට පැනීමට කිසිවිටකත් ඉඩ නොතබන්න. පිරිමින් යනු ආදරය දීමට වඩා ලබන්නට කැමති පිරිසකි. ඒ නිසා ඔබට ඔහුගේ ආදරය දිනෙන් දින වැඩි කරගැනීමට ඇති එකම ක්‍රමය නම් ඔබ ඉස්සරටත් වඩා ඔහුට ආදරය ලබා දීමය. ඉතා ඉක්මනින් ඒ සඳහා ප්‍රතිචාර ලැබේවි.


රාගය - ඇඹුල් රස, පැණි රස, තිත්ත රස, කහට රස, හෝ එකිනෙකට ආවේණික වූ වෙනස් රසයන් ගැහැනුන් තුළ ගැබ්වී ඇතත් රාගය නමැති කාරණයේදී ඔවුන් සොයන්නේ සියලු රස එක් වූ fruit salad ය. එවිට පිට කෑම ට යොමුවී ලෙඩ වීමට ඔහු නොසිතයි.

සොඳුරු සියුමැලි, හුරතල් පෙම්වතියක් පතන පෙම්වතුන් සැමියන් වූ පසු, දැනුමෙන් බුද්ධියෙන් පෙනුමෙන් මෙන්ම ආර්ථිකයෙන්ද තමාට හයියක් වන යකඩ ගැහැනියක් සොයයි. විවාහයෙන් පසු තාමත් ඔබ රඟන්නේ පෙම්වතියගේ චරිතය නම් සමහරවිට ඔහු තාවකාලික හෝ ස්ථිර replacement වලට යා හැක. මන්ද ගැහැනුන් මෙන් දුක් විඳීමට සහ ඉවසා දරාගැනීමට පිරිමින් උපතින්ම අකමැති නිසාය. මවකගේ දයාව කරුණාව ළඟ හුරතල් වන පිරිමි ආත්ම ලෙහෙසියෙන්ම දවා නිවා ගත හැක්කේ මාතෘ බිරිඳකට හෝ මාතෘ පෙම්වතියකට පමණකි. ඉති තරමටම අස්වැන්න නෙළා ගැනීමට හැකි වනවා සේම, ගැහැනියකගේ කැපවීමේ පරිමාව තුළ ඇයගේ සතුටේ පරිමාණය තීරණය වෙයි.

අනේ මල කෝලම්... කසාද බැඳලා මෙච්චර දුක් විඳින්නේ මොකටද? මෙච්චර දේවල්, කැපකිරීම් කරන්නේ මොකටද? කියලා. මෙන්න මේ කරුණු කියවලා බැලුව විට පස්සේ හිතෙයි දෙන දේ කාල වෙන දේ බලන බිරිඳක් ලෙස ඔහේ සිටිනවාද, ශරීර ශක්තියෙන් කෙසේ වෙතත් මොහොතක් ගෙදර නැති වුණත් ගෙදරම පාළු වෙලා යන ආකාරයේ සකලවිද දස්කම් ඇති super women කෙනෙක් වෙනවාද කියා ඔබට තීරණ කළ හැක.

රුධිරය කිරි කරන්නට තරම් සමත් ලොව සංවේදීම නිර්මාණය වන ගැහැනියට කළ නොහැකි යමක් මිහිමත තිබිය නොහැක. අවශ්‍ය වන්නේ ධනාත්මක සහ ප්‍රමාණාත්මක කැපවීම පමණකි .

එවිට, එක දිනයක් නොව මුළු දිවියම සතුටෙන් සැනසීමෙන් ගෙවා දැමීමට කාන්තාවට හැකි වනු ඇත.



සොඳුරු සියුමැලි, හුරතල් පෙම්වතියක් පතන පෙම්වතුන් සැමියන් වූ පසු, දැනුමෙන් බුද්ධියෙන් පෙනුමෙන් මෙන්ම ආර්ථිකයෙන්ද තමාට හයියක් වන යකඩ ගැහැනියක් සොයයි. විවාහයෙන් පසු තාමත් ඔබ රඟන්නේ පෙම්වතියගේ චරිතය නම් සමහරවිට ඔහු තාවකාලික හෝ ස්ථිර replacement වලට යා හැක.

**අනිශා ජයකොඩි**



# අලුත් දෑ තනන තරුණිය

## මදිරා ගෝවින්දි



මේ උපකරණය මඟින් අප තෙල් යොදාගෙන බැද ගන්නා ලද ආහාරයක අභ්‍යන්තරයේ මෙන් ම පිටත ද පවතින තෙල් ද ඉතා හොඳින් වෙන් කර ගෙන නැවත භාවිතයට ද ගැනීමට ද හැකියාවක් පවතී.

**බොහෝ පාසල්වල ළමයින්ගේ නව නිෂ්පාදන කරළියට ගෙන ඒමට විදුහල්පතිවරු, ගුරුවරු මෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ බලධාරීහු වර්තමානයේ මනා කැපවීමක් දක්වති. අතීතයට වඩා ළමයින්ට තාක්ෂණයේ දියුණුවත් සමඟ නව නිෂ්පාදන සිදු කිරීමට හොඳ ඉඩකඩක් නිර්මාණය වී තිබේ.**

මේ කියන්නට යන්නේ අප සමාජයේ කිසිදු කෙනකුගේ අවධානයට යොමු නොවූ ක්ෂේත්‍රයක් පිළිබඳ පාසල් ශිෂ්‍යාවකගේ දැනුමින් සැකසුණු උපකරණයක් ගැනය.

ඇත්තෙන්ම කෙනකුට මේ උපකරණය ගැන කියූ සැණින් වැඩි අවධානයකට නොගෙනම බැහැර කර හරින්නට ද පුළුවන. එහෙත් එහි ඇති සැබෑ ප්‍රයෝජනය අප මතුපිටින් බැලූ කල කෙනකුට නොවැටහුණ ද ඉන් මානව වර්ගයාගේ, සත්වයන්ගේ හා පරිසර පද්ධතීන්ගේ ආරක්ෂාවට සැලසෙන ප්‍රයෝජන අති මහත්ය.

පාසල් සිසුන් මෙන්ම ශිෂ්‍යාවන් ද මේ නව නිෂ්පාදන කෙරෙහි අද වන විට විශේෂ දක්ෂතා දැක්වීමට සමත් වී ඇත. ශිෂ්‍යාවකට යම් නව නිෂ්පාදනයක් කිරීමේදී සිසුන් මෙන් විවිධ උපකරණ සමඟ ගැටීමේ හැකියාවන් අවම වුවද වර්තමානයේ එය වෙනස් කර ඇත. අද දිනමිණ ද්වාර අතිරේකය මඟින් ඔබ වෙත කියන්නට යන්නේ එවන් ශිෂ්‍යාවක් නිපදවූ නව නිෂ්පාදනයක තොරතුරුය.

මේ Oil Saving bank නිෂ්පාදනය කිරීමට සමත් වන්නේ ඩී. ඒ. මදිරා ගෝවින්දි දුනුආරච්චි ශිෂ්‍යාවයි. ඇය ගම්පහ යසෝදරා දේවි බාලිකා විද්‍යාලයේ මෙවර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටිනා ශිෂ්‍යාවකි. ඇය විසින් නිෂ්පාදනය කළ නව නිපැයුම මඟින් නිවෙසේ මෙන්ම මහා පරිමාණ පොල් තෙල් යොදා කරනා බදින ආහාරවලින් බැහැර වන තෙල් නැවත භාවිතයට ගැනීමට හැකියාවක් පවතී.

අප සමාජයේ බොහෝ පිරිස් බෝ වන රෝගවලට වඩා වැඩි වශයෙන් බෝ නොවන රෝගවලට ගොදුරු වී තිබේ. හෘද රෝග, ස්ථුලතාව, දියවැඩියාව, කොලෙස්ට්‍රෝල් මට්ටම ඉහළ යෑම මෙන්ම පාසල් දරුවන්ගේ පවා BMI මට්ටම ඉහළ අගයක් පැවතීම අද අපට නිතරම ඇසීමට ලැබෙනා ලෙඩ රෝගය. මේ සඳහා අප ආහාරයට ගන්නා තෙල් ද බෙහෙවින් බලපාන අතර තෙල්වලින් අවම ආහාර පරිභෝජනය මින් ගැලවී සිටීමට මනා පිටිවහලකි. මේ උපකරණය මඟින් අප තෙල් යොදාගෙන බැද ගන්නා ලද ආහාරයක පවතින පිටත මෙන්ම අභ්‍යන්තරයේ තෙල් ද ඉතා හොඳින් වෙන් කරගෙන නැවත භාවිතයට ගැනීමට ද හැකියාවක් පවතී.



මෙලෙස ඉවත් කර ගන්නා තෙල් මඟින් ලිප තබන බඳුන්වල දැලි කුණු ඉවත් කිරීමට සබන් නිෂ්පාදනයට යොදා ගැනීම, පොල්තෙල් පහන් දැල්විය හැකි ප්‍රතිතෙල් නිෂ්පාදනය කිරීමට මෙන්ම සත්ව ආහාර නිෂ්පාදනයට ද යොදා ගැනීමේ හැකියාව පවතින බවට සොයා බැලීම් සිදු කර තිබේ.

සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටිනා ශිෂ්‍යාවක් අතින් මෙවැනි කිසි කෙනකුගේ අවධානයක් යොමු නොවනා ක්ෂේත්‍රයක් පිළිබඳ අවධානය යොමු කරමින් නව නිපැයුමක් සිදු කර තිබීම ඇගේ පාසලට මෙන්ම ගමට, නගරයට මෙන් සමස්ත ශ්‍රී ලංකාවටම ආඩම්බරයට කරුණකි. මෙය තව තවත් වැඩිදියුණු කර තෙල් ආශ්‍රිත නිෂ්පාදන සිදු කරන ආයතනවලට හඳුන්වා දීමට හැකි නම් මිනිසුන්ගේ ජීවිත ද ආරක්ෂා වෙනු ඇත. ඇය විසින් තවත් නිෂ්පාදන කිහිපයක් මේ වන විටත් අත්හදා බලමින් පවතින අතර විද්‍යුත් ස්වයංක්‍රිය බිත්තර තම්බන මැෂිම ද විශේෂත්වයක් ගනී. ඉන් ආපනශාලාවල එකවර විශාල ප්‍රමාණයක් බිත්තර තම්බා ගැනීමට හැකියාව පවතී. මෙමඟින් ස්වයංක්‍රියවම බිත්තරය තැම්බීමක් වන අතර අවසානයේ විදුලිය ක්‍රියා විරහිත වීමක් ද සිදු වේ.



මදිරා ගෝවින්දි දුනුආරච්චි අතින් නිමැවුණු කොවිඩ් - හැට් එකක් හා ලයිටරයක් ද පසුගිය කාලයේ තරගවලට ඉදිරිපත් කළ අතර ඉන් පදක්කමක් ද හිමි වී ඇත. මෙවැනි දක්ෂතා ඇති ශිෂ්‍යාවන් හට ඔවුන්ගේ නව නිෂ්පාදන සිදු කිරීමට දායකත්වයක් දක්වන්නේ නම් අප රට තුළ සිටිනා දක්ෂ සිසු සිසුවියන්ගෙන් රටට වැඩදායී නිෂ්පාදන තව තවත් බිහිවනු ඇත.

**ගයාන් සංජය**

## ඉස්කෝලේ ආදරය

රෙජිස්ට්‍රාර් වුණේ කවුද
දන්නේ නෑ අපි තවම
ලියවුණේ කෙළවරම
මේසෙ අපෙ නම් දෙකම
ලොකු සර් වෙලා මම
ආවෙ ඊයේ හවස
ගතවෙලා හරියටම
වසර තිස් හතරක්ම
ගියා මම වටයක්ම
"පරණ නෑ එකක්වත්
ඔක්කොම අලුත් මේස"
මතක්වුණා එකවරම
බැන්දෙ නැහැ අපි තවම......

**චතුර කවින්ද්‍ර**

## දේදුන්න

පොළෝ තලයෙන් උරා කවිකම්
අහස් තලයේ ගොතා පද වැල්
තැනූ මොළ කැටි වලා පැදි පෙළ
හඬන විට දී නැතිව තනුවක්
ඈත ක්ෂිතිජයේ පාට පාටින්
කෙටුණු එය නම්,
සොඳුරුතම ගීයක්..

**ඉමල්ක විජේසේකර**

## මංගල යෝජනා

නගරයේ සුප්‍රසිද්ධ ව්‍යාපාරික,
තැබෑරුම්හල් තුනක හිමිකරු,
සොයයි තම එකම දියණියට
මතින් තොර උගත් මනාළයෙක්

**නේත්‍රා දිව්‍යානි**

## රෝස රොබරෝසි

සරසවා ගසක්
පාමුල වැටී
මියෙන්නට
මොහොතකට
පෙරත්
හිනැහෙන

**තුෂාරී ජයසිංහ**

## කොවිෂීල්ඩ්...

කොරෝනා මර බිය පරදවනට
ලක් වැසි අපටත් සැනසුම දෙමින්
කොවිෂීල්ඩ් නමින්
මිතුරෙකු ඇවිදින්
පසළොස්වක පෝදා ගියෙමි මමත්
රෝහලට හමුවන්නට කොවිෂීල්ඩ්
මිතුරු...

වමතේ ඉහළ කොටස කඩියෙකු කන කලට
මෙන් දැනුණි පොඩි රිදුමක්
හඬන්නටවත් කෑගසන්ටවත්
අමතකව මොහොතක්
මුව ගොළු වුණා මගේ...

ඇඟ රිදුම සමඟ විටෙන් විට
උණ ගන්නා කලට කොවිෂීල්ඩ්
සතුරෙකු විලස දැනුණි මටත්
එක දවසක වේදනා නිමා කර
ගතට දැනෙයි සැනසුම් සුව දැන්නම්....

වසරක කාලයක් නිවසටම කොටු වී
ගත කළ සිරගත ජීවිතය නිමාකර
සුබ සිහින දකිනට මතු දවසක් එනු ඇත
ළඟ ළඟම අපටත්....

කොවුලනේ  දැන් රස මිහිරි ගීත කියාපන්
මී අඹ ගස් පලබරව හිනැහීයන්
ළඟ එන බක්මහ මඟුලට
කඳමලු බැඳගෙන නෑගම් යන්නට
මාල ගිරවුනේ  ඉතින් හනි හනිකට සැරසීයන්....

**සශිකා නිරෝෂි මහලියනගේ**

## විසුළ රතු ලෙයට ණයගැතියි පොරණේ !

මිණි මුතු සරු පසට හවබෝගෙට ලොබ    බැඳිමින්
හිණි පෙත්තෙන් ධනය ගෙනයෑමට මෙහි    ලඟිමින්
ගිනි දැල් අවුළුවා ලක පොරණේ එඩි    බිඳිමින්
දුනි පවරා උඩරටින් ගිවිසුම මත    ලියමින්

වින කටිමින් සිහළ දන සමඟිය සිඳ    දැමුවා
ධන වස්තුව කොල්ල කා පෙරළා දඩ    ගැසුවා
රණ බලයන් හානි කර සුරුවන් ලෙය    නැසුවා
පණ වැනි වූ ජාති කුල ආගම් පිල්    බෙදුවා

පණ අදින රටෙහි දන දැක සඟ රුවන    එඩිලා
රණ හඬින් කෙරුණු අණ "නැගිටිව් සිහළ    නුඹලා"
රනකුරින් ලියුව වදනකි ඉතිහාසෙ    පෙරළා
ගන රුහිරු උඩින් ඇඳි'යුරු හදින්    පුදලා

පන්දම් ගෙන රැකවල් දරාන සවිය    තැබුවෝ
අංගම් පොර සටනින් විකුමන් පෑව    විරුවෝ
ඉරණම් අත් අතරින් පර ගෙල සිඳී    දැමුවෝ
පල්ලම් බැස යන්නම සුද්දගෙ තෙදය    දිරුවෝ

දන්තුරේ මුල්ලේරියා බලන යන    සටනෙත්
රන්දෙණිවල වෙල්ලස්සෙ විරුවන් එක    ලෙයකුත්
ගන්නොරුව මාතලේ පෙන්වූ බාහු    බලයත්
රැන්දුවෙ ලක් මෑණියන් හිසේ මිණි    කිරුළුත්

විරුවන් එකම ලෙස ලෙයකට ගුණදම්    පෙන්නා
වියතුන් පවා ලක සටනට අත්වැල    දුන්නා
දරුවන් කරා සුරු නිදහස් දද    කරපින්නා
අඳුරින් එළිය දැක සුද්දා මර බිය    ගන්නා

රනින් ඔපලූ මුතුහරක් වැනිය සැම    ජනයන්
රතෙන් රුහිරුත් එකමුතුව සැදී එහි    හරයන්
දැහැන් ගත වී දම්වැලක් ලෙසින් එක    සගයන්
පිනෙන් ඉපදුණු ලක රකිමු නොවී පර    ගැතියන් !

උතුළ නිදහසට හැත්තෑ තුන් වසක්    පිරුණේ
මතුල සිහිනයට සීහෙළ දද අහස    ලෙළුණේ
විසුළ රතු ලෙයට කාහල නද නිතොර    පිදුණේ
පතුල හදවතින් විරුන්ට ණය ගැතියි    පොරණේ !

**මිහිරි පැතුමන්ති**
**ගම්පහ**

**ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට යොමු කරන්න**
**'යොවුන් ජනතා', දිනමිණ**
**අංක 35, ලේක්හවුස්, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.**
younjanatha@lakehouse.lk



## අවර ඉර

මඩින් හැඩි වුණ සොඳුරු මල් දම් දවයි ගිනි අව්වේ හෙළා
ඈතත් කිසිවෙකු කඳුළු බිඳුවක් දුන්නෙ නෑ පොළොවට සදා
තව තවත් මේ ඉරට පහළින් මල් පිපෙනකල් මග බලා
ඉන්න හින්දම ඉරත් හවහට කලින් පිටමං වී ගියා

**පියුමි මදුභාෂිණී**

## අමාවක

මම රාත්‍රියට සවන් දෙමි...

ඔබේ හඬ
හමුවෙයි කියා
සිතිවිල්ලෙන්

ඈත එක් තරුවක්
මා සමඟ
අවදියෙන්

සඳ එයි කියා
හැඟීමෙන්

**අයූ ප්‍රනාන්දු**

## ගම හැර යනවා මා තනි වෙනවා

මා අවදිව සිටිනා රෑ තුන් යාමේ
අපගේ මතකය පිළිරුව් දෙනවා
ඒ මතකයෙ ඔබගේ පැත්තෙන්
මා ඇවිළෙනවා මා ඇවිළෙනවා

ප්‍රේමාලිංගන මුවමඬලින්
ඔබ කුසුමක් වී පිපුනා
ඒ පෙතිවල සුවඳින් අද දින
මා මත්වෙනවා මා මත් වෙනවා

සුසුදු සුමුදු ඔබෙ ළය පෙතිවල
මම, නිල් දිය මැණිකක්  වූවා
ඒ සුකොමල පියුමම හෙට දා
ගම හැර යනවා මා තනි වෙනවා

**ධනංජය බණ්ඩාර**



# මාමලා නැන්දලා වන නැන්දලා අක්කලා වන social media

සමාජ මාධ්‍ය භාවිතය යනු අද වන විට සාමාන්‍යකරණය වූවකි. ළමා, තරුණ පිරිස මෙන්ම වැඩිහිටියන් ද සමාජ මාධ්‍ය පරිශීලකයන්ය . සමාජ මාධ්‍ය භාවිත නොකරන තරුණ පරපුරේ පුරුකක් අවාරේ හමුවිය හැක . එහෙත් එය අහම්බයකි. ඒ තරමටම අප සියලුදෙනාම සමාජ මාධ්‍යයන් හි ප්‍රබල පරිශීලකයන් බවට පත් වී ඇත. බහුතර වැඩහිටි ප්‍රජාව තුළ සමාජ මාධ්‍ය පිළිබඳ අසුබවාදී අදහස් සමූහයක් යුතු වුව ද ඒවා බොහෝමයක් තරුණ තරුණියන්ගේ ආරක්ෂා උදෙසාම වන බව ප්‍රත්‍යක්ෂ වන්නට කරුණු කාරණා ද බොහොමයකි.

සයිබර් අපරාධ පිළිබඳ වැඩිමනක් දෙනා කතා බහ කරයි. ඒ සයිබර් අපරාධ නිසාවෙන් කායිකව මෙන්ම මානසිකව පීඩාවට පත්වූවන් ද බොහෝමයකි. සිය ජීවිතයට සියතින්ම තිත තැබූවන් ද වෙයි. රැයේ වැටුණු වළේ දවාලේ වැටෙන්නවුන් ගැන සමාජය ක්‍රියා කරන්නේ ද විෂමාකාරී ලෙසය. ඒ මන්දයත්, සමාජය ද ඒ ආකාරයෙන්ම අවුල් වියවුල්ව සිටීම නිසාමය.



සයිබර් අවකාශයේ සිදුවන, එකී මෙකී නොකී සියලු ධන හා ඍණ තත්ත්වයන් පිළිබඳ සිදුවන බහුතර කතාබස් බොහෝය. ඒවා අතර වැළලෙන්නට යන ගැටලු රාශියක් ද ඇත. එවැනි වූ මතුපිටට නොපැමිණි අභ්‍යන්තර ගැටලු ගණනාවක් අතර එක් ගැටලුවක් වූ .....

'සමාජ මාධ්‍ය තුළින් අනිසි බලපෑම් එල්ල කිරීම' දැක්විය හැක. මෙය කාන්තා පාර්ශ්වයට වැඩි වශයෙන් ද, පිරිමි පාර්ශ්වයට සුළු බලපෑම් එල්ල කරයි.

ඒ අතර වැඩියෙන් ම අවධානය යොමුවන්නේ කාන්තාවන්ටය. ඒ මන්දයත්, ඒ තරමටම ඔවුන් විවිධ බලපෑම්වලට ලක්වන නිසාය.

ව්‍යාජත්වය තුළින් තම අනන්‍යතාවය සඟවා කටයුතු කරන පුද්ගලයන් එමටය. ඔවුන් විටෙක නළුවෙකු නිළියක ලෙස ද, විටෙක තම වයස් සීමාව බාල කරමින් ද, නැතිනම් සමීපතමයකු ලෙස ද ක්‍රියා කරයි. මෙවැනි මවාපෑම්වලට වැඩි වශයෙන් ගොදුරුවන තරුණියන්ගේ ශෝචනීය තත්ත්වය පිළිබඳ කතා කරන්නට කවරෙකුවත් ඉදිරිපත් නොවේ.

පිරිමි පාර්ශ්වය මෙන්ම කාන්තා පාර්ශ්වය ද, තමන්ට වඩා වයසින් බොහෝ ළාබාල වූවන්ට අනිසි පණිවිඩ යැවීම, නොහොබිනා ලෙස දුරකථන සංවාද සඳහා පෙලඹීම ද සිදු කරයි. පවුල් සංස්ථාව බිඳවැටීම හෝ තම පෙම්වතිය / පෙම්වතා හැර යාමේ හිඩැස තවත් අහිංසකයකුගෙන් පියවා ගැනීමට දරන වෑයම යුතු නොවේ. එක් දිනක් කතා කළ පමණින්, තරුණියක් හා හාද වූවා සේ, කෑව ද බිව්ව ද, ආදී ලෙස ආමන්ත්‍රණය කිරීම සිනාවට කරුණකි. ඇත්තෙන්ම සිතා බැලුවහොත් ඔවුන් කාලය කා දමන මුග්ධයන්ය. තම වැඩ කටයුතුවලට අවධානය නොදී අනවශ්‍ය ක්‍රියා කිරීමට වඩා පලක් ඇති යමකට පෙලඹීම කළ යුතුමය. එවිට බොහෝ දෙනා පීඩාකාරි මානසික තත්ත්වයන්ගෙන් මිදෙනු ඇත.

තම අදහස් බෙදා නොගන්නා තරුණ තරුණියන් බොහෝ දෙනා මෙලෙස පීඩා විඳිනවා ඇති. නමුත් අපගේ ද යුතුකම වන්නේ ඔවුන් පිළිබඳවත් හැකි ලෙස අවධානය යොමු කිරීමය.

ඒ අතරේම, සමාජ මාධ්‍ය පරිහරණයේදී ඇණියක් නැතිනම් කරදරකාරී ලෙස හැසිරෙන පුද්ගලයන්ට විරුද්ධ වීමට මැළි නොවන්න. මාමලා අයියලා වන්නට ද නැන්දලා, අක්කලා වන්නට උත්සහ කරද්දී සැලකිලිමත් වන්න. බිය නොවන්න. පවසන්නට ඇති දේ පැවසීමට බිය නොවන්න. මරණය තෙක් මිනිසාගේ සිතුවිලි හඳුනා ගන්නට අපහසු යන සත්‍යතාවයේ පිහිටා කල්පනාකාරී වන්න. පෞද්ගලිකත්ව ආරක්ෂා කරගන්න. තමන් ආරක්ෂා වන අතරේ නොමඟ යන මිතුරා මිතුරියට ද අතහිත දෙන්න. බැටළු වෙස් ගත් හිවලුන්ගේ රංගනයේ ගොදුරක් නොවන්න. විශ්වාස යන වීදුරුව තනන්නට පෙර දෙවරක් සිතන්න. ඕනෑ තරම් සිදුවීම් ඇස්වලට පෙනි පෙනිත් ඒ වළටම නොවැටෙන්න.

සමාජ මාධ්‍ය භාවිතයට මෙහෙව් කියා සම්මත කරගත් ආචාර ධර්ම නැතත්, අපම අපව හික්මවා ගනිමු. ලාමක බවින් තොරව පරිණත වූවෙකු ලෙස සමාජ මාධ්‍ය භාවිතයේ යෙදෙමු.

යතුර තමා සතු වුවත්
අන්ධකාරයේ සැරිසරමින්
දොර ඇර බලන්නට පෙර
දෙවරක් නොව දහස් වරක්
සිතා බලනු මැන......

දෙව්නි පෙරේරා



# Busy වෙලා ජීවිතේ මඟ හැර ගන්න එපා

ගොඩක් අයට තියෙන ප්‍රශ්නයක් තමයි නිතරම Busy වෙන එක. තියෙන වැඩ කන්දරාවත් එක්ක හුස්මක්වත් ගන්න වෙලාවක් නෑ කියලා බොහෝ දෙනෙක් කියනවා. තවත් අයට දවසේ පැය විසිහතරත් මදිවෙන තරමට වැඩ. Busy වෙද්දී දවසේ පැය විසිහතරට අමතරව තව පැය තුන හතරක් වැඩිපුර තිබුණ නම් කියලා හිතන වාර අනන්තයි. මේ විදියට වැඩවලට හිරවෙලා ඉන්න වුණාම ගොඩක් අයට නාන්න, කන්නවත් වෙලාවක් නෑ. ඔෆිස් යන කෙනෙක් නම් උදේ පාන්දර ගෙදරින් පිටත් වුණාම ආයේ නිවසට එන්නේ රෑ හයට හතට. ඒ ඇවිත් ඉතුරු වැඩ ටික කරලා නින්දට යන්නේ ආයෙමත් පහුවදා උදේ වැඩට යන්න බලාපොරොත්තුවෙන්. ජීවිතේ කියන්නේ අරගලයක් තමයි. ඒත් ඒ අරගලේ ඇතුළේ අපේ ජීවිත මඟ හැරගන්න හොඳ නෑ. බොහෝ දෙනෙක්ට තියෙන්නේ මේ වගේ ඒකාකාරී ජීවන රටාවන්. Busy වුණාම ඔබට ඔබව මඟ හැරෙනවා. ඔබේ පවුලේ අයව මඟ හැරෙනවා. තමන්ට ජීවිතේ විඳින්න තියෙන අවස්ථා අහිමි වෙනවා. ඒ නිසාම ගොඩක් අය ඉන්නේ පීඩනයකින්. තමන්ට කරන්න තියෙන වැඩ කන්දරාව දරාගන්න බැරි වුණා ම ඔවුන්ගේ ආතතිය වැඩි වෙනවා. හැසිරීම පවා වෙනස් වෙනවා. වැඩිපුර කේන්ති යෑම, අන් අයව නුරුස්සන ගතිය, කලබලකාරී බව නිරායාසයෙන් ම මිනිසුන්ගේ ජීවිතවලට එකතු වෙනවා. කෙටියෙන් ම කිව්වොත් තමන්ගේ පාලනයෙන් තමන්ව ගිලිහී යනවා. ඇත්තටම මේකට විසඳුමක් නැද්ද?

ඔව් Busy වෙන එක මඟ හැරගන්න විසඳුමක් තියෙනවා. ඒ තමයි වෙලාව කළමනාකරණය කරගෙන වැඩ කිරීම. ගොඩක් අය Busy වෙන්න එක හේතුවක් තමයි වෙලාව කළමනාකරණය නොකරන එක. හිතුන හිතුන වෙලාවට වැඩ කරන්න ගියාම එක වැඩක්වත් හරියට කරගන්න වෙන්නේ නෑ. දවස ගත කරන්නේ කොහොම ද කියලා ඔබට Plan එකක් නැත්නම් ඔබ Busy වෙන එක අරුමයක් නෙවෙයි. දවසට තියෙන්නේ පැය විසිහතරයි. ඒ පැය ගණන හරියට Target කරගත්ත ම ඔබ වැඩවලට හිර වෙන්නේ නෑ. ඔබට කරන්න තියෙන කාර්යයන් වර්ග කරගන්න. අත්‍යාවශ්‍ය වැදගත්, අත්‍යාවශ්‍ය වැදගත් නොවන යනාදී ආකාරයෙන් ප්‍රමුඛතාව අනුව කාර්යයන් වර්ග කරගන්න අපිට පුළුවන්. ඒ වගේ ම තමයි එදිනෙදා කරන්න තියෙන වැඩ එදාම කරන්න. මේ විදියට හැමදාම Plan එකකට අනුව වැඩ කරන්න පටන් ගත්ත ම Busy වෙන්නේ නෑ. වැඩවලට හිරවෙලා පීඩනයෙන් ඒකාකාරීව ජීවිතේ ගෙවනකොට අපේ ජීවිත නීරස වෙනවා. එතකොට හරියට අපි ජීවත් වෙන්න ඕනේ නිසා ජීවත් වෙනවා වගේ. නිවාඩු දවසට ට්‍රිප් එකක් යන්න, පවුලේ අයත් එක්ක සතුටු වෙන්න, තමන් ආස දෙයක් කරන්න. විවේකීව ඉන්නත් ඔබේ කාලයෙන් ඉඩ වෙන්කර ගන්න අමතක කරන්න එපා. Busy වෙලා ඔබේ ජීවිතය මඟහැර ගන්න එපා. සතුටින් සැහැල්ලුවෙන් ජීවිතේ විඳින්න.

මධුෂිකා ජයතිලක

# පොල්කටු ලන්තෑරුමෙන් එළිය බලන ලක්ෂාන්





ඕනෑම කෙනෙක් ළඟ තමන්ටම ආවේණික වූ කලාවක් හා යම් හැකියාවක් තියෙනවා. සුදේශ් ලක්ෂාන් කියන්නේ තමන් තුළ පැවති ඒ කලාව හා හැකියාව හඳුනාගෙන අපි එදිනෙදා පාවිච්චි කර ඉවත දමන පොල් කටු නැවතත් අලංකාර කැටයම් බවට පත්කරන තරුණයෙක්. අම්මයි, තාත්තයි, මල්ලියි එක්ක සුදේශ්ගේ පදිංචිය කුරුණෑගල. සුදේශ් සිප්සතර හැදෑරුවේ වැල්ලව මධ්‍ය විද්‍යාලයෙන්.

සුදේශ්ගේ තාත්තා විනෝදාංශය විදිහට පොල්කටු කැටයම් නිර්මාණය කරනු පුංචි කාලයේ ඉඳන්ම බලාගෙන සිටි සුදේශ් පියාගෙන් ලැබුණු ආභාෂය මතම පියාගේ විනෝදාංශය තමාගේ රැකියා අවස්ථාව බවට පත්කරගත් බව පැවසුවා. සාමාන්‍යයෙන් එදිනෙදා දකින සරල පොල්කටු කැටයම්වලට වඩා ඔහු විසින් සිදුකරන 'පොල්කටු ලන්තෑරුම' සුදේශ්ගේ කැටයම් අතර විශේෂ වෙනවා. ඔහුගේ නිර්මාණ වෙනුවෙන් මේ වන විට ඉහළ ප්‍රතිචාර හිමිවෙන අතර විශේෂයෙන්ම ලංකාවේ වෙළඳපොළට සාපේක්ෂව විදේශීය වශයෙන් ඔහුට ඉහළ වෙළෙඳපොළක් පවතින බව මතක් කළා. පොල්කටු කැටයම් යනු ඉතාමත් සංයමයකින් කළ යුතු නිර්මාණයක් බවත්, සමහර අවස්ථාවල කැටයමේ අවසාන අවස්ථාවේදී පොල්කට්ට කැඩී යාමට ඉඩ ප්‍රස්ථාව වැඩි වීමෙන් එය තමන්ට ලොකු අභියෝගයක් සහිත කාර්යයක් බව මතක් කළා. මීට පෙර සුදේශ් විසින් රැකියාවල් කිහිපයක්ම සිදු කළත් එම රැකියාවන්ගෙන් නොලැබෙන මානසික සතුටක් තමා විසින් සිදුකරන කැටයම් කලාව තුළින් ලැබෙන බව ඔහු පැවසුවේ ඉතාමත් සතුටින්.

ඔහු තම කැටයම් ආශ්‍රිත ව්‍යාපාරය ආරම්භ කළ මුල් වකවානුව තුළ තරුණයෙක් වශයෙන් එවැනි ව්‍යාපාර අවස්ථාවක් තෝරාගැනීම පිළිබඳව බොහෝ පිරිසක් ඔහුට සමච්චල් කරපු ආකාරය තමන්ගේ මේ දක්වා වූ ගමන තුළ අපූරු මතකයන් බව පැවසුවා. සුදේශ්ගේ මේ දක්වා ගමන තුළ ඔහුට අතහිත දුන් පිරිස අතරින් අම්මා, තාත්තා ඇතුළු පවුලේ සියලු දෙනාටත් විශේෂයෙන්ම ඔහුව නිතරම දිරිමත් කරන ඔහුගේ පෙම්වතියටත් වචනයකින් හරි සහයෝගය ලබා දුන් සියලු දෙනාටත් හදවතින්ම ස්තූතිවන්ත වන බව පැවසුවා.

සුදේශ්ගේ අනාගත බලාපොරොත්තුව වුණේ cocoSL නමින් පොල්කටු කැටයම් ආශ්‍රිතව ඉහළ වෙළඳ සන්නාමයක් ලංකාව තුළ පිහිටුවීමයි. අවසාන වශයෙන් අනාගතයේදී ව්‍යාපාර අවස්ථාවන් සඳහා යොමුවීමට සිටින නවකයන්ට ඔහු මෙන්න මෙහෙම පණිවිඩයක් දුන්නා.

'මට කියන්න තියෙම එකම දේ තමයි මොන රැකියාවක් කරත් ඔබේ හිත පිනවමින්ම එය සිදු කරන්න. ව්‍යාපාරයක් කරනවා නම් ක්ෂණික ලාභ එන්නේ නෑ, ටික කාලයක් මහන්සි වෙන්න ඕනි. මොන ප්‍රශ්න ආවත් අතහරින්න එපා. ඒ වගේම ඔබ උපයන මුදල් නිකරුණේ නාස්ති කරන්න එපා. කාලයට ගැළපෙන ව්‍යාපාර කරන්න. එතකොට හොඳ ආදායමක් ලබාගන්න පුළුවන් වෙනවා.'

කවි විජේසූරිය









# පෞරුෂවත් යෞවනය

මලක් සිනිඳු ය. සුවඳවත් ය. මොලකැටි ය. එය ජීවිතයට සතුට හා සොම්නස ළඟා කරයි. කුඩා දරුවන් ද මල් වැනි යැයි කියමනක් තිබේ. අපි එහි සුන්දරත්වය අත්විඳිමු. එයට ඇලුම් කරමු. මල් පොහොට්ටුවන් ළපටි සිත්මල් විදා පෙති විකසිතව හිනැහෙන සොඳුරුතම අවධිය වන්නේ අසිරිමත් යෞවනය යි.

සැබවින්ම නව යෞවනය පිපුණු මලකි. එහි රුවට, චමත්කාරයට ආකාර්ෂණය නොවන්නේ කවුරුන් ද? සිතට දැනෙනා නැවුම් හැඟීම් ආදරයෙන් මුදාහරින කාලවකවානුව මෙය යි. තටු සලා ඉගිල යන්නට, නිදහස, සතුට, විනෝදය සොයා යන්නට හදවත ඉල්ලා සිටින්නේ මේ කාලයේදීම ය. ජීවිතයේ නව පිබිදීමක් ඇතිවන යුගයක් ලෙසත් උපතේ සිට ක්‍රමයෙන් සිදු වෙමින් ආ වර්ධන ක්‍රියාවලීන්ගේ පරිපූර්ණත්වය අරඹන අවධිය වන්නේ ද මෙයයි. එනම් සමාජමය උවමනාව අනුව පුද්ගලයන් ජීවිතයේ ස්විය බලාපොරොත්තු තුලනය කරගැනීමේ ඔවුන් සතු හැකියාව වර්ධනය කරගනු ලබන්නේ යෞවනය තුළදී ය.

මිනිසෙකු තවත් මිනිසකුගෙන් වෙනස් වන්නේ පෞරුෂය හේතුවෙනි. බොහෝ යෞවනයන් සිතා සිටිනුයේ හොඳ පෞරුෂයක් ඇත්තේ රූපයෙන් උස, මහත සහ වර්ණවත් සමක් හිමි අයට යනුවෙනි. එය මනෝ විද්‍යාත්මක අර්ථයෙන් බැහැර කරයි. මන්ද කෙතරම් යහපත් බාහිර ලක්ෂණ තිබුණත් යම් තරුණයකුට හෝ තරුණියකට කිසියම් ගැටලුවක් විසඳා ගත නොහැකි නම් හෝ ගැටලුවකට හෝ කිසියම් අවස්ථාවකට මුහුණ දීමට හැකියාවක් නොමැති නම් හොඳ පෞරුෂයක් තිබිය හැකි බව විශ්වාස කළ නොහැකි ය.

ඔවුන් වටහාගත යුතු වන්නේ ස්වයං ප්‍රතිරූපය නැංවූ විට තමන්ගේ පෞද්ගලික ක්‍රියාකාරීත්වය ද ඉහළ යන බව ය. පෞරුෂත්වය ස්වයං ප්‍රතිරූපය නිර්මාණයේ එක් පැතිකඩ කි.

යෞවනයින් නිර්ව්‍යාජ ලෙස තමන් කෙරෙහි කිසියම් ආදරයක්, ප්‍රියමනාප භාවයක් දක්වන්නේ නම් තමා වටිනා මිනිසකු ලෙස තමාම පිළිගන්නේ නම් ඒ තුළින් තරුණ තරුණියන්ගේ සාර්ථකත්වය පෘථුල කරයි. අභියෝගවලට මුහුණ දෙයි. ඵලදායිතාවයේ ඉහළතම මට්ටම දක්වා යාමට නිරායාසයෙන් ඔබ පෙළඹෙයි. යෞවන යෞවනියන් සඳහා මුහුණදීමට සිදුවන ඉලක්ක සහ බාධක බොහෝ ය. ඉන් සමහර ඉලක්ක ජයගනු ලබන අතර සමහර ඉලක්කයන් ජය ගැනීමට නොහැකි ය. මෙහිදී අප වටහා ගත යුතු වන්නේ අනෙකාට කළ හැකි සියලුම දේ තමන්ට කළ නොහැකි බව ය. ඉලක්ක යනු ජීවිත නිෂ්ඨාවන් වශයෙන් හඳුනාගත යුතු ය. එය පෞරුෂවත් යෞවනයේ ලක්ෂණයකි.

ජීවිතයේ වැඩ කරන අවධිය සහ ජීවිතය විඳින අවධිය යෞවනය යි. අනාගතයට ආයෝජනයක් සිදු කරන්නේත්, ඉදිරිය අස්වද්දන්නේත් යෞවනය තුළයි. එය මනාව වටහා ගන්නේ නම් පෞරුෂවත් යෞවනයක් හිමි තරුණ තරුණියක ලෙසට සමාජය තුළ දෙපයින් නැඟී සිටීමට හැකිය. වටහාගත යුතු වන්නේ කිසිවෙකුගේ පෞරුෂය සහ හැකියාව තවත් අයෙකුට සමාන නොවන බවත්, අනෙකාගේ පෞරුෂය තමා කෙරෙහි සංසන්දනය නොකොට තමන්ට අවැසි ජීවිතය යථාර්ථවාදීව සුබවාදීව ගොඩනගා ගත යුතු බවය.

කල්පනී හෙට්ටිආරච්චි
කැලණිය විශ්වවිද්‍යාලය

2021 මාර්තු 06 සෙනසුරාදා කොළඹ ඩී.ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.